57 වන කාණ්ඩය
13 වන කලාපය

සිකුරාදා
1964 සැප්තැම්බර් 4

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව [තී. 2897]
පෙත්සම් [තී. 2898]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2900]

පිළිගන්වන ලද කෙටුම්පත් පනත [තී. 2912] :
Immigrants and Emigrants (Amendment) Bill

විසර්ජන කෙටුම්පත් පනත, 1964-65 [දහනවවන වෙන් කළ දිනය] [තී. 2926] :
ශීර්ෂ 100-109, 115-118, 123-130, 135-137, 140-147, 150-152, 155-156, 160-165, 167-168, 170-175 සහ 2 වන උප ලේඛනය කාරක සභාවේදී සලකා බලන ලදින්, සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා අනුමත කරන ලදී.

වැය සම්මතවල අතිරික්ත (1961-62) [තී. 3183]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 3185]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 13

வெள்ளிக்கிழமை,
4 செப்டம்பர், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

கணக்குப் பரிசோதனை அதிபதியினது அறிக்கை [ப. 2897]

மனுக்கள் [ப. 2898]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2900]

IMMIGRANTS AND EMIGRANTS (AMENDMENT) BILL [ப. 2912] :
முதன்முறை மதிப்பிடப்பெற்றது

ஒதுக்கீட்டு மசோதா, 1964-65 [ஒதுக்கப்பட்ட பத்தொன்பதாம் நாள்] [ப. 2926] :
குழுவில் ஆராயப்பெற்றது
தலைப்பு 100–109, 115–118, 123–130, 135–137, 140–147, 150–152, 155–156, 160–165, 167–168, 170–175 உம் இரண்டாவது அட்டவணையும்
திருத்தப்பெற்றவாறு மூன்றும் முறை மதிப்பிடப்பெற்று நிறைவேறியது

வாக்குப் பணங்களில் மிகைச் செலவு (1961–62) [ப. 3183]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 3185]

---

Volume 57
No. 13

Friday,
4th September, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**AUDITOR-GENERAL'S REPORT** [Col. 2897]

**PETITIONS** [Col. 2898]

**ORAL ANSWERS TO QUESTIONS** [Col. 2900]

**IMMIGRANTS AND EMIGRANTS (AMENDMENT) BILL** [Col. 2912] :
Read the First time

**APPROPRIATION BILL, 1964-65** [*Nineteenth Allotted Day*] [Col. 2926] :
Considered in Committee
Heads 100-109, 115-118, 123-130, 135-137, 140-147, 150-152, 155-156, 160-165, 167-168, 170-175 and Second Schedule
Read the Third time, as amended, and passed

**EXCESS VOTES (1961-62)** [Col. 3183]

**WRITTEN ANSWERS TO QUESTIONS** [Col. 3185]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

### 1964 සැප්තැම්බර් 4 වන සිකුරාදා

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායකතුමා [ගරු ශිෂු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

---

## විසර්ජන ගිණුම් පිළිබඳ ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව, 1962-63

*1962-63 ஆம் ஆண்டின் ஒதுக்கீட்டுக் கணக்குகள் மீதான கணக்குப் பரிசோதனை அதிபதியினது அறிக்கை*

AUDITOR-GENERAL'S REPORT ON THE APPROPRIATION ACCOUNTS, 1962-63

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

I present the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Appropriation Accounts of the Government of Ceylon for the Financial Year, 1962-63 (Part II).

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன—தொழில், வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Labour and Housing)

On behalf of the Leader of the House, I move,

"That the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Appropriation Accounts of the Government of Ceylon for the Financial Year, 1962-63 (Part II) be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.



## පෙත්සම්

*மனுக்கள்*

PETITIONS

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**

*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*

(Mr. M. Sivasithamparam—Uduppiddi)

I am presenting this petition on behalf of one V. R. Veeraswamy who is a Grade II Supervisor in the Land Development Department. Apparently, he had fallen into trouble with his immediate superior, the D. R. O., who had given him a little trouble and he was thereafter interdicted. An inquiry was held and he was dismissed. He appealed to the Public Service Commission and the P. S. C., as usual, has written to him that they have no reason to interfere in the decision already arrived at. He is appealing to you and this Honourable House that this matter be looked into and some relief be granted.

මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතුයැයි නියෝග කරන ලදී.

**කේ. එච්. ජී. ඇල්බට් මයා). (බෙන්තර ඇල්පිටිය)**

*(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)*

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, බෙන්තර පහළ ගම්භය වාසීන් විසින් එවන ලද පෙත්සමක් මා ඉදිරිපත් කරනවා. බෙන්තර ආනන්ද කන්නන්ගර සහ තවත් 1,510 දෙනෙක් විසින් අත්සන් කර බෙන්තර සුළු නගර සභාවක් කරන ලෙස ආයාචනය කරමින් ඉදිරිපත් කරන ලද ඒ පෙත්සම කථානායකතුමා සහ ගරු මහජන මන්ත්‍රීවරුන් වෙත මා ඉදිරිපත් කරනවා.

බෙන්තර නගරය බොහෙම ඉස්සර කාලයේ පටන් ලස්සණට තිබුණු නගරයක්. එය ඓතිහාසික නගරයක්. බොහොම හොඳ සාහිත්‍යයක් ගොඩ නැගූ ලංකාවේ සිංහල ජනතාව නගා සිටුවීමට විශාල සේවයක් කළ නගරයක්, මේ බෙන්තර නගරය. අද ඒ නගරය පරිහාණිය කරා ගමන් කරමින් පවතිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]
එහි නාමය පවා තව ටික කලකින් අඳුරින් වැසී යනවා ඇතැයි බෙන්තර ප්‍රදේශයේ වාසීන් තුළ බියක් තිබෙනව. එම නිසා ඒ නගරය නැවත වාරයක් නඟා සිටුවීමට ක්‍රියා කරන්න කියා විශේෂ ආයාචනයකුයි මේ ඉදිරිපත් කරන්නෙ. මේ නගරය දැන් ඉතා ශීඝ්‍රයෙන් කාර්මික නගරයක් බවට පරිවර්තනය වෙමින් තිබෙන නිසා මේ යෝජනාව ගැන සැලකිල්ල යොමු කර කටයුතු කරනවා ඇත යන බලාපොරොත්තු වෙනුයි, මේ යෝජනාව ඉදිරිපත් කර කර තිබෙන්නෙ.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදි.**

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

ගරු කථානායකතුමනි, හබුරුගල ඞී. ආර්. සිරිනෝරිස් මහත්මයා විසින් එවන ලද පෙත්සමක් මා ඉදිරිපත් කරනව. ඒ මහත්මයා ආණ්ඩුවේ ඉඩමක ගෙයක් හදා ගෙන පදිංචි වී සිටින අතරතුරදී බෙන්තර ප්‍රදේශයේ ගම්කාර්ය සභාපතිතුමා හා තවත් ඔහුගේ සහචරයින් පිරිසක් පැමිණ ගේ කඩා දමා බඩු මුට්ටු එහෙමම තිබෙද්දි අඹු දරුවන් එළියට ඇද දමා තිබෙනව. මේ සිද්ධිය වුණේ දැනට සති 3 කට පමණ පෙරයි. පොලීසියට මේ ගැන පැමිණිලි කරන ලද නමුත් ඒ පැමිණිල්ල කිසි සේත් භාර නොගත් බවත්, ඒ පිළිබඳව හරියාකාර ක්‍රියා කළේ නැති බවත් දන්වමින් ඒ මහත්මයා මේ සභාවට මෙම පෙත්සම ඉදිරිපත් කර තිබෙනව.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදි.**

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

ගරු කථානායකතුමනි, ජේ. ඒ. ඇල්බට් මහත්මයා විසින් එවන ලද පෙත්සමක් මා ඉදිරිපත් කරනව. ඒ මහත්මයා ආණ්ඩුවේ ඉඩමක අවුරුදු ගණනක් පදිංචිව සිටිය. ඔහුට ආණ්ඩුවෙන් අවසර පත්‍රයක් දී තිබුණා. නමුත් ඉඩම් හිමි ධනවතෙක් තවත් අවසර පත්‍රයක් අයථා මාර්ගයෙන් ලබාගෙන, දිස්ත්‍රික් උසාවියේ නඩු කියා ඉඩම අයිති කරගෙන, ඒ මහත්මයාව ඒ ඉඩමෙන් පන්නා දමන්ට සූදානම් වී තිබෙනව. ගෘහ මූලික ලැයිස්තු ආදියේ ලියා පදිංචි වී දැනට අවුරුදු 10 කට වැඩි කාලයක් ආණ්ඩුවේ මේ ඉඩමේ පදිංචි වී සිටින ඒ මහත්මයාට මගට බහින්නට සිදු වී තිබෙන මේ අවසථාවේ වහාම ඔහුට පිහිට වන්නය කියා පෙත්සමක් ඉදිරිපත් කර තිබෙනවා. මා මේ අවසථාවේදී එම පෙත්සම තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදි.**

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

## ORAL ANSWERS TO QUESTIONS

### අඹනක්කට්ටුව විවිධ සේවා සමුපකාර සමිතිය, අනුරාධපුර දිස්ත්‍රික්කය

*அம்பனக்கட்டுவ பலநோக்குக் கூட்டுறவுச் சங்கம்: அனுராதபுர மாவட்டம்*

### AMBANAKKATTUWA MULTI-PURPOSE CO-OPERATIVE SOCIETY, ANURADHAPURA DISTRICT

**2. පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)**

*(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலை)*

(Mr. P. M. K. Tennekoon—Mihintale)

අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සීමාසහිත අඹනක්කට්ටුව විවිධ සේවා සමුපකාර සමිතිය 1961.9.22 වැනි දින එස්. උඩයාපර් මහතාගෙන් වී බුසල් 43 ක් හා 1961.9.15 වැනි දින ඩබ්ලිව්. රංකිරා මහතාගෙන් වී බුසල් 116 ක් මිල දී ගත් බව එතුමා දන්නවාද? (ආ) ඉනික්බිතිව, අනුරාධපුරේ සමුපකාර ප්‍රාදේශීය බැංකුවෙන් ඔවුන්ට මුදල් ලබාගත හැකිවන පරිදි සමිතියේ සභාපති හා කළමනාකරු විසින් අත්සන් කරන ලද පිළිවෙලින් අංක ඒ. 165312 හා 165311 දරන චැක්පත් ඔවුන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිකුත් කරන ලද බව එතුමා දන්නවාද ? (ඉ) දෙපාර්තමේන්තුව මෙම චෙක්පත් මාරු කිරීම නැවැත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැන් ඔවුන් ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින බව එතුමා දන්නවාද ? (ඊ) මෙම මුදල් වහාම ගෙවීමට එතුමා වග බලා ගන්නවාද ?

*உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக, வினியோக அமைச்சரைக் கேட்ட வினா: (அ) அனுராதபுர மாவட்டத்திலுள்ள அம்பனக்கட்டுவைப் பல நோக்குக் கூட்டுறவுச் சங்கம் 15.9.61 இல் திரு. டபிள்யு. றன்கிரா என்பவரிடமிருந்து 116 புசல் நெல்லையும், 22.9.61 இல் திரு. எஸ். உடயப்பர் என்பவரிடமிருந்து 43 புசல் நெல்லையும் கொள்வனவு செய்ததென்பதை அவர் அறிவாரா? (ஆ) இதனையடுத்து அச்சங்கத் தலைவராலும், முகாமையாளராலும் கையொப்பமிடப்பட்ட முறையே A. 165311, A 165312 ஆம் இலக்கங்களையுடைய காசோலைகள் அநுராதபுரக் கூட்டுறவு மாகாண வங்கியில் பணம் பெறுவதற்கேதுவாக அவர்களுக்கு வழங்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (இ) இக்காசோலைகள் மாற்றப்படுவதைத் திணைக்களம் தடைசெய்தமையால் அவர்களுக்கு பெரும் இக்கட்டான நிலையேற்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஈ) இப்பணம் உடனடியாய் வழங்கப்படுவதற்கு அவர் வகை செய்வாரா?*

asked the Minister of Internal and External Trade and Supply: (*a*) Is he aware that the Ambanakkattuwa Multi—Purpose Co-operative Society Ltd., in the Anuradhapura District purchased 43 bushels of paddy from Mr. S. Udayappar on 22.9.1961 and 116 bushels of paddy from Mr. W. Rankira on 15.9.61 ? (*b*) Is he aware that subsequently the cheques Nos. A. 165312 and A. 165311 respectively signed by the Chairman and the Manager of the said society were issued to them to enable them to draw cash from the Co-operative Provincial Bank, Anuradhapura ? (*c*) Is he aware that as a result of the department suspending the cashing of these cheques they have now faced much hardship ? (*d*) Will he see that this money is paid immediately ?

**ගරු ද සොයිසා සිරිවර්ධන** (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)

*(கௌரவ டி சொய்சா சிறிவர்தன—உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக, விநியோக அமைச்சர் சார்பில்)*

(The Hon. de Zoysa Siriwardena—on behalf of the Minister of Internal and External Trade and Supply)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) අංක ඒ. 165311 චෙක්පත බැංකුවට ගිය විට එය මාරු කිරීමට තරම් මුදල් බැංකුවේ තිබුනේ නැත. එම නිසා ඒ චෙක්පත නිගරු විය. බැංකු ගිණුම තහනම් කළේ එයින් පසුවය. මෙසේ කළේ කළමනාකරු හෝ සමිති නිලධාරීන් වගකීමෙන් තොරව තවදුරටත් චෙක්පත් ගණුදෙනු කිරීම වැළැක්වීමටය. (ඊ) සමිතියේ ලියාපදිංචිය අවලංගු කර ඇත. දැනට බැංකුවේ ඉතිරි වී ඇත්තේ රු. 546.23 ක් පමණක් බැවින්, මේ වීවලට ගෙවිය යුතු මුදල දැන් ගෙවිය නොහැක. ඈවරකරු විසින් අයවිය යුතු මුදල් නොපමාව අය කොට මේ ගණුදෙනුව බේරීමට කටයුතු කරනු ඇත.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**

*(திரு. பீ. எம். கே. தென்னகூன்)*

(Mr. P. M. K. Tennekoon)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න කැමතියි. මේ කළමනාකරුගේ දූෂණකම් උඩ මේ සමිතිය විසුරුවා හැරියාය කියලයි, දැනගන්නට තිබෙන්නෙ. තත්ත්වය එහෙම නම්, කළමනාකරු තැන්පත් කර තිබෙන ඇප මුදල හෝ තහනම් කර ඒ ඇප මුදලෙන් මේ අහිංසක ගොවි රාළලා දෙදෙනාට වීවලට ගෙවිය යුතු හිඟ මුදල ගෙවීමට ඇමතිතුමා වහාම කටයුතු සලස්වනවාද කියා මා දැනගන්න කැමතියි.

**ගරු ද සොයිසා සිරිවර්ධන**

*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*

(The Hon. de Zoysa Siriwardena)

ඒ විධියට ක්‍රියා කරන්න පුළුවන් නම් ඒ අනුව කටයුතු කරන්නය කියා ඇමතිතුමාට දන්වන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කිරිඇල්ල: උස්බිම් ජනපද ව්‍යාපාරයක් ඇරඹීම

## கிரியெல்லத் தொகுதிக்கு மேட்டுநில குடியேற்றத் திட்டம்

## HIGHLAND COLONIZATION SCHEME FOR KIRIELLA

4. **පී. බී. විජයසුන්දර මයා.** (කිරිඇල්ල)
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කිරිඇල්ල ඡන්දදායක කොට්ඨාශයේ වැසියන් අතර බෙදා දීමට සෑහෙන තරම් රජයේ ඉඩම් නොමැති බව එතුමා දන්නවාද? (ආ) මෙම ඡන්දදායක කොට්ඨාශය සඳහා උස්බිම් ව්‍යාපාරයක්වත් පිහිටුවා නැති බවත් එතුමා දන්නවාද? (ඉ) බටහිර කොට්ඨාශයේ කොට්ඨාශ භාර වනාරක්ෂක නිලධාරීතැන, උස්බිම් ව්‍යාපාරයක් සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ යටිපව්ව වසමේ කලුවාවිලතැන්න ප්‍රදේශයෙන් අක්කර 250 ක ඉඩමක් නිර්දේශ කර මෙම ඉඩම දීමට අනුමතිය දුන් බව එතුමා දන්නවාද? (ඊ) මෙම ඉඩම මෙකී කාර්යය සඳහා වෙන් කිරීම ගැන වන සංරක්ෂක විරුද්ධ වූ බව එතුමා දන්නවාද? (උ) කිරිඇල්ල ඡන්දදායක කොට්ඨාශය සඳහා උස්බිම් ව්‍යාපාරයක් නොමැති හෙයින් කොට්ඨාශ භාර වනාරක්ෂක නිලධාරීතැන සහ දිසාපතිතැන විසින් නිර්දේශ කර ඇති පරිදි එකී ඉඩමේ එතුමා උස්බිම් ව්‍යාපාරයක් ආරම්භ කරනවාද?

*திரு. பி. பீ. விஜேசுந்தர,—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) கிரியெல்லத் தேர்தற்றெகுதியிலுள்ள மக்களிடையே பராதீனப்படுத்துவதற்கென முடிக்குரிய காணிகள் போதியளவில் இல்லையென்பதை அவர் அறிவாரா? (ஆ) இத்தேர்தற்றெகுதிக்கு மேட்டுநிலக் குடியேற்றத் திட்டமொன்று தானும் ஆரம்பிக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (இ) மேற்குப் பிரிவுப் பெரும்பாக வனபரிபாலன உத்தியோகத்தர், மேட்டுநிலக் குடியேற்றத் திட்டமொன்றிற்கென, இரத்தினபுரி மாவட்டத்திலுள்ள யட்டிப்பவ்வ வசமவைச் சேர்ந்த கலுவாவிலத்தன்ன பகுதியிலுள்ள 250 ஏக்கர் காணியைச் சிபார்சு செய்ததுடன் உடனடியாக இக்காணியை வழங்குவதற்கும் அங்கிகாரம் வழங்கினுரென்பதை அவர் அறிவாரா? (ஈ) இக்காணியை இத்தேவைக்குப் பங்கீடு செய்வதற்கு வனபரிபாலன அதிபதி மறுத்துள்ளாரென்பதை அவர் அறிவாரா? (உ) கிரியெல்லத் தேர்தற்றெகுதிக்கென மேட்டுநிலக் குடியேற்றத் திட்டமொன்றில்லையாகையால், பெரும்பாக வனபரிபாலன உத்தியோகத்தரும் அரசாங்க அதிபரும் சிபார்சு செய்தவாறு மேட்டுநிலக் குடியேற்றத் திட்டமொன்றை அவர் ஆரம்பிப்பாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that sufficient Crown lands are not available for alienation among the people of the Kiriella Electorate? (*b*) Is he also aware that even a highland colonization scheme has not been established for this electorate? (*c*) Is he aware that the Divisional Forest Officer, Western Division, recommended 250 acres of land in the Kaluwawilatenna area in Yatipawwa wasama in the Ratnapura District for highland colonization scheme and granted authority for the release of this land? (*d*) Is he aware that the Conservator of Forests objected to the allocation of the said land for this purpose? (*e*) In view of the fact that there is no highland colonization scheme for the Kiriella electorate, will he start a highland colonization scheme in the said land as recommended by the Divisional Forest Officer and the Government Agent?

**ගරු මෛත්‍රීපාල සේනානායක** (ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන ඇමති)—ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති වෙනුවට)

*(கௌரவ மைத்திரிபால சேனநாயக்க—கிராம, கைத்தொழில் அபிவிருத்தி அமைச்சர்—காணி, நீர்ப்பாசன மின்விசை அமைச்சர் சார்பில்)*

(The Hon. Maithripala Senanayeke—Minister of Rural and Industrial Development—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. (ආ) ඔව්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ප්‍රශ්න ඇසීම දන් විහිළුවකට පරිවර්තනය වී තිබෙනවා. පිළිතුරු දෙන්නට ඇමතිතුමත් නැහැ; පාර්ලිමේන්තු ලේකම්තුමත් නැහැ. වෙනත් ඇමතිවරයෙක් උත්තර දුන්නට අපට අතුරු ප්‍රශ්නයක් අසා පිළිතුරක් ලබා ගන්න බැහැ. මේ ඇමතිවරුන්ට කීවට අපි අසන දේවලට අදාළ ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවද දන්නෙත් නැහැ. අපට ඇමතිවරුන් මෙහෙම සලකනවා නම් නිලධාරීන් මීට වඩා දරුණු ලෙස සලකනවා.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, ඇමතිවරුන්ට යම් යම්—

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

Please inform the Ministers that either they themselves or their Parliamentary Secretaries should be present during Question time.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

I have informed all the Ministers that either they or their Parliamentary Secretaries should be here during Question time, but unfortunately, due to various circumstances, on some days they are unable to come.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මේ ඇමතිවරුන්ට අවවාදයක් වශයෙන් මිනිත්තු 10 කට පාර්ලිමේන්තුව කල්තබා ඇමතිවරුන්ට හෝ පාර්ලිමේන්තු ලේකම්වරුන්ට මෙතන්ට එන්න වැඩ පිළිවෙළක් සකස් කරන හැටියට මා ඉල්ලනවා. නැත්නම් හැමදාම අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා පමණයි. ඔබතුමාත් කියනවා; ඇමතිවරුනුත් පොරොන්දු වෙනවා; නමුත් හැමදාම තත්ත්වය මේකයි. පළමුවෙන්ම ඇසූ ප්‍රශ්නයටත් වෙන ඇමතිවරයෙක් උත්තර දුන්නෙ. ඊළඟ ප්‍රශ්නයටත් කර්මාන්ත ඇමතිතුමා පිළිතුරු දෙන්න යනව. ඒ දෙපොළටම ඒ ප්‍රශ්න ගැන අසන අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

ඉදිරියට නියම ඇමතිතුමා හෝ පාර්ලිමේන්තු ලේකම්තුමා මගින්ම උත්තර සැපයීමට වීර්ය කරනව.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ප්‍රශ්නවලට පිළිතුරු දීමට සැලකිල්ලක් දක්වන්න ඕනෑ. ඒ වෙලාවට ඇමතිතුමා සිටින්නම ඕනෑ.

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

මා ඒ ගැන ඇමතිවරුන්ටත් පාර්ලිමේන්තු ලේකම්වරුන්ටත් දන්වන්නම්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

හැමදාම දන්වනවලු.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

කලිනුත් දැනුම් දී තිබෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මිනිත්තු 10 කට සභාව කල් තබන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. පළමුවෙන්ම ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙන විට මා නිශ්ශබ්දව සිටියා. දෙවන වරටත් අදාළ ඇමතිතුමා වෙනුවට උත්තර දෙන්න සූදානම් වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මින් පසුව ප්‍රශ්නයක් අසන වේලාවට ඇමතිවරයා හෝ පාර්ලිමේන්තු ලේකම් වරයා සිටින්නටම ඕනෑ.

**ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)

එහෙම ආවෙ නැත්නම් දඬුවම මොකක්ද ?

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

I will leave it to the House.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

පළමුවෙන් ඇසූ ප්‍රශ්නයටත් ඇමති වරයා හෝ පාර්ලිමේන්තු ලේකම්වරයා උත්තර දෙන්න සිටියෙ නැහැ. දැන් මීළඟට තිබෙන්නේ සේනපාල සමරසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය. එයට පිළිතුරු දිය යුත්තේ කෘෂිකර්ම ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිතුමායි. ඒ ඇමති තුමත් නැහැ; එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමත් නැහැ. 1, 2, 3, 4, 5 වැනි ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා ඇමති වරුවත් පාර්ලිමේන්තු ලේකම්වරුවත් පැමිණ නැහැ. මේක මේ ගරු සභාවට කරන අගෞරවයක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් මහජනයාගේ අවධානය යොමු කිරීමටත් දඬුවමක් වශයෙනුත්, රැස්වීම කල් දමන මෙන් මම නැවතත් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මගේ ඉල්ලීම පිළිගෙන මීට පසු කටයුතු කරාවිය කියා මා බලාපොරොත්තු වෙනවා.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මේ ඇමතිතුමා උත්තර දෙන්න කෝපන්හේගන්වල සිට ආවා.

**ගරු මෛත්‍රීපාල සේනානායක—ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති වෙනුවට)**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பில்)*
(The Hon. Maithripala Senanayeke—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) සඳහන් කර ඇති අක්කර 250 මුදා හැරීමට බටහිර කොට්ඨාශයේ කොට්ඨාශ භාර වනාරක්ෂක නිර්දේශ කළ බැව් දනිමි. (ඊ) ඔව්. (උ) මේ ගැන පරීක්ෂා කරගෙන යන්නෙමි.

**පී. බී. විජයසුන්දර මයා.**
*(திரு. பீ. பி. விஜேசுந்தர)*
(Mr. P. B. Wijesundara)

මේ ප්‍රශ්නය ගැන මා විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමාගේ අවධානය යොමු කර වන්ට ඕනෑ. බටහිර කොට්ඨාශයේ කොට්ඨාශ භාර වනාරක්ෂක නිලධාරි තැන මේක යෝජනා කර තිබියදීත් වන සංරක්ෂක එය ප්‍රතික්ෂේප කර තිබෙනවා. විශේෂ යෙන්ම මේ ගැන පරීක්ෂා කර බලා මේ ඉඩම එකී කාර්යයට වෙන් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

අනිත් කාරණය මෙයයි. උඩ වලවේ ඉඩම් බෙදාදීම සම්බන්ධයෙන් කිරිඇල්ල ඡන්ද කොට්ඨාශයටත් යම්කිසි ඉඩම් කට්ටි ප්‍රමාණයක් වෙන් කළා. නමුත් ඊට පසුව, ඒ ඉඩම් කට්ටි ප්‍රමාණය භාගයකට අඩු කළා. ඒ ගැනත් සළකා බලා කිරි ඇල්ල ඡන්ද කොට්ඨාශයට වෙන් කර තිබුණු ඉඩම් කට්ටි ගණන වලංගු නොකර යථා කාලයේදී ඒ ඉඩම් දුන්නොත් මා ගරු ඉඩම් ඇමතිතුමාට කෘතඥ වෙනවා.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

මා ඒ කරුණු ගරු ඇමතිතුමාට දැනුම් දෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ගම්දහය ගම්කාර්ය සභාවේ ලිපිකරුවෙකුවූ එම්. ඩී. සේනානායක මහතා

*திரு. எம். டி. சேனநாயக்க, இலிகிதர், கம்தகய கிராமசபை*

MR. M. D. SENANAYAKE, CLERK, GAMDAHAYA V. C.

7. ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්නපුරය)

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)*

(Mr. D. P. R. Weerasekera—Ratnapura)

පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වරියගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගම්දහය ගම්කාර්ය සභාවේ ලිපිකරුවෙකු වූ එම්. ඩී. සේනානායක මහතා පළාත් පාලන කොමිෂන් සභාවේ විනයානුකූල ක්‍රියා මාර්ගයට යටත් වූ බව එතුමිය දන්නවාද? (ආ) ගණන් පරීක්ෂණ වාර්තාවක් මත පදනම් වූ එම චෝදනාව කළ යුතුව තිබුණේ මෙම නිලධාරියාට විරුද්ධව නොව සභාපතිට විරුද්ධව බව එතුමිය දන්නවාද? (ඉ) සභාපති එම වගකීම භාර ගනිද්දීත් සේනානායක මහතාගේ සාක්ෂිකරුවන් නොකැඳවා පරීක්ෂණයක් පවත්වා ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරන ලද බව එතුමිය දන්නවාද? (ඊ) එතුමිය මේ ගැන පරීක්ෂා කර බලා සහනයක් ලබා දෙනවාද?

*உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) கம்தகயக் கிராமச் சபையில் இலிகிதராயிருந்த திரு. எம். டி. சேனநாயக்க உள்ளூராட்சிச் சேவை ஆணைக்குழுவால் ஒழுங்கு நடவடிக்கைக்குட்படுத்தப்பட்டாரென்பதை அவர் அறிவாரா? (ஆ) கணக்குப் பரிசோதனை அறிக்கைப் பிரகாரம் செய்யப்பட்ட அக்குற்றச்சாட்டு தலைவருக்கெதிராகச் செய்யப்பட்டிருக்கவேண்டுமேயன்றி இவ்வுத்தியோகத்தருக்கெதிராய்ச் செய்யப்பட்டிருக்கக்கூடாதென்பதை அவர் அறிவாரா? (இ) இதற்குரிய பொறுப்பைத் தலைவர் ஏற்றுக் கொண்டபோதிலும் திரு. சேனநாயக்கவினது சாட்சிகள் அழைக்கப்படாமலே விசாரணையொன்று நடாத்தப்பட்டு அவருக்கெதிராய் ஒழுங்கு நடவடிக்கை எடுக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஈ) இது சம்பந்தமாய் அவர் விசாரணை நடாத்தி நிவாரணமளிப்பாரா?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs: (*a*) Is she aware that Mr. M. D. Senanayake who was Clerk of the Gamdahaya Village Committee was subject to disciplinary action by the Local Government Service Commission? (*b*) Is she aware that the charge which was based on the Audit report should have been made against the Chairman and not against this officer? (*c*) Is she aware that despite the Chairman accepting responsibility, an inquiry was held without summoning Mr. Senanayake's witnesses and disciplinary action was taken against him? (*d*) Will she inquire into this and give redress?

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

(අ) ඔව්. (ආ) නැත. (ඉ) නැත. (ඊ) පැන නොනගී.

## ඇඳිරියන්වල්ල, බලතොට හා මහවත්තකන්ද යන ගම් තුනට වෛද්‍ය පහසුකම්

*எந்திரியன்வல்ல, பலத்தோட்ட, மகாவத்த கந்த கிராமங்களுக்கு வைத்திய வசதிகள்*

ENDIRIYANWALLA, BALATOTA AND MAHAWATTAKANDA: MEDICAL FACILITIES

8. ඩී. පී. ආර්. වීරසේකර මයා.

*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*

(Mr. D. P. R. Weerasekera)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අධික ජනගහනයකින් යුත් ඇඳිරියන්වල්ල, බලතොට හා මහවත්තකන්ද යන ගම් තුනට වෛද්‍ය පහසුකම් නොමැති බව එතුමා දන්නවාද? (ආ) මෙම ගම් පිහිටා ඇත්තේ ආසන්නම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. වීරසේකර මයා.]

දිස් ඇන් සරියේ සිට සැතපුම් හයක් ඈතින් බවත්, ඒවාට ගමන් පහසුකම් නොමැති බවත්, එතුමා දන්නවාද? (ඉ) එතුමා මෙම ප්‍රදේශයට සංචාරක බෙහෙත් ශාලවක් ලබා දෙනවාද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) மிகவும் குடிசனம் அதிகமாயுள்ள எந்திரியன் வல்ல, பலத்தோட்ட, மகாவத்தகந்த ஆகிய மூன்று கிராமங்களுக்கும் வைத்திய வசதிகள் இடையாதென்பதை அவர் அறிவாரா? (ஆ) இவற்றிற்கு அண்மையிலுள்ள மருந்தகத்திலிருந்து ஆறு மைல்களுக்கப்பால் இக் கிராமங்கள் அமைந்துள்ளனவென்பதையும் அங்கிருந்து போக்குவரத்து வசதிகள் இடையாதென்பதையும் அவர் அறிவாரா? (இ) இப்பகுதிக்கு வேஷோநோ மருந்தக மொன்றினை அவர் அளிப்பாரா?

asked the Minister of Health: (a) Is he aware that three highly populated villages, Endiriyanwalla, Balatota and Mahawattakanda have no medicl facilities? (b) Is he aware that they are situated six miles away from the closest dispensary and that they have no transport facilities? (c) Will he provide a visiting dispensary for this area?

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டப்ளியு. பீ. ஜீ. ஆரியதாச—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Health)

(අ) එදිරියන්වල්ල, බලතොට සහ මහ වත්තකන්ද යන ගම්වල ජනගහණය 1,000 ක් පමණ වේ. වෛද්‍ය පහසුකම් ලබා ගත හැකි තරම් දුර ප්‍රමාණයක් ඇතුළත වෛද්‍ය ආයතන පිහිටා තිබේ. (ආ) එරත්න මධ්‍ය බෙහෙත්ශාලාව හා දෙහිපහල සංචාරක බෙහෙත්ශාලාව ඉහත කී ගම්වල සිට සැතපුම් 2 කේ සිට 5 දක්වා දුරින් පිහිටා ඇති නමුත්, කඳුවැටියකින් එය වෙන්වී ඇත. එම ස්ථානවලට යා යුත්තේ පයිනි. (ඉ) සඳහන් කරන ලද ගම්වල වැසියන්ට වෛද්‍ය පහසුකම් ලබාදීම සඳහා සංචාරක බෙහෙත් ශාලාවක් පිහිටු වීම ගැන අළුත් වෛද්‍ය ආයතන පිහිටුවීම සම්බන්ධව ළඟදී බැසගත් කැබිනට් තීරණය අනුව දිස්ත්‍රික්ක සම්බන්ධතා කමිටුව විසින් සලකා බැලීම සඳහා කටයුතු කරමි.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

1 වන ප්‍රශ්නය.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்சா சிறிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

1 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම් හා සැපයීම් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කල් ඉල්ලා තිබෙනව.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

# කෙටුම්පත් පණත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

## BILLS PRESENTED

### IMMIGRANTS AND EMIGRANTS (AMENDMENT) BILL

"to amend the Immigrants and Emigrants Act".

පිළිගන්වන ලද්දේ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන විසිනි. 1964 සැප්තැම්බර් මස 28 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.

# මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු
சபை அலுவல்

## BUSINESS OF THE HOUSE

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

On behalf of the Leader of the House, I move,

"That notwithstanding the provisions of Standing Order No. 24, the Motion appearing as item 2 on the Paper be proceeded with this day."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, අපිට මේ යෝජනාවට එකඟ වෙන්න අමාරුයි. සමහර විට ආණ්ඩුව සිතන්න පුළුවන් මේ 2 වැනි යෝජනාවේ තිබෙන දේවල් පැය භාගයකින් කරන්ට පුළුවන් වේය කියා. නමුත් එහෙම නොවෙන්නත් ඉඩ තිබෙනව. ගිය අවුරුද්දෙත් මේ විධියටම ගෙනා යෝජනාවක් සම්බන්ධයෙන් ඇති වුණ තත්ත්වය ඔබතුමා දන්නව ඇති. ඒ එක්කම මූලික වශයෙන් ඇසිය යුතු තවත් ප්‍රශ්නයක් තිබෙනව. මීළඟ යෝජනාව ඉදිරිපත් කළ විට මම ඒ ප්‍රශ්නය අහනව. මීළඟට ඇති තුන් වෙනි යෝජනාවේ සඳහන් කර තිබෙන දේ පක්ෂ නායකයන් සමග ආණ්ඩුව සහභාගි වී කළ සාකච්ඡාවකදී ගත් තීරණයෙන් පිට පැන තිබෙනව. එහෙම පිට පනිනවා නම් අඩුම ගණනේ ඒ බව පක්ෂ නායකයන්ට දන්වන්නවත් ඕනෑ. එසේ දන්වන්නෙ නැතිවයි මේ තුන් වෙනි යෝජනාව ගෙනැවිත් තිබෙන්නෙ. ඒ යෝජනාව ඉදිරිපත් කළාට පසුව මම ඒ ගැන කථා කරනව. ඒ නිසා මේ දෙවැනි යෝජනාව ඉල්ලා අස්කර ගන්නා හැටියට මම ඉල්ලනව [බාධා කිරීම්] හදිසියේ තදබදයකින් යුක්තව මෙය කරන්න ඕනෑ නැහැ.

පක්ෂ නායකයන්ගෙ රැස්වීමේදී මේ පිළිබඳව තීරණයක් ගත්ත. සභානායකතුමා මේ අවස්ථාවේදී නැති වීම ගැන කනගාටුයි. සභානායකතුමා නැතිව මේ කාරණය ගැන තීරණයක් ගන්න අමාරුයි. කරුණා කර සංවිධායක ඇමතිතුමා පණිවුඩයක් යවන්න සභානායකතුමාට එන්නය කියා.

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

දැන් එනවාය කියා මට දන්වා තිබෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් ටිකක් ඉන්න එනතුරු.

**ගරු මෛත්‍රීපාල සේනානායක**
*(கௌரவ மைத்திரிபால சேனநாயக்க)*
(The Hon. Maithripala Senanayeke)

කථානායකතුමනි, මෙම යෝජනාවට අදාළ වූ අංක 2 දැක්වෙන යෝජනාවෙන් කියනනෙ, 1961-62 මුදල් වර්ෂය සඳහා ලබා දුන් මුදල්වල ඉක්මවීම් පියවීම සඳහා මුදල් ලබා ගැනීම ගැන සලකා බැලීමට මෙම මන්ත්‍රී මණ්ඩලය කාරක සභාවකට පරිවර්තනය විය යුතුය යනනයි. ඒ අනුව ඒ පිළිබඳව සාකච්ඡා කරන්නේ මීළඟ රැස්වීමේදියි. අද යෝජනාවෙන් කරන්නෙ ඒ කාරක සභාව පත් කිරීම පමණයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

සභානායකතුමා එදා දුන් පොරොන්දුව අනුව වැඩ කරන්න අපි ලැහැස්තියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

සභානායකතුමා පැමිණ සිටින නිසා කරුණා කර ඇහුම්කන් දෙන්න. පක්ෂ නායකයන් සමග එදා සභානායකතුමා තීරණය කර ගත්තේ 28 වන දින රැස් වීමටයි. එදා ඒකමතික තීරණයක් ගත්ත. එදා අපට කිව්වෙ නැහැ ඊට කලින් රැස් වෙන්න සිදු වේවිය කියා. නමුත් අද එය වෙනස් කර තිබෙනව. එසේ වෙනස් කළා නම් ආණ්ඩුවට යුතුකමක් තිබුණා අඩුම ගණනේ ඒ බව පක්ෂ නායකයන්ට දැනුම් දෙන්න. අපි සහයෝගයෙන් සහ ඉවසිල්ලෙන් වැඩ කළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. අපි කොයි තරම් දුරට සහයෝගයෙන් කටයුතු කළාද කිව්වොත්, පරිපූරක ඇස්තමේන්තු ආදී යෝජනා විශාල සංඛ්‍යාවක් කිසිම සාකච්ඡාවක් නැතිව සමහර දිනවල අටෙන් පසුව අපි සම්මත කළා. අපට කිව්ව නම් 22 වෙනිදා රැස් වෙන්න ඕනෑය කියා, අපි ඒවා සම්මත කරන්න ඉඩ දෙන්නෙ නැහැ. ඒ මොකද 22 වෙනිදා සිට රැස් වෙනවා නම් අපට ඒ සඳහා කල් තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මෙම යෝජනාවට අදාළ යෝජනාවෙන් කියන්නෙ කාරක සභාවක් පත් කිරීම ගැනයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
අපි කථානායකතුමනි, ඉතාමත් සහයෝගයෙනුයි වැඩ කරන්නෙ. සහයෝගය සඳහා දෙපැත්තක් තිබෙන්න ඕනෑ. සහයෝගයයි කියන්නෙ එක පැත්තකින් කරන වැඩකට නොවෙයි. ඒ ගැන මී ළඟට තිබෙන තුන්වෙනි යෝජනාව පැමිණි විට කරුණු කියනවා. දැන් මේ යෝජනාව ගැන මොකද සභානායකතුමා කියන්නෙ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එදා සියලුම පක්ෂ නායකයන් කැඳවා තීරණයක් ගත්තා, ඔබතුමා ඉදිරිපිට, නැවත රැස්වීම 28 වෙනි දිනට යොදා ගත යුතුය කියා. [බාධා කිරීම්] මම මේ තුන්වෙනි යෝජනාව ගැනයි කථා කරන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)
මේ දෙවැනි යෝජනාව පිළිබඳ තීරණයක් ගත්තට පස්සෙ අනික් යෝජනාව ගැන කථා කරන්න පුළුවනි.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**
*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)
The Motion on Excess Votes is a formal one, unlike a Motion on Supplementary Estimates. In fact this was brought to my notice by the Hon. Acting Minister of Finance only last evening. It has to come up before a Committee, and the Committee has to be appointed before it is discussed on the 28th. This is a formal Motion in order to enable the House to form a Committee to discuss Excess Votes.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
ඉතින් 3 වැනි යෝජනාව වෙනස් කරන්නෙ නැත්නම් 2 වැනි යෝජනාව අද සම්මත කරන්න වුවමනාවක් නැහැ. 2 වැනි යෝජනාවෙන් බලාපොරොත්තු වන දේ 22 වැනිදා කරන්න පුළුවනි. ඒ නිසා ඇයි අද ගන්නෙ? මන්ත්‍රී මණ්ඩලය කාරක සභාවකට පරිවර්තනය වීම සඳහා තිබෙන යෝජනාව අද ගෙන එන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
The House has to assemble at least a day earlier than the date of discussion in order to go into Committee, and then the report of the Committee has to come before the House. In fact, I discussed this with the Hon. Acting Minister of Finance when it was brought to my notice late in the evening that this has not gone before the Cabinet as yet and that that formality has to be gone through.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)
කැබිනට් මණ්ඩලය ඉදිරියට ගියෙත් නැත්නම් ඇයි අද ගන්නෙ? 22 වැනිදාට පාර්ලිමේන්තුව රැස් වෙනවාම නම් මේ යෝජනාව එදාට ගන්න පුළුවනි. එදාට ඉදිරිපත් කරන්න පුළුවනි. 23 වැනිදාට ගන්නත් පුළුවනි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
That is why the House has to assemble on the 22nd. The House has to form a Committee to discuss the Excess Votes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් 28, 29, 30 යන ඕනෑම දවසක පුළුවනි. ඇයි අපි බබ්බු කියල හිතනවද ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

සියලුම පක්ෂවල නායකයින් කැඳවලා සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවෙදි මේ මාසේ 28 වැනිදා පාර්ලිමේන්තුව නැවත රැස් වීමට තීරණය කර ගත්තා. දැන් මේ යෝජනාවෙන් කරන්න යන්නෙ ඒ තීරණය වෙනස් කිරීමයි. මේ යෝජනාව උඩ පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී ගත් තීරණය වෙනස් වෙනව. මා විශේෂයෙන්ම මේ ගැන සඳහන් කරන්නෙ පසු ගිය දින කීපයෙදි කරුණු 87ක් සම්බන්ධයෙන්ම වැඩි විවාදයක් නොකර යෝජනා සම්මත කර ගන්න පුළුවන් වුණේ පක්ෂ නායකයින්ගෙ රැස්වීමේදී ගත් තීරණ උඩ වැඩ කරගෙන යාම පිණිස සහයෝගය දුන් නිසයි. එදා පැහැදිලි තීරණයක් ගත්තා. ඊළඟට පාර්ලිමේන්තු රැස්වීම කැඳවිය යුතු දිනය ගැන. නැවත කැඳවන්නෙ 28 වැනිදාය කියලයි තීරණය කර ගත්තෙ. ඉතින් දැන් එය වෙනස් කර 22 වැනිදට පවත්වන්න යන්නෙ මොකටද ? ඒ ගැන පැහැදිලි කරන්නෙ නැද්ද ? ඒ නිසා තමයි මේ වැඩ පිළිවෙළට අපි මේ අවස්ථාවේ විරුද්ධ වෙන්නෙ. 28 වැනිදටයි නැවත රැස්වෙන්න තීරණය කර ගත්තෙ. 3 වැනි යෝජනාවෙන් දැන් කියනව 22 වැනිදට රැස් වෙන්න ඕනැය කියල. ඒක න්‍යාය පත්‍රයේ තියෙනව. මේ විධියට කටයුතු කරන්න යනව නම් අපේ සහයෝගය දෙන්න බැහැ. මේ ආණ්ඩුව පොරොන්දු කඩනවා විටින් විට.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

සභානායකතුමා මේ ගැන මොකද කියන්නෙ ? සභාවේ අදහස විමසන්නද මේ සම්බන්ධයෙන් ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I do not mind dropping this Motion, but I will restrict myself to the next Motion.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම
### சபை அமர்வு
### Sitting of the House

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Tuesday, 22nd September, 1964."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க—காலி)*
(Dr. W. Dahanayake—Galle)

Why has the Hon. Leader of the House changed the date of the next Sitting from the 28th to the 22nd ? We are anxious to know the reason ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, සැප්තැම්බර් 22 වැනිදා රැස්වෙන්න වුවමනා බවයි දැන් කියන්නෙ. මීට මාසයකට පමණ පෙර පක්ෂ නායකයින්ගෙ රැස්වීමේදී ඒ අදහස ඉදිරිපත් කළේ නැහැ. එදා තීරණය කර ගත්තෙ නැවත රැස්වීම 28 වැනිදට විය යුතුය කියලයි. 22 වැනිදට රැස් වෙන්න වුවමනාවක් තිබුණා නම් එදා ඒ බව කියන්න තිබුණා. එහෙම කිව්වා නම් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එහෙත් එදා ප්‍රකාශ කළේ සැප්තැම්බර් 28 සහ 29 යන දවස්වල රැස් වුණාම හොඳටම ඇත කිය ලයි. එදා ඒක පැහැදිලි වශයෙන්, කිසිම මත භේදයක් නැතිව ඉදිරිපත් කළා. ඒක අපි පිළිගත්තා. කිසිම විරුද්ධත්වයක් නොපෙන්වා 28 සහ 29 යන දවස්වල රැස්වීමට තීරණය කළා. ඒ අනුව වැය ශීර්ෂ කීපයක් සම්මත කර ගත්ත. මේ ආණ්ඩුවේ අගමැතිනිය කෙරෙහි නම් අපේ කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]
විශ්වාසයක් නැහැ. රදළකමේ සිටින අග මැතිනිය මිනිසුන් කෙරෙහි කිසි අනුකම්පාවක් නැතිව රදළ දරදඬුකම උඩ වැඩ කර ගෙන යන බව අපි හොඳටම දන්නව. මේ සභානායකතුමාගෙ වචනවලට යම් සැලකිල්ලක් දක්වන්න පුළුවන් වේය කියා අපි සිතුව. අපට මෙයින් කළේ ගැට කැපීමක්. මේක දේශපාලන ගැට කැපීමක්. මේක—

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகனுயக்க)
(Dr. W. Dahanayake)
පොම්මෙ ගැහිල්ලක්.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
දේශපාලන පොම්මෙ ගැහිල්ලක්. ඇයි අපව රැවටුවෙ? අපේ වචන විශ්වාස කරන්න. ආණ්ඩු පක්ෂයෙ සංවිධායකතුමාත් සභානායකතුමාත් ආණ්ඩුව වෙනුවෙන් දුන් වචන විශ්වාස කරලයි, මේ කාරක සභා අවස්ථාවෙ වැඩ කටයුතු ඉතා මත්ම පහසු පිළිවෙළට කර ගෙන යන්න අපි සූදානම් වුණේ. රාත්‍රී 8න් පසුව අතිරේක වැය ශීර්ෂ සම්මත කර ගන්න පමණයි අපි එදා තීරණය කළේ. නමුත් අපි මෙතන නැති අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන රාත්‍රී 8න් පසු සමහර රෙගුලාසි පවා සම්මත කරගෙන තිබෙනව. එදා සාකච්ඡාවට සහභාගි වුණු ඇතැම් පක්ෂ නායකයන්ට යම් යම් හේතුන් නිසා රාත්‍රී 8න් පසුව ඉන්න බැරි වුණා. ඒ අය නැති අතරේ, සාකච්ඡා කළ යුතුව තිබෙන රෙගුලාසි පවා සම්මත කරගෙන තිබෙනව. සභානායකතුමා අපේ ඔළු අත ගාල අපි ඔක්කොම රවටල හෙමින් සැරේ හොඳ ටොක්කක් ඇනල තියෙනව. මේ විධියට නම් අපට මීට පස්සෙ ආණ්ඩුවෙ වචන විශ්වාස කරන්න බැහැ. පක්ෂ නායකයන්ගෙ රැස්වීම්වලට ඇවිත් කියනව—

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
අපට බැහැ. මේ ආණ්ඩුවෙ වචන විශ්වාස කරන්න.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
මේක කරන්න අදහසක් තිබුණ නම්— [බාධා කිරීමක්] ආණ්ඩුවට හදිසි වැඩ කට යුතු යෙදෙන්න පුළුවනි. ඒ අනුව තීරණ වෙනස් කරන්නත් සිදු වෙන්න පුළුවනි. නමුත් අඩු ගණනෙ අපිට මේ ගැන ඊයෙවත් දැනුම් දෙන්න තිබුණ නේද? අපට කිසිම දැනුම් දීමක් කළේ නැහැ. එදා ගත් තීරණය මේ විධියට වෙනස් කළාය කියා අපි දන්නෙ අද මෙම යෝජනාව ඉදිරිපත් කළාට පසුවයි. ඉතින් අපි මින් පසුව සහයෝගයෙන් වැඩ කරන්නෙ කොහොමද? එදා තීරණය අද ක්‍රියාවට නොදමා ආණ්ඩුවෙ වැඩි ඡන්දයෙන් මෙම යෝජනාව සම්මත කර ගත්තොත් අපට මින් පසුව සහයෝගයෙන් වැඩ කරන්න බැහැ. අද අපි ආණ්ඩුවටත් සභානායකතුමාටත් අවවාදයක් වශයෙන් කියනව, අපේ සහයෝගය නැතිව තමුන්නාන්සෙලට වැඩ කටයුතු කරන්න අමාරු බව මතක තබා ගන්නය කියා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
I agree that the hon. Member has a grievance. He is right in what he says, and I am very sorry I could not inform hon. Members of it last evening. In fact, the Hon. Acting Minister of Finance brought this to my notice last evening after about 5 o'clock or even later.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)
We will give you one extra day ; we will give you the 27th.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
The Hon. Acting Minister and the Clerk of the House saw me yesterday evening when I was coming after attending a Cabinet meeting on unemployment. That is why I withdrew the earlier Motion. I am sorry I did not tell him. I plead guilty to that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩඩ්ලි සේනානායක මයා. (දැදිගම)**
*(திரு. டட்லி சேனநாயக்க—டெடிகம)*
(Mr. Dudley Senanayake—Dedigama)

Then is it only for the Excess Votes that we are sitting on the 22nd ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මුදල් ඇමතිතුමාගෙ වැය සම්මතවල අතිරික්තය සම්මත කර ගැනීම සඳහා කාරක සභාවට පරිවර්තනය විය යුතු බවයි, නිදහසට කරුණක් හැටියට තියෙන්නෙ. 28 වන දා යෝජනාව ගෙනාවොත් 29 වන දා කාරක සභාවට යන්න පුළුවනි. එම කාර්‍යය සඳහා පැය එක හමාරක්වත් ගත වේය කියා මා සිතන්නෙ නැහැ. මොකක්ද මේ කරන්නෙ ? සභානායකතුමාගෙ පිළිතුරෙන් පෙනෙනව, හේතුව ඒක නොවන බව. හේතුව මේකයි. මෙතන පාර්ලිමේන්තුව තිබුනත් අගමැතිනිය මෙතන නැහැ. ඒකයි වැරද්ද. අගමැතිනිය අරලිය ගහ වලව්වෙ ඉඳගෙන ලනු අදිනව. මෙතන සිදු වන දෙයක් අගමැතිනිය දන්නෙ නැහැ. මේ ලනු ඇදිල්ලට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I do not mind the hon. Member criticizing or attacking me but I do not want him to attack somebody who has nothing to do with this matter. I admitted that I made a mistake. I would respectfully ask the hon. Member not to attack anybody who is not concerned in the matter.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

He was not attacking somebody else. You misled him first.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I take the responsibility. I am prepared to accept the blame.

**එම්. බාලසුන්දරම් මයා.—(කෝපායි)**
*(திரு. எம். பாலசுந்தரம்—கோப்பாய்)*
(Mr. M. Balasunderam—Kopai)

As far as the hon. Member for Welimada is concerned it is not a personal matter. There was a definite agreement in regard to the date. There is no reason why it should now be altered to the 22nd. Are you treating the leaders of the Opposition parties with scant courtesy without any sense of responsibility ? When you have agreed upon a particular date for debate why should you not stick to that date ? This was not a matter of personal grievance as far as the hon. Member for Welimada was concerned. He was only voicing the sentiments of the entire Opposition.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I did not say that this was his personal grievance. I asked him to criticize or attack me but not somebody who was not concerned in this matter.

**බාලසුන්දරම් මයා.**
*(திரு. பாலசுந்தரம்)*
(Mr. Balasunderam)

May we know why you altered the date to the 22nd ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I stated the reason. I said the Hon. Acting Minister of Finance mentioned this to me only last evening—

**ඩඩ්ලි සේනානායක මයා.**
*(திரு. டட்லி சேனநாயக்க)*
(Mr. Dudley Senanayake)

What is the reason ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

He wanted the Excess Votes to be taken up in Committee. Last year, too, we were stuck with the Excess Votes.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

That may be so, but why this hurry ? You can bring this matter up on the 28th.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

You can bring it on the 28th and you can pass it on the 29th.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

The Hon. Leader of the House must know that when you fix dates we have to adjust our work outside and come here specially. You cannot change dates according to your whims and fancies, or because the acting Minister of Finance thought otherwise later. You are treating the entire Opposition with scant courtesy, particularly the Leaders. I request that the date should be altered to the 28th of September.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்ளி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

As the hon. Member earlier stated we agreed on a particular date, and unless there is some very strong reason to alter that date I do not think the Hon. Leader of the House should suddenly spring upon us this meeting on the 22nd September. As a matter of fact, the question of Excess Votes can be disposed of on the 28th. There is no difficulty whatsoever. [*Interruption*], September 28th is a Monday. The date we agreed upon was the 29th. What is the difficulty about this ?



A number of hon. Members of this House are going on a delegation too. When they decided to go on this delegation it was agreed that the House would not meet till the end of the month when we adjourn today. That is the position.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am sorry that all this time was taken up——

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

It has to be the 29th September. Otherwise, we will have to move a Motion to fix the debate for the 28th because it is a Monday.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்ளி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

All right. Let it be the 29th September.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Will you kindly accept Motion No. 2 then ? I will move Motion No. 2.

කේ. එම්. පී. රාජරත්න මයා.
(திரு. கே. எம். பீ. ராஜரத்ன)
(Mr. K. M. P. Rajaratna)

We will accept Motion No. 2. It is agreed then that we meet on the 29th. We are agreeable to that.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We will move Motion No. 2. We will take Motion No. 3 with the date altered to 29th instead of the 22nd.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்ளி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

There is just one point I want to bring to the notice of the Hon. Leader. When we do meet it is very necessary

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

to give priority to a particular Motion that a number of Members of the Opposition have given notice of in connection with the Minister of Finance, and in his interest as well as in the interests of the House I think the Government should consider giving priority to that Motion. I want to bring that to the notice of the Hon. Leader of the House.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

May I suggest that we meet on the 28th of September, 1964, and that the hours of sitting be as on a Tuesday? Accept Motion No. 2 and in Motion No. 3 substitute the words, "2 p.m. on Monday, 28th September, 1964", for the words, "2 p.m. on Tuesday, 22nd September, 1964"; the hours of sitting would be as on a Tuesday. We start at 2 o'clock.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

And bear in mind what I have said.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Yes. I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Monday, 28th September, 1964, and that the hours of Sitting that day shall be as though it were a Tuesday."

ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

## BUSINESS OF THE HOUSE

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"That notwithstanding the provisions of Standing Order No. 24. the motion appearing as item 2 on the Paper be proceeded with this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

## විසර්ජන කෙටුම්පත් පණත 1964-65

## ஒதுக்கீட்டு மசோதா, 1964-65

## APPROPRIATION BILL 1964-65

කාරක සභාවේදී සලකා බලන ලදී.—[ප්‍රගතිය, සැප්තැම්බර් 3.]

100 වන ශීර්ෂය.—පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 5,02,667

1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා හා වැටුප්, රු. 3,02,142

*தலைப்பு 100.—உள்ளூராட்சி, உள்விவகார அமைச்சர்*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும் ரூ. 5,02,667*

*உப தலைப்பு 1.—பணியாளர் தொகையும் சம்பளமும், 3,02,142*

HEAD 100.—MINISTER OF LOCAL GOVERNMENT AND HOME AFFAIRS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 502,667*

*Sub-head 1.—Cadre and salaries, Rs. 302,142*

ඉදිරිපත් කරන ලද සංශෝධනය—[සැප්තැම්බර් 3.]

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'." —[කේ. එම්. පී. රාජරත්න මයා.]

පූ. භා. 10.38

සභා පතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

නියෝජ්‍ය කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා (ඩී. ඒ. රාජපක්ෂ මයා.) මූලාසනාරූඪ විය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, මම මුලින්ම පළාත් ආණ්ඩු සභා සම්බන්ධව අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්න කැමතියි. පළාත් ආණ්ඩු සභා 500 කට වැඩි ගණනක් මේ රටේ තියෙනව. ඒ සියලුම පළාත් ආණ්ඩු සභාවලට වැඩ කිරීමට විශාල බාධා තිබෙනව. ඒ බාධාවලින් ඉතාමත්ම නපුරු බාධාව තමයි, මුදල් නැතිකම. සියලුම පළාත් ආණ්ඩු සභාවලට අසනීපයක් තියෙනව. ඒ අසනීපය නම් මන්ද පෝෂණයයි. වැඩ කර ගැනීමට මුදල් ඇත්තෙ නැහැ. මේ කාරණාව මම හැම අවුරුද්දෙම කියනව. පළාත් ආණ්ඩු සභා වල වැඩ කර ගන්න මුදල් නැත කියා මම අවුරුදු 20 ක් තිස්සෙ කියනව. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රතිකර්මයක් යොදා නැහැ. මේ ප්‍රශ්නය විසඳීම පිණිස කුමක් කළ යුතුද කියා සොයා බැලීමට 1953 දී කොමිෂන් සභාවක් පත් කළා. ඒ තමයි, චොක්සි කොමිෂන් සභාව. 1955 දී චොක්සි කොමිෂන් සභාවෙ වාර්තාව ඉදිරිපත් කළා. නමුත් දැන් අවුරුදු 9 ක් තිස්සෙ ඒ කොමිෂන් සභාවේ අදහස් ක්‍රියාවෙ යොදවන්නෙ නැතිව ඒ වාර්තාව මුල්ලකට දමා තිබෙනව. එම නිසා, වැඩි පුර මුදල් ලබා ගැනීම සඳහා චොක්සි කොමිෂන් සභා වාර්තාවෙන් පෙන්වා තිබෙන කරුණු ක්‍රියාවේ යොදවන්නෙ නැත්තෙ මක්නිසාද කියා අපි අහන්න කැමතියි.

පළාත්පාලන කොමසාරිස්වරයා විසින් 1962 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන වාර්තාවෙන් මේ සම්බන්ධව, කොටසක් මම තමුන්නාන්සෙලාට කියවන්න කැමතියි. 1960-61 වර්ෂය සඳහා වූ පළාත් පාලන කොමසාරිස්වරයාගේ පාලන වාර්තාවේ 11 වන පිටුවේ මේ විදියට තිබෙනවා :

"මුදල් : පළාත් පාලන ආයතනයන්ගේ වගකීම් වැඩිවීමත්, පොදු පාලන ක්ෂෙත්‍රයෙහිලා ඒවායේ විෂය ප්‍රමාණය පුළුල් වීමත් සමගම ස්වකීය සීමිත ආදායම් මාර්ග පොදු මහජන සේවාවන්, සතුටුදායක අන්දමින් නඩත්තු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බැව් නගර සභා බහුල සංඛ්‍යාවකට පෙනී ගොස් තිබේ. වඩා කාර්යක්ෂම වූත්, විපුල ඵලදායි වූත්, සමාජ සේවයක් සැලසීම පිණිස පළාත් පාලන ආයතනයන්ට සහාය වීමේලා මහා ආණ්ඩුවත් පළාත් පාලන ආයතනයනුත් අතර පවත්නා මුදල් සම්බන්ධතා පිළිබඳ ඉක්මනින් තීරණයකට එළඹීම බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය."

කොමසාරිස්වරයා කියනවා, මුදල් පිළිබඳ ප්‍රශ්නය පුළුවන් තරම් ඉක්මනින් විසඳන්නය කියා. කොමසාරිස්වරයාගේ වාර්තාවේ තවත් කොටසක් මම කියවන්නම්. 5 වන පිටුව.

"දේපල බදු ප්‍රමාණයන් පිළිබඳ වර්ගානුකූල ක්‍රමයක් සම්මත කරගැනීමට හා පළාත් පාලන ආයතනය ඒ සඳහා නියමිත බල මණ්ඩලය වන විවිධ ආඥාපණත් යටතේ අය කරගනු ලබන දඩ මුදල් පරිහරණය කරගැනීමටද පළාත් පාලන ආයතනයන්ට හැකි වනු පිණිස නීති රීති සම්පාදනය කිරීමට ක්‍රියා කරගෙන යනු ලබන අතර, දැනට මූල්‍ය නිර්දේශයන් කෙරෙහිද ආණ්ඩුවේ සැලකිල්ල යොමු වී තිබේ."

හැම අවුරුද්දේම සැලකිල්ල යොමු වී තිබෙනවා. ඒකයි, කියන්නේ. ඊට පසුව කියනවා :

"දැනට පළාත් පාලන ආයතන සඳහා විවෘතව ඇති ආදායම් මාර්ගයනුත්, එම ආයතනවලට ආණ්ඩුවෙන් දෙනු ලබන ආධාර මුදලුත්, සැලකිය යුතු පරිද්දෙන් වැඩි කරනු නොලැබ ස්වකීය කාර්‍ය්‍ය කටයුතු සතුටුදායක අන්දමින් හෝ කාර්යක්ෂම ලෙසින් ඉටු කිරීම දුෂ්කරව ඇති නිසා, නිරාකරණය කළ යුතුව තිබෙන මූල්‍ය යෝජනා සම්බන්ධයෙන් වහාම තීරණයකට එළඹිය යුතුයයි පළාත් පාලන ආයතන ඉතා ඕනෑකමකින් ඉල්ලා සිටිති."

කොමසාරිස්වරයාම කියනවා, පළාත් පාලන ආයතන ඉතා ඕනෑකමකින් සෑම අවුරුද්දකම ඉල්ලන මේ මුදල් ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුය කියා. නමුත් තවමත් කිසිම තීරණයක් ගෙන නැහැ. පළාත් පාලන ආයතන 500 කටත් වඩා අද ඉතා දුර්වල තත්ත්වයකයි, තිබෙන්නේ. ඒ දුර්වල තත්ත්වය මගහැර වීම පිණිස උප ඇමතිවරිය ඉතා උනන්දුවෙන් ක්‍රියා කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

පූ. භා. 10.45

චොක්සි වාර්තාවේ සඳහන් කරුණු දෙකක් ගැන පමණක් මතක් කිරීමට මම කැමතියි. එක් කාරණයක් මෙයයි : පළාත් පාලන ආයතන සීමාවන් තුළ පිහිටි පෙට්‍රල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙළෙඳ ස්ථානවලින් විකුණනු ලබන සෑම පෙට්‍රල් ගැලුමක් සඳහාම ශත දෙක හමාරක් පළාත් පාලන ආයතනයට දිය යුතුයයි නිර්දේශ කර තිබෙනවා. ඒ යෝජනාව පිළිගෙන නැත්තේ මන්දැයි මා අහනවා. තමන්ට අයත් පාරවල් ටික නිසි පිළිවෙළට සකස් කිරීම පළාත් පාලන ආයතනවලට ලොකු අමාරුවක් වී තිබෙනවා. පී. ඩබ්ලිව්. ඩී. පාරවලුත් ඉතාම නරකයි. නමුත් පළාත් පාලන ආයතනවලට අයත් පාරවල මිනිසුන් වැටී තුවාල විය හැකි ලොකු වළවල්ද තිබෙන බව අප කල්පනා කරන්නට ඕනෑ. මෝටර් රථයක නැගී පී. ඩබ්ලිව්. ඩී. පාරක් දිගේ ඇස් පියාගෙන ගමන් කරනවා නම් නගර සභාවක නැත්නම් පළාත් ආණ්ඩු සභාවක පාරක් හමු වන්නේ කොතැනකදී දැයි දැන ගන්නට පුළුවනි. නගර සභාවක හෝ පළාත් ආණ්ඩු සභවක පාරකට මෝටර් රථය පැමිණි හැටියේම බඩවැල් පිටට විසි වන තරමට ගැස්සෙන්නට පටන් ගන්නවා. ඒ පාරවල් නියම පිළිවෙළට සකස් කර ගන්නට පළාත් පාලන ආයතනවලට මුදල් නැහැ. පළාත් පාලන ආයතනවලට අයත් පාරවල් පාවිච්චි කිරීම බොහෝ සෙයින් වැඩි වී තිබෙනවා. ලොරි සහ බස් වැනි ලොකු වාහන ගමන් කිරීම නිසා ඒ පාරවල් කැඩී බිඳී යනවා. අන්න ඒ නිසයි, ඒ පාරවල් සාදා ගැනීමට උදව් වීම පිණිස පැට්‍රල් වෙළෙඳාම් කරන ස්ථානවලින් යම්කිසි මුදලක් පළාත් පාලන ආයතනවලට දිය යුතුයයි අප කියන්නේ. වෙන රටවල නම් ඒක පිළිගෙන තිබෙනවා. පළාත් පාලන ආයතනවලට මුදල් ලැබෙන මාර්ගයක් හැටියට එය පිළිගෙන තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව ඒ වැඩ පිළිවෙළ පැහැර හැරීම කණගාටුවට කාරණයක්. පැට්‍රල් ගැලුමකින් ශත දෙක හමාරක් නොව ශත පහක් පැට්‍රල් විකුණන ස්ථානය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට දෙන ලෙස අප ඉල්ලා සිටිනවා.

චොක්සි කොමිෂන් වාර්තාවෙහි තවත් කරුණක් පෙන්වා තිබෙනවා. මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමෙන් ලැබෙන මුදල්ද පළාත් පාලන ආයතනවලට දීම ඒ කාරණයයි. දැනට ඒ මුදල් එකතු කරන්නේ මහ ආණ්ඩුවයි. එසේ එකතු කර පළාත් පාලන ආයතනවලට ඒ මුදල් දෙනවා. නමුත් ඒ මුදල් පළාත් පාලන ආයතනවලට දෙන්නේ අවුරුද්ද අන්තිමේදියි. අවුරුද්ද මුලදීම මේ මුදල් ඒ ආයතනවලට දෙන ක්‍රමයක් තිබෙනවා නම්, එසේ නැත්නම් ගාස්තු අය කරන විටම ඒවා ඒ ආයතනවලට දෙන ක්‍රමයක් තිබෙනවා නම්, ලොකු ප්‍රයෝජනයක් සිදු වෙනවා. මාස 12ට පසු ඒ මුදල් දීමෙන් පළාත් පාලන ආයතනවලට ලොකු අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා. මගේ කල්පනාව නම් රථ වාහන ලියාපදිංචි කිරීමෙන් ලැබෙන මුදල් මහ ආණ්ඩුව විසින් එකතු නොකළයුතු බවයි. එහෙම නම් කෙළින්ම ඒ ගාස්තු පළාත් පාලන ආයතනවලටම අය කර ගන්නට පුළුවනි. 1951 දී ලංකාවේ තිබුණු මෝටර් රථ සංඛ්‍යාව අනුවයි, ඊට පසුව බොහෝ කාලයක් යන තුරුම පළාත් පාලන ආයතනවලට මුදල් ගෙව්වේ. නමුත් 1958 දී ඒ 1951 දී තිබුණු මෝටර් රථ සංඛ්‍යාවෙන් ලැබෙන ආදායමට තවත් සියයට 12 ක් එකතු කළා. මෝටර් රථ වාහන ලියා පදිංචි කිරීමේ ගාස්තු හැටියට දැන් පළාත් ආණ්ඩු සභාවලට මුදල් ලැබෙන්නෙ, 1951 තිබුණු මෝටර් රථ සංඛ්‍යාව අනුව ගණන් බලා සියයට 12 ක් වැඩි කරලයි. මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වැරදියි. අද දවසේ තිබෙන මෝටර් රථ සංඛ්‍යාව අනුවම මුදල් දෙන ලෙස අප ඉල්ලා සිටිනව. එය කිසිම අමාරුවක් නැති වැඩක්. දැන් තිබෙන ක්‍රමය අනුව, අයුතු අන්දමට අසාධාරණ පිළිවෙළට පළාත් ආණ්ඩු සභාවට අයිති මුදල් මහ ආණ්ඩුව විසින් හොරකම් කර තිබෙනව. ඇත්ත වශයෙන් මේක හොරකමක්ය කියන්න පුළුවනි. නැති මිනිහාගෙන් මහ ආණ්ඩුව ගන්නව. මන්ද? පළාත් ආණ්ඩු සභාවලට ලැබෙන මුදල් මදි. එවැනි ආයතනවලින් හරියට ගණන් බලන්නෙ නැතුව අයුතු පිළිවෙළට මුදල් හොරකම් කර ගන්නෙ මොන කාරණයක් නිසාද කියා අහන්නට කැමතියි. මේ අන්දමට පළාත් ආණ්ඩු සභාවලට සලකන්නෙ මන්ද? සත්තකින්ම මහා ආණ්ඩුව පළාත් ආණ්ඩුවලට දක්වන්නෙ කුඩම්මාගෙ සැලකිල්ලක් බවට ඕනෑ තරම් කාරණා තිබෙනව. මෙයට හොඳම සාක්ෂි වශයෙන් මෑතකදී ඇති කළ රෙගුලාසි වගයක් පෙන්වන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

තමුන්නාන්සෙ දන්නව, පළාත් ආණ්ඩු සභාවල සේවකයන්ගේ ජීවනාධාර මුදල් මහ ආණ්ඩුවෙන් ගෙවන්න නීතියක් තිබෙනව. එස්. එල්. ඒ. සහ සී. එල්. ඒ. කියන විශෙෂ ජීවනාධාර සහ ජීවන වියදම් ආධාර මුදල් මහ ආණ්ඩුවෙන් ගෙවනව. මේ ළඟදි කොමසාරිස්වරයා චක්‍ර ලේඛන වගයක් නිකුත් කර තිබෙනවා, පළාත් ආණ්ඩු සභාවලට දෙන ආධාර මුදල් අඩු කිරීමට සහ සීමා කිරීමට. කොපමණ වැඩ තිබුණත් සේවක සංඛ්‍යාව සීමා කර තිබෙනව. එක්තරා සීමාවකට ඇතුළත් සේවකයන්ට පමණයි, ඔය ජීවනාධාර මුදල් මහ ආණ්ඩුවෙන් දෙන්නෙ, කියායි චක්‍ර ලේඛනය නිකුත් කර තිබෙන්නෙ. මෙ හෙම කළේ ඇයි? මහ ආණ්ඩුවෙන් දෙන මුදල් ප්‍රමාණය අඩු කර ගන්නට නොවේද? මහ ආණ්ඩුවට තිබෙන ලෙඩේ පළාත් ආණ්ඩු සභාවල කර උඩ තබන්න නොවෙද එය කළේ? මහ ආණ්ඩුවට තිබෙන වසංගත රෝගය මුදල් නැත කියන එකයි. ඒ වසංගත රෝගය පළාත් ආණ්ඩු සභාවලටත් බෝ කර තිබෙනව. එම නිසා අප ඉල්ලා සිටිනවා, නීතිය අනුව ජීවනාධාර මුදල් දෙන්නය කියා. සීමා කිරීමක් කරන එක වැරදියි. අවශ්‍ය සේවකයන් සිටිනවා නම්, සේවකයන් අවශ්‍යයයි ඔප්පු කර තිබෙනවා නම්, අවශ්‍යයයි කියා පිළිගන්නවා නම්, එබඳු අවශ්‍ය සේවකයන්ට ජීවනාධාර මුදල් පළාත් ආණ්ඩු සභාවලට මහා ආණ්ඩුව විසින් දීම සීමා කර තිබෙන්නෙ මන්ද කියා ප්‍රශ්න කරන්නට කැමතියි. මෙම චක්‍ර ලේඛන කාටවත් දන්වන්නෙ නැතුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් නොදැනුවත්ව හැංගි හොරා යන චක්‍ර ලේඛනයි. සමහර විට මෙම චක්‍ර ලේඛන නිලධාරීන් සකස් කර ඇමතිතුමාගෙන් අත්සන් ලබා ගන්නවා ඇති. බොහොම වැඩ තිබෙන වෙලාවක ඉදිරිපත් කඩදාසි ඉදිරිපත් කළාම ඒවායේ තිබෙන සන්දේශය කියවන්නෙ නැතුව, ඔහේ අත්සන් කරනවා ඇති. කෙසේ වුවත් මම කියනවා, අලුතෙන් නිකුත් කර තිබෙන මෙම චක්‍ර ලේඛන වැරදි චක්‍ර ලේඛනය කියා, නීතිවිරෝධි චක්‍ර ලේඛනය කියා. මන්ද, නීතියක් තිබෙනවා, සියලුම අවශ්‍ය සේවකයන්ට ජීවනාධාර මුදල් දිය යුතුය කියා. එහෙම නම් සීමා කරන්නෙ කොහොමද? එසේ සීමා කිරීම සඳහා නිකුත් කරන චක්‍ර ලේඛන නීතිවිරෝධයි. එම නිසා ඒක විගස ඉවත් කර ගන්නා ලෙස මතක් කරනව.

තවත් අලුත් චක්‍ර ලේඛනයක් යවා තිබෙනවා, දුම්රිය දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි පළාත් ආණ්ඩු සභා සීමාව තුළ තිබෙනවා නම්, නීතිය අනුව ඒවාට වරිපනම් ගෙවන්න ඕනෑ. දුම්රිය දෙපාර්තමේන්තුවෙන් පළාත් ආණ්ඩු සභාවට වරිපණම් ගෙවීම තහනම් කරමින් අලුත් චක්‍ර ලේඛනයක් යවා තිබෙනව. මොකද මෙ වැනි නීති විරෝධි චක්‍ර ලේඛන යවන්නෙ? යම් දුම්රිය ස්ථානයක් පළාත් ආණ්ඩු සභා සීමාවක් ඇතුළත තිබෙනව නම් ඒකට නියම විධියට වරිපණම් ගෙවන්ට ඕනෑ. ඇයි, දුම්රිය දෙපාර්තමේන්තුව ඒකෙන් නිදහස් කරන්නෙ? දුම්රිය දෙපාර්තමේන්තුවට විශේෂ නිදහසක් දෙන්නෙ ඇයි? ලංගමට එහෙම නිදහසක් දෙන්නෙ නැහැ. වෙනත් ආණ්ඩුවේ ගොඩනැගිලිවලට දෙන්නෙ නැහැ. ඇයි එහෙම නම් දුම්රිය දෙපාර්තමේන්තුවට මෙවැනි නිදහසක් දෙන්නෙ? ඇයි මේ විධියේ චක්‍ර ලේඛන යවන්නෙ කියා මා අහන්ට කැමතියි. ඒ නීති විරෝධි චක්‍ර ලේඛන ඉවත් කරන්ට කියා මා ඉල්ලනවා. මා දන් පෙන්වා දුන්න, එවැනි චක්‍ර ලේඛන දෙකක්. එකක් ජීවනාධාර මුදල සම්බන්ධයෙන්; අනික දුම්රිය දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සඳහා වරිපණම් ගෙවීම සම්බන්ධයෙන්. ඒ දෙකම ඉවත් කරන්ටය කියා ඉල්ලනව.

ඊළඟ කාරණය: පළාත් පාලන දෙපාර්තමේන්තුවට හුඟක් වැඩ තිබෙන නිසා අලුත් දෙපාර්තමේන්තුවක් පිහිටුවා ගත්ත, ජල සම්පාදන දෙපාර්තමේන්තුවය කියා. ලොකු නමක් තිබුණට මේ දෙපාර්තමේන්තුවෙන් කෙරෙන වැඩ ප්‍රමාණය හුඟක් අඩුයි. ඒ ඇයි? ජල සම්පාදන ක්‍රම ආණ්ඩුව නියම අන්දමට සකස් කරල නැහැ. ජල සම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාවේ යොදවා තිබෙන අන්දම ගැන කොමසාරිස්තුමාගේ වාර්තාවෙන් කොටසක් මා දන් කියවන්ට කැමතියි. නිදර්ශනයක් වශයෙන් ගාල්ලෙ ජල සම්පාදන යෝජනා ක්‍රමය ගන්නව. කොමසාරිස්තුමාගේ වාර්තාවේ සී.බී. 5 දර දරණ පිටුවේ ඒ පිළිබඳව සඳහන් කර තිබෙන්නේ මෙහෙමයි:

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"ගාල්ලේ මහ නගර සභාව සඳහා සැලැස්ම සම් පාදනය කොට ඇති ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ස්වකීය කොටස පියවා ගැනීමට ණය මුදලක් ලබා ගැනීමට එම සභාවට නොහැකි වී තිබීම නිසා එම යෝජනා ක්‍රමය අවුරුදු 6 කටත් අධික කාලයක් තිස්සේ සිටම ඇණහිට තිබේ."

පූ. භා. 11

කොමසාරිස්වරයා කියනවා, 1961-62 දී, ජල සම්පාදන ක්‍රමය ඇණහිට තිබෙනවය කියා. ගාලු මහ නගර සභාව සඳහා ඇති කළ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සැලැස්ම අනුව 1957 දී විවෘත කිරීමක් තිබුණු බව මට මතකයි. ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා විසින් ඒ අවස්ථාවේදී තැබූ මුල් ගල පමණයි, තවම තිබෙන්නෙ. දැන් අවුරුදු 8 ක් තිස්සේ ඒ සැලැස්ම අනුව වැඩ කරන්ට නොහැකි වී තිබෙනවා. ගාලු මහ නගරයට පිරිසිදු ජල සම්පාදන ක්‍රමයක් අවශ්‍ය බව කවුරුත් පිළිගන්නවා. දක්ෂ ඉන්ජිනේරු වන් විසින් ඉදිරිපත් කර තිබෙන සැලැස්ම අනුව දැන් අවුරුදු 8 ක සිට වැඩ ඉදිරියට ගෙන යන්ට බැරිව තිබෙනවා. එක්තරා නගර සභාවක තිබුණු මේ විධියේම අමාරු කමක් විසඳා තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. මහනුවර නගර සභාව ගැන විශේෂ උනන්දුවක් අරගෙන අගමැතිවරිය එහි ජල ප්‍රශ්නය විසඳුවාය කියා අපට ආරංචියි. ඒ කාරණය ඇත්ත නම් අගමැතිවරිය ඉදිරි පත් වී මහනුවර පිරිසිදු ජල ක්‍රමයක් ඇති කිරීමට වැඩ පිළිවෙළක් යෙදෙව්වා නම්, ඒ විධියේ වැඩ පිළිවෙළක් අනික් සියලු ම නගරවලත් යොදවන්න කියා අපි ඉල්ලා සිටිනවා. මහනුවරට විශේෂයක් මොකද? ගාල්ලටත්, කුරුණෑගලටත්, මාතරටත්, ඒ විධියේ යෝජනා ක්‍රමයක් ඇති කර දෙන්න බැරි ඇයි කියා මා අහනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
එක පාරට බැහැනෙ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)
බැරි නම් බැරිය කියා පැත්තකට වන එකයි තිබෙන්නෙ. ගරු සභාපතිතුමනි, ඒ මහනුවර ජල ක්‍රමය විසඳීම ගැන සතුටු වන අතරම, මහනුවරට දුන් සහන අනුවම ගාල්ලෙත් වැඩ කටයුතු ආරම්භ කරන්නය කියා පළාත් පාලන දෙපාර්ත මේන්තුවෙන් මා ඉල්ලනවා. කරුණා කර ඒ ඉල්ලීම සටහන් කරගෙන, අවුරුදු 8ක් ඇණහිට ඇති සැලැස්ම මතු කර වහාම ගාල්ලේ ජල සම්පාදන ක්‍රමයේ වැඩ කටයුතු ආරම්භ කරන්නය කියා මා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලනවා.

නොයෙකුත් නගරවලට ඉතාමත්ම අවශ්‍ය ව ඇත්තේ පිරිසිදු ජල ක්‍රමයි. ඒ නිසා මේ ජල සම්පාදන දෙපාර්ත මේන්තුවේ වැඩ කටයුතු හැකි තරම් පුළුල් කරන්නය කියා මා ඉල්ලනවා. ණය ගැනීමෙන් ජල සම්පාදන ක්‍රම ඇති කරන්න පුළුවන්. විශාල මුදලක් යොදවා ජල සම්පාදන ක්‍රම ඇති කිරීමට පළාත් ආණ්ඩු සභාවලට මුදල් නැහැ. ඒ නිසා පළාත් ආණ්ඩු සභාවලට ණය දෙන අරමුදලක් තිබෙනවා. අද මේ ආණ්ඩුව විසින් කර තිබෙන්නෙ මොකක්ද? ඒ පළාත් ආණ්ඩු සභාවලට ණය දෙන අර මුදලට—"ලෝකල් ලෝන්ස් ඇන්ඩ් ඩිවලප් මන්ට් fපන්ඩ්" කියන, පළාත් ආණ්ඩු සභා වල සංවර්ධනය අරමුදලට—මහ ආණ්ඩු වෙන් මුදල් දෙනවා මදි. ඒ අරමුදල පුළුවන් තරම් තර කිරීමට මහ ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. මන්ද කියතොත්, 500 ක් පමණ පළාත් ආණ්ඩු සභා නොයෙ කුත් අවශ්‍ය කටයුතුවලට මුදල් ඉල්ලනවා. ඒ අවශ්‍ය කටයුතු නම්, ජල සම්පාදන ක්‍රම, නොයෙකුත් වෙළඳ සැල් පිහිටුවීම, නියම විධියට කානු සෑදීම—ඩ්‍රේනේජ්—ආදී ඒ නගරවල වැඩ කටයුතුයි. ඒවා සඳහා මහ ආණ්ඩුවෙන් ණය මුදල් ඉල්ලනවා. නමුත් මහ ආණ්ඩුවෙන් අර ණය දෙන අරමුදල සීමා කරගෙන එයට මුදල් නොදීම නිසා අද පළාත් ආණ්ඩු සභා 500 ක වැඩ කටයුතු ඇණහිට තිබෙනවා. ඒ නිසා පළාත් ආණ්ඩු සභා සංවර්ධන අර මුදලට සෑහෙන මුදලක් මහ ආණ්ඩුවෙන් දෙන්නය කියා අපි ඉල්ලනවා. පළාත් ආණ්ඩු සභාවලින් කරනු ලබන ඉල්ලීම්වල අවශ්‍යතාව පිළි ගන්නවා නම්, ඒ ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ සතුටුදායක නම්, වහාම ණය දෙන්නය කියා අපි ඉල්ලනවා. එමෙන්ම අද පළාත් ආණ්ඩු සභාවලට දෙන ණය වෙනුවෙන් පොලියක් ගන්නවා. සියයට 4 ක පොලියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ගන්නව. නමුත් ආණ්ඩුව කිසිම පොළියක් නොගෙන පළාත් ආණ්ඩු සභාවලට ණය මුදල් දිය යුතුය කියා මා කියනව. මක් නිසාද, පළාත් ආණ්ඩු සභාවල වැඩ කටයුතු ගෙන යන්නෙ මහා ආණ්ඩුවේ වගකීමක් ඇතිව බව සියලු දෙනාම පිළිගන්නව. මහා ආණ්ඩුවෙන් කරන්ට තිබෙන දේවල් පළාත් ආණ්ඩු සභා මතයි පැවරී තිබෙන්නෙ. ඒ නිසා අර ණයට දෙන අර මුදලින් ආණ්ඩුව විශාල පොළියක් ගන්නවා නම් ඒක ඉතාමත් අසාධාරණ ක්‍රමයක්ය කියා මා කියන්නට සතුටුයි. ඒ වාගේම පළාත් ආණ්ඩු සභා ණය ගන්නෙ වැදගත් අවශ්‍ය වැඩ කටයුතු කරන්නටයි. ඒ වාගේම ස්වල්ප කාලයකට නොවෙයි, පරම්පරා ගණනාවකට ප්‍රයෝජනවත් වන දේවල් කරන්නටයි පළාත් ආණ්ඩු සභා ඒ මුදල් යොදවන්නෙ. පළාත් ආණ්ඩු සභා ලොකු ණයක් ගත්තොත් ඒක අවුරුදු 20 කින් 30 කින් නොවෙයි ගෙවන්නෙ. ඊටත් වඩා ඒ කාලසීමාව වැඩි කරන්නට ඕනෑ. ජල සම්පාදනය වැනි දේවලට ණයක් ගත්තොත් ඒක අවුරුදු 50 කින් ගෙවන ණයක්. ඒ නිසා ණය ආපසු ගෙවීම අවුරුදු 20 කට 30 කට සීමා නොකළ යුතුයි. ඒ කාලසීමාව අවුරුදු 40 ක් 50 ක් නොකළොත් පළාත් ආණ්ඩු සභාවලට වැඩ කටයුතු ගෙන යන්න බැහැ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර කථාව කෙටි කරන්න.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

එම නිසා වැඩට ආශාවක් දක්වන, වැඩ කරන්ට තේරුමක් තිබෙන, පාර්ලිමේන්තු ලේකම් තුමියගෙන් මා ඉල්ලා සිටිනව, පළාත් ආණ්ඩු සභාවලට තිබෙන ඉතාමත්ම වැදගත් ප්‍රශ්නය වන මේ මහා ආණ්ඩුවෙන් දෙන මුදල් ආධාර පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කරන්නය කියා.

පළාත් පාලන සේවා කොමිෂන් සභාව පිළිබදවත් වචන ස්වල්පයක් කියන්ට තිබෙනව. මේ කොමිෂන් සභාවේ එක්තරා වැඩ කොටසක් බොහොම උනන්දුවෙන් කරනව. ඒ වැඩ කොටස තමයි පත්වීම් දීම. පත්වීම් පිළියෙළ කර දීමට නම් මේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ලොකු ආශාවක් දක්වනව; නමුත් අනිකුත් රාජකාරි සියල්ලම පැහැර හරිනව. පළාත් පාලන සේවා කොමිෂන් සභාව ගැන මේ ගරු සභාවේ ඉතාමත්ම තද විවේචන ඇති වී තිබෙනව. විශේෂයෙන්ම අවුරුදු දහයකදී පළාත් පාලන සේවා කොමිෂන් සභාව සම්බන්ධයෙන් මා ඇසූ ඉතාමත්ම තද විවේචනය ඇති වුණේ මේ ගිය අවුරුද්දෙයි. ඒ විවේචනය කළේ දකුණු කොළඹ දෙවන මන්ත්‍රී බර්බර්නාඩ් සොයිසා මහත්මයායි. බර්නාඩ් සොයිසා මහත්මයා කළ විවේචනය ලංකා සමසමාජ පක්ෂය කළ විවේචනයක් හැටියට මා පිළිගන්නව. දැන් ඔබතුමියට ඒ රාජකාරිය පැවරී තිබෙනව. ඒ නිසා බර්නාඩ් සොයිසා මන්ත්‍රීතුමා විවේචනය කළ ප්‍රශ්න ඔබතුමියට විසඳන්න පුළුවන්. පළාත් පාලන සේවා කොමිෂන් සභාව සැලකිල්ලක් දක්වන්නේ පත්වීම් දෙන්න පමණයි. වෙන කිසිම වැඩක් කරන්නෙ නැහැ.

ගාල්ලේ නගර සභාවේ, විදුලිය දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ අතිකාල දීමනා ගෙවීම අත්හිටුවා තිබෙනවාය කියා මා මේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවට දැනුම් දුන්නා. නමුත් උන්නැහෙලා මේ කඩදාසි වීසි කර තිබෙනව. තමන් යටතේ සිටින සේවකයන්ගේ අතිකාල දීමනා ගෙවීමටත් ක්‍රියා නොකරන කට්ටියකුයි මේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවෙ ඉන්නෙ. ඒ අය තමන්ගේ සේවකයන්ගේ සුභ සිද්ධිය ගැන සොයනවද? පළාත් ආණ්ඩු සභා කොමිෂන් සභාව සොයන්නෙ, තමන් යටතේ සිටින සේවකයන්ගේ සුභ සිද්ධියට අදාළ කරුණු ගැන නොව, තමන් කැමති, තමන්ට වාසි තිබෙන තමන්ගෙ විශෙෂ ලැදිකමක් තිබෙන, "ෆේවරිට්ස්" කොට සට අයිති නිලධාරීන්ට උපකාර කිරීම පිළිබඳ කරුණු ගැන පමණය, කියා මම පළාත් ආණ්ඩු සභාවෙ සාමාජිකයන්ට චෝදනා කරනව. කනගාටුවෙන් වුවද මේ අවස්ථාවේදී එක නිලධාරියෙක් ගැන සඳහන් කරන්න සිදුවී තිබෙනව. එනම් දැනට ගාලු නගර සභාවෙ සිටින විදුලි ඉංජිනේරු මහතා ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළාත් ආණ්ඩු සභා කොමිෂන් සභාවෙන් ඒ ඉංජිනේරු මහතා කරන සියලුම වැරදි වසා ගන්නව. විශාල සුදු හුණු බාල්දියක් තබාගෙන ඒ ඉංජිනේරු මහත්මයාගේ වැරදිවලට සුදු හුණු ගානව. කලින් මහනුවර මහ නගර සභාවේ සිටි ඒ විදුලි ඉංජිනේරු මහතාට පැය 24 න් එතැනින් පිට වෙන්න සිදු වුණා. ඒ මොකද? අග අගමැතිවරියට ලැබුණු පැමිණිලි රාශියක් අනුව අගමැතිවරිය පළාත් ආණ්ඩු සභා කොමිෂන් සභාවට දැන්වීමේ ප්‍රතිඵලයක් විශයෙන් පැය 24 න් ඒ ඉංජිනේරු මහතා ගාල්ලට මාරු කළා. ගාල්ල සභාපතිතුමනි, බේරුවල බොක්ක වාගේ ස්ථානයක්. මා එසේ කියන්න ඇයි? බේරුවල බොක්ක සැම තැනම තිබෙන කුණු රොක් වී එකතු වන ස්ථානයක්. ඒ වාගේම වෙනත් පළාත්වලට එපා වුණු නිලධාරීන් ගාල්ලට යවන සිරිතක් අද තිබෙනව. ඒ ඉංජිනේරු මහතා නුවරට නරක නම්, පැය 24 න් එතැනින් පිට කිරීමට කරුණු තිබුණා නම්, පළාත් ආණ්ඩු සභා කොමිෂන් සභාවට තිබුණ එකම යුතුකම ඒ නිලධාරියා විසින් කර ඇති වැරදි පිළිබඳ ලැයිස්තුවක්—චාජ් ෂීට් එකක්—ඉදිරිපත් කර ඒ නිලධාරියාගේ වැඩ තහනම් කර වැරදිකරු නම්, නරක නම්, ඔහු පන්නා දැමීම මිස ගාල්ලට යැවීම නොවෙයි.

හොඳයි දැන් ඔහු ගාල්ලට යැව්ව. ගාල්ලට ගියාට පසු උන්නැහෙ පටන්ගත්ත ගාල්ලෙ මිනිසුන්ගෙන් පළිගන්න. කොහොමද ගාල්ලෙ මිනිසුන්ගෙන් පළිගත්තෙ? අපට ආරංචියි නුවරදී උන්නැහේට විරුද්ධව තිබුණ චෝදනාව කතෝලික ආක්‍රමණය සම්බන්ධ වැඩ කිරීම බව. ඒ නිසා උන්නැහෙ මොකද කෙළේ? ගාල්ලට ගිහින් බෞද්ධයන්ට විරුද්ධකම් කරමින් බෞද්ධයන්ගෙන් පළිගැනීමයි. පළමුවෙනි වතාවට ගරු සභාපතිතුමනි, වෙසක් පෝය දවසේ මුළු ගාලු නගරයම අඳුරේ තැබීමට මේ ඉංජිනේරුවා කටයුතු සැලැස්සුව. වෙසක් පෝය දින මේ පුද්ගලයා විදුලි එළිය දුන්නෙ නැහැ. පළමුවෙනි වතාවට ගාලු නගරයට සිද්ධ වුණා අඳුරේ වෙසක් උත්සවය පවත්වන්න. ඊට කලින් අවුරුදුවලදී සිටි ඉංජිනේරු මහත්මයා නම් කෙළේ, විදුලි බලය අඩුවෙන් ලැබුණත්, මහා මාර්ගවල තිබෙන විදුලි පහන් වලට දෙන විදුලි බලය නවතා හෝ වෙසක් සැරසිලි සඳහා මහජනයාට විදුලිය බලය ලබා දීමයි. නමුත් මේ පුද්ගලයා පැමිණි පළමුවෙනි අවුරුද්දෙ වෙසක් පුර පසළොස්වක දවසෙ කිසිම වෙසක් සැරසිල්ලක් නැති පුදුම විධියෙ වෙසක් උළෙලක් පවත්වන්නට ගාලු නගරයට සිද්ධ වුණා.

පූ. භා. 11.15

සභාපතිතුමනි, එක් පිරිසක් පොඩි වෙසක් තොරණකට මේ පුද්ගලයාගෙන් විදුලි බලය ඉල්ලුව. ඒ සඳහා විදුලි බලය දෙන්න බැරිය කියා කිව්ව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා කරුණා කර සවන් දෙන්න. දැනටමත් ගරු මන්ත්‍රීතුමා පැයක් පමණ වේලා කථා කර තිබෙනව.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)
ගරු සභාපතිතුමනි, මට තවත් ටික වේලාවක් කථා කරන්න ඕනෑ. මේවා මෙතන දීම කියන්න ඕනෑ. එහෙම නැතිව වෙන කොහොමද මේවා ඉදිරිපත් කරන්නෙ? වෙන කොහෙදිද මේවා කියන්නෙ? මම මේවා ගෙදර ගිහිල්ලද කියන්නෙ?

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්. (නාත්තන්ඩිය)**
*(சேர் அல்பேட் எப். பீரிஸ்—நாத்தாண்டிய)*
(Sir Albert F. Peries—Nattandiya)
වෙලාව සීමා කරල තියෙනව නම් ඒ ගැන සලකන්න එපායැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)
තව ටික වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙනව.

ඉතින් ඒකට ඉඩ දෙන්න බැරිය කී අවස්ථාවේ ඒ පළාතේ මිනිස්සුත්, තොරණ හැදූ මිනිස්සුත් එකතු වෙලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

පළාතේ මන්ත්‍රීවරයාගේ මාර්ගයෙන් පෙත්සමක් ඉදිරිපත් කළා. අහල පහල ගෙවල් තිහක විතර මිනිස්සු එකතු වෙලා කුමක්ද කළේ? ගෙවල් තිහක උදවිය කියා සිටියා, අපට හැන්දෑවට ලයිට් වුවමනා කරන්නෙ නැහැ, හැන්දෑවට අපේ ගෙවල් තිහේම ලයිට් නිවා දමන්න; කොහොම හරි තොරණට ලයිට් දෙන්න, කිව්වා. ඒත් අර ඉංජිනේරු තැන ඒ ගැන සැලකිල්ලක් පෙන්නුවෙ නැහැ. පළිගැනීමක් වශයෙන් ඒ තොරණට ලයිට් දුන්නෙ නැහැ. එපමණක් නොවෙයි, අවුරුදු ගණනාවක් තිස්සෙ ඒ පැත්තෙ පන්සල් කීපයකට දීලා තිබුණු විදුලි බලය නැති කර දැම්මා. එහෙම නැත්නම් අවහිර කළා මේ පුද්ගලයා. ඒ සියලු දෙයක්ම මේ පුද්ගලයා කළේ අර නුවරින් ඔහුට වැදුණු පහරට පළි ගන්නයි. මිනිසුන්ගෙන් ඔය විධියට පළි ගන්න පටන් ගත්තම ඒ ගැන පැමිණිලි කළා. කාටද පැමිණිලි කරන්නෙ? පළාත් පාලන සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන පැමිණිලි නිකම් බීරි අලියට වීණාව ගානව වගෙයි.

මේ පුද්ගලයා බෞද්ධයින්ගෙන් පළිගැනීමක් පමණක් නොවෙයි කළේ. සාමාන්‍ය මහජනයාගෙනුත් පළිගන්න පටන් ගත්තා. මොහු මොනවද කළේ? තමන්ගෙ වැඩ කටයුතුත් බොහොම නරක විධියටයි කළේ. තමන්ගෙ පාලනය යටතෙ කරන්න තිබුණු වැඩ කොටස පවා බොහොම නොසැලකිලිවන්ත ලෙසටයි කර ගෙන ගියෙ. මේ ඉංජිනේරු තැන ආවට පස්සෙ ගාලු නගරයේ විශාල සංඛ්‍යාවක් විදුලි සැරය වැදීමෙන් මිය ගියා. එහෙම වුණේ මේ ඉංජිනේරු තැනගේ නොසැලකිල්ල නිසයි. මා මේ විධියේ බරපතළ චෝදනාවක් ඉදිරිපත් කරන්නෙ වගකිව යුත්තෙකු හැටියටයි. මේ ඉංජිනේරු තැන මිනීමරුවෙක් වුණා.

**ඩී. පී. වික්‍රමසිංහ මයා.** (මාවතගම)

*(திரு. டீ. பீ. விக்ரமசிங்ஹ—மாவத்தகம)*

(Mr. D. P. Wickramasingha—Mawatagama)

එහෙම නම් ඔහු එල්ලුම් ගස් අරින්න ඕනැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, ගාල්ලේ මහ මෝදර විමලාවතී උපාසිකාව මළේ මේ ඉංජිනේරු තැනගේ වරද නිසාය කියා වෘත්තීය සමිතියක නියෝජිත පිරිසක් පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉපිරිපිටට ඇවිත් කරුණු ඉදිරිපත් කළා. ඉතින් මේ කොමිෂන් සභාව ඒවා ඇහුවද? නැහැ, ඇහුවෙ නැහැ. විමලාවතී උපාසිකාවගෙ පොඩි දරුවන් හතර දෙනා වෙනුවෙන් වන්දි මුදලක් ලබා ගැනීමට ගාලු දිස්ත්‍රික් උසාවියෙ නඩුවක් පැවරුවා ළමයින්ගෙ මාමණ්ඩි කෙනෙක්. නඩු තීන්දුව දුන්නා පැය 24ක් ඇතුළත සම්පූර්ණයෙන් නෙරපා දමන් නෙයි කියල. එහෙත් ඒ නඩු තීන්දුවවත් ගණන් ගෙන තිබෙනවද මේ කොමිෂන් සභාව? මේ ඉංජිනේරු තැන ගාලු නගර සභාවේ ඉඳන් තමන්ට ඕනෑ විධියට පන්දු ගහනව.

සුගතදාස නැමැති සුළු සේවකයෙක් වෘත්තිය සමිතියක් ඉදිරියට ඇවිත් ඉංජිනේරු තැනගෙ අයුතු පාලනයට විරුද්ධව සාක්ෂි දුන්නය කියා ඔහු අස් කර දැම්මා. අද වැනි දවසේ සුගතදාස කම්කරු උසාවියේ නඩුවක් දමා තිබෙනව. පළාත් පාලන සේවා කොමිෂන් සභාව මේ ඉංජිනේරු තැනගෙ පැත්ත අරන් කියනව, "උඹ කොච්චර දේ කළත් අපි උඹව බේරනව," කියල. මේ විධියට සිදු වෙනව නම් මොන වටද මේ කොමිෂන් සභාව තියෙන්නෙ? ඒ නිසා මා ගරු පාර්ලිමේන්තු ලේකම් තුමියගෙන් ඉල්ලනව මේ කොමිෂන් සභාවට සාමාජිකයන් තෝරා පත් කිරීමේ ක්‍රම ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රතිපත්ති අනුව සංශෝධනය කරන්නෙයි කියා.

**සභාපතිතුමා**

*(அக்கிராசனர்)*

(The Chairman)

ගරු මන්ත්‍රීතුමා දැන් පැයකුත් විනාඩි පහක් අරන් තියෙනව.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*

(Dr. W. Dahanayake)

තවත් සුළු වේලාවක් පමණයි මා කථා කරන්නෙ. අද පළාත් ආණ්ඩු සභා කොමිෂන් එකේ සාමාජිකයන් තෝරන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිවරයයි. රහස් ඡන්දය පාවිච්චි කර මෙම සාමාජිකයන් තෝරන්නය කියා මා ඉල්ලා සිටිනව. නගර සභාවකින් එක් අයකු තෝරා ගන්න වුවමනා නම් අයත් රහස් ඡන්දයෙන් කර ගන්න පුළුවනි. ඇමතිතුමා තෝරනකොට එක් පක්ෂයකට අයිති අයයි, පත් වන්නෙ. එම පක්ෂයෙ කැමැත්ත තිබෙන තුරු ඒ අයට ඉන්න පුළුවනි. පක්ෂයක අපක්ෂ පාති කමක් ඇත්තෙ නැහැ. පක්ෂයක තියෙන්නෙ පක්ෂපාතිකමයි. වැඩපොළකට හෝ ෆැක්ටරියකට හෝ උපදේශක සභාවක් පත් කරන විට ඒ සඳහා සාමාජිකයන් තෝරා ගත යුත්තෙ ඡන්දයෙන්ය කියන එකයි, ලංකා සමසමාජ පක්ෂයෙ අදහස. ඒ වගෙම පළාත් ආණ්ඩු සභා කොමිසමේ සමාජිකයන් තෝරා ගැනීමත් ඡන්දයට අනුව කරන හැටියට පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් මා ඉල්ලා සිටිනව.

තව එක කාරණයක් මතක් කරන්න තියෙනව. ග්‍රාම සේවකයන් පිළිබඳ වගකීම තියෙන්නෙත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාටයි. එම නිසා මා ග්‍රාම සේවකයන් පත් කිරීම ගැන ප්‍රශ්නයක් අහනව. අළුතින් පත් කළ ග්‍රාම සේවකයන්ට—මුලින් පත් කළ ග්‍රාම සේවකයන් ගැන නොවෙයි මා අහන්නෙ—එම පත්වීම් දුන්නෙ මූලික විභාගයෙන් ලබා ගෙන තිබුණු ලකුණු අනුවද, නැද්ද කියා මා ප්‍රශ්න කරනව. මුලින්ම ග්‍රාම සේවකයන් පත් කරන විට ගරු ඇමතිතුමා කඩන්නෙ නැති පොරොන්දුවක් දුන්න. එම පොරොන්දුව තමා, "ලකුණු අනුව මිස අන් කිසි විධියකට ග්‍රාම සේවකයන් පත් කරන්නෙ නැත," යන්නයි. ඊට පසු විටින් විට අළුත් ග්‍රාම සේවකයන් පත් කර තිබෙන බව අපි දන්නව. ඒ අය පත් කළේ විභාගයෙදි ලකුණු ගෙන තිබුණු පිළිවෙළටද නැතිනම් වෙන පිළිවෙළකටද කියා මා ප්‍රශ්න කරනව.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සේවකයන් පත් කළාට පමණක් මදි. ඔවුන්ට විඳින්න සිදු වී ඇති කරදර අවහිර ගැනත් කල්පනා කරන්න ඕනැ. අද දවසෙ ඔවුන්ට මුහුණ පාන්න සිදු වී ඇති නොයෙකුත් අවහිරතාවයන් සහ බාධාවන් ගැන කල්පනා කර බලා ඒවා මග හරවන්න ඕනැ. ඒ අය විඳින අමාරුකම්වලින් එකක් ගැන කියන්න කැමතියි. ඒ අයට පදිංචි වෙන්න තැන් නැහැ. ඒ වගේම කන්තෝරු පවත්වාගෙන යන්න තැන් නැහැ. ග්‍රාම සේවකයන්ට පදිංචිය සඳහා ස්ථානයන්ද රාජකාරි කටයුතු පවත්වාගෙන යාම සඳහා කාර්යාලයන්ද සපයා දීම ආණ්ඩුවෙ යුතුකමක් බව කියන්න ඕනැ. එවැනි පහසුකම් සලසා නොදීම නිසා ඒ අය එක් එක් පුද්ගලයන්ගෙ ගෙවල පදිංචි වී සිටිනව. එසේ වූ විට එම නිවාස හිමියන්ගෙ ආයුධ හැටියටයි, ඒ ග්‍රාම සේවකයන්ට ක්‍රියා කරන්න වෙන්නෙ. මගෙ කොට්ඨාශයෙ එක් ග්‍රාම සේවකයෙක් ගිහින් පදිංචි වුණේ යූ. එන්. පී. කොන්ත්‍රාත්කාරයකුගෙ ගෙදරයි. ඔහුට සිදු වුණා අර යූ. එන්. පී. කාරයගෙ කැමැත්තට වැඩි සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන්න. මා මේ ගැන පළාතෙ ඩී.ආර්.ඕ. තැනටත් කරුණු ඉදිරිපත් කළා. ඇයි, ග්‍රාම සේවකයන්ට නිවාස පහසුව සලසා නොදෙන්නෙ? ඇයි, ඔවුන්ට රාජකාරි කටයුතු කිරීම සඳහා කන්තෝරු සකස් කර නොදෙන්නෙ? සියලුම ග්‍රාම සේවකයන්ට නිවාස පහසුව සහ කන්තෝරු පවත්වාගෙන යාමෙ පහසුව සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

රට සභා පිළිබඳව තව ප්‍රශ්නයක් අහන්න තියෙනව. ඒක්තරා වැය ශීර්ෂයක රට සභා ගැන සඳහන් වී තිබෙනව. ඒ රට සභා පනත සම්බන්ධව කොමිටි රාශියක සන්දේශ ආණ්ඩුව ලබාගෙන තිබෙනව. ඒ රට සභාවලට කොපමණ බලතල පවරන්න ආණ්ඩුවේ අදහස තිබෙනවද කියා අපි අහන්න කැමතියි. රට සභා පිහිටුවීමට පෙර, රට සභා ගැන පාර්ලිමේන්තුවේ සම්පූර්ණ වාදයක් කිරීමට—ඒ පිළිබඳව අපේ අදහස් ප්‍රකාශ කිරීමට—ඉඩක් දෙනවද කියා දැන ගන්න කැමතියි. මේ වැය ශීර්ෂවල රට සභා ගැන සඳහන් වෙනව. පාර්ලිමේන්තුවේ සම්පූර්ණ වාදයක් පවත්වන්නෙ නැතිව රට සභා සම්බන්ධයෙන් කිසිම දෙයක් කරන්න එපාය කියා අපි ඉල්ලනව. රට සභා ප්‍රශ්නය ගැන මත භේද රාශියක් තියෙනව. රට සභාවලට කොපමණ බලතල දෙනවද යන ප්‍රශ්නය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය ගැන මේ ගරු සභාවේ මත නියම විධියට ප්‍රකාශ කිරීමට ඉඩ දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. සිවසිතම්පරම් මයා.
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)

Mr. Chairman, I would start off by asking the hon. fair Parliamentary Secretary when the Government proposes to table the Draft Bill regarding the establishment of District Councils. In the Throne Speech of 1963 the Government told us that they were considering the possibility of establishing District Councils. In the Throne Speech of this year after the coalition was formed it was mentioned that a Draft Bill for the establishment of District Councils would be tabled during the tenure of this Parliament. I would like at the very outset to ask from the hon. fair Parliamentary Secretary as to the possible period of time when she proposes to table in this House or in the Senate the proposed Draft Bill about District Councils.

I do not think that there should be any difficulty for the Government to do so because, I believe, somewhere in 1958 or so the late Mr. S. W. R. D. Bandaranaike had published a Draft Bill for the establishment of District Councils in the Gazette for the purpose of getting the views of the public. Thereafter, of course, a committee had gone into this matter and submitted its report. I would earnestly ask the hon. fair Parliamentary Secretary to consider tabling this Draft Bill as early as possible because I see in the establishment of District Councils not only the doing away of the prestige of colonial administration in this country through kachcheries but also the possibility of settling a large number of problems affecting the minorities of this country. I think, this matter of the establishment of District Councils is an urgent matter and I hope the Government would, as they promised in the Throne Speech, table for our consideration this Draft Bill.

I wish to congratulate the hon. fair Parliamentary Secretary on having announced in the newspapers that she would take very early steps to bring all houses in Colombo particularly under the Rent Control Act. I am not surprised that the hon. fair Parliamentary Secretary, who had been in the forefront of the struggle for the rights of tenants, had decided to do so soon after she assumed office.

There are two matters I wish to draw her attention to. One is the provision today in the Rent Restriction Act that on a furnished house you can charge 25 per cent. extra as rent. I think the hon. fair Parliamentary Secretary should know as well as I do what type of furnishings we find in these houses. Flats or houses with a few pieces of antique furniture, which are not even useful for people to admire as antiques, are termed as furnished flats or houses and an extra charge of 25 per cent is levied.

පූ. භා. 11.30

I also wish to draw her attention to a new device that the landlords are adopting to cheat the provisions of the Rent Control Act and that is this. At one time they used to get key money and all that sort of thing. They have given up that and have now started a new one. They say, "We will give the house on the assessed rent but you must enter into a written legal tenancy agreement and my lawyer's fees for drawing up this deed of tenancy is so much" which is sometimes as high as Rs. 2,000. That is the new device that the landlords are adopting in the form of lawyers' fees to draw up deeds of tenancy in order to beat the Rent Control Act. I would ask the hon. fair Parliamentary Secretary to consider that matter also when the new amendments to the Act are brought about.

May I also commend to her notice the practice that is obtaining in cities like Bombay where, when a house falls vacant, the right to re-let that house is taken away from the landlord and vested in the Government. I believe this is in Bombay. When a house falls vacant the landlord has no right to let the house out to any

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

person he likes, but the Government steps in and lets out the house according to a system of priorities to a would be tenant. It is a very desirable step that we should take in this country also, thereby preventing the landlords from getting "key money" and all that sort of thing when they let a house to a new tenant. I would commend this suggestion to the fair Parliamentary Secretary. When the new amendments are brought this provision too should be given earnest consideration.

I am glad that the Government is firm on this question of the abolition of racing. I was rather amused to hear the fervent appeal made by the hon. First Member for Colomb South (Mr. J. R. Jayewardene) that racing be allowed to continue. Mr. Chairman, we have no objection to racing as such; what we object to is the thing that goes along with it, betting. I think the fair Parliamentary Secretary knows, as well as I do, the number of lower middle-class people, the number of poor people, who have lost everything as a result of this betting that goes on. This one-time sport of kings, dope peddlers and bucket-shop keepers should be totally banned. It is time the Government put its foot down firmly and said, "No more racing and no more betting".

We should find fault with the police for the spread of this evil, for the way in which they deal with these bucket-shop keepers. I think it is correct to say that they are in league with the bucket-shop keepers of this country. The whole of the Fort Police, the C. I. D., and the C. B. I., are too well known to two bucket-shop keepers in the York Street and Canal Row area. The police, as well as others, know that these two bucket-shop keepers are operating very close to the Fort Police Station, but so far nothing has been done by the police to bring these two people to book. Everybody knows that betting is going on openly in these places; betting is done by hundreds of people over the telephone, but the police are taking no action to prevent these illicit bettings from going on.

Connected with this question is the question of the social clubs that have sprung up in Colombo and which are running tombolas and casinos. That is one other matter to which the Home Ministry should direct its attention. I know of several cases of people who have betted, almost literally, their last shirt in these places. They go under the synonym of "Social Clubs", but in fact they are running gambling dens. Proceeding against these so-called social clubs might affect the *bona fide* clubs like the S. S. C., the Tamil Union Cricket Club and the Orient Club, but it can be laid down emphatically that steps would be taken by the Home Ministry against clubs whose sole purpose is organizing tombolas and casinos.

There is one small matter I wish to refer to in regard to Local Government employees. Today, when a town council is elevated to the status of an urban council, the employees of the town council cease to be employees of the Local Government Service Commission. They are retired from the date the town council was elevated to the status of urban council. Quite often the chairman of the newly constituted urban council refused to take on these employees who were there in the town council earlier, with the result that quite a number of these employees are being forced to retire prematurely when it is not necessary for them to retire. I think that is a matter to which I should draw the attention of the fair Parliamentary Secretary.

Mr. Chairman, a lot has been said about toddy both in this House and outside. On more than one occasion I have spoken on this matter and expressed our complete approval of the proposal of the Hon. Minister of Finance with regard to the tree tax system.

The hon. Leader of the Opposition, on one occasion, said that the rate of crime in Jaffna had shown an increase during the four or five months of the toddy season. I do not know who had supplied him with statistics. Is he relying on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

some pontifical statement made by a Judge of our Supreme Court on the Bench ? The tree tax system in Jaffna was introduced at the time the late Mr. D. S. Senanayake was in charge of the affairs of this country and it was allowed to continue even during the time the Leader of the Opposition was the Prime Minister of this country. I wish to ask the hon. Leader of the Opposition this question : if he knew that there was an increase in crime, why did he allow the tree tax system to continue in Jaffna ? If he was aware that crime increased during the four or five months of the toddy season, why did he, as Prime Minister of the country, not take steps to put an end to the tree tax system in this country ? Of course, he may not have been interested in Jaffna, or there may have been some other reason.

Whatever the reason, the argument that crime has increased is untenable. Everybody knows that you can never get intoxicated with toddy. One has to drink gallons and gallons of toddy before one loses one's senses. Therefore I wish to say that I have already supported, and I once again lend my entire support to, the proposal to allow toddy to be tapped from coconut trees.

Mr. Chairman, in the course of the discussion on the Estimates of the Hon. Minister of Finance we raised the question of the difficulty which the Tamils and Muslims are facing in this country in having their deeds registered as the result of a provision in the Finance Act of last year, namely, that deeds should not be registered unless the parties prove their citizenship.

The Hon. Minister of Finance promised to look into the matter and said that though it was not a matter which same entirely within his province yet it might be raised with the Home Ministry. That is why I am raising it today.

I think, if the hon. fair Parliamentary Secretary inquires, it will be found that more than a hundred deeds of Tamils and Muslims are lying unregistered with the Registrar of Lands in Colombo and in the Kandyan provinces mainly. I think we protested very strongly when this Section in the Finance Act was discussed that year but our protests were of no avail. And our fears have been realised today as we find that *bona fide* citizens of this country are unable to prove their citizenship in the way the Registrar of Lands wants them to do so, namely, the production of the birth certificates of your father, grandfather and great-grandfather.

It may be that people of our generation will have the birth certificates of their father. But certainly our fathers do not have the birth certificates of their fathers. That is the position in which we the Tamils and the Muslims are placed in this country. In a way, the registered citizens of this country are better off than the citizens by descent because they have only to produce the certificate of registration and their citizenship is accepted. But we have to produce our father's and sometimes our grandfather's certificates which are not even in existence.

May I suggest to the hon. fair Parliamentary Secretary that the Registrar of Lands might adopt the very simple test whether your name is on the voters' list or not. I think the voters' lists in our country are prepared with care, scrutinized, objected to and so on. If one's name appears on the voters' list that should be fairly sufficient proof that one is a citizen of this country. Therefore, may I suggest that the Registrar of Lands might adopt that very simple test and thereafter have these deeds registered ?

There is one other small matter which I wish to raise under this Head. Unfortunately, in our country, sometimes, our names reveal the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

caste to which we belong, particularly in Jaffna and in some parts of the south. May be, there are some who are ashamed—I do not know why—that their names reveal the caste to which they belong, and they wish to have the name changed. Quite often they go to the courts and have the name changed. For instance, in Jaffna if the name is Alvan they know that he belongs to a minority Tamil group. So he wishes to change the name to Alvapillai or Alvar, and thus the name is changed. But what the Registrar does is, when he issues the certificate in the amended form he insists on giving the earlier particulars also. He says the original name is Alvan and that that is being changed to Alvapillai or Alvar—thereby completely spoiling the purpose for which this man had gone and got the name changed. This is a very small matter which the hon. fair Parliamentary Secretary could attend to administratively When the certificate is issued after the amendment the particulars appearing before the amendment need not appear in the amended certificate. I do not know why they should include the earlier particulars at all! It is a small matter which the fair Parliamentary Secretary might look into.

Yesterday my hon. Friend the hon. Member for Vavuniya (Mr. T. Sivasithamparam) was speaking of the refusal of the Government Agent, Vavuniya, to issue new gun licences to *bona fide* cultivators in Vavuniya. While I entirely endorse whatever the hon. Member said, in Jaffna licences which had already been issued to people had been withdrawn and the Government Agent in the course of a letter withdrawing the licence says that he is acting under Section 6 (1) (*b*), (*c*) and (*d*) of the Firearms Ordinance.

Section 6 (1) (*b*), (*c*) and (*d*) reads as follows:

> " (*b*) when (for reasons to be recorded by him in writing) the Government Agent deems it necessary for the security of the public peace to withdraw such licence or permit; or
>
> (*c*) if the Government Agent is satisfied that the possession and use of a gun by the holder of the licence or permit is not necessary for the purpose for which he required the gun at the time of the issue or last renewal; or
>
> (*d*) if the Government Agent is satisfied that the possession and use of the gun by such holder is dangerous to the life or property of any other person or persons."

Is it very seriously suggested that the people who have gun licences in Jaffna have become suddenly dangerous to the peace and tranquillity of this country? Is it suggested that persons who had licences for guns in Jaffna have become dangerous to the security, peace and the law of this country?

වී. ඒ. අලෙගකෝන් මයා. (මන්නාරම)
(*திரு. வீ. ஏ. அழகக்கோன்—மன்னார்*)
(Mr. V. A. Alegacone—Manrar)

Not only in Jaffna, in Mannar also!

එම්. සිවසිතම්පරම් මයා.
(*திரு. எம். சிவசிதம்பரம்*)
(Mr. M. Sivasithamparam)

This process of recalling gun licences and withdrawing them is done only in the Tamil areas, I am reliably informed. I have tabled a Question for the hon. fair Parliamentary Secretary to answer on certain information I received from the Nuwara Eliya District. The Government Agent had withdrawn licences of only Tamils and of nobody else. I am reliably informed that that is so. I have asked the hon. Parliamentary Secretary to table the names of the people who have made applications for licences and so on. If my information is correct that this sort of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

action is taken only against Tamils then she should look into the matter and do something about it.

Finally, I wish to refer to a parochial matter in my own electorate. Very often on the Floor of this House I have refrained from referring to matters which are parochial and referred to matters of general interest. This is a matter over which I am very perturbed and grieved, that is why I should like to raise it on the Floor of the House.

පූ. භා. 11.45

There is a village in my electorate which has no fresh water for the purpose of drinking. There is only one well which serves a population of nearly 10,000 to 15,000 people. Women from very early hours of the morning have to trek distances of nearly 2 to 3 miles in order to get one or two pots of fresh water purely for the purpose of drinking. This problem has been existing for a very long time and it was looked into, and nearly 30 years ago a scheme was prepared for the supply of pipe-borne water to this particular village, which is known as Karaveddi. During my predecessor's period of office, estimates were prepared and all plans were ready, and in 1961 tenders were called for for the completion of this water scheme. This is what the Commissioner of Local Government says in his Administration Report for 1960-61 :

> "Tenders were called for Karaveddi and Kotapola Water Supply Schemes during the year......"

The Commissioner of Local Government and the officials concerned were good enough to have realized the urgency and the need for this water supply scheme. They went ahead with all the preliminary steps and called for tenders.

At this stage, due to my ill-luck and the ill-luck of my constituents, somebody suggested to me that I should meet the Minister, who, I may say, is not the present Minister but the hon. Member for Matara (Mr. Samaraweera), who had a scene yesterday of which I think we are all very rightly ashamed. He was the Minister then. Somebody suggested to me that I should meet him and put my case to him, so that there would be no slip between the tender and the actual construction. I did meet the Minister and I explained to him the urgency of my case. He agreed with me and said, "This scheme must be done. Siva, kindly give me the particulars of the case and I will put it through ". I gave him the necessary particulars. What happened the next morning was that he made the order, "Lay by ". That was what the Minister did to me after all the trouble I had taken to see him in this matter.

I believe the Hon. Minister of Communications had said in Jaffna that some of the Members representing Northern electorates did not look after the needs of their constituents. Here is a case where the officials had sanctioned the scheme, tenders had been called for, everything was ready when, just because I had the courtesy to meet the Minister to ask him that the scheme be put through, the order was made that the scheme should be " laid by ". It was laid by and it is still laid by.

The position today is that fresh plans have been drawn curtailing the water supply scheme so that it could fit in with the original estimates. I urge the hon. fair Parliamentary Secretary, who has often on the Floor of this House, raised parochial matters pertaining to my electorate, to look into this matter and see that something is done.

**ඩී. පී. වික්‍රමසිංහ මයා.**
*(திரு. டீ. பீ. விக்ரமசிங்ஹ)*
(Mr. D. P. Wickramasingha)

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය පාලනය පිළිබඳව කරුණු කීපයක් කීමට මම අදහස් කරනවා. මා කියන්නට යන පළමුවන කාරණය පිළිබඳව මීට ප්‍රථමත් මම මේ ගරු සභාවේදී කියා තිබෙනවා. ඒ [illegible] හත්පත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආදායම් පාලක නිලධාරිතුමාගේ කාර්යාලය සම්බන්ධවයි. එය පිහිටා තිබෙන ස්ථානය හා ගොඩනැගිල්ලේ තත්ත්වය පිළිබඳව අපි දිස්ත්‍රික්ක ඒකාබද්ධ කාරක සභා රැස්වීම්වලදී නොයෙක් විට කථා කර තිබෙනවා. එම කාර්‍යාලය සඳහා නව ගොඩනැගිල්ලක් වුවමනා බව අපි කියා තිබෙනවා. එහෙත් මේ වන තුරුත් ඒ පිළිබඳව කිසිවක් කර නොමැති වීම ගැන අපි කණගාටු වෙනවා.

වයඹ පළාතේ වැඩිම ජන සංඛ්‍යාවක් අයත් වන්නේ වැඩවිල්ලි හත්පත්තු ආදායම් පාලක කොට්ඨාශයටයි. එම කොට්ඨාශයෙන් දිනපතා මේ කාර්යාලයට පැමිණෙන සංඛ්‍යාවට එහි සුව පහසුකම් ඇත්තේ නැහැ. ඊටත් වඩා මේ කාර්යාලය පිහිටි ස්ථානය කිසි සේත්ම සුදුසු නැහැ. මේ අවස්ථාවේදී ස්ථිර ලේකම්තුමාත් මෙහි සිටින බව පෙනෙන නිසා මම ඉල්ලා සිටින්න කැමතියි, මේ වැඩවිල්ලි හත්පත්තු ආදායම් පාලක කොට්ඨාශය දෙකට කඩන්නය කියා. මේ කොට්ඨාශය පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන තුනකට සම්බන්ධයි. ඒ තරම් විශාල ප්‍රදේශයක සිටින ජන සංඛ්‍යාවකට ඔවුන්ගේ කටයුතු කරගැනීමට අපහසුයි, එක කාර්යාලයක් පමණක් තිබීමෙන්. ඒ නිසා නුදුරු අනාගතයේදීම මේ පිළිබඳව ස්ථිර වැඩ පිළිවෙලක් ඇති කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

මම හිතනවා, මේ කාර්යාලය පිහිටුවීම සඳහා සුදුසු ඉඩමක් තිබෙනවාය කියා. ගොඩනැගිල්ලක් තැනීම පමණයි අවශ්‍ය. අළුත් ගොඩනැගිල්ලක් තැනීමට මුදල් නොමැති නම් සුදුසු ගොඩනැගිල්ලක් තිබෙන තැනකට මේ කාර්යාලය ගෙන යන මෙන් මම ඉල්ලා සිටිනවා. මේ සඳහා වහාම පිළියමක් කිරීමට සිදු වී තිබෙනවා. දැනට තිබෙන කාර්යාලය වැස්සට තෙමෙනව . වැහි දිනවලට හරියට හරක් මඩුවක් වාගෙයි. නිලධාරීන්ට එහි වැඩ කරන්න අමාරුයි. මහජනයාගේ වැදගත් කාර්යයන් ඉටු කිරීමට තිබෙන මෙබඳු කාර්යාලයක් මීට වඩා හොඳ ස්ථානයක මීට වඩා හොඳ තත්ත්වයක තිබිය යුතුයි.

ප්‍රාදේශීය පාලනය පිළිබඳව තවත් කරුණක් කියන්න තිබෙනවා. නව ග්‍රාම සේවකයින් හා පොලීසිය අතර ඇති සම්බන්ධතාව ඉතා දුර්වල බව අපට පෙනී ගොස් තිබෙනවා. මේ නිසා මහජනයාට විශාල හිරිහැරයකට මුහුණපාන්නට සිදු වී තිබෙනවා. මීට පෙර ගම්මුලාදෑනින් සිටි අවස්ථාවේදී මීට වඩා හොඳ සම්බන්ධතාවක් තිබුණා. මේ සම්බන්ධතාව දුර්වල වීමට හේතුවක් වශයෙන් සමහරුන් දක්වනවා, අළුත් ග්‍රාම සේවක මහත්වරු කලින් සිටි ගම්මුලාදෑනි මහත්වරුන්ට වඩා උගත් නිසා ගම්මුලාදෑනීන් මෙන් ග්‍රාම සේවකයින් පොලිස් නිලධාරි මහත්වරුන්ට බැගෑපත් නොවීමය කියා. හේතුව කුමක් වුවත්, පොලීසියත් ග්‍රාම සේවකයනුත් අතර මීට වඩා කිට්ටු සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය කටයුතු සලසනවා ඇතැයි අපි විශ්වාස කරනවා. එසේ නොකළහොත් ග්‍රාම සේවා ක්‍රමයෙන් අප බලාපොරොත්තු වන තරම් සේවයක් සලසා ගන්න ලැබෙන්නෙ නැහැ.

ඊළඟට වයඹ පළාතටම පොදු වූ කාරණයක් ගැන මතක් කරන්න කැමතියි. වයඹ පළාතේ කච්චේරියේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය තරම් නිලධාරීන් නැති නිසා එහි අංශ කීපයකම වැඩ කටයුතු ප්‍රමාද වී තිබෙනවා. එහි දිසාපතිතුමාත් මේ ගැන අමාත්‍යාංශයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා යයි මා කල්පනා කරනවා. කෙසේ වුවත් මේ දක්වා අවශ්‍ය තරම් නිලධාරීන් ඒ කච්චේරියේ නැති නිසා වැඩ කටයුතු වලට බාධා සිදු වී තිබෙනවා. මේ සඳහා නිදර්ශනයක් ඉදිරිපත් කරන්න කැමතියි. පළාත් පාලන ආයතනවල මුදල් දිසාපතිතුමා භාරයේ කච්චේරියෙහි තැන්පත් කරතත්, කලට වේලාවට කච්චේරියෙන් මේ මුදල් ලබාගැනීමට බැහැ. මා සභාපතිවරයා වශයෙන් සිටින පිලැස්ස ගම්කාර්ය සභාවට දැනට 6 මාසයක මුදල් ලබා ගන්නට බැරි වී තිබෙනවා. තත්ත්වය මෙසේ හෙයින්, අපට, ඒ ගම්කාර්ය සභාවට වැඩ කටයුතු කරගෙන යෑමට බොහොම අපහසුයි. දිසාපතිතුමාගේ වාර්තා මගින් මාස යෙන් මාසය අපේ මුදල් තත්ත්වය දැන ගන්නට අපට වුවමනා කරනවා. නමුත් දැනට ඒ සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. මා සභාපතිවරයා වශයෙන් සිටින ගම්කාර්ය සභාවට පමණක් නොව අනිකුත් ගම්කාර්ය සභාවලටත් මේ තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. එම නිසා දැනට තිබෙන ක්‍රමය වෙනස් කරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. වික්‍රමසිංහ මයා.]

කරනවා නම් හොඳයි. පළාත් පාලන ආයතනවල මේ මුදල් පිළිබඳව ක්‍රියා කිරීම මහජන බැංකුවට පවරනවා නම් කලට වේලාවට කටයුතු කෙරෙනවා ඇතැයි මා කල්පනා කරනවා. නමුත් තවම නම් එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ නැහැ. එම නිසා මේ කාරණය ගැන පළාත් පාලන ඇමති අංශයෙන් ස්ථිර පියවරක් ගත යුතු බව මතක් කරන්නට කැමතියි.

ඊ ළඟට පළාත් පාලනයෙහි ඇති අඩු පාඩු කීපයක් ගැන මතක් කරන්නට සතුටුයි. මේ කියන කරුණු මීට පෙර කීප වතාවකදීම මේ ගරු සභාවේදී ප්‍රකාශ කර තිබෙනවා. වෙනත් ගරු මන්ත්‍රීවරුන්ද මේ කරුණු නොයෙක් වර ඉදිරිපත් කර තිබෙනවා. පළාත් පාලන කටයුතු දියුණු කිරීම සඳහා මෙතෙක් දී ඇති වරප්‍රසාද ගැන මුලින්ම ඒ අමාත්‍යාංශයට අපේ ස්තුතිය පිරිනමනවා. මෙතෙක් දී ඇති වරප්‍රසාද යටතේ අපේ ප්‍රදේශ විශාල දියුණුවක් ලබා තිබෙන බව මතක් කරන අතරම, දැනට මූලික වශයෙන් මුහුණ පාන්නට සිදු වී ඇති කරුණු කීපයක් ගැනද මතක් කිරීම යුතුකමක් යයි මා කල්පනා කරනවා. වොක්සි කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කරන කාලයේ දී සාමාන්‍යයෙන් ගම් කාර්ය සභාවකට ලැබුණේ රුපියල් 3,000 ක තරම ආධාර මුදලකුයි. නමුත් ඉන් පසු එම මුදල ක්‍රමයෙන් වැඩි කර ගෙන ගොස් දැන් රුපියල් 12,000 දක්වා මුදලක ආධාරයක් දෙනවා. සමහර විට ඊටත් වැඩි ආධාරයක් දෙනවා. ගම් කාර්ය සභා ප්‍රදේශවල දියුණුව සැලසීම සඳහා දෙන මෙම ආධාර මුදල ගැන අපේ ස්තුතිය පළාත් පාලන අමාත්‍යාංශයට හිමි වෙනවා. නමුත් මේ මුදල් පාවිච්චි කිරීමේදී, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් නොයෙකුත් අමාරුකම් ඇති වෙනවා. අවුරුද්ද අවසානයේදී මේ මුදල් දීම නිසා නොයෙකුත් කරදරවලට හිරිහැරවලට මුහුණ පාන්නට සිදු වෙනවා. කොටින්ම මේ නිසා ගම්කාර්ය සභාවල වැඩට බාධා ඇති වෙනවා. ටෙන්ඩර් කැඳවීමට හා වෙනත් වැඩ කටයුතු කිරීමට කාලය මදි නිසා පාඩු සිදු වෙනවා. පසුගිය අවුරුද්දේ පිලැස්ස ගම්කාර්ය සභාවට රුපියල් 12.000 ක් විතර ලැබුණා. ඒ මුදල් යොදවා මාර්ගයක් සෑදවීම සඳහා අප ටෙන්ඩර් කැඳවීමට ක්‍රියා කළා. මේ වැනි අවස්ථාවලදී සමහර විට කීප වතාවක් ටෙන්ඩර් කැඳවීමට අපට සිදු වෙනවා. සමහර විට කොන්ත්‍රාත්කාරයන් ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නැහැ. එසේම මුදල් ආපසු යන අවස්ථාත් තිබෙනවා. අන්තිමට මට ගිහින් කියන්න සිදු වුණා, මේක ඉක්මණින් එවන්නය කියා. සමහර තැන්වලින් බාධා වන නිසයි, අපට මේ වගේ අතවරවලට මුහුණ දෙන්න සිදු වී තියෙන්නෙ. ඇමතිතුමාටත්, අගමැතිණියටත්, කොමසාරිස්තුමාටත්, හිටපු ස්ථාවර ලේකම්තුමාටත්, අපේ සංගමය වෙනුවෙන් ඉල්ලීම් කීපයක් ඉදිරිපත් කර තියෙනව. ගම් සභා වෙනුවෙන් ඉදිරිපත් කර තිබෙන ඒ ඉල්ලීම් මේ අවුරුද්ද ඇතුළත ඉටු කර දෙන ලෙස අපි ඉල්ලා සිටිනව. මම ඒ ඉල්ලීම් ගැන ලුහුඬින් මතක් කරන්න කැමතියි.

අපට තදබල ප්‍රශ්නයක් වී තිබෙන්නේ මාර්ග පිළිබඳ ප්‍රශ්නයයි. ගම් සභා ප්‍රදේශවල මාර්ග ප්‍රශ්නය විසඳීමට සතුටුදායක වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයෙන් කෙරෙන්නෙ නැහැ. ඒ සම්බන්ධයෙන් දැනට තිබෙන නීති රීති වෙනස් කරන්නට ඕනෑ. එසේ නොකළොත් අවුරුදු කීපයක් යන විට අපේ ලංකාවෙ ගම්බද පළාත්වල මහජනයාට ගමන් කරන්නට තිබෙන පාරවල් වැසී යන්නට පුළුවන්. අද වුණත්, යම් කිසි පුද්ගලයෙක් බලහත්කාරයෙන් පාරක් අල්ල ගත්තොත් නඩු කියන්න උසාවියට ගියාම ගම් සභාව නඩුවෙන් පරදිනව. අපට සැලැස්මක් ඉදිරිපත් කරන්නය කියනව. සැලැස්මවල් හදන්න රුපියල් දහස් ගණනක්, ලක්ෂ ගණනක් වියදම් කරන්න සිදු වෙනව. මේ සම්බන්ධයෙන් අළුතෙන් නීති රීති සකස් නොකළොත්—දැනට තිබෙන නීති රීති සංශෝධනය නොකළොත්—අන්තිමට යන්න පාරක් නැති වෙනව.

දාවල් 12

ඉඩම් අත්පත් කර ගැනීමෙදිත් ගම්සභාවලට ලොකු කරදරයකට මුහුණ පාන්න සිදු වෙනව. මේ පිළිබඳ ප්‍රශ්නය පළාත් පාලන දියුණුවට විශාල බාධාවක් වී තිබෙනව. සමහර විට ඉඩමක් අත්පත් කර ගැනීමට අවුරුදු හත අටක කාලයක් ගත වෙනවා. එසේම සභාපති කෙනකුගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු 3 ක කාලය තුළදී බලාපොරොත්තු වන යම් කිසි වැඩක් කිරීමට බැරි වන බව කාටත් පැහැදිලියි. විශේෂයෙන් ආදායම් මාර්ග උපදවා ගන්නට පුළුවන් කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ඉක්මණින් කරන්නට පුළුවන් වන පිළිවෙළට නීති රීති සකස් කරන්නට ඕනෑ. වෙළඳ පොළක් සෑදීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීමට අවුරුදු හතක් අටක් ගත වෙනව නම් ඒ ඉඩමෙන් ඇති වැඩක් නැහැ. වෙළඳ පොළක් සෑදීමට මහත්සි ගන්නෙ යම් කිසි ආදායමක් ලබා ගැනීම ටයි. ඒ ආදායම ප්‍රදේශයේ දියුණුව සඳහා පාවිච්චි කරන්නට පුළුවන්. ඒ නිසා ඉඩම් ගැනීමේ ප්‍රතිපත්තිය පිළිබඳව අපි වාර්තා වක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව සාකච්ඡා වක් ඇති වුණොත් අපි තවත් විස්තර ඉදිරිපත් කරන්න කැමතියි. මීට වඩා ඉක්මනින් ඉඩම් අත්පත් කර ගැනීමට පුළුවන් වන පිළිවෙළට නීති රීති සකස් කළ යුතු බවයි, අපේ අදහස.

දැනට අපට බලය තිබෙන්නේ පොදු අරමුදලින් රුපියල් 500 ක් දක්වා වියදම් කිරීමට පමණයි. රුපියල් 500 කින් මේ කාලයේ කරන්නට පුළුවන් වැඩය මොකක්ද? ළිඳක් අළුත්වැඩියා කරනව නම් රුපියල් 500 කට වඩා වියදම් වෙනව. සාමාන්‍ය අඩි පාලමක් බඳිනව නම් රුපියල් 500 කට වඩා වියදම් වෙනව. නමුත් පොදු අරමුදලින් වියදම් කරන්න පුළුවන් ප්‍රමාණය රුපියල් 500 ට සීමා වෙනව. කාලයේ තත්ත්වය ගැන සලකා, බඩු ගණන් වැඩි වී තිබෙන බව සලකා, රුපියල් 500 යේ සීමාව රුපියල් 1,000 දක්වා වැඩි කරන ලෙස මම ඉල්ලා සිටිනව. ඒ අන්දමට රුපියල් පන්සියයේ සීමාව දහස දක්වා වැඩි කළොත් අපට අවශ්‍ය වැඩ කටයුතු, හදිසියෙන් කළ යුතු වැඩ කටයුතු කර ගැනීමට පහසු වෙනව. එම නිසා මෙම සීමාව රුපියල් දහස දක්වා වැඩි කරන ලෙස නමුන්නාන්සෙලා ගෙන් ඉල්ලා සිටිනව.

පළාත් පාලන ආයතනවලට ආදායම වැඩි කර ගැනීම පිළිබඳ යෝජනා රාශියක්ම ඉදිරිපත් කර තිබෙනව. ඒවායින් බොහොමයකටම අපට සතුටුදායක පිළිතුරු ලැබී තිබෙනව. පසුගිය අවුරුදු තුන-හතර ඇතුළතදී එම ඉල්ලීම් ඉෂ්ට වී තිබෙනව. ඒ ගැන මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව. නමුත් එයින් පමණක් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. විශේෂයෙන්ම චොක්සි කොමිෂන් වාර්තාවේ සඳහන්ව තිබෙන කාරණා ගැන කල්පනා කර ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කර පළාත් පාලන ආයතනවලට දිය යුතු පහසුකම් දීමට, එම ආයතනවලින් කෙරෙන සේවය වඩාත් ක්‍රමවත් අන්දමින් කර ගෙන යාමට හැකි වන පරිදි සකස් කිරීමට, කටයුතු යොදන ලෙස ඉල්ලා සිටිනව.

පසුගිය වර පැවති ගම්සභා නියෝජිත වරුන්ගේ සම්මේලනයේදී වැදගත් කාරණා කීපයක්ම ඉදිරිපත් කළා. එයින් එක් වැදගත් කරුණක් නම් ගුවන් විදුලි බලපත්‍රවලින් ලැබෙන ආදායම, ඒ ඒ පළාත් ආණ්ඩු පාලන ආයතනවලට ලබා ගැනීමට අවසර දීමයි. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සෙ දන්නවා, ලංකාවේ තිබෙන ගුවන් විදුලි යන්ත්‍රවලින් සියයට සියයකින්ම බලපත්‍ර ගාස්තු ලැබෙන්නෙ නැති බව. මන්ද? අප දන්නව සමහර අය බලපත්‍ර ලබා නොගෙන ගුවන් විදුලි යන්ත්‍ර පාවිච්චි කරන බව. නමුත් ගම්සභා වලට බලපත්‍ර ගාස්තු අය කිරීමට අවසර දෙනවා නම්, ඒ ඒ ප්‍රදේශවල තිබෙන පළාත් පාලන ආයතනවල නිලධාරීන් යවා ගුවන් විදුලි යන්ත්‍ර තිබෙන සෑම කෙනෙකුගෙන්ම බලපත්‍ර ගාස්තු ලබා ගන්න පුළුවනි. කිසිවකුට ගාස්තු නොගෙවා පැහැර හරින්න බැහැ. නමුත් දැන් තිබෙන තත්ත්වය අනුව නම් පැහැර හරින්නට හොඳටම අවකාශ තිබෙනව. යම් ලෙසකින් සම්පූර්ණයෙන්ම ඉඩ දෙන්නෙ නැත්නම් එක් කොටසක් රජය ටත් අනික් කොටස ගම් කාර්ය සභාවල ටත් නැත්නම් පළාත් පාලන ආයතනවල ටත් ලබාගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනව. රථවාහන වලට බල පත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ගාල්ලේ ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) සඳහන් කළ නිසා ඒ ගැන වැඩි පුර යමක් කියන්නෙ නැහැ.

ගම්සභා කොටස් කැඩීම සම්බන්ධයෙන් යමක් කියන්න ඕනෑ. දැනට වයඹ පළාතම පාලනය වෙන්නෙ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ මාර්ගයෙන්. මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. වික්‍රමසිංහ මයා.]

ප්‍රදේශය කොටස් දෙකකට කැඩිය යුතුය කියා මම අදහස් කරනව. මන්ද? වයඹ පළාතෙ ගම්කාර්ය සභා 52ක් තිබෙනව. තව අවුරුද්දක් ගත වන විට සමහර විට එය 60 දක්වා වැඩි වෙන්න පුළුවනි. සභ කාර පළාත් පාලන කොමසාරිස්වරයකු යටතේ පාලනය වන ලංකාවේ තිබෙන විශාලම ප්‍රදේශය වයඹ ප්‍රදේශය කියා මම කල්පනා කරනව. මෙම ප්‍රදේශයේ ඇති විශාලත්වය නිසා නියම අන්දමට කටයුතු කර ගෙන යාමට අපහසු තත්ත්වයක් ඇති වී තිබෙනව. එම නිසා මෙම කොටස දෙකට කඩන ලෙස මා ඉල්ලා සිටිනව. හලාවත දිස්ත්‍රික්කය එක කොටසකටත්, කුරුණෑගල දිස්ත්‍රික්කය තවත් කොටස කටත් සිටිනසේ බෙදන්න පුළුවනි. එසේ කොටස් දෙකකට බෙදා ඒ කොටස් දෙක සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් දෙදෙනකුගේ පාලනය යටතේ තබන්න පුළුවනි. එසේ කළොත් වැඩ කටයුතු වඩාත් පහසුවෙනවා පමණක් නොවෙයි; ප්‍රදේශය දියුණු කිරීමටද හැකි වන බව තමුන්නාන්සේට මතක් කර සිටිනව. එම නිසා මේ ගැන ඉක්මනින් වැඩ පිළිවෙළක් යොදන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනව.

මගේ කථාව අවසන් කරන්නට පළමු තවත් එක් කාරණයක් ගැන පමණක් සඳහන් කරන්න කැමතියි. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැඩ කරන නිලධාරියකු ගැනයි මා චෝදනා කරන්නෙ. නමුත් ඔහුට විරුද්ධව නගන සියලුම චෝදනා මේ අවස්ථාවෙදි ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මේ පිළිබඳව කාරණා විස්තර සහිතව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියටත්, ගරු ඇමතිතුමාටත් පසුව ඉදිරිපත් කරනව. මෙම නිලධාරියා ගෙන යන කඩාකප්පල් කාරී ක්‍රියා මාර්ගය නිසා අපේ ප්‍රදේශයේ ගම්කාර්ය සභාවල තත්ත්වය නැත්නම් ගම්කාර්ය සභාවල කටයුතු ඉතාමත් පහත් තත්ත්වයකට වැටී තිබෙනව. ඒ විතරක් නොවෙයි, එහි කුමන්ත්‍රණ ව්‍යාපාරයක් පවතිනව. අපි ඒ කාර්යාලයට යවන ලියුම් කියුම් පවා නැති වෙනව. අපි යවන ලියුම් වලට සමහරවිට පිළිතුරු ලැබෙන්නෙ නැහැ. ඒ අතර සමහර කණ්ඩායම් ඒ මහත්මයා හමුවීමට ඇවිත් හෙමින් සීරුවේ ඔවුන්ගේ පෞද්ගලික කටයුතු කර ගත් නව. ඒ පිළිබඳ කාරණා පසුව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමින්, මේ ගරු සභාවේ ඉදිරිපත් වුණු අදහස් සැලකිල්ලට යොමුවී අනාගතයේදි හොඳ වැඩ පිළිවෙළක් ඇති වේයයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

සුමනපාල දහනායක මයා. (දෙණියාය)
(திரு. ஸுமனபால தகநாயக்க—தெனியாய)
(Mr. Sumanapala Dahanayake—Deniyaya)

සභාපතිතුමනි, පළාත් පාලන අමාත්‍යාං ශයේ වැය ශීර්ෂ යටතේ පැවැත්වෙන සෑම කථාවකින්ම, මේ අවුරුද්දේ පමණක් නොව මීට ඉහත අවුරුදුවලදීත්, චොක්සි වාර්තාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරන්නෙ මන්ද යන ප්‍රශ්නය ඉදිරිපත් වුණු බව අපට පෙනී ගියා. අද චොක්සි වාර්තාවේ සුළු කොටසක් ක්‍රියාත් මක කිරීමෙන් පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු ඉතා සාර්ථක වී තිබෙන බව රහසක් නොවෙයි. විශාල මුදලක් වැය කර මෙවැනි කොමිසන් සභා පත් කිරීමෙන් වැඩක් නැහැ, ඒවායේ වාර්තා සම්පූර්ණ යෙන්ම ක්‍රියාත්මක කරන්නෙ නැත්නම්. චොක්සි කොමිසන් වාර්තාවේ සුළු කොට සක් ක්‍රියාත්මක කිරීමෙන් පළාත් පාලන ආයතනවල සෑහෙන ප්‍රගතියක් ඇති වී තිබෙන නිසා හැකි තරම් ඉක්මනින් චොක්සි කොමිසන් වාර්තාව සම්පූර්ණ යෙන්ම ක්‍රියාත්මක කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගෙන් ඉල්ලා සිටින්ට කැමතියි.

සභාපතිතුමනි, සමහර ගම්කාර්ය සභා පිහිටා තිබෙන්නෙ, ඉතාම දියුණු පළාත් වලයි; සමහර ගම්කාර්ය සභා පිහිටා තිබෙන්නෙ ඉතාම නොදියුණු පළාත්වලයි. එහෙත් රජයෙන්, දියුණු පළාත්වල පිහිටි ගම්කාර්ය සභාවලටත්, නොදියුණු පළාත් වල පිහිටි ගම්කාර්ය සභාවලටත් එක හා සමානව වැඩ කිරීමෙන් රජයේ යුතුකම හරියාකාර ඉටු නොවන බව මතක් කරන්ට ඕනෑ. යම්කිසි පාරක් තැනීම සඳහා ගම් කාර්ය සභාවට "ග්‍රාන්ට්" මුදලක් හෝ ආධාර මුදලක් හෝ දෙනවායයි හිතමු. ඒ අවස්ථාවේදි, ඒ ගම්කාර්ය සභාව පිහිටා තිබෙන පළාත ගැනත්, ඒ සභාවේ ආදායම ගැනත්, ඒ පළාත දියුණු පළාතක් ද යන්න ගැනත් කල්පනා කර බලන්ට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එසේ නැතිව සෑම ගම්කාර්ය සභාවකටම එක හා සමානව ආධාර බෙදා දීමෙන් විශාල අසාධාරණයක් සිදු වෙනව, නොදියුණු පළාත්වල පිහිටි ගම්කාර්ය සභාවලට. එම නිසා මින් ඉදිරියට ගම්කාර්ය සභාවලට ආධාර මුදල් දීමේදී විශේෂයෙන් නොදියුණු පළාත් ගැන කල්පනා කොට ඒ ආධාර මුදල් දෙන්ටය කියා මා ඉල්ලා සිටිනව.

අද ගම්කාර්ය සභාවලින් කෙරෙන වැඩ දෙසත්, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු වෙන් කෙරෙන වැඩ දෙසත් බලන විට අපට පෙනී යනව, ඒ අංශ දෙකෙන්ම හුඟක් දුරට එක හා සමාන වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදෙන බව. අප සෑම අවස්ථාවක දීම මතක් කර දී තිබෙනව, ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අද කෙරෙන සේවයට වඩා විශාල, වැදගත්, උසස් සේවයක් ලබා ගන්ට පුළුවන්, පළාත් පාලන අංශයට ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ කිරීමෙන්, කියා. පළාත් පාලන දෙපාර්තමේන්තුවත්, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවත් පසුගිය වර්‍ෂයේ එකම අමාත්‍යාංශයක් යටතේ තිබුණු නිසා අපි ඒ අවස්ථාවේ විශේෂයෙන් ඉල්ලා සිටියා, මේ දෙපාර්තමේන්තු දෙකම ඒකාබද්ධ කරන්ට කියා. එසේ ඒකාබද්ධ කිරීමෙන් ඒ දෙපාර්තමේන්තුවලට වැය කරන මුදලින් විශාල වැදගත් වැඩ කොටසක් ඉටු කර ගැනීමට පුළුවන් බව අපි ඒ අවස්ථාවේදී මතක් කළා. අද නැවතත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් පාලන අමාත්‍යාංශයෙන් වෙනත් අමාත්‍යාංශයකට මාරු කර තිබීමෙන් අප කලින් ඇති කරගෙන තිබුණු බලාපොරොත්තුව ඉෂ්ට නොවන බව පෙනී යන නිසා මා ඉතා කනගාටු වෙනව.

අද ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු වෙන් විශාල මුදලක් වැය වෙනව. මේ මුදල් වැය වන්නේ විශේෂයෙන්ම පාරවල් කැපීමටයි. ගම්කාර්ය සභාවලිනුත් විශාල වශයෙන් මුදල් වැය වන්නේ පාරවල් කැපීමටයි. මේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙත් පළාත් පාලන ආයතනවලත් සම්බන්ධකමක් නැති නිසා බොහෝ අවසථාවල වැඩිපුර වියදම් සිදු වෙනව. එය සිදු වන්නේ මෙහෙමයි. කපනු ලැබූ පාරවල් ඒ ඒ අවසථාවලම ගම්කාර්ය සභාවලට බාර නොගෙන, ඇතැම් විට මාස ගණනක් නැත්නම් අවුරුදු ගණනක් ප්‍රමාද වී ගම්කාර්ය සභාවලට බාර ගැනීමේදී, එතෙක් කල් පාර නඩත්තු නොකර තිබීම නිසා, කලින් පාර කපන්න ගිය වියදමට වඩා විශාල මුදලක් නැවතත් ඒ සඳහා වියදම් කිරීමට සිදු වෙනව. ඒ නිසා නැවත වරක් මේ කාරණය ගැන කල්පනා කර බලන ලෙස මා රජයෙන් ඉල්ලනව. අද රජය මුදල් පිළිබඳව සැලකිලිමත් වන නිසා මේ දෙපාර්තමේන්තු දෙක ඒකාබද්ධ කළොත් විශාල ප්‍රයෝජනයක් ලබන්නට පුළුවන් බව මා කියනව. ඒකාබද්ධ වීමක්, නියම සැලැස්මක්, නැතිව රජයේ ආයතන වලින් වැඩ කෙරෙන විට අපි බලාපොරොත්තු වන වැඩ ප්‍රමාණය කෙරේය කියා අපට විශ්වාස කරන්න බැහැ. නමුත් මේ දෙපාර්තමේන්තු දෙකම එක සැලැස්මක් අනුව වැඩ කරනවා නම් එසේ වියදම් කරන මුදලින් විශාල සේවයක් ලැබෙන බව මතක් කරන්න කැමතියි.

අ.භා. 12.15

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් පළාත් පාලන අංශයට විශාල චෝදනාවක් ඉදිරිපත් කිරීමට තිබෙනව. මා මේ ගරු සභාවට පැමිණි දින සිටම විශේෂයෙන්ම දෙණියාය කොට්ඨාශයේ තිබෙන මොරවක ගම්කාර්ය සභාව දෙකට බෙදන්නය කියා අපි ඉල්ලා සිටියා. අපි එසේ ඉල්ලා සිටියේ එය විශාල ගම්කාර්ය සභාවක් නිසයි. ගිය අවුරුද්දෙත් ඉල්ලුවා. මාතර දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවෙනුත් අපි යෝජ්නාවක් ඉදිරිපත් කළා. ඒ ප්‍රදේශයේ මහ ජනයාගෙනුත් යෝජනා ඉදිරිපත් වුණා. ඒ සමගම ගම්කාර්ය සභා දෙකට බෙදීම සඳහා රටේ සෑම පැත්තකින්ම ලොකු උද්ඝෝෂණයක් තිබුණු නිසා, පළාත් පාලන අමාත්‍යාංශය මගින් 1964 ජනවාරි 10 වැනිදා ගැසට් පත්‍රයකින් නිවේදනයක් කළා, මට මතක හැටියට, ගම්කාර්ය සභා 87 ක් පමණ දෙකට බෙදා වෙන් කරන්නය කියා. මහජනයාගේ ඉල්ලීම උඩ ඒ ගම්කාර්ය සභා 87 න් එකක් හැටියට මේ මොරවක ගම්කාර්ය සභාවත් ඇතුළත් වී තිබීම ගැන අපි සතුටු වුණා. 1964 ජනවාරි 10 වැනිදා ගැසට් නිවේදනයෙන් ඒ ගම්කාර්ය සභා 87 තේ කාලය මාස 6 කින් දික් කළා, ඒවා දෙකට බෙදීම පිණිස.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

නමුත් මට කණගාටුයි කියන්න, මොරවක ගම්කාර්ය සභාව තුළ සිටින ජනතාවට විශාල අසාධාරණයක් කර තිබෙනවා.

පළාත් පාලන අංශය මගින් හිතුවක්කාර අන්දමට මොරවක ගම්කාර්ය සභාව දෙකට කැඩීම පිණිස එහි කාලය 6 මාසය කින් දික් කරමින් 1960 ජනවාරි 10 වැනිදා නිකුත් කළ ගැසට් නිවේදනය මොරවක ගම්කාර්ය සභාව සඳහා අවලංගු කර 1964 අප්‍රේල් 7 වැනිදා තවත් ගැසට් නිවේදනයක් නිකුත් කළා. එසේ කර ඒ ගම්කාර්ය සභාව දෙකට බෙදීම නැවැත්වීම ගැන අපි කණගාටු වෙනව. මේ සම්බන්ධව ප්‍රශ්න කර අපි ලියුම් කීපයක් ලිව්වා. ගම් කාර්ය සභා දෙකට බෙදීමේදී අනික් ගම් කාර්ය සභා අසූ ගණනක් සමග මොරවක ගම්කාර්ය සභාවත් දෙකට බෙදිය යුතුය කියා 1964 ජනවාරි මාසයේදී තීරණය කළා. නමුත් හදිසියේ කිසිම හේතුවක් නොදී අප්‍රේල් මාසයේදී එය වෙනස් කළා. මොරවක ගම්කාර්ය සභාව දෙකට බෙදීමට මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්වරයත් දිසාපතිවරයත් ඇතුළත්ව පත් කළ කොමිටියක් තිබුණා. මේ ගම්කාර්ය සභාවේ දීර්ඝ කළ කාලය ඇතුළත එය දෙකට කඩා වෙන් කිරීමේ කට යුතු මේ කොමිටිය ළඟි ළඟියේ කර ගෙන ගියා. ඒ කොමිටියටවත් දන්වන්නේ නැතිව, පළාතේ මන්ත්‍රීවරයා හැටියටත් මේ ගරු සභාවේදි නොයෙක් වර ඉල්ලුම් කළ කෙනෙක් හැටියටත් මටත් දන්වන්නේ නැතිව, මහජන මතයක් ගැන සොයන්නෙත් නැතිව, ඉතාම හිතුවක්කාර විධියට මේ කළ ක්‍රියාව ගැන මේ අවස්ථාවේදි අපේ අප්‍රසාදය පළ කරන්න ඕනෑ. මෙන්න මේ හේතුව නිසයි මොරවක ගම් කාර්ය සභාව දෙකට නොකැඩුවේ, කියා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියට පුළුවන් නම් දැන් වුවත් කියන්න. ඇත්ත වශයෙන්ම මොරවක ගම් කාර්ය සභාව දෙකට නොකැඩීම ගැන ගරු පාර්ලිමේන්තු ලේකම් තුමියට කිසිම සාධාරණ හේතුවක් දක්වන්න බැරිය කියා මා කියනව. අනිකුත් ගම් කාර්ය සභා සමගම මේ ගම් කාර්ය සභාවත් නොකැඩීමෙන් ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල අසාධාරණයක් කර තිබෙනව. මාතර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කොමිටියේදීත්, දෙවතාවර ටත්, මොරවක ගම් කාර්ය සභාව දෙකට කැඩිය යුතුය කියා අපි යෝජනාවක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මොරවක ගම් කාර්ය සභා ප්‍රදේශය තුළ විශාල ජනගහනයක් සිටිනව. ඒ වාගේම ඒ ගම් කාර්ය සභාවට විශාල ආදායමකුත් ලැබෙන මාර්ග තිබෙනව. සමහර විට පළාත් පාලන දෙපාර්තමේන්තුව කල්පනා කරනවා ඇති මොරවක ගම් කාර්ය සභාවේ ආදායම මදිය, ඒ ප්‍රදේශයේ සිටින ජනගහනය මදිය කියා. නමුත් ඒ ප්‍රදේශයේ 13,000 කට වැඩි ගණනක් ලියා පදිංචි වූ ඡන්ද දායකයින් සිටිනව. ඒ වාගේම, තේ වතු රාශියකුත්, වෙළඳ ආයතන රාශියකුත් තිබෙන ඒ මොරවක ගම් කාර්ය සභාවට අවුරුද්දකට විශාල ආදායමක් ලැබෙනව. අපි දන්නව සමහර අවස්ථාවලදී ඉතා මත්ම සුළු ඡන්දදායකයින් සංඛ්‍යාවක් සිටින, ඡන්දදායකයින් තුන්හතරදාහක් සිටින ගම් කාර්ය සභා දෙකට කඩා තිබෙන බව. එවැනි සුළු ගම් කාර්ය සභාත් දෙකට කඩා තිබෙන අතර මේ ගම් කාර්ය සභාව දෙකට නොකැඩීමෙන් දෙපාර්තමේන්තුව ලොකු අසාධාරණයක් කරනව. අද සමහර ගම්කාර්ය සභා කඩා තිබෙන විධියට අවුරුද්දකට රුපියල් 300 කට වැඩි ආදායමක් ලැබෙන්නේ නැහැ. අප පත්‍රවලින් දැනගත්තා මේ හිනිදුම ආසනයෙ නෙලුව ගම් කාර්ය සභාව දෙකකට කඩා තිබෙන බව. එයින් එකක් තමයි දෙල්ලව ගම් කාර්ය සභාව. ඒකෙ ඡන්ද කොට්ඨාශ 7යි තියෙන්නෙ. ඡන්දදායකයින් ඉන්නෙ 1,500ක් පමණලු. ආදායම අවුරුද්දකට රුපියල් 300ක් වත් නැතිලු. එවැනි ගම් කාර්ය සභාත් දෙකට කඩා තිබෙනවා නම්, මොරවක ගම් කාර්ය සභාව වැනි, දෙකට කැඩීමට සුදුසු ගම් කාර්ය සභාවක් දෙකට නොකැඩුවේ මොන හේතුවක් උඩද කියා මා විශේෂයෙන්ම දැනගන්නට සතුටුයි. පුළුවන් නම් කියන්න මොන හේතුවක් උඩද මොරවක ගම් කාර්ය සභාව දෙකට කැඩීමට නොසුදුසු වුණේ කියා. ගරු පාර්ලිමේන්තු ලේකම් තුමියගේ පිළිතුරු කථාවේදී මේ සම්බන්ධව ප්‍රකාශයක් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනව.

ඊළඟට, දෙනියාය ගම් කාර්ය සභාව ගැන අද රටේ විශාල කසුකුසුවක් තිබෙනව, ඒ ගම් කාර්ය සභාවේ මුදල් වංචාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවාය කියා. ඒ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව කර තිබෙන වැඩ කොටස මොකක්ද කියා මා දැනගන්ට සතුටුයි. මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් අනුගමනය කර තිබෙනවාද, එහෙම නැත්නම් මේ වංචා කළ අයට දඬුවම් දෙන්න වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද, එහෙමත් නැත්නම් අඩු වශයෙන් මේ සම්බන්ධයෙන් විභාගයක් වත් කරගෙන යනවාද කියා මා දැන ගන්නට සතුටුයි. කරුණා කර ඒ ගැන සොයා බලන මෙන් මා පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනව.

ඊළඟට, අපි පසුගිය අවුරුද්දෙත් මතක් කර දුන්නා මේ උඩරට ගැමි කොමිෂන් සභාව සම්බන්ධයෙන්. මුලින්ම උඩරට ගැමි කොමිෂන් සභාව වැනි කොමිසමක් පත් කර නොදියුණු ප්‍රදේශ දියුණු කිරීම ගැන අපි සන්තෝෂය ප්‍රකාශ කරන්න ඕනෑ. නමුත් උඩරට ගැමි කොමිෂන් සභාවට වෙන් කර තිබෙන මුදල ප්‍රමාණවත් නොවන බවත් ඒ සමගම කිව යුතුව තිබෙනව. ඒ මුදල තවත් වැඩි කළ යුතුයි. ඒ සමගම මේ කොමිෂන් සභාව උඩරට ප්‍රදේශවලට පමණක් සීමා කර තිබෙන්නෙ මක් නිසාද කියා මා ප්‍රශ්න කරනව. නොදියුණු ප්‍රදේශ තියෙන්නෙ උඩරට පමණක්ද? ගිය අවුරුද්දෙත් මා මේ ප්‍රශ්නය මතු කළා. ගරු සභාපතිතුමනි, ඔබතුමා නියෝජනය කරන ගිරුවා පත්තුව ප්‍රදේශයත්, මොරවක් කෝරළය, හිනිදුම් පත්තුව ආදී ප්‍රදේශත් දියුණු නැහැ. ඒවා නොදියුණු ප්‍රදේශයි. හදිසියේ ලෙඩෙක් ගෙන යන්න වුණොත් පුටුවක තබා කද බැඳගෙන සැතපුම් ගණන් පයින් යන්න තිබෙනව. විශේෂයෙන්ම මොරවක් කෝරළය හා හිනිදුම් පත්තුව නොදියුණු ප්‍රදේශ බව මා මතක් කරන්න ඕනෑ. හැතැප්ම 10 ක් 12 ක් අඩි පාරවල් දිගේ ලෙඩුන් උස්සාගෙන යන්න සිද්ධ වී තිබෙනව. ඒ ප්‍රදේශවලට කිසිම වාහනයක් යන්න බැහැ. එම නිසා මම ඉල්ලා සිටිනවා, උඩ රට ගැමි කොමිෂන් සභා යෝජනා ක්‍රමය තවත් පුළුල් කර මොරවක් කෝරළේ, හිනිදුම් පත්තුව, ගිරුව පත්තුව ආදි නොදියුණු පළාත්වලටත් එයින් ප්‍රයෝජනයක් ලබා දීමට කටයුතු කරන්නය කියා. සමහර විට කියන්න පුළුවනි, උඩ රට ගැමි කොමිෂන් සභාවට ඒ ප්‍රදේශ ඇතුලත් වන්නෙ නැති නිසා ඒ ගැන කටයුතු කරන්න බැරිය කියා. නමුත් මම පෙන්වා දෙන්න කැමතියි, මොරවක් කෝරළේ ප්‍රදේශය බොහෝ ඉස්සර පටන්ම උඩ රට ප්‍රදේශයත් සමග සැහෙන සම්බන්ධකම් තිබෙන ප්‍රදේශයක් බව. ඒ පිළිබඳ කරුණු ඇතුලත් කරන ලද සන්දේශයක් අපි එවකට සිටි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට භාර දුන්න. අද තවමත් ඒ පළාතේ උඩ රට චාරිත්‍රානුකූලවයි ආවාහ විවාහ ආදිය සිදු කරන්නෙ. ඒ වාගේම මොරවක් කෝරළේ කොලවෙනි ගම නායක ස්වාමීන්වහන්සේටත් මොරවක් කෝරළේ ආදායම් පාලක නිලධාරිතුමාටත් දියවඩන නිලමේ තේරීම සම්බන්ධයෙන් ඡන්ද බලය තිබෙනව. එයින් අපට පෙනී යනවා බොහෝ ඉස්සර පටන්ම මොරවක් කෝරළේ උඩ රට ප්‍රදේශයත් සමග පැවති සම්බන්ධය. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා උඩ රට ගැමි කොමිෂන් සභා යෝජනා ක්‍රමය තවත් පුළුල් කර මොරවක් කෝරළේ, හිනිදුම පත්තුව, ගිරුව පත්තුව ආදි ප්‍රදේශත් ඊට ඇතුලත් කරන්නය කියා.

අද රටේ විශාල ආන්දෝලනයක් ඇති කර තිබෙන ප්‍රශ්නයක් නම් රා ප්‍රශ්නයයි. මීට කලින් සෑම අවුරුදුවලදීම සුරාබදු දෙපාර්තමේන්තුව ගැන සාකච්ඡා කරද්දී නොයෙකුත් දෝෂාරෝපණත් විවේචනත් ඇති වුණා. මේ අවස්ථාවේදී සභාපතිතුමනි, අපි සන්තෝෂ වෙනව රුපියල් 15 ක බද්දක් උඩ පොල් ගස් මැද ගැනීමට ආණ්ඩුව විසින් අවසර දීමට කටයුතු කර තිබීම ගැන. සමහර අවස්ථාවලදී අපේ පළාත්වල ජනතාව මී රා මැදීම හේතුකොට ගෙන විශාල කරදරවලට මුහුණ පා තිබෙනව. එසේ සිදු වී ඇත්තේ පොලිසියේ සහ සුරා බදු දෙපාර්තමේන්තුවේ ක්‍රියා කලාපය නිසයි. එම නිසා මේ විධියට රා මැදීමට අවසර දීමෙන්, ඒ ක්‍රියා මාර්ගය අනුගමනය කිරීමෙන්, පොලිසියෙන් සහ සුරා බදු දෙපාර්තමේන්තුවෙන් මහජනයාට විඳින්නට සිදු වූ කරදර හිරිහැරවලින් ඔවුන් බේරා ගැනීම ගැන අපි ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනව. ඒ එක්කම අපි කොයි අවස්ථාවකදීවත් කියන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

නැහැ රා මැදීම හොඳය කියා. නමුත් මුදල් ඇමතිතුමා ප්‍රකාශ කර ඇති පරිදි, අද ඉතාමත් දරුණු ලෙස පැතිරී තිබෙන කසිප්පු වසංගතය සම්පූර්ණයෙන්ම නැති කර දැමීමට මෙය බොහෝ දුරට උපයෝගී වෙනවා ඇති. විශෙෂයෙන් අපේ ප්‍රදේශයේ වතුකර පළාත්වල අව්ව වැස්ස දෙකම නොබලා වැඩ කරන කම්කරු ජනතාව හැන්දෑවේ යම් කිසි බීමක් පාවිච්චි කිරීමට පුරුදු වී සිටිනව ; ඇබ්බැහි වී සිටිනව. නමුත් අද අරක්කු මිල වැඩි නිසාත්, ඔවුන්ට ලැබෙන ආදායමෙන් අරක්කු වැනි බීම පාවිච්චි කිරීමට නුපුළුවන් නිසාත්, කසිප්පු වැනි අඩු වියදමකින් සොයා ගැනීමට පුළුවන් බීම පාවිච්චි කිරීමට ඔවුන් පුරුදු වී සිටිනව. රා මදින්න පටන් ගත්තම කසිප්පු බොන්න පුරුදු වෙලා ඉන්න අයත් කසිප්පු බීම සම්පූර්ණයෙන්ම අත් හැර දමා රා බොන්න පටන් ගන්න ඉඩ තියෙනව.

අද රටේ තිබෙන අමද්‍යප ව්‍යාපාරයට අපි ගරු කරනව. රජයත් අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කරන්න යනවය කියා මට දැන ගන්න ලැබී තිබෙනව. ඒක බොහොම හොඳයි. අපිත් ඊට සහයෝගය දෙනව.

අයවැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සෙ අපේ පළාතේ පැවැත්වුණු රැස්වීම් කීපයකට මාත් සහභාගි වුණා. ප්‍රවාහණ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ ප්‍රමුඛත් වයෙන් පවත්වන ලද රැස්වීමකදීත් වෙනත් රැස්වීම් ගණනාවකදීත් අහන්න ලැබුණේ පළාතෙ ජනතාව රා මැදීමට අවසර දීම ගැන සන්තෝෂය පළ කළ කථා පමණයි. අඩු මිළට බොන්න වෙනත් බීමක් නැති නිසා රා මැදීමට ඉඩ දෙන්න අදහස් කිරීම ගැන මහජනයා මේ ආණ්ඩුවට කෘතඥ වෙනව. මත්පැන් බොන්න පුරුදු වෙලා ඉන්න කෙනෙකුට අමද්‍යප ව්‍යාපාරය කොයි තරම් දුරට ගෙන ගියත් ඒක නවත්තන්න අමාරුයි. ඒ නිසා රා මදින්න ඉඩ දුන්නොත් අඩු ගණනේ කසිප්පු මර්දනය කරන්නවත් පුළුවන් වේවි. අවවාද කිරීමෙන් පමණක් මත්පැන් බොන්නන් එයින් මුදා ගැනීම අමාරුයි. ඒ නිසා ඉතාමත් අහිතකර කසිප්පුවට ඇබ්බැහි වූ අයට ඊට වඩා අඩුවෙන් අහිත කර දෙයක් වන රා බොන්න ලැබුණොත් කසිප්පු නොබී ඒ වෙනුවට රා බොන්න පටන් ගත්තම කසිප්පු මර්දනය වේවි.

රා මදින්න අවසර දීමට රජය ඉදිරිපත් කළ අදහස ක්‍රියාත්මක නොකර හරින්න ඉඩක් ඇති බවට සැකයක් තියෙනව. මේ දීමට අදහස් කළ වරප්‍රසාදය නැති කරන්න යන බවට සැකයක් තියෙනව. දැන් පෙත් සම් අත්සන් කරගෙනත් යනව. එදා ගරු මුදල් ඇමතිතුමා කී අන්දමට රා වරප්‍රසාදය අඩු ගණනේ මාස හයකටවත් අත් හදා බැලීමක් වශයෙන්වත් දීමට විරුද්ධව තීරණයක් දැන් නොගන්න ලෙස ඉල්ලමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනව.

අ. භා. 12.30

**ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්**

*(சேர் அல்பேட் எப். பீரிஸ்)*

(Sir Albert F. Peries)

ගරු සභාපතිතුමනි, තවත් ගරු මන්ත්‍රීන් විශාල දෙනෙක් කථා කරන්න බලාපොරොත්තුවෙන් සිටින නිසා මගේ කථාව දීර්ඝ කරන්න අදහස් කරන්නෙ නැහැ. තවත් අමාත්‍යාංශ නවයක් ඉතිරි වී තිබෙන නමුත් ඒ හැම එකක්ම සාකච්ඡා කරන්න තියෙන්නෙ අද දවස පමණයි. අද රෑ අටට පස්සෙ කිසිම සාකච්ඡාවක් නොකර, ඉතිරි වැය ශීර්ෂ සියල්ලක්ම සම්මත කරන්නයි ඒ නිසා වෙන්නෙ. අධ්‍යාපන ඇමති අංශය වැනි වැදගත් අමාත්‍යාංශ ගණනාවක්ම ගැන සාකච්ඡා කරන්න තබා වචනයක් පවා කථා කරන් කරන්න බැහැ එතකොට. මීට පෙරත් බොහොම වෙලා තියෙනව. ඉස්සර මන්ත්‍රීන් සිය දෙනකු පමණ සිටි කාලේ බල පෑ සථා වර අණපණත්මයි එකසිය පණස් ගණනක් මන්ත්‍රීන් ඉන්න අදත් තියෙන්නෙ. ඒ අනුව කාරක සභා අවස්ථාවට වෙන් කළ දින ගණන දොළහයි ලැබෙන්නෙ. ඒ ගණන 18ක්වත් කළොත් සෑහෙන ප්‍රමාණ යක්වත් සාකච්ඡා කරන්න පුළුවන් වේවි. වහාම ඒ ගැන කටයුතු කර දින 18ක් හෝ වැඩි ගණනක් හෝ දෙන්න තීරණය කරන ලෙස තරයේ ඉල්ලනව. මහජනයා දේශ පාලනය කෙරෙහි වැඩි උනන්දුවක් දක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්වනව. මන්ත්‍රීවරුන් ළඟටත් වැඩි වැඩි යෙන් ජනයා එනව. මහජනයගෙත්, පළාත්වලත් අඩුපාඩුකම් කියා සිටින්න තියෙන එකම ස්ථානය පාර්ලිමේන්තුව පමණයි. විවාදයට සහභාගි වෙන්න ආශා වෙන් හිටපු ඇතැම් මන්ත්‍රීවරුන්ට ඉඩක් ලැබුණේ නැහැ. ඉතිරි වී තිබෙන අමාත්‍යාංශ නාමයක් සාකච්ඡා කරන්න හම්බ වෙන් නෙත් නැහැ. ඒ නිසා ස්ථාවර නීති වෙනස් කිරීමට පියවරක් ගන්න හැටියට ඉල්ලා සිටිනව.

ඒ ළඟට මා නියෝජනය කරන ප්‍රදේශය ගැන වචනයක් දෙකක් කියන්න බලා පොරොත්තු වෙනව. නොයෙකුත් අඩුපාඩු කම් තිබෙනව. ඒව එකින් එක ගෙන විස්තර කරන්න වුවමනා කරන්නෙ නැහැ. හැම ගරු මන්ත්‍රීවරයෙක්ම වාගෙ ඉදිරිපත් කරන ලද එම කරුණුවලට පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමිය පිළිතුරු දෙනු ඇත කියා මා විශ්වාස කරනව.

නාත්තන්ඩිය කොට්ඨාශයෙ ගම්සභා දෙකක් තියෙනව. මැද පළාත සහ යටකලං පත්තුව යනුවෙන් එම ගම් කොට්ඨාශ දෙක නම් කර තියෙනව. මැද පළාත කොට්ඨාශයට වඩා යටකලංපත්තු කොට්ඨා ශය ලොකුයි. මගේ ඡන්දදායක කොට්ඨාශ යෙන් තුනෙන් දෙකොටසක් පමණ යට කලංපත්තු කොට්ඨාශයට අයිතියි. එහි සාමාජිකයන් සියලු දෙනාම වාගෙ කැමැත් තෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙ නව, එම කොට්ඨාශය තුනකට කඩන්න කියා. එම යෝජනාව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියට ලැබී ඇත කියා මා විශ්වාස කරනව. මාරවිල, මහවැව සහ යටකලාන යනුවෙන් එම කොටස් තුනට නම් තබන හැටියටයි, ඉල්ලන්නෙ. එම යෝජනාව කුරුණෑගල සහකාර පළාත් පාලන කොම සාරිස්තුමාට යවා තිබෙන බව පේනව. එසේම එතුමා එම කොට්ඨාශය කොටස් දෙකකට කඩනව නම් වඩා සුදුසුය කියා වාර්තා කර තිබෙන බවක් ආරංචියි. ඊයෙ පෙරේදා එම ගම්සභාපතිතුමා ඇවිත් මා හමු වී කියා සිටිය, එම කොට්ඨාශය කොටස් දෙකකට කැඩීමෙන් වැඩි ප්‍රයෝ ජනයක් ලැබෙන්නෙ නැහැ, කොටස් තුනකට කැඩුවොත් නම් ප්‍රයෝජන ලැබෙ නව කියා. විශාල ජනගහණයක් සිටිනා එම කොට්ඨාශය කොටස් තුනකට කැඩුවොත් වඩා හොඳින් ඒ ඒ කොටස්වල වැඩ කර ගෙන යාමට හැකි වන බවයි, ඔහුගෙ අද අදහස. එම කාරණය ගැන සිත යොමු කර යටකලංපත්තු ගම් සභා කොට්ඨාශය කොටස් තුනකට කඩන ලෙස කරන ලද ඉල්ලීම ස්ථිර කර දෙන හැටියට මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් ඉල්ල නව.

අපේ පළාතෙ පාරවල් බොහොම දුර්ව ලයි. ළිං හැනීම සඳහා අපේ පළාතට ආධාර ඉල්ලා තිබෙනව. නමුත් ලැබෙන්නෙ ඉතා සුළුවෙනුයි. පාලම් සහ බෝක්කු යනාදි යත් ඉතා අබලන් තත්ත්වයක තිබෙනව. ඔය කරුණු සියල්ලක්ම වාගෙ වාර්තා වී තිබෙන නිසා ඒ ගැන වැඩිය කතා කරන්න මා අදහස් කරන්නෙ නැහැ.

නාත්තන්ඩියෙ නගර සභාවක් තිබෙ නව. නාත්තන්ඩියෙ තියෙන ඉරිදා පොළ අරගෙන එය හොඳට පවත්වාගෙන යාමට යෝජනාවක් ස්ථිර කරගෙන තියෙනව, නගර සභාවෙදි. ඒ පොළ අයිතිකාරයා එය රුපියල් 75,000 කට විකුණන්න කැමති වෙලා තියෙනව. තක්සේරු කිරීම අනුව ඒ මුදල ඔහුට ගෙවිය යුතුය කියා ස්ථිර කර ගෙන තියෙනව. එම මුදල ලැබේවිය කියා අපි විශ්වාස කරනව. හොඳ ලස්සනට නගරය පවත්වාගෙන යාමෙ අදහසින් තවත් යෝජනා ඉදිරිපත් කර තියෙනව. ඒව ගැන කල්පනාව යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනව. මැද පළාතෙ නිවාස නැති අයට නිවාස සාදා දීම සඳහා රුපියල් 35,000 ක්ද කොහේද වෙන් කර තිබෙනව. ඒ ගණනට ටෙන්ඩර් භාර ගන්න බැහැ කියනව. තවත් රුපියල් 5,000 ක් විතර ඒ මුදලට එකතු කළොත් හොඳට එම කාර්යය කර ගන්න පුළුවන් වේවි. ඒ ගැන කල්පනාව යොමු කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනව.

ඒ පළාතෙ රෙජිස්ට්‍රාර් ජනරාල් කන්තෝරුව තියෙන්නෙ හලාවතයි. ඔප්පුවක කොපියක් හෝ උප්පැන්නයක් ගන්න ගියාම බොහෝ අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වෙනව. පාසැල් ළමුන් ගෙ උප්පැන්න සහතික පිටපත් එහෙම ගන්න හුඟක් ප්‍රමාද වෙනව. එතරම් ප්‍රමාද වන්නෙ මන්ද කියා මා ප්‍රශ්න කරනවා මේ ප්‍රමාදවීම් ගැන මගේ කොට්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්]

ඨාශයෙ අය ඇවිත් මට නිතරම කරදර කරනව. එම නිසා මේ ගැන දෙපාර්තමේන්තුවට දන්වා සතියක් තුළදිවත් එවැනි සහතික ලබා ගැනීමට හැකි වන වැඩ පිළිවෙළක් යොදා මෙම ප්‍රමාදවීම් වළක්වන ලෙස මා ඉල්ලා සිටිනව.

තවත් කතා කරන්න ගරු මන්ත්‍රීන් සිටින නිසා මගේ කතාව මෙයින් අවසාන කරනව.

**වී. එන්. නවරත්නම් මයා.** (චාවාකච්චේරි)

(திரு. வீ. என். நவரத்னம்—சாவகச்சேரி)

(Mr. V. N. Navaratnam—Chavakach-cheri)

கௌரவ உப அக்கிராசனரவர்களே, எனக்கு முன் பேசிய கௌரவ அங்கத்தவர் இச்சபையிலே பல முக்கிய அமைச்சுக்களைப் பற்றி விவாதிப்பதற்கு சந்தர்ப்பம் கொடுக்கப்படவில்லை எனக் கண்டனம் தெரிவித்தார். அதனை நானும் ஆதரிக்கின்றேன். விவாதிக்கப்படாத அமைச்சுக்களைப் பற்றி கூடிய சீக்கிரத்தில் இச்சபை தனது அபிப்பிராயத்தைத் தெரிவிக்கக் கூடிய வசதிகள் இன்னும் ஓரிருமாத காலத்துக்கிடையில் செய்யப்பட வேண்டும் என்று நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன். இவ்வளவு காலமாக உள்ளூராட்சி அமைச்சுக்கெனத் தனியாக அமைச்சரொருவர் இருந்தார். ஸ்தல ஸ்தாபனங்களுடைய விஷயங்களைப் பற்றிக் கவனிக்க வேண்டியன எவ்வளவோ இருக்கின்றது. அவற்றைப் பற்றிக் கவனிக்க தனியாக ஒரு அமைச்சர் இருக்க வேண்டியது மிகமிக அவசியமாகும். நிலைமை இப்படியிருக்கும் பொழுது உள்ளூராட்சி அமைச்சையும் அதோடு சேர்ந்த வேறு அமைச்சொன்றையும் ஒரே அமைச்சருக்குக் கொடுத்துள்ள காரணத்தினால் பல விஷயங்கள் நல்ல முறையிலே ஆராயப்படாமலிருக்கின்றன. எங்களுடைய அரசாங்கத்தில் பல அமைச்சர்கள் தங்களுக்கென ஒரேயொரு அமைச்சை மாத்திரமே வைத்துக் கொண்டிருக்கின்றார்கள். வேறு சிலருக்கு பல அமைச்சுக்கள் வழங்கப்பட்டிருக்கின்றன. எனவே, சகல அமைச்சர்களும் ஒரேயளவு வேலையை செய்யக்கூடிய விதமாக எங்களுடைய பிரதமர் ஏற்ற ஒழுங்குகளைச் செய்வார் என எதிர்பார்க்கின்றேன்.

கடந்த இரண்டு மூன்று மாதங்களாக உள்நாட்டமைச்சர் மாதத்திற்கு இரு முறை அல்லது மும்முறை என்ற விதத்தில் மாவட்ட சபைகளைப் பற்றிய அறிக்கைகள் சிலவற்றை பத்திரிகைகள் வாயிலாக வெளியிட்டு வந்திருக்கின்றார். அரசாங்கமும் 1960 ஆம் ஆண்டு சிம்மாசனப் பிரசங்கத்தில் மாவட்ட சபைகளைப் பற்றிக் குறிப்பிட்டது. 1961 ஆம் ஆண்டிலும் குறிப்பிட்டது. அத்துடன், 1962 ஆம் ஆண்டு, 1963 ஆம் ஆண்டு, 1964 ஆம் ஆண்டு ஆகிய எல்லா ஆண்டுகளிலும் இது பற்றிக் குறிப்பிட்டதோடு மாத்திரமன்றி, மூன்று, நான்கு மாதங்களுக்கு ஒருமுறை இதுபற்றிய அறிக்கைகளைப் பத்திரிகைகளிலும் பார்க்கக்கூடியதாக இருந்தது. ஆனால், இதுவரையிலும் இது சம்பந்தமாக எந்தவிதமான மசோதாவும் இந்தச் சபையிலே சமர்ப்பிக்கப்படாதது மிகவும் மனம் வருந்தத்தக்க விஷயமாகும்.

மாவட்டச் சபைகள் பற்றி இந்த அரசாங்கம் என்ன கொள்கைகளைத் தன்னுள் வைத்திருக்கின்றது, எப்படிப்பட்ட ஒரு மசோதா இந்தச் சபையிலே சமர்ப்பிக்கப்பட இருக்கின்றது என்பன பற்றி அறியப் பொதுமக்கள் மிகவும் ஆவலாக இருக்கின்றார்கள். எனவே, இதுபற்றி ஒரு திட்டவட்டமான அறிக்கையை இந்தச் சபையிலே உதவி அமைச்சர் அவர்கள் கொடுப்பார்கள் என எதிர்பார்க்கின்றேன்.

சென்ற பல ஆண்டுகளாக ஸ்தல ஸ்தாபனங்கள் சம்பந்தமாகச் சட்டத்திலே கௌரவ அமைச்சர் அவர்களுக்குக் கொடுக்கப்பட்ட மேலதிகமான அதிகாரத்தை அவர் ஜனநாயகக் கொள்கைக்கு மாறாகக் கடைப்பிடித்து வந்திருப்பது மிகவும் வேதனைக்குரிய விஷயமாகும். பல கிராமச் சங்கங்கள் சம்பந்தமாகவும், இன்னும் பல ஸ்தல ஸ்தாபனங்கள் சம்பந்தமாகவும் எந்தவிதமான தேவையுமில்லாத நேரத்திலே அமைச்சர் அவர்கள் தம் மேலதிகமான அதிகாரத்தைப் பாவித்து மக்கள் மனம் புண்படக்கூடிய முறையிலே நடந்துவந்திருக்கிறார்கள். குறிப்பாகச் சில கிராமச் சங்கங்களின் கால எல்லையைப் பொதுமக்களின் விருப்பத்துக்கு மாறாக ஒத்திவைத்திருப்பது கண்டிக்கக்கூடிய ஒரு விஷயமாகும்.

பல ஸ்தல ஸ்தாபனங்கள் தங்களது அதிகாரத்துக்குள் உள்ள பாதைகளை நல்ல முறையிலே பரிபாலிக்கப் பொருள் வசதி இல்லாது

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

மிகவும் கஷ்டப்படுகின்றன. முக்கியமாக, கிராமச் சங்கங்களுக்கு அதன் பாதை வேலைகளுக்காக அரசாங்கத்தால் கொடுக்கப்படும் பணம் போதுமானதாக இல்லை. பெரிய விஸ்தாரமான கிராமச் சங்கங்களுக்கு ஒரு வருடத்துக்கு ஏழாயிரம், அல்லது எட்டாயிரம் ரூபாயைக் கொடுத்து பாதை வேலைகளை நன்ருகக் கவனிக்கும்படி எதிர்பார்க்க முடியாது. அதுமட்டுமல்ல. ஒரு குறிக்கப்பட்ட பாதைக்கு ஒரு முறை பணம் கொடுத்தால் மற்ற வருடங்களிலே அதனை நல்ல முறையில் வைக்க இந்தச் சங்கங்களுக்கு அரசாங்கம் பண உதவி கொடுப்பதில்லை. ஆதலால், வீதிகளைத் திருத்துவதற்காக இந்தக் கிராமச்சங்கங்களுக்கு அரசாங்கம் கொடுக்கும் தொகையை உயர்த்த வேண்டுமென்றும், கிராமச் சங்கங்களினுல் திருத்தப்பட்ட வீதிகளை உடனடியாக போக்குவரத்து இலாகா எடுத்து நடாத்த வேண்டுமென்றும் கேட்டுக் கொள்கின்றேன்.

வடமாகாணத்திலே உள்ள கிராமச் சங்கங்களினதும் விசேஷமாக எனது தொகுதியிலே உள்ள கிராமச் சங்கங்களினதும் எல்லைகள் இருபது, முப்பது வருடங்களுக்கு முன் வரையறுக்கப்பட்ட எல்லைகளாகும். அதன்பின் பல காரணங்களின் காரணமாக, அதாவது, சில கிராமங்களின் ஜனத்தொகை கூடியதன் காரணமாகவும் சில கிராமங்களிலுள்ளோர் குடியேற்றத்திட்டங்களில் சென்று குடியேறியதன் காரணமாகவும் இந்தக் கிராமச் சங்கங்களின் எல்லைகளைத் திருத்தியமைக்க வேண்டியது அவசியமானதாக இருக்கின்றது. எனவே, எல்லாக் கிராமச் சங்கங்களினதும் எல்லைகளைத் திருத்தியமைக்கக்கூடியதாக ஒரு குழுவை இந்த அமைச்சு நியமிக்க வேண்டுமென்றும் அவ்விதம் நியமிப்பதில் ஏதாவது காலதாமதம் ஏற்படின், குறைந்தது அவசியமான இடங்களுக்காவது சில நிபுணர்களை அனுப்பி எல்லைகளையும் வட்டாரங்களையும் நிர்ணயிக்க வழிவகை செய்ய வேண்டுமென்றும் கேட்டுக் கொள்கின்றேன்.

අ. භා. 12.45

ஒரு வருடத்துக்கு முன்னர் சாவகச்சேரி பட்டின சபையை நகர சபையாக உயர்த்த வேண்டுமென்று அமைச்சு சிபார்சு செய்து அந்தத் தீர்ப்பு அரசாங்க கஸட்டிலே பிரசுரிக்கப்பட்டது. அந்த நேரத்திலே நான் ஸ்தல ஸ்தாபன இலாகா அதிகாரியை அணுகி, சாவகச்சேரி நகர சபைக்கு, சாவகச்சேரி கிராம சபையிலே உள்ள இரண்டு வட்டாரங்களைச் சேர்த்துக்கொள்ள வேண்டுமென்று வாதாடினேன். அப்பொழுது அந்த ஸ்தல ஸ்தாபன அதிகாரி அந்த இரண்டு வட்டாரங்களையும் சேர்த்துக் கொள்ள அப்பொழுது நேரமில்லை என்றும், அரசாங்க வர்த்தமானியில் அதைப் பற்றிப் பிரசுரித்த பின்னர் திரும்பவும் எல்லைகளை மாற்ற முடியாது என்றும் என்னிடம் திட்டவட்டமாகக் கூறியது மாத்திரமன்றி, இரண்டு வாரங்களுக்குப் பின்னர் கடித மூலமும் அறிவித்தார். இதற்கு இரண்டு வாரங்களின் பின்னர் அரசாங்க வர்த்தமானி மூலம் அவ்விரு வட்டாரங்களும் சேர்த்துக் கொள்ளப்பட்டிருப்பதாக அறிய முடிந்தது. அந்த ஸ்தல ஸ்தாபன இலாகா அதிகாரி, இது சம்பந்தமாக நீங்கள் கூறியபடி வேறு காரணங்களுக்காக அந்த இரண்டு வட்டாரங்களையும் சேர்த்துக் கொள்ளவில்லை என்று அறிவிக்கவில்லை. வேறு காரணங்களுக்காக, சிலர் சில அமைச்சர்களை சந்தித்ததன் காரணமாக இது நடந்தது என்று என்னுல் அறியக்கூடியதாக இருந்தது. அந்த ஸ்தல ஸ்தாபன இலாகா அதிகாரி உண்மையிலே நல்லவராக இருந்தாலும், அவருக்கு இரண்டு முக்கிய பொறுப்புக்கள் இருப்பதன் காரணமாக தன்னுடைய கடமைகளைச் சரியாகச் செய்ய முடியாத நிலை ஏற்பட்டிருக்கின்றது. அந்த அதிகாரி தனது கடமைகளைச் சரிவரச் செய்ய வேண்டுமானுல் ஒன்றில் உள்ளூராட்சி இலாகாவின் தலைவராக இருக்க வேண்டும். அல்லது உள்ளூராட்சி அதிகார சபையின் தலைவராக இருக்க வேண்டும். அப்படியில்லாமல் இரண்டு பொறுப்புக்களையும் அவர் ஒருவரே வகிப்பதனுல், இரண்டு வேலைகளையும் எப்படித் திருப்திகரமாகச் செய்ய முடியும்? ஆதலால், அவர் ஸ்தல ஸ்தாபன இலாகாவின் முழுநேர அதிகாரியாகக் கடமையாற்ற வேண்டும். ஸ்தல ஸ்தாபன சேவைக் கொமிஷனுக்கு தனியாக முழுநேர தலைவரொருவர் நியமிக்கப்பட வேண்டும் என்று இந்த நேரத்திலே கேட்டுக் கொள்ளுகின்றேன்.

கௌரவ உப அக்கிராசனரவர்களே, இந்தச் சந்தர்ப்பத்தில் உள்நாட்டமைச்சு சம்பந்தமாகச் சில கண்டனங்களையும் நான் தெரிவிக்க வேண்டியவனுக இருக்கின்றேன். யாழ்ப்பாணம் முதலாந்தர உத்தியோகத்தரொருவர் இருக்க வேண்டிய மாவட்டமாகும். இவ்வளவு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නවරත්නම් මයා.]

காலமுமாக முதலாம் வகுப்பிலிருக்கும் சிவில் சேவை அதிகாரிகளே யாழ்ப்பாண மாவட்ட அதிபர்களாகக் கடமையாற்றி வந்திருக்கிறூர்கள். ஆனுல் கடந்த ஓரிரு வருடங்களாக இம் மாவட்டத்திற்கு மூன்ரும் தர, நான்காம் தர உத்தியோகத்தர்களே அனுப்புகின்றீர்கள். இது இம் மாவட்டத்தையே அவமதிப்பதாக இருக்கின்றது. ஒரு மாவட்டத்தில் மாவட்ட அதிபர் தான் முதல் உத்தியோகத்தர். மற்றவர்கள் எல்லோரும் அவருக்குப் பின்னுல் தான். அப்படியிருக்கும் நேரத்தில் இப்பொழுது யாழ்ப்பாணத்தில் வேறு இலாக்காக்களில் மாவட்ட அதிபரிலும் பார்க்க உயர்ந்த சம்பளம் எடுக்கும், அவரிலும் பார்க்க பெரிய வகுப்பில் இருக்கும் உத்தியோகத்தர்கள் இருக்கிறூர்கள். அப்படிப்பட்டவர்களுக்கு மேலாக மூன்ரும் தர அல்லது நான்காம் தர வகுப்பிலிருக்கும் ஒருவரை அனுப்பினுல் அது அங்கிருக்கும் அந்த உத்தியோகத்தர்களுக்கும் பொது மக்களுக்கும் திருப்தியை உண்டாக்குவதாகவே இருக்கும். இதை கௌரவ அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி கவனித்து ஆவன செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

ஒரு மாவட்டத்தில் அரசாங்க அதிபராக இருப்பவர் பொது மக்களுடன் நேரடியாக நெருங்கிப் பழகி, அவர்களுடைய குறைகளேக் கேட்டறிந்து ஆராய்ந்து, அவர்கள் கேட்கும் விண்ணப்பங்களேச் செய்யக் கூடியவராக இருக்க வேண்டும். ஆனபடியால், மாவட்ட அதிபர் எந்த மொழி மாவட்ட மக்களுடைய மொழியாக இருக்கிறதோ அந்த மொழியில் சம்பாஷிக்க வல்லவராக இருக்க வேண்டும். இந்தக் கொள்கைக்கு மாருக யாழ்ப்பாண மாவட்டத்தில், வவுனியா மாவட்டத்தில், மன்ஞர் மாவட்டத்தில், திருகோணமலே மாவட்டத்தில் அரசாங்க அதிபர்கள் பொது மக்களோடு நேரடியாகத் தொடர்பு கொள்ளக் கூடிய வசதியில்லாமலிருக்கின்றது. பொது மக்களுடைய மொழியைப் பேச முடியாத அதிகாரிகளே அனுப்புவது சனநாயகத்துக்கு மாருனது. அந்த மாவட்டத்தில் வசிப்பவர்கள் இந்த அரசாங்கம் எங்களே ஆள்வதற்கு எவரெவரையோ அனுப்புகின்றது என்று எண்ணக் கூடிய விதத்தில் நடப்பது மிக்க வேதனேக்குரிய விஷயமாகும். ஆதலால், இனிமேலாவது ஒவ்வொரு மாவட்டத்திற்கும் அந்த மாவட்ட மக்களுடைய மொழியில் மக்களுடன் பழகக் கூடியவர்களேயே அனுப்ப வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக மரவரி விடயத்தைப் பற்றியும் இச்சந்தர்ப்பத்திலே சில வார்த்தைகள் என்னுல் பேசாமல் இருக்க முடியாது. மரவரி என்பது ஏதோ புதிதாகக் கொண்டுவரப்பட்ட ஒரு திட்டமல்ல. அல்லது எவரும் பயப்படக் கூடிய ஒரு பூதமுமல்ல அந்தத் திட்டம். மரவரி முறையானது யாழ்ப்பாணத்தில் சுமார் இருபது வருடங்களுக்கு மேலாக அமுலில் இருந்து வருகின்றது. தவறணே முறையிலும் பார்க்கச் சிறந்த ஒரு திட்டமே மரவரிமுறை. கடந்த இருபது வருடங்களுக்கு மேலாக நல்ல திட்டமென்று அரசாங்கமும் ஏற்றுக் கொண்ட இந்த திட்டத்தை நாட்டிற்கு அபாயம் விளேவிக்கக்கூடிய ஒரு திட்டமென்று சில அரசியல் வாதிகள் கூறுவது விசித்திரமானதாக இருக்கிறது. முக்கியமாக ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்தவர்கள் மரவரி முறையை இப்பொழுது கண்டிக்க ஆரம்பித்துள்ளனர். கௌரவ உடுப்பிட்டித் தொகுதிப் பாராளு மன்ற அங்கத்தவர் (திரு. எம். சிவசிதம்பரம்) அவர்கள் குறிப்பிட்டதுபோல ஐக்கிய தேசியக் கட்சியினரது ஆட்சிக் காலத்தில்தான் மரவரி முறை யாழ்ப்பாணத்தில் கொண்டுவரப்பட்டது. ஐக்கிய தேசியக் கட்சியினர் சுமார் பத்து வருடங்களுக்கு மேலாக நாட்டின் பீடத்தில் இருந்திருக்கிறூர்கள். மரவரி முறையினுல் சமயம் பாழாகும், பொது மக்கள் பாதிக்கப்படுவார்கள் என்று ஐக்கிய தேசியக் கட்சியினர் நினேத்திருந்தால் அவர்கள் தாம் அதிகாரத்திலிருந்தபோதே மரவரி முறையை யாழ்ப்பாணத்தில் நிற்பாட்டி இருக்கலாம். ஆனுல் உண்மை என்னவென்ருல் மற்றைய சகல திட்டங்களிலும் பார்க்க மரவரி முறை சிறந்ததாக இருக்கிறது. இவ்விடயத்தில் அரசாங்கம் விட்டுக்கொடுக்காமல் உறுதியாக இருக்க வேண்டும். மற்றைய பிரதேசங்களில் மரவரி முறையை அமுல் செய்வதில் தடைகள் இருந்தால் அவற்றை அரசாங்கம் நீக்கவேண்டும். தற்பொழுது அமுலில் இல்லாத வவுனியா, மன்ஞர் மாவட்டங்களிலும் மரவரி முறையை அமுலுக்குக் கொண்டு வரவேண்டுமென்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යූ. බී. වන්නිනායක මයා. (යාපහුව)**

*(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)*

(Mr. U. B. Wanninayake—Yapahuwa)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ, මගේ ආසනයේ ඇති අඩුපාඩු පිළිබඳව, වචන ස්වල්පයක් කියන්නට මා මේ අවස්ථාවේදී නැගිට සිටි බව පළමුවෙන් කියන්නට කැමතියි. අනිකුත් බොහෝ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළාක් මෙන්ම මගේ පළාතේ ගම්බද පාරවල තත්ත්වයත් ඉතාම කනගාටුදායක බව පළමු කොටම නොකියා බැහැ. ගම්බද පාරවල් ගණනාවක්ම තවත් අවශ්‍ය වී තිබෙන අතර දැනට තිබෙන පාරවල් අළුත්වැඩියා කිරීමට—ඒවා නඩත්තු කිරීමට—මුදල් නැතිකම නිසා අපේ පළාතේ ගම් සභාවලට ඉතා අමාරු තත්ත්වයකට මුහුණ දීමට සිදු වී තිබෙනව. අපේ ආසන ඉතා විශාල ඒවා. ඒ නිසා පාරවල් ප්‍රමාණය හැතැප්ම වශයෙන් විශාල බව සත්‍යයක්. පාරවල් නඩත්තු කිරීමට වර්ෂයක් වර්ෂයක් පාසා අවශ්‍ය මුදල් දැන් අවුරුදු ගණනකින් නොලැබුණු නිසා මේ පාරවල තත්ත්වය ක්‍රමක්‍රමයෙන් පරිහාණියට පත් වී තිබෙනව. මේ පාරවල දුර්වල තත්ත්වය නිසා ඒ පළාත් වාසීන්ට කරදර රාශියකට මුහුණ පෑමට සිදු වී තිබෙනව. කොටින් කියතොත් හදිසි අවස්ථාවකදී ලෙඩකු ආරෝග්‍යශාලාවකට ගෙන යාමට පවා අමාරු තත්ත්වයක් බොහෝ පළාත්වල තිබෙනව. එසේ ගෙන යන අවස්ථාවලදී මරුමුවට පත් වූ ලෙඩුන් ගැනද අපට නොයෙක් අවස්ථාවලදී අසන්ට ලැබී තිබෙනව. එසේම මේ පාරවල දුර්වල තත්ත්වය නිසා පාලන කටයුතු සම්බන්ධයෙනුත් යම් යම් බාධා ඇති වී තිබෙනව. උසස් මුලාදෑනීන්ට හෝ අනිකුත් මුලාදෑනීන්ට ගමනාගමනයට තිබෙන අපහසුකම නිසා, ඔවුන්ගේ රාජකාරි පවා කර ගෙන යාමට අමාරු තත්ත්වයක් ඒ පළාතේ පවතිනව.

ගරු සභාපතිතුමනි, අපි කව්රුත් දන්නව, මේ කාලයේ රථ වාහන හිඟයක් තිබෙන බව. ඒවා අමුතුවෙන් අළුත්වැඩියා කිරීම ඒ තරම් ලෙහෙසි වැඩක් නොවෙයි. ඒ නිසා, පාලන කටයුතුවල යෙදී සිටින නිලධාරීන්ගේ ගමනාගමනයට තිබෙන බාධා නිසා, පාලන කටයුතු හුඟක් අත්හිට තිබෙන බව කියන්නට කැමතියි.

ඒ පළාතේ නොයෙකුත් සංවර්ධන ව්‍යාපාර ආරම්භ කරල තියෙනව. අළුතෙන් ජනපද ආරම්භ කරල තියෙනව. ගම් පළල් කිරීමේ ව්‍යාපාර කීපයක් ආරම්භ කර තිබෙනව. නිලධාරීන්ට එහා මෙහා යාමට තිබෙන අමාරුව නිසා ඒ කටයුතු හුඟක් දුරට ඇණ හිට තිබෙනව. ගැමියන් විසින් ඉතා අමාරුවෙන් නිපදවන එළවලු අලෙවි කර ගැනීම සඳහා මධ්‍යස්ථානවලට ගෙන ඒමට ඇති අපහසුකම නිසා ඔවුන්ට විශාල පාඩු විඳීමට සිදු වී තිබෙනව. සංවර්ධනය ගැන කියනව නම්, වෙන කිසිම දෙයක් නොකළත් ඒ ගම්වලට අවශ්‍ය පාරවල් ටික හරිගස්සා දෙනව නම්, අවශ්‍ය අළුත් පාරවල් ටික හදා දෙන අතර තියෙන පාරවල් හොඳ තත්ත්වයට පත් කරනව නම් වැදගත් සංවර්ධනයක් ඒ මගින්ම ඒ පළාතට සිදු වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු කර වීමට කැමතියි.

පාරවල් නිසි පිළිවෙළට නඩත්තු කිරීම ඉතා වැදගත් දෙයක්. පාරවල් නඩත්තු කිරීම සඳහා එක ඒක ගම් සභාවලට කම්කරුවන් කීප දෙනකු බැගින් පත් කර තිබෙනව. ඒ කම්කරුවන්ට ඒ වැඩය කරන්නට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. ඉස්සර දුන්න මුදලටම සමාන මුදලක් දැනුත් දෙන්නෙ. රුපියලේ වටිනාකම දැන් බොහෝ දුරට අඩු වෙලා තියෙනව; තව තවත් අඩු වේගන යනව. දෙන මුදලෙන් කරන්න පුළුවන් වැඩ ප්‍රමාණය ක්‍රමක්‍රමයෙන් හීන වේගන යනව. ඒ නිසා මේ කරුණු සියල්ලම සලකා අනික් කරුණු පසෙක තබා සංවර්ධනයට දියයුතු රුකුලක් වශයෙන්වත් ගම්සභා පාරවල් සෑහෙන තත්ත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය කටයුතු අප්‍රමාදව සලසන මෙන් මම ඉල්ලා සිටිනවා.

තවත් එක් විශාල අඩුපාඩුවක් ගැන වචනයක් කියන්න තිබෙනවා. අපේ පළාතට ඉතාමත් අවශ්‍ය දෙයක් තමයි, ළිං. අවුරුදු පතා ළිං කැපීම සඳහා සෑහෙන සම්පූර්ණ මුදල් වෙන් කරන බව අපි දන්නවා. එහෙත් දැන් අවුරුදු කීපයක සිට ළිං කැපීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

සඳහා දෙන මුදල් අඩු වී තිබෙනවා. සමහර විට රජයට මුදල් හිඟකම නිසා වෙන්න ඇති, එසේ කරන්නේ. අපේ පළාත්වලට දීර්ඝ නියං කාලයක් තිබෙනවා. අවුරුද්දේ වැසි ලැබෙන කාලය මාස කීපයකට සීමා වී ඇති අතර නියං කාලය ඉතා වැඩි කාල යක් පවතිනවා. මේ නිසා බීමට පවා ජලය හිඟවන කාලයක් ඇති වෙනවා. ඒ නිසා ඒ පළාත්වල ජනයාට අවශ්‍ය තැන්වල ළිං තනා දීම විශාල සේවයක්. ඒ පළාත්වල ළිං කැපීම සඳහා ගම්කාර්ය සභාවලට දෙන ආධාර මුදල් පුළුවන් තරම් වැඩි කරන ලෙස මම ඉල්ලා සිටිනවා. පසු ගිය කාල යේදී රුපියල් 1,000 කට තැනීමට පුළුවන් ළිඳක් අද තැනීමට රුපියල් 3,000 ක් 4,000 ක් පමණ වුවමනා කරනවා. ඒ පළාත්වල ළිං අනික් පළාත්වල ළිංවලට වඩා ගැඹුරට කැණිය යුතුයි. නැති නම් සෑහෙන තරම් වතුර ලබාගැනීමට අපහසුයි. ඒ නිසා සෑම ගම්කාර්ය සභාවකටම එක විදියටම මුදල් වෙන් කිරීමෙන් ළිං කැණීම එක විදියටම කරන්න අමාරුයි. කරුණු එසේ හෙයින් අපේ පළාත්වල පුළුවන් තරම් ළිං කැපීම සඳහා ආණ්ඩුව ආධාර දෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ග්‍රාම සේවකයින් ගැනත් වචනයක් කිය යුතුයි. ග්‍රාම සේවකයින්ට තමන්ගේ ගමේ සේවය කිරීමට ඉඩ නොදීම දැන් ප්‍රතිපත්ති යක් වශයෙන් පිළිගෙන තිබෙනවා. ඒ නිසා ඔවුන්ට බොහෝ විටම වැඩ කරන්න සිද්ධ වෙන්නේ පිට පළාත්වලයි. අපේ ප්‍රදේශවල කුලියට ගැනීමට ගෙවල් නැති නිසා ග්‍රාම සේවකයින්ට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. බොහෝ අවස්ථාවලදී ඔවුන්ට තම කාර්යාල සුදුසු ස්ථානයක පිහිටුවා ගැනීමට බැරිව යනවා. ග්‍රාම සේවක කාර්යාල කොට්ඨාශයේ මධ්‍ය ස්ථානයක පිහිටු විය යුතු බව කවුරුත් පිළි ගන්නවා ඇති. ඔවුන්ගේ කාර්යාල පිහිටුවා ගැනීමට සුදුසු මධ්‍යස්ථාන ලබාගැනීමට ඇති අපහසුකම් නිසා බොහෝ විට මධ්‍ය ස්ථාන නොවන මුල්ලක තම කාර්යාල පිහිටුවා ගැනීමට සිද්ධ වෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත්හිට වනවා.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවනු ලැබ, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.*

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

ගරු සභාපතිතුමනි, දිවා භෝජනය සඳහා විසිර යන්නට පෙර මා කථා කරමින් සිටියේ අප ප්‍රදේශයේ ග්‍රාම සේවකයන්ට සුදුසු මධ්‍යස්ථානවල ඔවුන් ගේ කාර්යාල පිහිටුවීමටත් ඔවුන්ට නේවා සිකව විසීමටත් ගෙවල් නොමැතිකම නිසා ඔවුන්ට මෙන්ම මහජනයාටද සෑහෙන පමණ කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබීම ගැනයි. සුදුසු මධ්‍යස්ථානවල ගෙවල් ලබා ගැනීමට තිබෙන අපහසුකම නිසා ග්‍රාම සේවකයන්ට භාර වී ඇති ප්‍රදේශයන්හි මුළුවල පදිංචි වීමට ඔවුන්ට සිදු වී තිබෙනව . මේ නිසා ඔවුන්ටත් මහ ජනයාටත් කරදරයක් සිදු වී තිබෙන හෙයින් සුදුසු මධ්‍යස්ථානවල මේ ග්‍රාම සේවකයන්ට ඔවුන්ගේ කාර්යාල පිහිටුවා ගැනීමටත් නේවාසිකව විසීමටත් සුදුසු ගෙවල් සපයා දීම ගැන මේ අමාත්‍යාංශය මගින් කිසියම් වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම් හොඳයි. කාර්යාලයට යාමට නේවාසිකව සිටීමේ පහසුකම්ද ඇති කර තොත් ග්‍රාම සේවකයන්ට මෙන්ම මහ ජනතාවටද ලොකු පහසුවක් සැලසෙනවා.

උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු ගැනද වචන කීපයක් කියන්නට කැමතියි. උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු ගැන සමීක්ෂණය පටන් ගත්තේ පසුගිය රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේදීයි. ඒ සමීක්ෂණය උඩරට දිස්ත්‍රික්ක කීපයකට පමණක් සීමා කළ බව එවකට ඒ සම්බන්ධව කටයුතු භාරව සිටි ඇමතිතුමා ප්‍රකාශ කළා. එවිට, මුළු උඩරට ප්‍රදේශයටම සේවයක් වන හැටියට අනික් දිස්ත්‍රික්කද මේ සමීක්ෂණ යට ඇතුළත් කරන ලෙස අප ඉල්ලා සිටියා. ඉන් පසු එදා සිටි ඇමතිතුමා කීවේ ඒ සමීක්ෂණය දිස්ත්‍රික්ක කීපයකට සීමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළත් ඒ සමීක්ෂණයෙන් ලබා ගන්නා අදහස් අනුව කටයුතු ක්‍රියාත්මක කිරීමේදී උඩරට ප්‍රදේශයේ සියලුම දිස්ත්‍රික්ක ඊට ඇතුළත් කරන බවයි. ඒ නිසා පසුගිය අවුරුදු දෙකේදීම අප මේ ගැන රජයට කරුණු ඉදිරිපත් කළා. පසුගිය අවුරුද්දේ අයවැය ලේඛනය ගැන සාකච්ඡා පැවැත්වෙන විටදීත් මා පමණක් නොව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් පැමිණ සිටින වෙනත් ගරු මන්ත්‍රීවරුන්ද මේ ගැන රජයට කරුණු ඉදිරිපත් කළා. ඇමතිතුමා ඒ ඉල්ලීම් ගැන සලකා බලා මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවටත් ලියා එවා තිබුණා. ඇමතිතුමා එසේ ලියා එවා තිබුණේ උඩරට ගැමි පුනරුත්ථාපනය සම්බන්ධයෙන් කටයුතු කරන මණ්ඩලය මඟිනුයි. අපත් ලෑස්ති වී වැඩ පිළිවෙළක් සකස් කර ඒ මණ්ඩලයට යැව්වා. නමුත් අද වනතුරු අපට ඒ ගැන සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ. ඒ ගැන සැලකිල්ල යොමු කොට ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රතිඵල අපට ලබා දීමට ඉදිරිපත් වන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගෙන් මා ඉල්ලා සිටිනවා. මා නියෝජනය කරන ප්‍රදේශයේ අඩුපාඩු ගැන මීට වඩා යමක් කියන්නට මා ඇත් බලාපොරොත්තු වන්නේ නැහැ. තවත් වරක් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටින්නේ අපේ ප්‍රදේශයේ පාරවල් සකස් කිරීමටත් ළිං කැපීමටත් සෑහෙන තරම් මුදල් අප්‍රමාදව වෙන් කර දෙන ලෙසයි. කොට්ඨාශයේ අඩුපාඩු ගැන කියන්නේ එපමණයි. වෙනත් කාරණයක් ගැන තවත් වචන දෙක තුනක් කියන්නට අදහස් කරනවා.

This question relates to a grievance of the Local Government Service Pensioners' Association.

I understand that as far back as 1st October, 1957, the Cabinet made a decision that two concessions, namely, the commutation of pension and the addition of five years of service as a climatic bonus, be granted to Local Government Service employees and the Cabinet also decided that the decision would be with retrospective effect.

The association has made representations on several occasions after that, and I understand that the decision has been conveyed to the local authorities, that the concessions be granted to the members of this association ; but nothing has been done as yet.

I also understand that the employees of three local bodies, Colombo, Kandy and Galle, are already enjoying these concessions.

The request of this association is that the concessions be extended to their members also, and as I have already said that decision has already been made by the Cabinet and it is only a matter of implementing the decision.

I appeal to the hon. fair Parliamentary Secretary to take up this question and see that the members of this association are also given the benefit of these concessions.

අමරනන්ද රත්නායක මයා. (පස්සර)
(திரு. அமரானந்த ரத்நாயக்க—பஸ்ஸறை)
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව සලසා දීම ගැන ප්‍රථමයෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මුලින්ම මා අදහස් කරන්නේ උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය ගැන වචන කීපයක් කථා කරන්නටයි. මේ ක්‍රමය යටතේ ඌව පළාත දියුණු වෙනවායයි එඩිතරව ප්‍රකාශ කිරීමට තරම් අපට පුළුවන්කමක් නැහැ. ඇත්තෙන්ම උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය ඉතාමත් සුළුයි. අපේ ප්‍රදේශ උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයට අසු වන නිසා පළාත් පාලන ආයතනවලට ආණ්ඩුවෙන් දෙන ආධාර මුදල්ද අඩු කරන අතර ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු මඟින් කළ යුතු වැඩ කටයුතු සඳහාද අඩුවෙන් මුදල් දිය යුතුය කියන හැඟීමක් ඒ ඒ දෙපාර්තමේන්තුවල තුළ තිබෙනවා. මේ ගැන වැලිමඩ ගරු මන්ත්‍රීතුමාද කරුණු ප්‍රකාශ කළා. උසස් නිලධාරීන්ගේ අදහසක් තිබෙනවා, උඩරට ගැමි කොමිෂන් සභාවෙන් ආධාර ලැබෙනවාය කියා. මේ නිසා ඒ ඒ දෙපාර්තමේන්තුවලින් වැඩ කටයුතු කරවා ගැනීමට අපහසු තත්ත්වයක් අද ඇති වී තිබෙනව. ඇත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරතන්ද රත්නායක මයා.]
වශයෙන්ම උඩරට ගැමි කොමිෂන් සභාව ආරම්භ කරන ලද්දේත්, එයට මධ්‍යම පළාත, ඌව පළාත ඇතුළත් කරන ලද්දේත්, අධිරාජ්‍ය වාදීන් මේ රට පාලනය කරන අවදියේදී උඩරට ජනතාව, විශෙෂ යෙන්ම මේ පළාත්වල ජනතාව, ඒ අධිරාජ්‍ය වාදීන්ට විරුද්ධව සටන් කළ නිසා, ඒ ප්‍රදේශ දියුණුවෙන් අඩු තත්ත්වයක තිබුණු නිසයි. එසේ අධිරාජ්‍ය වාදීන්ට විරුද්ධව ක්‍රියා කළ නිසා, ඔවුන් මේ පළාත් වල දියුණුව සම්පූර්ණයෙන්ම අමතක කර දමා තිබුණා. එපමණක් නොවෙයි, ඒ ප්‍රදේශවල සිංහල ජනතාවට දියුණු වන්නට ඉඩ නොදී පාගා දමා තිබුණා. මෙන්න මේ විධියේ තත්ත්වයක් තිබුණු නිසා උඩරට ගැමි කොමිෂන් සභාවක් පිහිටුවා මේ ප්‍රදේශ දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කළා. උඩරට ප්‍රදේශයට අයත් වෙනත් නොදියුණු ප්‍රදේශ තිබෙන බව අප පිළිගන්නා නමුත් පළමුවෙන් මේ ප්‍රදේශ දියුණු කිරීමට කටයුතු යෙදීමෙහි ඇති වරදක් මට පෙනෙන්න නැහැ. දෙනියායෙ මන්ත්‍රීතුමා (සුමනපාල දහනායක මයා.) සඳහන් කළා, උඩරට වෙනත් නො දියුණු ප්‍රදේශ තිබෙනවාය, එයින් ප්‍රදේශ කීපයක් පමණක් තෝරා ගෙන දියුණු කිරීම වැරදිය කියා. නමුත් ඒ ගරු මන්ත්‍රීවරයාට මතක් කර දෙන්න කැමතියි—අප ඉතාමත්ම සන්තෝෂ වෙනව උඩරට වෙනත් පළාත්වල වත් ආධාර දෙනවා නම්, දියුණු කරනවා නම්—වෙනත් ප්‍රදේශ දියුණු කරනවා තබා, ගැමි කොමිෂන් සභාව මගින් දියුණු කිරීමට ආධාර කිරීමට, දැනට තෝරා ගෙන තිබෙන ප්‍රදේශවලටවත් නියම අන්දමට ආධාර නොලැබෙන බව. එම නිසා, යම්කිසි විධිය කින් ඒ ප්‍රදේශවලට දෙන ආධාර අඩු කිරීමට කල්පනා කරනවා නම් එය අසාධාරණ යක් බව මතක් කරන්න සිදු වී තිබෙනව.

ගරු සභාපතිතුමනි, උඩරට ගැමි කොමිෂන් සභාවේ ඌව ප්‍රදේශය වෙනුවෙන් පෙනී සිටින්නෙ ටී. බී. රත්නායක මහත්මයා පමණයි. විශාල ප්‍රදේශයක් වන ඌව ප්‍රදේශය වෙනුවෙන් මෙයට වඩා වැඩි සංඛ්‍යාවක් නියෝජනය කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටිනව. ඒ වාගේම මතක් කළ යුතු කාරණයක් තිබෙනව. ඒ උඩරට ගැමි කොමිෂන් සභාව මගින් මගේ ප්‍රදේශයේ කරන කාර්යයන් දෙකක් ගැනයි. එයින් එක් කටයුත්තක් නම් ලුනුගල සිට පල්ලෙකිරුව හරහා මැදගම දක්වා පාරක් තැනීමයි. මෙම පාර වැටී ඇත්තේ සරුසාර ඉඩකඩම් ඇති ගම්නියම් ගම් මැදින්. මෙම පාර තැනීම දෙපැත්තෙන්ම ආරම්භ කර තිබෙනව. ලුනුගල පැත්තෙන් තැනීමට ආරම්භ කළ පාර පසු ගිය අවුරුදු එක හමාර තුළම සකස් කර තිබෙන්නෙ සැතපුම් භාගයකටත් අඩු ප්‍රමාණයකුයි. මේ ගැන විමසා බැලූ විට දැන ගන්නට ලැබුණෙ, උඩරට ගැමි කොමිෂන් සභාවෙන් ඒ සඳහා ආධාර මුදල් ලැබී නැති බවයි. මේ වැඩ කටයුතු ඉක්මනින් හමාර කරන ලෙස මම ඉල්ලා සිටිනව. මේ සම්බන්ධයෙන් ලිපි රාශියක්ම ලියා තිබුණත් සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ. මා කලිනුත් සඳහන් කළ පරිදි, තවත් නියෝජිතයන් එම ප්‍රදේශය වෙනුවෙන් නියෝජනය කිරීම සඳහා ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිනව. එපමණක් නොව, තෝරා ගත් ප්‍රදේශවල වැඩ කටයුතුවත් හරිහැටි කෙරෙන්නේ නැතිනම් අනික් ප්‍රදේශ අරගෙන වැඩ කටයුතු කරන්නට ලැබෙන්නේ කවදාද කියා මේ අවස්ථාවෙදී ප්‍රශ්න කරන්න කැමතියි.

අ. භා. 2.15

මැටිගහතැන්න ඇකිරිගම පාර අවුරුදු ගණනාවක් තිස්සේ තවමත් හදා ගෙන යනව. නමුත් තවම හැතැප්ම හතරක වැඩවත් අවසන් කර ගන්න බැරි වුණා. ඇත්ත වශයෙන්ම මෙම පාර තැනීමේ කටයුතු මේ වැනි තත්ත්වයකට පත් වී තිබෙන නිසා පළාත්වැසියන් බලවත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙනව. රථවාහන ගමනා ගමනය සඳහා පලල් වශයෙන් පාර කපා තිබුණත් පාර හරිහැටි සකස් කර නැති නිසා රථ වාහන ගමන් කරන්න බැහැ. කොටින්ම, අලුත් මෝටර් රථයකට වුණත් මේ පාරෙ ගමන් කරන්නට සිදු වෙන්නෙ පළමුවන ගියරය දමාගෙනයි. ඒ තරම් නරක තත්ත්වයකයි එය තිබෙන්නෙ. ඒ ප්‍රදේශයේ ජනතාව බස් ගමනාගමනය කරන ලෙස ඉල්ලා සිටියත් මෙවැනි පාරක බස් ගමනාගමනය කරන්නෙ කොහොමද ? එම නිසා මේ පාර මට්ටම් කර, නියම අන්දමට සෑද ගමනාගමනයට සුදුසු වන පරිදි සකස් කරන ලෙස ඉල්ලා සිටිනව. මේ කාරණා පිළිබඳව පැහැදිලි කර දීම සඳහාත්, ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාට මේ දේවල් පෙන්නා දීම සඳහාත්, අවස්ථාවක් ලැබෙනවා ඇතැයි මම කල්පනා කරනවා. ගරු ඇමතිතුමාත් ඒ ස්ථානයට කැඳවාගෙන ගොස් ඒ පාර පෙන්වා දෙන්ට මා අදහස් කරනවා. මේ කරුණ ගැන ඉතා ඉක්මනින් ක්‍රියා කර ඒ පාරේ බස් රථයක් ධාවන කරවිය හැකි අන්දමට වංගු හරිගස්වා, ඒ පාරට වියදම් කළ මුදලින් මහජනයාට ප්‍රයෝජනය ලබා ගැනීමට අවස්ථාව සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයට ස්තුතිවන්ත වෙන්ට ඕනෑ, විශාල ප්‍රචාරයක් නැති වුණත්, ගාලගෝට්ටි යක් නැති වුණත්, එම අමාත්‍යාංශය මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කර තිබෙන නිසා. ලංකාවේ බොහෝ නොදියුණු ප්‍රදේශවල ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ අළුතෙන් ඇති කර කාර්යාල පිහිටුවා මහජනයාට ඒ කාර්යාලවලින් සිදුවිය යුතු සේවය ලබා ගැනීමට ඉඩ සලසා තිබෙනවා. පස්සර ඡන්ද කොට්ඨාශයට අළුත් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් අවශ්‍ය බව මා කියා සිටියේ 1962 දියි. ඒ අනුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් අළුතෙන් ඇති කර ඒ මගින් විශාල සේවයක් දැනට සිදු වී ගෙන යන බව මා කියන්නෙ සන්තෝෂයෙන්. බදුල්ල ආදී තවත් ප්‍රදේශ රාශියකත් අළුතෙන් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ වෙන් කර කාර්යාල පිහිටුවා දුප්පත් මහජනයාට තමන්ගේ රාජකාරි පහසු වෙන් ඉටු කර ගැනීමට අවස්ථාව සලසා තිබෙනවා. ඒ කටයුතු සම්බන්ධයෙන් දිසාපතිවරුන් අමාත්‍යාංශයත් විශාල මහන්සියක් දරා තිබෙන නිසා අමාත්‍යාංශ යටත් ඒ නිලධාරීන්ටත් ප්‍රශංසා කිරීම මගේ යුතුකමක්ව තිබෙනවා.

එපමණක් නොව ග්‍රාම සේවක මහත් වරුන්ගෙන් වැඩි දෙනකුගේ සේවාවන් ඉතා හොඳින් ඉටු වන බව මතක් කරන්ට කැමතියි. අපි බලාපොරොත්තු වුණු අන්දමට ඒ උදවිය ගෙන් බොහෝ දෙනකු ඉතා අවංකව සේවය කරගෙන යන බව පෙනී යනවා. මගේ ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරීන් අවංක අන්දමින් සිය සේවය කර ගෙන යන බව මතක් කරන්ට කැමතියි. මන්ත්‍රීවරුන් කීප දෙනකු ප්‍රකාශ කළාක් මෙන්, ග්‍රාම සේවක නිලධාරීන් තම ගමේම සේවය නොකරන නිසා ඔවුන්ට කාර්යාලයක් රජයෙන් සපයා දීම හෝ කාර්යාලයක් සපයා ගැනීමට ආධාර මුදලක් දීම හෝ කළ යුතුයි.

ගම්කාර්ය සභා අංශයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විශාල වැඩ පිළිවෙළක් පසුගිය කාලයේ ගෙන ගියා. ගම්කාර්ය සභා රාශියක්ම අළුතෙන් බෙදා වෙන් කළා. මා හිතන්නෙ මේ අවුරුද්ද අවසානයේදී අලුතින් ගම්කාර්ය සභා රාශියක් මේ රටේ ඇති වෙනවා ඇති. මගේ කොට්ඨාශයේ කලින් තිබුණේ ගම්කාර්ය සභා 2½ ක් පමණයි. ඒ කියන්නේ මගේ කොට්ඨාශයට සම්පූර්ණයෙන් අයත් ගම්කාර්ය සභා 2 කුත්, පස්සර හා මහියංගන ආසන දෙකටම අයිති එක ගම්කාර්ය සභාවකුත් යනුවෙන් ගම්කාර්ය සභා 2½ක් මගේ කොට්ඨාශය තුළ තිබුණා. පස්සර ගම්කාර්ය සභා ප්‍රදේශය ගම්කාර්ය සභා දෙකකට වෙන් කළා. ආසන දෙකටම අයිතිව තිබුණු ගම්කාර්ය සභාව වෙනස් කර, මගේ ආසනය තුළ තිබුණු ඊට අයිති ප්‍රදේශය අළුත් ගම්කාර්ය සභාවක් බවට පත් කළා. පට්ටිපොළ ගම්කාර්ය සභාව සුළු නගර සභාවක් කර එහි කොටසක් වෙනම ගම්කාර්ය සභාවක් වශයෙන් වෙන් කළා. ඔය ආදි වශයෙන් ගම්කාර්ය සභා 2½ කුත් සුළු නගර සභාවකුත් තිබුණු මගේ කොට්ඨාශයේ දැන් සුළු නගර සභා 2 ක් සහ ගම්කාර්ය සභා 4ක් ඇති කර තිබෙනවා. මේ කරුණු අනුව ගැමි ජනතාවගේ ඕනෑ එපාකම් පිරිමසා ගැනීමට ගැමි ජනතාවට මේ දෙපාර්තමේන්තුවෙන් විශාල සේවයක් ඉටු කර තිබෙන බව අවංකව ප්‍රකාශ කරන්ට කැමතියි. ඒ වෙනුවෙන් අමාත්‍යාංශයට අපේ ප්‍රශංසාව හිමි වෙනවා.

සභාපතිතුමනි, ගම්කාර්ය සභා මගින් කරවන ලද රථවාහන ගෙන යා හැකි පාරවල් සම්බන්ධයෙනුත් මේ අවස්ථාවේදී මතක් නොකරම බැහැ. මගේ කොට්ඨාශයේ, ලුණුගල — වැදිවෙල — ගල්ලිඳ කපොල්ල පාර, පට්ටිපොල ගම්කාර්ය සභා වෙන් කෙරෙනවා. කහටරුප්ප පාර ඔය පළාතේ ගම්කාර්ය සභාවෙන් නිම වී තිබෙනවා. මවුස්සාගොල්ල බිබිලේගම පාර රථ වාහන ගෙන යෑමට හැකි විධියට පස්සර ගම්කාර්ය සභාව මගින් කපා තිබෙනවා. එමෙන්ම මඩුගස්තලාව පාරත් රථවාහන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

ගෙන යා හැකි පරිදි ඔයපළාත ගම්කාර්ය සභාව මගින් කපා තිබෙනවා. පස් කපා රථ වාහන ගෙන යෑමට හැකි පරිදි පාර පළල් කරගෙන යනවා මිස ඒවාට තාර දැමීමට හෝ ඒවා නියම විධියට නඩත්තු කිරීමට මුදලක් වියදම් කරන්නේ නැහැ. ඒ සඳහා මුදල් ලැබී නැහැ. ලුනුගල වැදිවෙල පාරට පමණක් 1 වැනි සැතපුමට තාර දැමීමට රුපියල් 10,000 ක් පමණ දී තිබෙනවා. නමුත් සැතපුම් 2 ක් පමණ පාර කපා තිබෙනවා. අවුරුද්දෙන් අවුරුද්ද පාර සේදී යෑම නිසා කල් යෑමේදී ඒ වියදමෙන් ප්‍රයෝජනයක් නැති වී යනවා. පාරක් ආරම්භ කළා නම්, ඒ පාරේ වැඩ අවසාන වන තුරු පාර නඩත්තු කිරීමට ආධාර දීම අපේ යුතුකමක්ව තිබෙනවා. එසේ නැත් නම් වියදම් කළ මුදලින් කිසිම ප්‍රයෝජනයක් නැහැ. කඳුකර ප්‍රදේශවල කොයි විධියට පස් කපා පාර සකස් කළත් වැසි කාලය වන විට ඒවා සේදී යනවා. ඒ නිසා ඒ ගම්කාර්ය සභාවලින් කපා ගෙන යන පාරවලට නියම විධියට ආධාර දුන්නොත් තමයි ඒ වියදම් කළ මුදලින් නියම ප්‍රයෝජන ලබා ගන්න පුළුවන් වන්නෙ.

මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම මේ අමාත්‍යාංශය සම්බන්ධව තම තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වෙන් සිටින නිසා දීර්ඝ කාලයක් කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. මට මේ අවස්ථාව දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතරම, උඩරට කොමිෂන් සභා යෝජනා ක්‍රියාත්මක කිරීමේදී දෙපාර්තමේන්තු තුළත් අමාත්‍යාංශ තුළත් වැරදි අවබෝධයක් තිබෙනවා නම්, ඒවා අමතක කර දමා කට යුතු කරන හැටියට ඉල්ලා සිටිනවා. එදා උඩ රට ගැමි කොමිෂන් සභාව ඇති කළේ, එදා අධිරාජ්‍යවාදීන් විසින් මේ ප්‍රදේශය අමතක කර දමා, නොදියුණු තත්ත්වයකින් ගෙන ආ නිසා, ඒවා යථා තත්ත්වයට පත් කිරීමට විශේෂ මුදලක් දිය යුතුය කියන යෝජනාවක් අනුවයි. ඒ නිසා උඩ රට ගැමි කොමිෂන් සභාවෙන් වැඩ කෙරෙනවා යයි සිතා ගෙන සාමාන්‍ය වශයෙන් ගම්කාර්ය සභාවලට සෞඛ්‍යය අතින්, අධ්‍යාපනය අතින්, නැත්නම් වෙනත් අංශයකින් දෙන්නට තිබුණු ආධාර මුදල් නතර නොකර මේ ප්‍රදේශය දියුණු කර ගැනීම සඳහා සෑම කොට්ඨාශයකටම දෙන මුදල් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මේ ප්‍රදේශය සඳහාත් වෙන් කිරීමට අධිෂ්ඨාන කර ගන්නා හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

යූ. පී. වයි. ජිනදාස මයා. (කුණ්ඩසාලෙ)
(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலெ)
(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු සභාපතිතුමනි, ස්වදේශ සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මේ රටෙන් කච්චේරි ක්‍රමය ඉවත් කිරීම ගැන සාකච්ඡාවක් පසුගිය අවුරුදු කීපය ඇතුළත පැවතුණා. කච්චේරි ක්‍රමය යල් පැනපු, එමෙන්ම මේ කාලයට ඔබින්නේ නැති, මහජනයාට හිරිහැර ඇති වන, ක්‍රමයක් හැටියට සෑම මන්ත්‍රීවරයෙක්ම පාහේ මේ ගරු සභාවේදී ප්‍රකාශ කර තිබෙනවා. ඒ වෙනුවට යොදන්නට යනවා යයි කියන දිස්ත්‍රික් සභා ක්‍රමයත් පිළිබඳව කරුණු ඉදිරිපත් කරනවා නම් අපි සන්තෝෂ වෙනවා. ඒ අනුව කච්චේරි ක්‍රමය ඉතා ඉක්මණින් මේ රටින් තුරන් කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම ග්‍රාම සේවකයින් සම්බන්ධවත් ප්‍රශ්න කීපයක් මතු වුණා. ග්‍රාම සේවක ක්‍රමය හොඳයි. එයට මම සතුටුයි. නමුත් එය දැන් ටිකක් වෙනස් ක්‍රමයකට සැලැස්වීගෙන එනවා. පරණ ගම්මුලාදෑනිකම් කළ අයත් මේ ග්‍රාම සේවකයින් හැටියට තේරී සිටිනවා. ඒ අය විසින් අලුත් අයටත් දූෂණ පුරුදු කර ගෙන එන බව මගේ කොට්ඨාශයෙන්ම සමහර අවස්ථාවල පෙනෙන්න තිබෙනවා. ඒ අයට පදිංචි වන්නට නියම වශයෙන් තැනක් නැහැ. ඔවුන්ට පදිංචි වන්නට සිදු වී තිබෙන්නෙ පරණ ගම්මුලාදෑනීන්ගේ ගෙවල. එහෙම නැත්නම් ඔවුන්ගේ නෑදෑයින්ගේ ගෙවලයි. ඒ නිසා මේ අලුත් අයටත් පරණ ගම්මුලාදෑනීන්ගේ දූෂණ පුරුදු පුහුණු කර ඒ අනුව කටයුතු කරන්නට පුරුදු කරගෙන යන වැඩ පිළිවෙළක් දැන් ගම්වල ඇති වේගන යනවා. ඒ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගේ අවධානය යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

ඊළඟට උඩරට ගැමි කොමිෂන් සභාව ගැන මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීන් කීප දෙනෙක්ම කථා කළා. ඇත්ත වශයෙන්ම උඩරට ගැමි කොමිෂන් සභාවේ වැඩ පිළිවෙළ ගැන අපට සතුටු වෙන්නට පුළුවන් කමක් නැහැ. ඒ වැඩ කටයුතු ආරම්භ කළේ 1952 දීයි. ඊට පසු 1956 දී එක්තරා නිලධාරියෙක් පත් කරගෙන ඌව හා මධ්‍යම ප්‍රදේශ දෙකේ කටයුතුවලට රුපියල් ලක්ෂ 30, 35, 40 බැගින් වෙන් කරනව. හැබැයි, ඒ වැඩ කරන්නෙ අර කොමිෂන් සභාවෙ වාර්තාව අනුවමයි. ඊට වඩා ටිකක්වත් වෙනස් කරන්නෙ නැහැ. අවුරුදු 10 ක් ඇතුළත මේ රටේ තත්වය හුඟක් වෙනස් වී තිබෙනව. ඒ නිසා දැන් රටේ තත්ත්වය අනුව යම්කිසි වැඩ පිළිවෙළක් යොදනවා නම් පමණයි අපට උඩරට ගැමි කොමිෂන් සභාවෙන් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්.

උඩරට ගැමි කොමිෂන් සභාව මගින් තනන පාරවල් ගැන අපි බලමු. ඒ පාරවල් සෑදීම භාර කරන්නෙත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවටයි. විරුද්ධ පාර්ශ්වයේත් ආණ්ඩු පක්ෂයේත් ගරු මන්ත්‍රීන් තුළ රජයේ වැඩ දෙපාර්තමේන්තුව කෙරෙහි ලොකු කලකිරීමක් තිබෙනව. ඇත්ත වශයෙන්ම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට තවත් වැඩ පැවරීමෙන් සතුටුදායක අන්දමින් ඒවා ඉෂ්ට වෙන්නෙ නැහැ. ඒ නිසා මේ කටයුතුවලට උඩරට ගැමි කොමිෂන් සභාවේම වෙනමම අංශයක් ඇති කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ විධියට වෙනමම වැඩ දෙපාර්තමේන්තුවක් උඩරට ගැමි කොමිෂන් සභාවේම ඇති කළොත්, මේ ප්‍රදේශ වඩාත් දියුණු කරන්ට පුළුවන් වේවිය කියා මා කල්පනා කරනවා. නමුත් පසුගිය අවුරුදු 4 ඇතුළතදීම ඒ සම්බන්ධයෙන් සතුටුදායක වැඩ පිළිවෙළක් දෙපාර්තමේන්තුවෙන් සිදු වුණේ නැහැ. උඩරට ප්‍රදේශ ගැන සැලකිල්ලක් නොදක්වන ඇමතිවරුන් සිටිනවාද කියා මා තුළ සැකයක් තිබෙනව. එහෙම නැත්නම් උඩරට ප්‍රදේශ ගැන වුවමනාවක් නොදක්වන ඇමතිවරුන් ඉන්නවාය කියා මා තුළ සැකයක් තිබෙනව. මධ්‍යම, වයඹ, උතුරු-මැද, මධ්‍යම වයඹ ආදී වශයෙන් කොයි තරම් ප්‍රදේශ එකතු වුණත් අපට කමක් නැහැ. නමුත් සෑහෙන ප්‍රමාණයට මුදල් වෙන් කරන්න ඕනැ. ඒ වාගේම සෑහෙන වැඩ පිළිවෙළක් යොදන්න ඕනැ. ඒ වාගේම මේ කටයුතු කරන්න බලගතු නිලධාරි සංඛ්‍යාවක් වෙන් කරන්න ඕනැ. ඒ වාගේම උඩරට ගැමි කොමිෂන් සභාවේ කාර්යාලය මහනුවර පිහිටුවිය යුතුයි. ඒ කාර්යාලය මහනුවර තිබුණොත් තමයි අපේ ඕනෑඑපාකම් ගැන සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන්ට පුළුවන් වන්නෙ. ඒ වාගේම උඩරට ගැමි කොමිෂන් සභාව සංශෝධනය කළ යුතුයි. ඒ වැඩ කටයුතුත් වෙනස් කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට කාරක සභාවක් පත් කරන මෙන් මා ගරු පාර්ලිමේන්තු ලේකම් තුමියගෙන් ඉල්ලා සිටිනවා. මේක ඉතාමත් ඉක්මනින්ම කළ යුතු දෙයක්. නැත්නම් ප්‍රයෝජනයක් ඇති වෙන්නෙ නැහැ. නිකම් දෝෂාරෝපණවලට ලක් වෙනවා පමණයි.

ගම් කාර්ය සභා පිළිබඳවත් සෑහෙන පල පුරුද්දක් තිබෙන නිසා ඒ ගැනත් මතක් කරන්ට සතුටුයි. ගම් කාර්ය සභා දැන් හුඟක් දියුණුයි. ගම් කාර්ය සභාවලට දැන් සෑහෙන ආදායම් මාර්ග තිබෙනවා. ඒ වුණත් ගම් කාර්ය සභාවල වැඩ ශීඝ්‍රයෙන් කරගෙන යෑමට නොයෙක් අවහිරකම් තිබෙනව. කාර්මික නිලධාරීන්ගේ හිඟකම, බදු අය කර ගැනීමට තිබෙන අපහසුකම් ආදී අවහිරකම් තිබෙනව. බදු නොගෙවන අයගෙන් බදු අය කර ගැනීමට තිබෙන නීති ඉතාමත් දුර්වලයි. බදු නොගෙවන අයගේ බඩුමුට්ටු වෙන්දේසි කර මුදල් ගන්න පුළුවන්. නමුත් එය ක්‍රියාවේ යොදවන්න පුළුවන් නීතියක් නොවෙයි. කිසිම ගම් කාර්ය සභාපතිවරයෙක් එය කරාවිය කිය මා සිතන්නෙ නැහැ. උසාවියට ගියොත් සමහර විට හිඟ බදු මුදල් අය කර දෙනවා. නමුත් සමහර උදවිය ඒවා ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. ඒ විධියට බදු අය කිරීම සම්බන්ධයෙන් නීතියේ දුර්වලකම් තිබෙනවා.

අ. භා. 2.30

තවත් ප්‍රශ්නයක් තිබෙනව මස් කඩ සම්බන්ධයෙන්. නොයෙකුත් අවස්ථාවලදී වැරදි අන්දමින් මස් කඩ සඳහා අවසරපත්‍ර දී තිබෙන බව මට දැනගන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදාස මයා.]

ලැබී තිබෙනව. සමහර උදවිය ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ නොකර මස් කඩ සඳහා අවසර පත්‍ර දී තිබෙනවා. ඒ වාගේම නුසුදුසු ස්ථානවලත් මස් කඩ ඇති කිරීම සඳහා අවසර පත්‍ර දී තිබෙනව. මේ විධියට හිතුවක්කාර අන්දමින් මස් කඩ සඳහා අවසර දී තිබෙන අයට දඬුවම් කිරීම පිණිස වහාම ඒ සම්බන්ධ නීති සංශෝධනයක් කළොත් හොඳයි. එසේ නොකිරීම නිසා මනුෂ්‍යයන්ට වුවමනා ආහාරයක් සම්බන්ධයෙන් අද නොයෙක් විධියේ හානිකර අශෝභන සිඛීන් ඇති වන බව පෙනෙනව. මේවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ගම් කාර්ය සභාවලට තවත් බලතල ඕනෑ. දූෂණ වැඩ කරන ගම් කාර්ය සභාපතිවරුන්ට විරුඩව දඬුවම් කිරීමට නීතියක් සම්පාදනය කිරීම ගැන මා දෙපාර්තමේන්තුවේ සැලකිල්ල යොමු කරවනව. ඒ වාගේම ගම් කාර්ය සභාවල සභාපතිවරුන් කරන දූෂණවලට, වැඩ නොකර මුදල් ලබා ගැනීම, මුදල් වංචා කිරීම ආදී දූෂණ වලට, මේ පසුගිය අවුරුදු කීපය තුළදීම දඬුවම් කර නැහැ. දූෂණ වැඩ කළ ගම් සභාපතිවරයෙක් අස්ව ගියොත් ඔහුට විරුද්ධව ක්‍රියා කර ඒ මුදල් අය කර ගැනීමටත්, ඔහුට දඬුවම් කිරීමටත් නීතියෙන් ඉඩක් නැත යන කථාවක්. මට දැනගන්නට ලැබුණා. ඒක වැරදියි. මම දන්නවා, මගේ කොට්ඨාශයේම එක්තරා ගම් සභාපතිවරයෙක් රුපියල් 20,000 ක් වංචා කර තිබෙනව. පොලිසියෙන් නොයෙක් විධියට ක්‍රියා කරනව. සී. අයි. ඩී. එකෙනුත් එනව. නමුත් නඩු නැහැ. උසාවියට ගෙන්වලත් අත්සන් ගෙන තිබෙනව. ඒ ෆයිල් එක මම බැලෙව්ව. රත්තල් තුන හමාරක පමණ ලියකියවිලි පමණක් තිබෙනව. එයින් කිසිම වැඩක් සිදු වී නැහැ. පාතදුම්බර හාරිස්පත්තුවෙ දැනට සිටින ගම් සභාපතිවරයාත් නියෝජිතවරුත් මට චෝදනා කරනව, මම ඒ වැරදි වසනවාය, ඒ දූෂණ වැඩ කරන උදවිය ආරක්ෂා කරනවාය කියා. එම නිසා ම ඉතා ඕනෑකමින් මේ ගරු සභාවේදී පාර්ලිමේන්තු ලේකම්තුමියට දන්වා සිටිනව පසු ගිය කාලයේ දූෂණ වැඩ කළ උදවියට දඬුවම් කිරීමට හැකි පමණ ඉක්මනින් කටයුතු කරන්නය කියා.

ඊ ළඟට මම දැනගන්න කැමතියි, 1958දී පමණ පළ කර ඇති සුරා සූදු කොමිෂන් සභා වාර්තාව සම්බන්ධයෙන් මේ ආණ්ඩුව අනුගමනය කරන්නට බලාපොරොත්තු වන ප්‍රතිපත්තිය මොකක්ද කියා. පුංචි දරුවාගේ සිට මහල්ලා දක්වා මේ රටේ සිටින ජනතාවට තේ වතුර පොවන්නා වාගේ මත් පැන් පෙවීමද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය? මත්පැන් සම්බන්ධවත් රේස් සූදුව සම්බන්ධවත් පැහැදිලි ප්‍රකාශයක් කළ යුතුයි. එසේ නැතිව එක් එක් කෙනාට වුවමනා හැටියට, තම තමන් වටා සිටින හත් අට දෙනා කියන හැටියට අපට රා ටිකක් බොන්න ගහක් මැදගන්න ඉඩ දෙන්නය, අරක්කු මිල අඩු කර දෙන්නය, කියා කියන පළියට කටයුතු කිරීමට තීරණයකට බහිනවාද යන්න පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් ආණ්ඩුව හෝ ඒ අමාත්‍යාංශයේ ඇමතිතුමා හෝ කරනවා නම් හොඳයි.

එක්කෙනෙක් කියනව ගෙයක් ගෙයක් පාසා තැබෑරුම් තබා රා දෙන්න ඕනෑය කියා. තවත් එක්කෙනෙක් කියනව අරක්කු මිල අඩු කරන්න ඕනෑය කියා. තවත් කෙනෙක් කියනව කෑම කන ගමන්ම බොන්න සෑම කෙනකුටම බීර දෙන්න ඕනෑය කියා. මට තේරෙන්නෙ නැහැ ආණ්ඩුවෙ ඇමතිවරුන්ගෙ ප්‍රතිපත්තිය මොකක්ද කියා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රකාශයක් කරන්න ඕනෑ. ලක්ෂ ගණන් වියදම් කර පළ කර තිබෙන සුරා සූදු කොමිෂන් සභා වාර්තා ගැන ක්‍රියා නොකර නිශ්ශබ්දව සිටීමට කිසිම හේතුවක් නැහැ. එම නිසා එම වාර්තාව සම්පූර්ණයෙන්ම නැවත වරක් ඉදිරිපත් කර ඒ සම්බන්ධයෙන් මහජන මතය සහ ආණ්ඩුවේ මතය ලබාගෙන යම් කිසි වැඩ පිළිවෙළක් ඇති කරන හැටියට මම විශේෂයෙන් ඉල්ලනව. මත්පැන් ව්‍යාපාරයට මම කොහෙත්ම කැමති නැහැ. බ්‍රැන්ඩි වේවා, අරක්කු වේවා, බීර වේවා මොනවා හෝ මත්පැනක් මේ රටේ තිබෙනවාට මම කැමති නැහැ. මම කියන්නෙ නැහැ මේවා එක වරම තුරන් කරන්න පුළුවන්ය කියා. ඒ වාගේම මොනම ආගම් කතෘවරයකුටවත් මොනම දේශපාලනඥයකුටවත් එක වරම යම් කිසි දෙයක් කරන්න පුළුවන් වුණාය කියා මම කියන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අපි අනුක්‍රමයෙන් ඒවා නැති කළයුතුයි. එම නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේවා වැඩි කිරීමද, නැත් නම් නැති කිරීමද කියන එක ගැන අපි දැනගන්න ඕනෑ. මට පෙනෙන්නෙ නම් රටේ නරක වැඩවල ට ආණ්ඩුව තවත් ආධාර කරනවා වාගෙයි. දැන් මේ සම්බන්ධයෙන් රටේ විශාල ප්‍රසිද්ධියක් තිබෙනව. මම කල්පනා කරනවා මේකට අනුබල දෙන උදවිය පස්සට ලොකු අමාරුවකට වැටේය කියා. මේ රටේ මහජනයා ඥනාන්විතයි. ඔවුන් හොඳින් කල්පනා කරනව. ආගම කෙරෙහි සැලකිල්ලක් දක්වා ආගමානුකූලව ජීවත් වන පිරිසක් අද රටේ ඉන්නෙ. ලංකාව, චීනය හෝ රුසියාව වැනි රටවල් හැටියට සලකන්න ඕනෑ නැහැ. මේ ප්‍රශ්නයේදී "රජා හෝ මා හෝ ගංගා හෝ" කීවා වාගේ මොන අතින් හෝ විනාශයට පත් වෙනව. මේ කාරණය සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වා ක්‍රියා නොකලොත් විනාශයකට පත් වන්න ඉඩ තිබෙන නිසා මේ ගැන නැවත වරක් කල්පනා කරන හැටියට මම ඉල්ලා සිටිනව.

අවසාන වශයෙන් තවත් කාරණයක් සඳහන් කරන්න කැමතියි. පළාත් පාලන සේවා කටයුතුවලදී නොයෙකුත් ප්‍රශ්න මතු වෙනව. පළාත් පාලන කොමසාරිස්තුමා සම්බන්ධයෙන් ඊයෙ පෙරේදා රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. වීරසේකර මයා.) ප්‍රශ්නයක් මතු කළා. ඒ සම්බන්ධයෙන් වැඩිය කථා කිරීමට මා කැමති නැහැ. පළාත් පාලන කොමසාරිස්තුමා ගැන යමක් කියන්න යන්නෙ නැහැ. මාත් අවුරුදු විස්සක් පමණ ගම් කාර්ය සභාපතිවරයෙකු හැටියට කටයුතු කර තාබෙනව. මගෙ කාලෙ පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ කිරීමට ඒ ඒ හැම දෙනාම හොඳට වැඩ කළා.

වී. සී. ජයසූරිය මහත්මයා ගැන මම දන්නව. ඒ මහත්මයා හොඳට වැඩ කළා. ඒ මහත්මයට තමන් වෙත පැවරෙන වැඩ රාජකාරි ගැන හොඳ දැනුමක් තිබුණා. බොහොම දක්ෂ විධියට වැඩ කළා. පසු කාලයක ඒ මහත්මයා අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් විශයෙන් උසස් තනතු-

රක් ලැබී ගියා. මහතන්තිල මහත්මයටත් හොඳ දැනුමක් තිබෙනව. පළාත් පාලන කොමසාරිස්වරු දෙතුන් දෙනෙක් හිටියා. මහත්මයත් බොහොම දක්ෂයි. කොයි හැටි වෙතත් පාර්ලිමේන්තුවට ඇවිත් නිලධාරීන්ගේ හිත් දූෂ්‍ය වන විධියට කථා කිරීමෙන් හොඳක් වෙන්නෙ නැහැ. නිලධාරීන් කෝප කිරීමෙන් වැඩක් නැහැ. දිගට හරහට තර්ක කරමින් නිලධාරීන් විවේචනයට ලක් කිරීම හොඳ නැහැ. ඒ විධියට නොකර අපට හොඳටම පුළුවන්කම තිබෙනව ඒ අය ලවා රටට නියම සේවයක් ලබා දීමට. තමන් වෙනුවෙන් නිදහසට කියන්න තිබෙන දෙයක් කීමට ඉඩක් නැති තැන්වලදී නිලධාරීන් විවේචනය කිරීමෙන් සිදු වන්නෙ ඔවුන් කිසිම දෙයක් කිරීමට ධෛර්‍යයක් නැති පිරිසක් වීමයි. නිලධාරීන් අධෛර්‍යවත් කිරීම සුදුසු නැහැ. ඒ අයත් පිට අය නොවෙයි, අපේම අයයි. අපේම කොටස් හැටියටයි නිලධාරීන්වත් සලකන්න ඕනෑ. ඒ නිසා යම් යම් දේ කරන විට ඒවා කල්පනාවෙන් කරන්න ඕනෑ. යම් යම් දේ කියන විටත් කල්පනාවෙන් කියන්න ඕනෑ. වෙනත් දෙපාර්තමේන්තුවල වගේම පළාත් පාලන දෙපාර්තමේන්තුවේත් ඉන්නව ඕනෑවට වඩා ඉදිමුණු අහංකාර උප කොමසාරිස්වරු. වුවමනා නම් ඒ අයගෙ නම් වුණත් කියන්න දන්නව. මා එක්කත් නිරපරාදේ හැප්පිලා තියෙනව. ඒ වුණාට මා නම් කැමති නැහැ මෙවැනි තැනකදී පුද්ගලයන්ගෙ නම් ඉදිරිපත් කරමින් චෝදනා කරන්න.

කා අතිනුත් වැරදි සිදු වෙනව. ඒ වගේම නිලධාරීන් අතිනුත් වැරදි වැඩ කෙරෙනව. ඒවා ඕනෑකමින්ම කරන දේවලද කියා සොයා බලන්නත් ඕනෑ. වැරදි තිබෙනවා නම් ඒවා නියම විධියට ඉදිරිපත් කර ඇමතිතුමා ලවා හෝ අමාත්‍යාංශය භාර ස්ථාවර ලේකම්තුමා ලවා හෝ ඒ කටයුත්ත භාර වෙනත් උසස් නිලධාරියෙකු ලවා හෝ අවවාද කරන්න ඕනෑ. මහජන මන්ත්‍රීන්ගෙන් කෙරෙන්න තියෙන දේ අතර ඒකත් වැදගත් තැනක් ගන්නව. මහජන මන්ත්‍රීන් විශේෂයෙන්ම ගම්බද සාමාන්‍ය ජනතාව සමගයි ගම් කාර්ය සභාවල කටයුතුවලදී මෙන්ම වෙනත් පොදු වැඩවලදීත් වැඩියෙන්ම සිටින්නෙ. ඒ නිසා පළාත් පාලන දෙපාර්ත-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදස මයා.]

මේන්තුවේ කොමසාරිස්තුමා පමණක් නොව උප කොමසාරිස්වරුනුත් ගැමි ජනතාව ගැන හොඳට දැන ගන්න ඕනෑ. ඒ තත්ත්වය ඇති කිරීමට උත්සාහ කරන ලෙස ඉල්ලා සිටිනව. දැනට සිටින පළාත් පාලන කොමසාරිස්තුමා ඉතා හොඳින් වැඩ කරන බව විශේෂයෙන්ම කියන්න ඕනෑ .එහෙත් ඒ සම්බන්ධයෙන් ඊට වඩා යමක් කියන්න යන්නෙ නැහැ. වැඩි වෙලාවක් නැති නිසා වෙනත් දේ ගැනත් දැන් කථා කරන්න අදහස් කරන්නෙ නැහැ. ඒ නිසා මා ඉදිරිපත් කළ කරුණු කීපය ගැන විශේෂ සැලකිල්ල දක්වන හැටියට ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

ගාමිණී ජයසූරිය මයා. (හෝමාගම)

(திரு. காமினி ஜயசூரிய—ஹோமாகம)

(Mr. Gamani Jayasuriya—Homagama)

ගරු සභාපතිතුමනි, අවුරුදු දෙක තුනකට පෙර සල්පිටි කෝරළයේ උඩුගහපත්තුව ගම්කාර්ය සභාව තුළ මුඩුක්කු සංහාරය සඳහා රුපියල් 33,000 ක පමණ මුදලක් වෙන් කළා. නිවාස තැනීමටයි මුදල් වෙන් කළේ. දැන් ගෙවල් තනා ඉවරයි. ගෙවල් නැති උදවිය ඒවායේ පදිංචි කර වීමේ අවස්ථාවයි දැන් ඇවිත් තිබෙන්නෙ. ගම්කාර්ය සභාවට මුඩුක්කු සංහාරය සඳහා මුදල් දුන් අවස්ථාවේ යම්කිසි කොන්දේසි වගයක් ඉදිරිපත් කර තිබෙනව. ගෙවල් හැදුවට පස්සෙ ඒවා ලබා ගන්න අය එතෙක් තමන් හිටපු පැල්පත් කඩා දමන්න ඕනෑ කියන එකයි ඒ කොන්දේසිය. ඒ පළාතේ සමහර අය පැල්පත් හදාගෙන ඉන්නව. තවත් සමහර අය කුලියට ගත් ගෙවල ඉන්නව. ඒ දෙගොල්ලම ගෙවල් නැති අයයි. කුලී ගෙවල ඉන්න අය ගම්කාර්යසභා නිවාස ක්‍රමයෙන් ගෙවල් ඉල්ලනව. ගෙවල් ලැබුණම තමන් කලින් හිටපු කුලී ගෙවල් කඩන්න අවසර දෙන්න බලයක් ඒ අයට නැහැ. අයිතිකාරය වෙන කෙනෙක් නිසා කුලියට ඉන්න මිනිහට ඒක කරන්න බැහැ. මට ගෙයක් ලැබුණු නිසා මා කුලියට හිටපු උඹේ ගේ කඩා දමාපන් කියන්න බැහැ. මේ කොන්දේසිය නිසා ගම්කාර්ය සභාවෙන් හදපු ගෙවල් පදිංචියට දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනව. ගෙවල් හිඟය පිළිබඳ ප්‍රශ්නය ගම්බදව පවතින්නෙ කොළඹ නගරයේ තිබෙන අන්දමට නොවේය කියලයි මා හිතන්නෙ. ඒ නිසා මේ ගැන විශේෂයෙන් කල්පනා කර, ගම්කාර්ය සභාවට දී තිබෙන මේ කොන්දේසි අස්කර වෙන ඕනෑම සාධාරණ කොන්දේසියක් දමන්න. ඊට ගම්කාර්ය සභාව ලැස්තියි. එහෙත් ගෙවල් දෙන්න ඉස්සර වෙලා කලින් හිටපු ගේ කඩා දමන්න කියන නියෝගය අයින් කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් මා ඉල්ලා සිටිනව.

අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමා ආණ්ඩුවේ සුරාබදු ප්‍රතිපත්තිය අනුව රුපියල් පහළොවක් ගෙවන සෑම ඉල්ලුම්කරුවෙකුටම පොල් ගහක් බැගින් මදින්න අවසර දෙනවය කිව්වා. මේ ගැන අද රටේ ලොකු ගෝසාවක් තිබෙනව. මෙම රා ප්‍රතිපත්තිය සාර්ථක වුණොත් දේශපාලන වාසිය අතින් අපට සන්තෝෂ වෙන්න පුළුවනි. ඒ මගින් දේශපාලන වශයෙන් අපට ලොකු ප්‍රයෝජනයක් සැලසෙන්න ඉඩ තියෙනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මුල් අවස්ථාවෙ කෙසේ වෙතත් මෑතදී ජයග්‍රහණය ලබා ගත්තෙ, ඒ කියන්නෙ මේ ආණ්ඩුව ජයග්‍රහණය ලබා ගත්තෙ, වැඩි වශයෙන් ස්ත්‍රී පක්ෂයෙ ඡන්දවලිනුයි. එය කවුරුන් විසිනුත් පිළිගන්නව ඇති. මේ ප්‍රතිපත්තිය උඩ නම් එක කාන්තාවකගෙ ඡන්දයක්වත් තමුන්නාන්සෙලාට ලැබෙන්නෙ නැහැ. ඒ අතින් බලාගෙන යනකොට තමයි, දේශපාලන වශයෙන් අපි සන්තෝෂ වන්නෙ. නමුත් මෙම සභාවෙ වගකීමක් ඇති මන්ත්‍රීවරුන් හැටියට එවැනි දේ නොවෙයි අප කල්පනා කළ යුත්තේ. මේ රටේ මහජන දියුණුව හා මහජන ආරක්ෂාව ගැන ඊට වඩා පුළුල් ලෙස කල්පනා කරලයි, යම් කිසි ප්‍රතිපත්තියක් පිළිගත යුත්තෙ. කුණ්ඩසාලෙ ගරු මන්ත්‍රීතුමා (යූ. පී. වයි. ජිනදස මයා.) මේ ගැන බොහොම පැහැදිලි වශයෙන් කරුණු ඉදිරිපත් කර කීව, ප්‍රතිපත්තියක් තියෙනව නම් එය කුමක්ද කියා ප්‍රකාශ කරන ලෙස. මේ ගැන කරුණු හොයන්න කොමිෂන් සභාවක් පත් කොට, ඒ මගින් සපයන වාර්තාව කියවා බලා, එය සභාවට ඉදිරිපත් කර ප්‍රතිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තියක් හැටියට යමක් පිළිගත්තොත්, සමහරවිට අපට එවැන්නක් පිළිගන්න හැකි වන්න පුළුවනි. එසේ නැතුව එක පුද්ගලයෙක් කාටවත් නොකියාම එක පාරටම මෙවැන්නක් හදිසියෙ ඉදිරිපත් කර රටේ කලබලයක් ඇති කිරීම නුවණට හුරු දෙයක් නොවෙයි. අපේ පළාත්වල කතාවක් තියෙනව, "ගෙරි මස් කනත් බෙල්ලෙ බැඳගෙන කන්න එපා" ය කියා. අද මේ රටේ තියෙන්නෙ එවැනි තත්ත්වයක් බව කියන්න සිදු වී තිබෙනව. බොන මිනිහගෙ බීම කවදාවත් නවත්වන්න බැහැ. බුදුන් වහන්සෙගෙ කාලයෙ දීවත් ඒ විධියට බීම නවත්වන්න පුළුවන් වුනේ නැහැ. ඒ ගැන අපි හොඳට දන්නව. එම කරුණ දන්නව වගේම, බෞද්ධ රටක මිනිසුන් වශයෙන් අපේ රටේ අය මත්පැනට පිළිකුලක් දක්වන බවත් අපි දන්නව. ගම්බද මඟුල් ගේක අඩි ගහන අය සිටින්න පුළුවනි. කාමරේ කට ගිහින්, අඩියක් ගහල, කට පිහදා ගෙන, බලත් විටකුත් කාල එළියට එන සිරිතක් තමයි, ඒ අය අතර තියෙන්නෙ. මත්පැන් ගැන ස්වභාවයෙන්ම පිළිකුලක් දක්වන නිසයි, එසේ කරන්නෙ. එසේ දක්වන පිළිකුල් ස්වභාවය හොඳ දෙයක් බව්යි, මගේ පුද්ගලික හැඟීම. සමහරු අයානව, කුකුල් මස් කෑම වැරදිද කියා. කුකුල් මස් කෑවට අපි කුකුළන් මරන වද? වැඩි දෙනා කුකුළන් මරන්නෙ නැහැ. සමහර අය කියන්න පුළුවනි——

**සේනපාල සමරසේකර මයා.** (අක්මීමන)
*(திரு. சேனபால சமரசேக்கர—அக்மீமன)*
(Mr. Senapala Samarasekara—Akmeemana)

කන නිසයි මරන්නෙ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

සමහර අය කියන්න පුළුවනි, ඒක බොරු වැඩක් කියා.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

උගුරට හොරා බෑත් කනව.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

කන්න පුළුවන්නම්, මැරුවට මොකද, කියා සමහර අය අහන්න පුළුවනි. එම තර්කය පිළිගන්න අය මේ මත්පැන් ප්‍රශ්නයත් ඒ අයුරින්ම පිළිගන්න පුළුවනි. මස් කන නිසා මැරුවට මොකද යන තර්කය පිළිගන්න පුළුවන්කම තියෙන, ආගමික පරිසරයක නොහැදුණු, ආගම කෙරෙහි විශ්වාසයක් නොදක්වන උදවිය රා ප්‍රශ්නයත් ඒ අයුරින්ම පිළිගන්න පුළුවනි.

අ. භා. 2.45

අපේ රට බෞද්ධ රටක්. මත්පැන් ගැන පිළිකුලක් අපේ රටේ තියෙනව. කසිප්පු කාරය වුණත් තමාගෙ පුතා කසිප්පු කාරයකු වෙනව නම් ඊට අකමැතියි. කොතරම් බොන තාත්ත කෙනෙක් වුණත් තමාගේ පුතා බොනවා දකින්න කැමති නැහැ. එවැනි තත්ත්වයක් මේ රටේ තියෙනව. මා අහන්නෙ එවැනි තත්ත්වයක් තිබීම හොඳද, නරකද කියායි.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

කොහොමද, කසිප්පු ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

එවැනි තත්ත්වයක් තිබීම හොඳ නම්, රා මැදීමට අවසර දීම හොඳ නැති දෙයක් හැටියටයි මට පෙනෙන්නෙ. මොකද, ඒ තත්ත්වය වෙනස් වෙනව, මේ අන්දමට රා මැදීමට ඉඩ දුන්නොත්. අද තිබෙන චාරිත්‍ර, අදහස් සියල්ලක්ම වෙනස් වන්න පුළුවන් කව්රු හෝ පිළිගන්නව නම් අද රටේ තිබෙන ඒ විධියෙ චාරිත්‍ර වෙනස් වීම හොඳය කියා රා මැදීමට ඉඩ දුන්නට වරදක් නැහැ. ඒ වගේම රා මැදීමෙන් කසිප්පු වළක්වන්න පුළුවන්ය කියා ඔප්පු කරන්න පුළුවන් නම් ඒත් රා මැදීමට අවසර දීම ගැන මට එකඟ වන්න පුළුවන්. මගේ හැඟීමේ හැටියට රා ඇති කිරීමෙන් කවදාවත් කසිප්පු නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

කරන්න බැහැ. තමුන්නාසෙල බබ්බු නොවෙයි. ගම් පළාත්වල සංචාරය කරන තමුන්නාන්සෙල දන්නව, අර සැර බීමට පුරුදු වී සිටින මිනිසුන්ට කවදාවත් රා සැහෙන්නෙ නැති බව. ලාභයට යම් කිසි සැර බීමක් හදා දෙන්නට තමුන්නාන්සෙලට පුළුවන් නම් සමහර විට කසිප්පු නැති කරන්නට පුළුවන්. නමුත් ප්‍රධාන කාරණාව මේක ආර්ථික ප්‍රශ්නයක් වීමයි. රැකී රක්ෂා ඇති කරල, දුප්පත්කමේ දුක අඩු කරන්නට ආර්ථික තත්ත්වය දියුණු කරල තිබුණොත් මේවා මේ රටේ ප්‍රශ්න හැටියට ඇති වන්නෙ නැහැ. මේ කරුණු ගැන තමුන්නාන්සෙලා කල්පනා කරන්න ඕනෑ.

ඒ සමගම තවත් කාරණයක් කිව යුතුව තිබෙනව. මේ රටේ පොල් තිබෙනව. මේ රටේ නිපදවන පොල්වලින් වැඩි කොටසක් පාවිච්චි කරන්නේ මේ රටේ ජනතාවයි. පිටරට යවන්නේ ඉතා සුළු කොටසයි. තව අවුරුදු හයක්, හතක් යන විට මේ පොල්වලින් එක ගෙඩියක්වත් පිටරට යවන්න බැරි තත්ත්වයක් ඇති වෙනව. ජනගහණය වැඩි වෙලා, සෑම පොල් ගෙඩියක්ම මේ රටේ උදවියට පාවිච්චි කිරීමට වුවමනා වෙනව. පොල් ගස් මදින්නට ගියොත් ඒ පොල් ගස්වලින් ගෙඩි ලබා ගන්නට පුළුවන්කමක් නැති බව තමුන්නාන්සෙලා හොඳටම දන්නව. ඒ නිසා ඒ ගැනත් කල්පනා කළ යුතුයි.

මී ළඟට ග්‍රාම සේවක මහත්වරුන් ගැන වචනයක් කියන්නට ඕනෑ. මට පෙර කථා කළ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ග්‍රාම සේවක මහත්වරුන් ගැන කථා කළා. ඒ කථා වලින් අපට පෙනී යනව, ගිය අවුරුද්දේ මාර්තු මස 1 වැනිදා පත් කළ මේ තරුණ ග්‍රාම සේවක මහත්වරුන් තුළ අද ලොකු කලකිරීමක් ඇති වී තිබෙන බව. ඒක බොහොම භයානක දෙයක්. හිටපු ගම්මුලාදැනි මහත්වරුන් තුළ වරදක් තිබුණා හෝ නොතිබුණා හෝ තමුන්නාන්සේලා ඒ උදවිය අස් කළා. ඔවුන් අයින් කළේ පිරිසිදු චේතනාවකින්ද කියා අපි කල්පනා කළා. එසේ පිරිසිදු චේතනාවකින් ඔවුන් අයින් කළා නම් අළුතෙන් පත් කරන උදවිය තුළ කලකිරීමක් ඇති නොවන අන්දමට—ඒ උදවියගෙන් ගත යුතු නියම ප්‍රයෝජනය රටට ගැනීමට පුළුවන් වන අන්දමට—කටයුතු කරන්න ඕනෑ. ඒ අයට පත්වීම් දෙන අවස්ථාවේදී ගෙවල් කුලී වශයෙන් මාසයකට රුපියල් 30ක් හෝ 35ක් දෙන්නට පිළියෙල කරනවාය කියා ප්‍රකාශ කළා. දැන් අවුරුද්දකට වැඩි කාලයක් පහු වෙලා තියෙනව. ගෙවල් කුලී හැටියට හෝ කායසීල කුලී හැටියට හෝ ඔවුන්ට මසකට ලැබෙන්නේ රුපියල් 4.80 සි. තමුන්නාන්සෙල දන්නව, නගරබදව නොවෙයි, ගම්බදවවත් රුපියල් 4.80 කට පැල්පතක්වත් ලබා ගන්නට පුළුවන්කමක් නැති බව. ඒ උදවියගෙන් අවංක සේවයක් බලාපොරොත්තු වෙනව නම් ඒ සේවය කරන්නට පුළුවන් වන අන්දමට ඒ තරුණයන්ට යම් කිසි වැඩ පිළිවෙළක් සලස්වා දීම වටිනව නේද? මේක, වහම කල්පනා කර ඉක්මණින් කළ යුතු දෙයක්. ඒ ග්‍රාම සේවකයන්ට සැහෙන දීමනාවක් ගෙවල් කුලී හැටියට හෝ කායසීල කුලී හැටියට මාසයකට රුපියල් 30 ක් 35 ක්, දෙන්නට ඕනෑ.

තවත් කරුණක් තිබෙනවා. මේ උදවිය පත් කරන්නට යෙදුණේ ගමකින් ගමකට මාරු කර යැවිය හැකි සේවකයන් හැටියටයි. නමුත් ඒ සේවකයන්ගේ ගම්වලට ඔවුන් පත් කළ නොහැකි බව කොන්දේසිවල සඳහන් වී නැතත් ඒ සේවකයන්ගේ ගම්වලට පත් වීම් නොදිය යුතු බව ප්‍රතිපත්තියක් හැටියට බොහෝ දෙනාගේ පිළිගැනීමක් තිබෙනවා. එහෙත් තමතමන්ගේ ගම්වලට සේවයක් කිරීමට සමහර තරුණයන් බොහෝ ආශාවෙන් ඉන්නවා. තමන් කරන්නට ආශාවෙන් සිටින සේවය සඳහා ඉඩ නොලැබෙන අන්දමින් ක්‍රියා කිරීම නම් හොඳ මදි බවයි, මගේ කල්පනාව. අවශ්‍ය වුවහොත් ඒ සේවකයන්ගේ ගම්වලට වුවද මාරු වීම් දීමට ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. පිට පළාත්වලට පත් වූ ග්‍රාම සේවකයන්ට ඔවුන්ගේ සේවය අවංකව, එඩිතරව කරන්නට යැම නිසා නොයෙකුත් කරදර හිරිහැරවලට මුහුණ පාන්නට සිදු වූ අවස්ථා ගැන කියැවෙන වාර්තා මේ අවුරුද්ද මුලදී තමුන්නාන්සේලා පුවත්පත් මගින් කියවන්නට ඇත කියා මා කල්පනා කරනවා. සමහර ග්‍රාම සේවකයන්ගේ ඔළු පළා තිබුණා. ඒ වගේම සමහර ග්‍රාම සේවකයන් පිහියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාරවල් කැවා. එම නිසා ග්‍රාම සේවකයන්, සිය සේවය සඳහා යන විට පොලීසියේත්, සුරාබදු දෙපාර්තමේන්තුවේත් ආධාරයත් ආරක්ෂාවත් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පොලීසියේ ආරක්ෂාව ග්‍රාම සේවකයන්ට ලබා දිය හැකි වන පිළිදි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස මා ඉල්ලා සිටිනවා. තවද, ග්‍රාම සේවකයන්ගේ රාජකාරි කටයුතුවලදී නිල ඇඳුම් වලින් සැරසිය යුතු බව ප්‍රකාශ වී තිබුණත් තවම නම් ඔවුන්ට නිල ඇඳුමක් සකස් කර දී නැති බව පෙනෙනවා. ඔවුන්ට නිල ඇඳුමක් දීම ඉතාමත්ම යෝග්‍යයි. නිල ඇඳුමක් තිබෙන විට එයින් යම්කිසි බලයක් ලැබෙනවා. ඒ වගේම අන්‍යයන්ගේ ගෞරවයද හිමි වෙනවා. එවිට රාජකාරිය හොඳින් කරන්නට පුළුවන් වෙනවා. ඒ නිසා ඉක්මනින් ග්‍රාම සේවක මහතුන්ට නිල ඇඳුම් සපයන ලෙස මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් තවත් එක කාරණයක් මතක් කළ යුතුයි. දැනට තමන් භුක්ති විඳින වරප්‍රසාද අහිමි වන්නට යනවා යයි ග්‍රාම සේවකයන් තුළ දැන් එක් තරා බියක් තිබෙනවා. දැනට හොඳ වැඩ සඳහා දෙන දීමනාවත්, වට්නාකමේ සහ තීක ලිවීම වෙනුවෙන් ලැබෙන දීමනාවත්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන වැඩ කට යුතුවල යෙදීම නිසා ලැබෙන දීමනාවත්, නවත්වන්නට යනවා යයි ආරංචි වී තිබෙන හෙයින් ග්‍රාම සේවකයන් තුළ ලොකු බියක් තිබෙනවා. සමහර විට මෙය දූෂමාන ආරංචියක් වෙන්නටත් පුළුවනි. යම්කිසි විධියකින් මෙය ඇත්ත නම් එය ඉතාමත්ම කනගාටුදායකයි. මේ දුප්පත් තරුණයන්ට තව තවත් වරප්‍රසාද දිය යුතුව තිබියදී දැනට ඔවුන්ට හිමි වී තිබෙන වරප්‍රසාදත් නතර කරනවා නම් එය වරදක් බව මතක් කරන්නට කැමතියි. එවැනි පිය වරක් නොගන්නා ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගෙන් ඉල්ලා සිටිමින්ද, මට කථා කරන්නට අවස්ථාව දීම ගැන මූලාසනයට ස්තුතිවන්ත වෙමින්ද මගේ කථාව අවසන් කරනවා.

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා.**
**(පුත්තලම)**

*(ஜனுப் எம். எச். எம். நயினு மரிக்கார்—புத்தளம்)*

(Mr. M. H. M. Naina Marikar—Puttalam)

Mr. Chairman, I am very glad of the opportunity you have given me to raise one or two matters pertaining to the administration of Mosque and Muslim Charitable Trusts. I do not want to speak at great length, particularly on the last day of the Committee stage of this Budget, and I shall confine myself as far as possible, to three or four matters that arise in the administration of the Mosque and Muslim Charitable Trusts.

I think you are aware that the entire subject matter of the Mosque and Muslim Charitable Trusts has been regulated and administered under an Act called the Muslim Mosques and Charitable Trusts or Wakfs Act, No. 51 of 1956. For the last four or five years this Act has been in operation. We have had a commissioner and the necessary machinery under which the subject matter of this Act has been administered, and we are in a position to appreciate some of the problems that arise in the administration of this Act.

You will remember that the object of this Act was first to provide for the registration of mosques, muslim shrines and places of religious resort, to prescribe the powers, duties and functions of the trustees of registered mosques, places of religious resort and Muslim charitable trusts or wakfs, to establish a muslim charities fund and to set up all necessary machinery in the form of a board—the Wakfs Board—with necessary powers to carry out certain objects of this Act. This was done for the purpose of putting an end to the large number of corrupt practices that were being committed by the various trustees of mosques and shrines with the result that the funds that were being allocated to those mosques and shrines were not utilized in the best possible way and in the best interests of the community.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නයිනා මරික්කාර් මයා.]

Having worked this Act for some time they found that there were certain deficiencies and gaps in the working of the Act itself and so an amending Act was brought in in 1962 called the Muslim Mosques and Charitable Trusts or Wakfs (Amendment) Act, No. 21 of 1962 which empowered the board to do a number of things. For example, it enabled the board to dismiss trustees outright on a complaint made by the congregation of the mosque. The most important section of that amending bill is the one which enabled the board to delegate some of its powers to the commissioner, because they found that in the working of the main Act some of the administrative duties of the Board of Wakfs were not possible to be carried out by the board itself, and the commissioner therefore, on behalf of the board, had to make investigations where complaints of corruption in the appointment of trustees were made to the board.

ප. භා. 3

But, as I said, the really important provision of this amending Act was to give the board the power to investigate into any complaint made by a member of a *jamaath* of a mosque against a trustee or trustees and to dismiss them, to suspend them or to remove them after investigation into the complaint. You will see that that was one of the points that we really opposed because it gave the board an extraordinary power, a power against which a trustee who was wrongfully dismissed had no remedy whatsoever, except to go to the Supreme Court on a writ. Unfortunately, some of the criticisms we made on the Floor of this House against the possible abuse of that power were not well received by the Minister at the time, and the amendment went through in that form. The result is that we find today the board had acted very irresponsibly and very arbitrarily in a number of cases.

I think, that at the time we debated this Bill, one of the fears we really entertained was that it was possible for the Wakfs Board—constituted as it was probably on a political basis—to dismiss trustees arbitrarily and unreasonably because they did not happen to be of their own political persuasion. It was then possible for them to appoint as trustees of mosques and various other places people who were politically useful to them. I am not at all sure whether those fears have not been justified in a number of cases.

I will refer to one particular case where such an appointment was made and the only remedy that was available to the congregation of that particular mosque was to take the case to the Supreme Court. The case was argued at length in the Supreme Court and it is reported in 66 N. L. R. at page 16 as Cader Vs. Commissioner of Mosques and Muslim Charitable Trusts. The point that was made there was that the members of the Wakfs Board must exercise their discretion in an honourable and *quasi*-judicial way without taking into consideration any kind of political or other factor in selecting trustees.

I believe that this was a case of great significance as far as the administration of this particular Act was concerned because of the way it broke the callous and rather arbitrary attitude of the people who then composed the Wakfs Board. I am glad to find that in that judgment the late Justice Kingsley Herat had ordered costs to the extent of 250 guineas to be paid by the members of the Wakfs Board to the plaintiffs. Whether that money has been paid by the various members of the board is not known. I would ask the hon. fair Parliamentary Secretary to find out whether in fact these costs have been paid, and, if not, why they have not been paid so far.

I know that a great deal of money has gone into this case by way of expenses and a great deal of local animosity has been created as a result of the case. The fellow-feeling that existed in that village—a village in Sammanturai in the Batticaloa District—has been fouled by this kind of action. Therefore, I would ask the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hon. fair Parliamentary Secretary to go into this matter and find out whether these costs have been paid and if not, why they have not been paid.

I am glad that the present board which was constituted recently consists of men who have a great deal of understanding, who can bring to bear upon their functions as members of the Wakfs Board a sense of duty and also of piety. The important thing is that the board must consist of men who are really acceptable in the sense that they will not act contrary to the spirit not only of the Act but also of the particular functions and duties that they have to perform.

One must remember that a mosque, a temple or a church is really the very centre of social and religious life in a community and if you are going to tamper with its administration on the basis of political preferences or political bias you are, in other words, destroying the very basis of that social and religious order. Therefore, it is very necessary that, in the first place, the Board of Wakfs which is really the pivotal or the institution through which the entire Act is being administered should consist of men who understand the nature of the work they are doing and men who will be able to bring to bear upon their duties that sense of understanding and also that sense of imagination which is so very necessary to make the administration of mosques all over the Island an achievement which will rebound to the credit of the Muslim community. I would, therefore, ask of the Hon. Minister, wherever possible, to avoid or to prevent any kind of political preference or political bias being brought into the picture because that would tend to destroy the very nature of the mosques and also the various charitable trusts which are administered under this Act.

Sir, the other matter I should like to raise is about the question of the funds. As pointed out, there is what is known as a charitable fund under this Act. The correct name is Muslim Charities. Under Section 45 of the Act, the Board of Wakfs is empowered to spend funds for certain purposes. May I just mention these objects in order to point out the purpose which I have in my mind? Under Section 45, the Board can utilize these funds for the following purposes:—

"(a) the building, restoration and maintenance of mosques;

(b) the relief of poverty among Muslims or any section thereof;

(c) the advancement of the education of the Muslims or any section thereof;

(d) the advancement of Islam generally;

(e) any other purposes beneficial to Muslims or any section thereof; and

(f) the payment of expenditure incurred in the management and administration of the Fund."

We are glad to find from the report of the Commissioner of Wakfs that, in 1961, the Muslim Charities Fund had accumulated Rs. 54,294.23 and at the end of September 1963, which is the latest figure we have, it had reached the target of Rs. 60,597.16. You will see that there is an increase in the contribution made by various Mosques and Muslim Charities. Now, out of this fund in 1961—Rs. 54,294.23 according to the report—the amount utilized is Rs. 6,590 and the figures work out in this way: mosques Rs. 3,000, Muslim education Rs. 2,400 and relief of distress, under which comes incurable diseases, Rs. 1,190.

In 1963 the amount utilized has been Rs. 16,440, a fairly large amount, almost double the amount utilized in 1961. It has been expended in this way: mosques Rs. 11,750, religious instruction Rs. 200, education Rs. 2,450 and relief of distress Rs. 2,040.

My point is that out of the Muslim Charities Fund the quantum of benefit received by the mosques in 1961 was Rs. 6,590 and, according to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Report of the Commissioner for Mosques, Rs. 11,750 only in September 1963. The Report quite categorically states that a large number of mosques have really no income whatsoever. For example, in the Report issued in July 1964, the Commissioner states that of the 951 institutions over 827 have no income other than contributions from members who use the mosques for prayer and worship. He also states that of those mosques only 52 mosques have incomes ranging between Rs. 1,500 and Rs. 2,500 per annum each ; 72 mosques an income of over Rs. 2,500 per annum each ; and 80 mosques an income between Rs. 750 and Rs. 1,500.

The point I am making is that a large number of these mosques have really no income other than the contributions they get from those who use them. Although the statute empowers the Board to utilize in its discretion the fund for the specific purposes which I have mentioned, for example, education, relief of poverty, and so on, yet I would earnestly request that the bulk of the money be used for the construction of mosques and renovation of old mosques.

I say this for a very good reason, because we find that a large number of these mosques are fairly old and need restoration ; and also because we find that today as a result of economic hardship—we know what it is—people are finding it more and more difficult, in spite of their piety to make generous contributions towards the maintenance of mosques; and a large number of mosques are finding it extremely difficult even to pay the priests for officiating at religious ceremonies.

ප. භා. 3.15

The bulk of the money, therefore, I say, should be utilized, as far as possible, for the building of new mosques, because a large number of Muslims today are settling down in various places. New colonies are being formed, and there are some places where there have been no mosques for a number of years and those are places at which a mosque has got to be built. And this particular fund has this main object in view. The others, Muslim education, the relief of poverty, and so on, are merely ancillary to the main object of this fund.

I would, therefore, ask the hon. fair Parliamentary Secretary, through the Commissioner, to devote the bulk of the Fund towards the maintenance of those mosques which have no income whatsoever and also for the building of new mosques in places where they are needed.

There is another matter I should like to raise and it is relevant to the point I have just made, namely, that under this Act mosques have to contribute a certain percentage of their income. This is laid down in Section 43 (2) which, in turn, tells how much the mosques should contribute. Section 43 (2) says :

"Subject as hereinafter provided, it shall be the duty of the trustee or trustees of each mosque,......in respect of that mosque, shrine, place, trust or wakf, to pay to the Commissioner in each year to be credited to the Fund, within twenty-one days after the date on which the statement referred to in Section 46 is required to be furnished, a contribution on the total income of that mosque, shrine, trust or wakf, less any sums paid out of such income as rates and taxes....".

And Section 46 (1) imposes on the trustees a duty to furnish accounts and also to declare what the income is.

The point I wish to make in this case is that the First Schedule under the Act prescribes the quantum or the amount that a mosque should pay towards the charities fund ; under the First Schedule to Section 43 (2), where the income of a mosque, charitable trust or wakf referred to in Section 43 is not more than Rs. 1,500, the rate of contribution shall be one per cent ; where the income is more than Rs. 1,500 but not more than Rs. 2,500, it is 3 per cent, and where the income is more than Rs. 2,500, it is 5 per cent. You will see that really a large number of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

mosques cannot contribute that amount, and it is my earnest request that the percentage should in the first place be reduced because it does not take into account the expenditure involved in the maintenance of mosques. It merely says, apart from rates and taxes, the actual maintenance of the mosque is not taken into account in levying this percentage; it has to be levied on the totality of the income. Therefore that should be reduced because when this Act was passed there was no law that a mosque should contribute to wealth tax or to income tax.

Although I think in the last Budget the exempted amount was raised to one lakh of rupees, nevertheless a large number of mosques still have to contribute a substantial amount by way of wealth tax and income tax. I know for certain that in the case of the Puttalam mosque, if something is not done very soon, we will have to sell some of the properties we have in order to maintain the mosque and to meet our income tax liabilities. This is a matter that the Hon. Minister should seriously consider because, after all, if the mosque cannot be maintained for the service of the Muslim community, then, as I said, the whole basis of the social order collapses.

There is another matter which arises under this same subject. I am told, and I think it is true, that where mosques are being built with contributions the Commissioner, under a misapprehension of the law, has asked that the income from contributions should be covered under this Section. That is to say, where a mosque is going to be built, and, in fact, no trustees have been appointed, it has become customary for the Commissioner to ask whoever goes on this collection to remit to him a percentage of the collections in terms of this Schedule. I think it is wholly wrong because this Act merely envisages a mosque that is already in existence and a trustee who is also functioning, but not a mosque which is going to be built. I have in every case advised the collectors not to contribute anything at all because under this law it is not possible for the Commissioner to claim that money. But it has become an administrative practice I think the people who collect contributions to mosques also get a letter from the Commissioner of Wakfs stating that this is a genuine and a deserving case; therefore he may be tempted or induced not to give that letter of authority, with the result that the task of collecting subscriptions towards the building of a mosque may be greatly jeopardized.

Those are the matters I want to raise under this Head, and I am sure the Hon. Minister will seriously consider the main points that I have raised.

One other little matter struck me. The report submitted by the Commissioner is very vague. You will find it follows a very stereotype pattern. It does not give us enough insight into the working of the department. It merely says, such an amount of money has been collected, so many mosques have been registered, so many mosques have an income of so much, and so on. It follows a particular pattern from year to year. I do wish that when he submits a report he would consider these matters. After all we are voting Rs. 67,000, of which Rs. 45,000 is on personal emoluments, and I think we are entitled to get from the Commissioner a more detailed and a more incisive report on the working of the department so that we can find out exactly how this department is functioning and to what extent the problems that face the Muslim community in the matters of administration of mosques and charities are being dealt with.

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)

*(திரு. பி. எச். பண்டார—பதுளை)*

(Mr. B. H. Bandara—Badulla)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාවේදී මා විශේෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

යෙන්ම ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගේ අවධානය යොමු කරවන්ට කැමතියි, විශේෂ කාරණයක් පිළිබඳව. පළමුවෙන්ම මතක් කරන්ට ඕනෑ, ගම්කාර්ය සභාවලට වෙන් කරන මුදල කිසිසේත් ප්‍රමාණවත් නොවන බව. විශේෂයෙන්ම මේ ආණ්ඩුව බලයට පත් කළේ, ගම්බද මහජනතාවයි. ගම්බද මහජනතාව එදා 1956 දී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පෙරළා දමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවන්ට උනන්දු වූයේ විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවලට අවශ්‍ය කරුණු ඉටු නොවීම නිසා ගම්බද ජනතාව තුළ ඇති වූ කලකිරීම උඩයි. අපි කල්පනා කරන්ට ඕනෑ, ඒ ගම්බද මහජනතාව අප කෙරේ තැබූ විශ්වාසය එසේම පවතින්නට අපෙන් ඉටු විය යුතු යුතුකම් ඉටුවුණාද කියා. ගම්කාර්ය සභාවලට වෙන් කරන මුදල්වල ප්‍රමාණය දෙස බලන විට ගම්බද උදවියගේ අදහස් ඉෂ්ට වී නැති බව පෙනී යනව.

නගර සභාවලට හා සුළු නගර සභාවලට සෑහෙන ආදායමක් තිබෙන නිසා පාරවල්, ජලය, විදුලි බලය හා සෞඛ්‍ය පහසුකම් ආදිය වෙනුවෙන් විශාල මුදලක් වැය කරන්ට ශක්තියක් ඒ ආයතනවලට තිනෙව. එහෙත් ගම්කාර්ය සභාවලට එවැනි ආදායමක් නැහැ. මගේ කොට්ඨාශයේ එක්තරා ගම්කාර්ය සභාවකට එක කොට්ඨාශයක් වෙනුවෙන් වැය කරන්ට පුළුවන්කම තිබෙන්නේ රුපියල් 500 ක් පමණයි. සභාපතිතුමනි, රුපියල් පන්සියයකින් මොනවද කරන්ට පුළුවන් ? ළිඳක්වත් හරි හැටි කපන්ට පුළුවන්ද ? ප්‍රමුඛත්වය අනුව ගම්කාර්ය සභාවකට දෙනවා අවුරුද්දකට විශේෂ ආධාර මුදලක්. ජල පහසුකම් හා විදුලි පහසුකම් ලබා ගැනීම යන වැඩ දෙකට පමණයි, මා හිතන්නෙ ඒ මුදල් දෙන්නෙ. මගේ කොට්ඨාශයට නම් ඒ දෙකවත් පසු ගිය අවුරුද්දේ ලැබී නැහැ. මම ඒ ගැන දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතුන්ගෙන් විමසා බැලුව. එවිට මට දැනගන්ට ලැබුණා, ඒ ආධාරය දෙන්නෙත් දිස්ත්‍රික්කයේ එක ගම්කාර්ය සභාවකට බව. බදුලු දිස්ත්‍රික්කයේ තිබෙනව, ගම්කාර්ය සභා 27 ක්. ජල නළයක් ලබා ගන්ට බලා ඉන්ට ඕනෑ, අවුරුදු 27 ක්. අවුරුදු 27 ක් බලා සිටීමෙන් පසුවයි, ජල නළයක් ලැබෙන්නෙ. මේකයි,

තත්ත්වය. අප දන්නව, මේ රටේ මහ නගර සභා හා සුළු නගර සභා තිබෙන්නෙ ඉතා සුළු සංඛ්‍යාවක් බව. වැඩි ජනගහණයක් වාසය කරන්නෙ ගම්බදවයි. මාර්ග පහසුකම් නැති, ජලපහසුකම් නැති, විදුලි බල පහසුකම් නැති, සෞඛ්‍ය පහසුකම් නැති ඒ ගම්බද මහජනතාවගෙ දියුණුව සැලසිය හැක්කෙ ගම්කාර්ය සභා මගින් පමණක් නම් විශේෂයෙන් ආණ්ඩුවේ යුතුකමක්ව තිබෙනව, ගම්කාර්ය සභාවලට වෙන් කරන මුදල වැඩි කරන්ට. ආණ්ඩුවට බල කර කිය නව, ගම්කාර්ය සභාවලට දෙන මුදල කිසිසේත් ප්‍රමාණවත් නැහැ කියා. අපි දන්නව, බොහෝ ගම්බද ප්‍රදේශවල යන්ට එන්ට පාරක් නැහැ ; බොන්ට වතුර ටිකක් නැහැ. විදුලි බලය ගැන නම් කියන්ට ඕනෑ නැහැ ; එය කවදා ලැබේදැයි කියන්ට බැහැ. පාරක් නැත්නම්, බොන්ට වතුර ටිකක් නැත්නම් අපේ යුතුකමක් තිබෙනව, ඒ ටිකවත් ගම්බද මහජනතාවට සළසා දෙන්න.

නිවාස ප්‍රශ්නය ගැන බලමු. ගම්කාර්ය සභාවලට නිවාස යෝජනා ක්‍රමයක් තිබෙනව. එහෙත් කොළඹ වැනි ප්‍රදේශවලදී අපට තට්ටු නිවාස දකින්ට ලැබුණත්, ගම්බද ප්‍රදේශයක තට්ටු නිවාස දකින්ට ලැබෙන්නෙ නැහැ ; ලැබුණත් බොහොම කලාතුරකින් දකින්ට ලැබෙන්නෙ. නිවාස හිඟයෙන් පීඩිතව විශාල පිරිසක් ගම්බදව සිටිනව. සමහරවිට පවුල් තුන-හතර එක ගෙදර ජීවත් වෙනව. ගම්බදට නිවාස යෝජනා ක්‍රමයකුත් ඇත්තෙ නැහැ. එම නිසා අපේ රටේම ජීවත්වන ජනතාව දිහා බලා, වඩාත්ම නොදියුණු තත්ත්වයක ජීවත්වන පිරිස දිහා බලා, ඒ අයගේ යහපත වෙනුවෙන්, සුභසිද්ධිය වෙනුවෙන්, දියුණුව වෙනුවෙන් කටයුතු කරන ලෙස මතක් කරන අතරම ඒ ප්‍රදේශවල ඇති අඩුපාඩුකම් හැකිතරම් දුරටවත් සපුරා ලීමට කටයුතු යොදන ලෙසද ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, ගම්බද ප්‍රදේශවල අඩුපාඩුකම් බොහෝ දුරට මග හරවා ගැනීමට යොදා ගත හැකි වැදගත් ආයතනයක් තමයි ගම්කාර්ය සභා. ගම්බද ප්‍රදේශවල තිබෙන අඩුපාඩුකම් නැති කර ගැනීම සඳහා මුදල් යෙදවිය හැකි වෙනත් ආයතනයක් නැහැ ; වෙනත් ක්‍රමයක් නැහැ. ග්‍රාම සංවර්ධන සමිති තිබුණත් එය සීමා වෙන්නෙ, එයින් වැඩක් වෙන්නෙ සුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටසකට පමණයි, සුළු ප්‍රදේශයකට පමණයි. එම නිසා අපට තරයේම කියා සිටින්නට සිදු වී තිබෙනව අපේ ගම්බද ප්‍රදේශ දියුණු කිරීම සඳහා ගම්කාර්ය සභා වලට දෙන මුදල් ප්‍රමාණවත් නැති බව. එම නිසා ගරු උප ඇමතිතුමියට මතක් කර සිටිනව, බලකර සිටිනව මෙයට වඩා වැඩි ආධාර මුදලක් රජයෙන් දෙන ලෙස. මුදල් වැඩි කිරීමෙන් පමණයි ගම්බද ප්‍රදේශවල ඇති අඩුපාඩුකම්, ප්‍රශ්න විසඳා ගැනීමට හැකි වෙන්නෙ. එම නිසා මේ කාරණය ගැන ගරු උප ඇමතිනියගේත්, ගරු ඇමති තුමාගේත් අවධානය යොමු කරන සේ නැවත වරක් ඉල්ලා සිටිනව.

ගරු සභාපතිතුමනි, නගර දෙස බලන විට අපට පෙනී යනවා නොයෙකුත් පහසු කම් තිබෙන බව. ජල පහසුකම්, විදුලි පහසු කම්, සෞඛ්‍ය පහසුකම් ආදියෙන් කිසිම අඩු පාඩුවක් නැහැ. නමුත් ඒ පිරිස ගැන පමණක් නොවෙයි ගම්බදව ජීවත් වන විශාල ජනතාව ගැනත් කල්පනා කර බලන්න ඕනැ. පහසුකම් සලසන විට ඒ අයටත් සාධාරණව ලැබෙන අන්දමට කට යුතු සකස් කරන්න ඕනැ. එක කොටසකට පමණක් සෑම සැප පහසුකමක්ම දී තවත් කොටසකට හැමදාම දුක් විඳින තත්ත්ව යෙන්, කරදර විඳින තත්ත්වයෙන් ජීවත් වන්න සලසනවා නම් එය වැරදි බව පෙන්නා දෙන්න ඕනැ. එම නිසා අපේ යුතුකමක් තිබෙනවා දුක් විඳින කොටස වත් සාධාරණ අන්දමින් සැලකීමට. මේ කාරණය පිළිබඳවත් විශේෂයෙන් සැල කිල්ල යොමු කොට ඒ ජනතාවට සහනය සලසා දෙන ලෙස නැවත වරක් මතක් කර සිටිනව.

අ. භා. 3.30

ඊළඟට ප්‍රජා මණ්ඩල ගැනත් වචනයක් කියන්න කැමතියි. දිවංගත ගරු බණ්ඩාර නායකතුමා පළාත් පාලන ඇමතිවරයා වශ යෙන් කටයුතු කරන කාලයේදීයි මෙම ප්‍රජා මණ්ඩල පිහිටුවීම ආරම්භ කළේ. ඒ කාලයේ ප්‍රජා මණ්ඩලවලින් විශාල වැඩ කොටසක් ඉටු වුණත් අද එයින් වැඩක් කෙරෙන බවක් පෙනෙන්නෙ නැහැ. ඇත්ත වශයෙන් ප්‍රජා මණ්ඩල මේ රටේ තිබෙනවාද කියන බවක්වත් දැන් පෙනෙන්නෙ නැහැ. ප්‍රජා මණ්ඩලයකට ගුවන් විදුලි යන්ත්‍රයක් [illegible] ඒක පාවිච්චි කරන්නෙ එම මණ්ඩලයේ සභා පතිවරයායි. එයාගෙ ගෙදරයි ගුවන් විදුලි යන්ත්‍රය තිබෙන්නෙ. එම නිසා ගම්බද ජනතාවට යහපතක් වන විධියට—ගම්බද ප්‍රදේශවල ක්‍රීඩා භූමි පිහිටුවීම, කියවීම් ශාලා ඇති කිරීම, වෙනත් නොයෙක් ප්‍රයෝජනවත් වැඩ කටයුතු සංවිධානය කිරීම—ග්‍රාම සංවර්ධන සමිති හා ඒකාබද්ධ කොට ප්‍රජා මණ්ඩල නැවතත් සකස් කර එයින් බලාපොරොත්තු වූ සේවය ලබා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම වැදගත් බව සඳහන් කරන්න ඕනැ.

උඩරට ගැමි කොමිෂන් සභාව ගැන මන්ත්‍රීවරුන් රාශියක්ම කථා කළා. උඩ රට ප්‍රදේශයක් වෙනුවෙන් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් ඒ ගැන මගේ අදහස් දක්වන්නට කැමතියි. ගරු මන්ත්‍රීවරුන් කීප පළක්ම ප්‍රකාශ කළා, ප්‍රදේශ කීපයකට පමණක් සීමා කරන්නෙ නැතුව මුළු උඩරට ප්‍රදේශයම ඇතුළත් කරන්නටය කියා. නමුත් මම නම් ඉල්ලා සිටින්නෙ උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලෙසයි. හේතුව මෙයයි. සමහර මන්ත්‍රී වරුන්ගේ කථාවලින් පෙනී ගියේ මෙම වාර්තාව අනුව උඩරට ප්‍රදේශයට විශාල සේවයක් සිදු වී තිබෙනවාය කියායි. නමුත් මගේ කල්පනාවේ හැටියට නම් මේ නිසා කිසිවක් සිදු වී නැහැ. කිසි දියුණු වක් ඇති වී නැහැ. සමහර විට ඒ වාර්තා වේ වැදගත් කරුණු අඩංගු වෙන්න පුළු වන්. නමුත් ඒවා හරිහැටි ක්‍රියාත්මක වී නැහැ. මෙම කොමිසම නිසා සිදු වී තිබෙන දෙය නම් වෙනත් අංශවලින් කිසිම කට යුත්තක් කර ගන්නට බැරි වීමයි. මන්ද? වෙනත් දෙපාර්තමේන්තුවලින් මේ මේ අඩුපාඩුකම් මගහරවා දෙන ලෙස, අඩුපාඩු කම් සම්පූර්ණ කර දෙන ලෙස, ප්‍රශ්න විසඳා දෙන ලෙස ඉල්ලා සිටියාම කියන්නෙ උඩරට ගැමි කොමිෂන් සභාව මගින් ඒ කටයුතු කරනවාය කියායි. මේ නිසා අපට සිදු වී තිබෙන්නෙ වාර්තාව දිහා බල බලා සිටීම පමණයි. එම නිසා මේ වාර්තාව ඉවත් කර දමා වැඩ කිරීමට හැකි, වැඩ පිළිවෙළක් සකස් කළ හැකි වාර්තාවක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ගරු සභාපතිතුමනි, උඩරට ගැමි කොමිෂන් සභාවක් පත් කිරීමෙන් අදහස් කළේ මොන කාරණයක්ද? ඇත්ත වශයෙන් මෙය සකස් කළේ ඉතාමත්ම නොදියුණු තත්ත්වයක තිබුණු මෙම ප්‍රදේශ දියුණු කිරීමටයි. පාරවල් පිළිබඳ ප්‍රශ්න, අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්න, සෞඛ්‍ය ප්‍රශ්න මේ ආදී දහසකුත් එකක් ප්‍රශ්න විසඳාලීමටයි. ඇත්ත වශයෙන් මේ ප්‍රදේශයේ අද දක්වා පවතින තත්ත්වය ගැන කල්පනා කර බලන විට අපට පැහැදිලි වශයෙන් පෙනී යන කාරණයක් නම්, මේ රට පාලනය කළ අධිරාජ්‍යවාදීන් විසින් ඌව වැනි ප්‍රදේශවල ජීවත්වන මහජනතාවගෙන් පළිගැනීම සඳහා, ඒ ජනතාව හැමදාම පහත් තත්ත්වයක තැබීම සඳහා කිසිම අන්දමක දියුණුවක් ඇති නොවන තත්ත්වයෙන් හැම දෙයක්ම සකස් කර තිබුණු බවයි. අන්න ඒ විධියේ පළිගැනීමේ චේතනාවෙන් අධිරාජ්‍යවාදීන් කටයුතු කළ නිසයි ඒ ප්‍රදේශ අද දක්වාම නොදියුණු තත්ත්වයක තිබෙන්නෙ. අන්න ඒ නිසයි උඩ රට ගැමි කොමිෂන් සභාව පත් කළේ. ඒ උඩ රට ගැමි කොමිෂන් සභාව තොරතුරු පරීක්ෂා කර බලා, මෙන්න මේ ප්‍රශ්න ඇතුළත් වන්නට ඕනෑ, මේ මේ කරුණු ඉටු වන්නට ඕනෑ. කියා වාර්තාව ඉදිරිපත් කර තිබෙ තිබෙනවා. ඒ වාර්තාවෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ ඒ නොදියුණු ප්‍රදේශ දියුණු කරන්නයි. නමුත් ඒ වාර්තාවෙන්වත්, ඒ වැඩ පිළිවෙළින්වත්, ඒ තරම් ලොකු සේවයක් ඉටු නොවන බව පෙනෙන නිසයි, උඩ රට ගැමි කොමිෂන් සභා වාර්තාව අයින් කර දමන්නය කියා මා කියන්නෙ.

තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ රා ප්‍රශ්නය දැන් සුළු මොහොතකට කලිනුත් මතු වුණා. මා විසින් රා බොන්න කියනවාත් නොවෙයි, නොබොන්න කියනවාත් නොවෙයි. සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂයට මහජනයා ඉදිරියට ගොස් වෙන කියන්න දෙයක් නැති නිසා මේ රා ප්‍රශ්නයක් අල්ලා ගෙන දඟලන බව කියන්න ඕනෑ. රා රේන්දකාරයින් හා කසිප්පු කාරයින් කවුද කියා අපි දන්නව. රා හොඳයි කියලවත්, නරකයි කියලවත්, මා කියන්නෙ නැහැ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ රටේ තිබෙන පොල් ගසෙන් නම් ප්‍රයෝජන ගන්න ඕනෑ. මේ රට අමද්‍යප රටක් වෙනවා නම්, මා කැමතියි. නමුත් රටේ දියුණුවට ආදායමක් ලබා ගන්න ක්‍රමයක් තිබෙනවා නම්, එය ලබා ගත යුතුයි. අපි දන්නව, පිට රටින් ගෙන්වන බීම වර්ග විශාල වශයෙන් මේ රටේ අලෙවි වෙනව. ඒ මගින් විශාල මුදලක් පිටරට යනව. මා නොබීවට කමක් නැහැ. අපට පුළුවන් මේ රටේ තිබෙන පොල් ගසෙන් ප්‍රයෝජන ගන්න. මා පිටරට ගිය දවස්වල මට පෙනුණා, මේ රටේ බීමවලට—අරක්කු වලට—පිට රට අය ප්‍රිය කරනව. ඒ නිසා විශේෂයෙන්ම අපේ රටේ ආදායම වැඩි කර ගන්නට—පිට රට අය මේ රටේ බීම වලට, අරක්කුවලට, ප්‍රියභාවයක් දක්වන නිසා—අපේ රටේ ආදායම දියුණු කර ගන්නට, අපි කටයුතු කරන්න ඕනෑ. ඒ අනුව අපි අරක්කු වැඩිපුර නිපදවන්නට ඕනෑ. ඒ මගින් මේ රටේ මිනිසුන් බේබද්දන් කරන්න කියා මා කියනවා නොවෙයි. එසේ කළොත් අරක්කු පිටරට යවා විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්.

ආගම ගැන කථා කර අපේ රට දියුණු කරන්න අමාරුයි. අපේ රට දියුණු කරන්නට, අපේ රටේ සංවර්ධනයක් ඇති කරන්නට, අපට මුදල් වුවමනා කරනවා. අපේ රටේ පිටරට මුදල් තත්ත්වය—විදේශ විනිමය තත්ත්වය—පහත වැටීම නිසා යම් යම් ආර්ථික ප්‍රශ්න ඇති වී තිබෙනව. අපේ රටේ ආර්ථික දියුණුව ඇති කර ගන්න ක්‍රමයක් තිබෙනවා නම්, අපි ඒ ක්‍රමයට විරුද්ධ නැහැ. පිට රටින් ඕනෑ තරම් බීම මේ රටට ගෙන්වනව. අපේ තානාපතිවරුන් පිටරටවල සිටිනවා. අපේ රටේ අරක්කු පිළිබඳ ප්‍රචාරයක් පිටරටවල ඇති කළොත්, අපේ ආදායම් තත්ත්වය දියුණු කර ගන්න පුළුවන් වේවි. තානාපති සේවය ඒ සඳහා යෙදෙන්න ඕනෑ. තානාපති සේවයෙන් අපේ රට පිළිබඳ ප්‍රචාරයන් ඇති වන්නේ නැත්නම්, ඒ තානාපති සේවයෙන් වැඩක් නැහැ. එමෙන්ම ඒ තානාපති සේවය සඳහා විශාල මුදලක් වැය වෙනව, විශාල පඩි ගෙවනව. ඒ මිස මොනම රටක තානාපති සේවයකින්වත් මේ රටේ දියුණුවට යමක් කෙරෙනවා යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා හිතන්නෙ නැහැ. තේ පිළිබඳව ප්‍රචාර යන්, පෙ ල් පිළිබඳව ප්‍රචාරයන්, ආදිය පිට රටවල ඇති කර, ඒ මඟින් මේ රටේ ආදායම දියුණු වන මාර්ග ඇති කරන්නට ඒ තානාපතිවරුන් කටයුතු කරන්න ඕනෑ. ඔවුන් මේ රටට ආදරය ඇති පිරිසක් නම් ඒ කටයුත්ත ඔවුන්ගෙන් ඉටු වෙන්න ඕනෑ. නමුත් තානාපති සේවය සඳහා යන්නේ මේ රටට ආදරයක් නැති, මේ රට දියුණු කරන්න ඕනෑය කියන ජාතික හැඟීමක් නැති, පිරිසක් නිසා අපට මේ රටේ තත්ත්වය දියුණු කර ගන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ නිසා ඒ ගැනත් අපේ විශේෂ සැලකිල්ල යොමු වන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් ග්‍රාම සේවකයින් පිළිබඳවත් මතක් කරන්නට ඕනෑ. ග්‍රාම සේවකයින් පිළිබඳ ප්‍රශ්නයේදි එකක් විශේෂයෙන්ම මතක් කළ යුතුයි. මේ රටේ තවමත් තිබෙන්නේ අධිරාජ්‍ය කාලයේ තිබුණු යල් පැනපු ක්‍රමයයි. ග්‍රාම සේවක ක්‍රමය ඇති වුණාට අර පරණ ක්‍රමයේ වෙනසක් වී නැහැ. අද රජයේ සෑම කටයුත්තක් සම්බන්ධයෙන්ම මූලිකයා හැටියට ක්‍රියා කළ යුත්තේ ග්‍රාම සේවකයායි. ඉඩමක් පිළිබඳව අගමැතිතුමියට පෙත්සමක් එවා තිබෙනවාය කියා අපි සිතමු. අගමැති තුමිය ඒ පෙත්සම ඉඩම් ඇමතිතුමාට යවනවා. ඉඩම් ඇමතිතුමා තම ස්ථාවර ලේකම්ට දෙනවා. ස්ථාවර ලේකම් දිසාපතිතුමාටත්, දිසාපති තුමා ආදායම් පාලක නිලධාරියාටත් යවනවා. ඒ විධියට අන්තිමට ඒ ඉඩම සම්බන්ධයෙන් තීන්දු වක් කරන්න වෙන්නෙ ග්‍රාම සේවක මහත්මයාටයි. ඊළඟට ග්‍රාම සේවකයාගේ නිර්දේශ ආදායම් පාලක නිලධාරි තැනට යවනවා. ආදායම් පාලක නිලධාරි තැන ඒවා දිසාපතිට යවනවා. සෑම අවස්ථාවක දීම, සෑම කාරණයක් සම්බන්ධයෙන්ම ඔය ආකාරයටයි කෙරෙන්නෙ. අවසාන වශයෙන් ඒ ඒ කරුණු සම්බන්ධයෙන් සොයා බැලීම පැවරෙන්නෙ ග්‍රාම සේවකයා මතයි. මේ ක්‍රමය වැරදියි. මීට වඩා පළල් අන්දමින් අපි වැඩ කරන්න ඕනෑ. ග්‍රාම සේවක මහත්මයාට ඇත්ත වශයෙන්ම වැඩ වැඩියි. මැතිවරණ ලැයිස්තු, හාල් කූපන් පොත්, ඉඩම් පිළිබඳ කරුණු, ළමයකු පාඨශාලාවට ඇතුළත් කිරීමට සහතික දීම, ඒ වාගේම නඩුහබ, කල කෝලාහල මේ ආදී සෑම දෙයක් සම්බන්ධ යෙන්ම ග්‍රාම සේවකයාට වැඩ කරන්ට වී තිබෙනවා. ඒ නිසා ග්‍රාම සේවකයාට වැඩ වැඩියි. වැඩ ඕනෑවට වඩා වැඩි වන විට ඔහුගෙන් ඉටුවිය යුතු කාර්යයන් හරියා කාරව ඉෂ්ට වෙන්නෙ නැහැ. ඒ වාගේම ග්‍රාම සේවකයාට සමහර අවස්ථාවලදී මිනීමැරුම්, කලකෝලාහල ආදි භයානක අවස්ථාවන්ටත් මුහුණපාන්ට සිද්ධ වෙනවා. නමුත් ඒ ග්‍රාම සේවකයින්ට කිසිම ආරක්ෂාවකුත් නැහැ. මේ අනුව බලන විට ග්‍රාම සේවක ක්‍රමය අනුව පුද් ගලයන් වෙනස් වුණාට ක්‍රමය සකස් වී නැති බව පෙනෙනවා. ඒ නිසා මහජනයාට වඩාත් ප්‍රයෝජනයක් ලබා දෙන්න නම් ග්‍රාම සේවකයාට කරන්ට පුළුවන් වැඩ කොටසක් භාර දෙන්න ඕනෑ. ග්‍රාම සේවක යන්ට ලිපිකරුවන් නැහැ. නමුත් ඔවුන්ට දවසකට ලියුම් රාශියක් ලියන්න සිද්ධ වෙනවා. ඒ නිසා බලාපොරොත්තු වන වැඩ කොටස ඉෂ්ට කරන්ට අමාරුයි.

බදුල්ලේ කච්චේරිය ගැනත් මම වචන යක් කියන්න ඕනෑ. මා සඳහන් කරන්නෙ නිලධාරීන් පිළිබඳව නොවෙයි; කච්චේ රියෙ ඉඩකඩ මදිකම ගැනයි. ඌව ප්‍රදේ ශයේ ප්‍රධාන කච්චේරිය බදුල්ල කච්චේරි යයි. පැරණි ගොඩනැගිල්ලක පිහිටුවා තිබෙන ඒ කච්චේරියේ ඉඩකඩ ප්‍රමාණය කිසිසේත්ම නොසෑහෙන බව අපට පෙනෙ නවා. ඒ නිසා, ගොඩනැගිලි ආදිය නැති කම නිසා එහි නිලධාරීන්ට හරියාකාරව වැඩ කරන්ට පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ නිසා අවශ්‍ය ගොඩනැගිලි තනා හැකි තරම් ඉක්මණින් මේ කච්චේරිය වෙනත් ස්ථානයකට ගෙන යා යුතුව තිබෙනවා. වුව මනා නම් පැරණි ගොඩනැගිල්ලේ කවු ගෙයක් ඇති කරන්න පුළුවන්. කච්චේරි යේ ඉඩකඩ නොමැතිකම නිසාම මහජන තාවට උප්පැන්න සහතික ලබා ගැනීමේ දීත් නොයෙකුත් කරදර ඇති වී තිබෙනවා. උප්පැන්න සහතික කලට වේලාවට ලබා ගත නොහැකිවීම නිසා විභාග කීපයකටම ඉදිරිපත් වෙන්න සමහර ශිෂ්‍යයන්ට පුළුවන් වුණේ නැහැ. සමහර අවස්ථාවලදී ඊටත් වඩා වැදගත් කාරණා සම්බන්ධ යෙන් උප්පැන්න සහතිකයක් ලබා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ගන්න ගියාම මාස ගණන් අවුරුදු ගණන් බලා ඉන්න සිද්ධ වෙනවා. මට මතකයි, මේ ළඟදී එක්තරා කෙනෙකුගේ උප්පැන්න සහතිකයක් ලබා ගන්න මාස 6 ක් ගතවුණා. මේ ගැන සොයා බැලුවාම අවශ්‍ය නිලධාරීන් නොමැති බව පෙනී ගියා. ඒ වාගේම කච්චේරියේ පවතින ඉඩකඩ නොමැතිකම නිසා සමහර ලියකියවිලි වේයන් පවා කා තිබෙනවා. ඒ වාගේම සමහර ලියවිලි සොයා ගන්නත් බැරිව තිබෙනවා. මහජනයාගේ බලාපොරොත්තු සුන් නොවන අන්දමට, මහජනයාට කරදරයක් නොවන හැටියට, කටයුතු කිරීමට යුතුකමක් තිබෙනවා. උප්පැන්න සහතික ලබා ගැනීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් අපට නිතර නිතරම පැමිණිලි ලැබෙනවා. ඒ නිසා ඒ කාර්යයට අවශ්‍ය නිලධාරීන් සපයා බදුල්ලේ කච්චේරියෙන් උප්පැන්න සහතික ලබා ගැනීමේදී ඇති වන ප්‍රමාදය නැති කිරීමට වැඩ පිළිවෙළක් යොදන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.45

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් අයි. ඒ. කාදර් මහතා මූලාසනාරූඪ විය.**

**අලගකෝන් මයා.**
*(திரு. அழகக்கோன்)*
(Mr. Alegacone)

கௌரவ உப தலைவர் அவர்களே! உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சின் மானியங்கள் பற்றி விவாதம் நடக்கின்ற இவ்வேளையிலே நானும் என்னுடைய தொகுதி பற்றிச் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். முதலாவதாக மன்னூர் கச்சேரிக் கட்டடம் இன்றிருக்கும் நிலை பற்றிச் சொல்ல வேண்டியிருக்கிறது. இக்கட்டடம் இருநூறு முன்னூறு வருடப் பழைமைவாய்ந்த ஒரு கச்சுக் கட்டடமாகும். இக்கட்டடம் நாளாவட்டத்தில் இடிந்து சொரிந்து கொண்டிருக்கிறது. இந்தக் கட்டடத்தை மாற்றி அதற்குப் பதிலாக வேறொரு கட்டடத்தை அமைக்க அரசாங்கம் இதுவரை எதுவித எத்தனமும் செய்யவில்லை. அரசாங்கம் பணமுடையால் கஷ்டப்பட்டுக் கொண்டிருக்கும் இவ்வேளையில் ஒரு புதுக் கட்டடத்தை அமைத்துத் தரும்படி கேட்க எனக்கு விருப்பம் இல்லை. இருப்பினும் தற்பொழுதிருக்கும் கட்டடத்தில் அனேக குறைபாடுகள் உள்ளபடியால் மன்னூர்க் கச்சேரிக்கெனப் புதுக்கட்டடம் ஒன்றைக் கட்ட வேண்டியது அவசியமாகின்றது. இதுவிடயத்தை அரசாங்கம் உடனடியாகக் கவனிக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன்.

இரண்டாவதாகத் துவக்கு அனுமதிப் பத்திரங்கள் பற்றிப் பேச விரும்புகிறேன். சென்ற வருடம் மார்கழி மாதத்தில் பல துவக்குச் சொந்தக்காரர்கள் துவக்குக்களைப் புதுப்பிக்கும் பொருட்டு மன்னூர் காரியாதிகாரியிடம் சென்றபோது அவர் துவக்குகளை வைத்திருப்பதற்கான அனுமதிப் பத்திரங்களைப் புதுப்பித்துக் கொடாமல் துவக்குகளையே பறிமுதல் செய்து விட்டார். நான் அறிய சுமார் பதினைந்துக்கு மேற்பட்ட துவக்குக்களை அவர் பறிமுதல் செய்து விட்டார். இந்த விடயத்தைப் பற்றிக் கேள்விப்பட்ட துவக்குச் சொந்தக்காரர்கள் பலர் தங்கள் துவக்குகளை வைத்திருப்பதற்கான அனுமதிப்பத்திரங்களைப் புதுப்பிக்காமலேயே இருந்து விட்டார்கள். என்ன காரணத்திற்காக மன்னூர் மாவட்ட அரசாங்க அதிபரும் காரியாதிகாரியும் இப்படித் துவக்குகளைப் பறிமுதல் செய்கிறார்களோ எனக்குத் தெரியாது. காரணம் கேட்டால் அவர்களோ கொழும்பிலிருந்து எங்களுக்கு உத்தரவு வந்திருக்கிறது என்று கூறுகிறார்கள். இந்த உத்தரவுகள் எந்த இடத்திலிருந்து பிறக்கின்றனவென்று எனக்குத் தெரியவில்லை. மன்னூர் மாவட்டத்தில் துவக்குகளை வழங்குமுன்பு நன்றாக விசாரித்தபின்பே அதிகாரிகள் பொதுமக்களுக்குத் துவக்குகளை வழங்கினார்கள். மன்னூர் ஒரு விவசாயப் பிரதேசமாகும். தவிர மன்னூரில் காடுகளும் காட்டுப் பாதைகளும் அதிகம். கிராம மக்கள் பட்டினத்திற்குப் போக வேண்டுமானால் காட்டுப் பாதைகளினூடே தான் போக வேண்டும். பொது மக்கள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தங்களையும் தங்களுடைய விவசாயத்தையும் காட்டு மிருகங்களிடமிருந்து பாதுகாத்துக் கொள்ள வேண்டியவர்களாக இருக்கிறார்கள். கரடி, புலி, யானை முதலிய மிருகங்களிட மிருந்து தங்களையும் தங்கள் விவசாயத்தையும் பாதுகாக்க வேண்டிய பொறுப்பு மன்னார் மக்களுக்கு எப்பொழுதுமே இருந்துகொண்டிருக்கிறது. அரசாங்கம் பறிமுதல் செய்து வைத்திருக்கும் துவக்குக்கள் துருப்பிடித்து அழிந்தால் ஏழை விவசாயிகளுக்கு யார் மீண்டும் புதுத் துவக்குக்களை வாங்கிக் கொடுப்பார்கள்? எனவே, நான் இச்சந்தர்ப்பத்தில் பறிமுதல் செய்யப்பட்ட துவக்குக்கள் அனைத்தும் உடனடியாகத் திருப்பிக் கொடுக்கப்பட வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். அத்துடன் இதுவரை துவக்கு அனுமதிப் பத்திரங்களைப் புதுப்பித்துக் கொடாமல் இருப்பவர்களுக்கும் அவற்றைப் புதுப்பித்துக் கொடுத்தல் வேண்டும். மன்னார் மக்களின் சீவனோபாயத்திற்குத் துவக்குகள் இன்றியமையாதனவையாக இருக்கின்றன என்று இச்சந்தர்ப்பத்தில் நான் அரசாங்கத்திற்குச் சுட்டிக் காட்ட விரும்புகிறேன். எனவே மன்னார் மாவட்டத்தில் துவக்குகளுக்கான அனுமதிப் பத்திரங்களை வழங்க சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு அரசாங்கம் உடனடியாகக் கட்டளையிட வேண்டும்.

மூன்றாவதாகக் கசிப்புத் தொல்லையைப் பற்றிச் சில வார்த்தைகள் பேச விரும்புகிறேன். இந்த விடயத்தைப் பற்றி எனக்கு முன்பும் பல அங்கத்தவர்கள் இச்சபையிலே பேசி இருக்கிறார்கள். குடிப்பழக்கத்தைச் சட்டத்தால் நிற்பாட்டிவிட முடியாது. குடிவெறியினால் உண்டாகும் கெடுதல்களைப் பொது மக்கள் உணராத வரையில் இப்பழக்கத்தைச் சட்டத்தால் எவ்விதம் நிறுத்த முடியும்? மதுவைக் குடிப்பதில் குற்றம் எதுவும் இல்லை. மித மிஞ்சிக் குடிப்பதுதான் அபாயமானதாகும். யாராவது தமது சுகத்திற்குத் தக்கபடி குடிப்பதை எவருமே தடுக்க முடியாது. ஆனால் மித மிஞ்சிக் குடிப்பது கண்டிக்கப்பட வேண்டியதொன்றேயாகும். மன்னார் மாவட்டத்தைப் பொறுத்த வரையில் அங்கே கட்டாயமாக மரவரி முறை அமுலுக்குக் கொண்டு வரப்பட வேண்டும். யாழ்ப்பாணப் பகுதியிலே கிட்டத்தட்ட இருபது வருட காலமாக இந்த மரவரி முறை இருந்து வருகின்றது. இந்த மரவரி முறை இங்கு மிகவும் நன்றாக நடைபெற்று இத்தொழிலில் ஈடுபட்டவர்கள் பொருளாதாரத் துறையில் முன்னேறி யிருப்பதோடு அவர்களின் பிள்ளைகளையும் நன்கு படிப்பித்து அவர்களும் இப்பொழுது நல்ல உத்தியோகங்களிலே இருக்கிறார்கள். இவ்வளவு நலனைக் கொடுக்கின்ற இந்த மரவரி முறையே எங்களுடைய பகுதிக்கும் கேட்டபோது மதுவரிப் பகுதியினர் சொன்னது என்னவென்றால், "யாழ்ப்பாணத்திலிருக்கும் இந்த மரவரி முறையை நாங்கள் நிற்பாட்டப் போகிறோம்; அதனால் இதனை மன்னாருக்குத் தருவதில் புண்ணியமில்லை; உங்களுக்குத் தரமாட்டோம்" என்பதாகும்.

எனது தொகுதியிலே சுமார் மூவாயிரம், நாலாயிரம் பேர் கள்ளிறக்கும் தொழிலில் ஈடுபட்டிருந்தார்கள். இவர்களைக் "கரையார்", "சாண்டார்" என அழைக்கிறார்கள். இவர்கள் முன்பெல்லாம் நல்ல நிலையில் இருந்து வாழ்க்கை நடாத்தியவர்கள். ஆனால், இப்பொழுது, மரவரி முறையைக் கொண்டு வராதபடியால் உண்ண உணவின்றி, உடுக்க உடையின்றித் திண்டாடுகிறார்கள். இதற்குக் காரணம் எனது பகுதியிலே நடைமுறையிலிருக்கும் கள்ளுத் தவறணை முறைதான். இத் தவறணைகளில் இந்தியர்களையும் பிறரையும் கொண்டுவந்து வைத்து இவர்களின் தொழிலைக் கெடுத்து விட்டார்கள். இதனால் இம் மக்கள் ஏழைகளாக இன்று வாழ்க்கை நடாத்தித் துன்பப் பட்டுக் கொண்டிருக்கிறார்கள். ஆகையால், இவ்வேழை மக்களுடைய நலன் கருதி இந்த மரவரி முறையை மன்னார்ப் பகுதிக்கும் தர வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்ததாக, இந்த மரவரி முறையில் பத்து மைல்களுக்கு ஒரு கள்ளுத் தவறணை இருந்தால் இதனை அமுல் நடாத்த முடியாதென்று சட்டம் கொண்டு வந்திருக்கிறார்கள். இதனால் மரவரி முறையினால் கிடைக்கக் கூடிய பலன் மிகவும் குறைந்துவிடுகின்றது. ஆகையால் இந்தச் சட்டத்தை ஐந்து மைல் அல்லது மூன்று மைல் என்று மாற்றி அமைக்க வேண்டுமென்று நான் அமைச்சர் அவர்களிடம் கேட்டுக் கொள்ளுகிறேன்.

நான் இச்சந்தர்ப்பத்தில் அரசாங்கத்திடம் கேட்டுக் கொள்ளும் மற்றொன்று என்னவென்றால் சாராயத்தின் விலையைக் குறைக்க வேண்டுமென்பதாகும். இப்பொழுது சிபாரிசு செய்யப்பட்டிருக்கும் மரவரி முறையினால் கிடைக்கும் ஏராளமான கள்ளை அரசாங்கமும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

வாங்கி இதனைக் கொண்டு சாராயம் தயாரிக்கலாம். இவ்வாறு செய்வதனால் சாராயத்தின் விலையை இலகுவாகக் குறைக்க முடியும். மேலும், மரவரி முறையினால் அதிகரிக்கும் கள்ளை அரசாங்கம் உத்தரவாத விலைத் திட்டத்தின் கீழ்க் கொண்டு வந்தாலும் மக்களுக்கு அதனால் அநேக நன்மைகள் விளையும். அவர்கள் இதனால் பெரும் வருவாயைப் பெற்று இன்று கீழ் நிலையிலுள்ள அவர்களுடைய வாழ்க்கைத் தரத்தை உயர்த்திக் கொள்ளுவார்கள். இவ்விஷயத்தில் அதிக சிரத்தை காட்டும்படி நான் அமைச்சர் அவர்களை வினயமாகக் கேட்டுக் கொள்ளுகிறேன்.

மன்னூர்ப் பகுதியிலே குடிநீர் விநியோகத் திட்டமொன்றைத் தொடங்கி வைக்க இப்பொழுது ஏழு, எட்டு ஆண்டுகளுக்கு முன், காலஞ்சென்ற கௌரவ பண்டாரநாயக்க அவர்களை நான் தூண்டியதன் காரணமாக அவர் ஒரு இலட்சம் ரூபா தந்தார். இத்திட்டம் 1960 ஆம் ஆண்டு தொடங்கியது. ஆனால் இதன் முடிவை இன்னும் காணோம். வேலை நடக்கிறது என்று சொல்லுகிறார்கள். நாலு வருடங்களாகியும் வேலை முடியவில்லை. இதனை "வோக்கர் அண்ட் சன்ஸ்" க்குக் கொந்தராத்து கொடுத்திருக்கிறார்கள். கன காலமாக அவர்கள் வேலை செய்யாமற் கிடந்து, இப்பொழுது, ஒருவாறு சொற்ப வேலை செய்து வருகிறார்கள். இதனைக் கௌரவ அமைச்சர் அவர்கள் கவனித்து சீக்கிரம் இத்திட்டத்தை முடித்துத் தரும்படி நான் கேட்டுக் கொள்ளுகிறேன்.

எனது பகுதியிலே மக்கள் குடிதண்ணீர் இல்லாமல் பெரிதும் கஷ்டப்படுகிறார்கள். அவர்களுக்கு ஒரு நாளைக்கு ஒரு மணித்தியால குடி தண்ணீர் விநியோகந்தான் கிடைக்கிறது. காலையில் 6½ மணியிலிருந்து ஏழு மணி வரையும், மாலை 4½ மணியிலிருந்து ஐந்து மணி வரையுந்தான் அவர்களுக்குத் தண்ணீர்விநியோகம் கிடைக்கிறது. ஆகையால் அமைச்சர் அவர்கள் இதனை முக்கியமாகக் கவனிக்க வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்த விஷயம் என்னவென்றால், மன்னூரிலே ஒரேயொரு பட்டின சபைதான் இருக்கின்றது. மன்னூர் மாவட்டத்திலுள்ள ஸ்தல ஸ்தாபனங்களில் இந்தப் பட்டின சபையைத் தவிர்த்து மற்றவையெல்லாம் கிராமச் சங்கங்களாகவே இருக்கின்றன. அவை கிட்டத்தட்ட 1947 ஆம் ஆண்டிலிருந்தே, அதாவது, பதினேழு வருடங்களாக கிராமச் சபைகளாகவே இயங்கி வருகின்றன. எனவே, அவைகளில் தகுதியானவற்றை நகர சபைகளாக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

மன்னூர், மன்னூர் மாவட்டத்தின் தலைநகரம். எனவே, அதன் தரத்தை உயர்த்தி, அதனை மாநகர சபையாக்க வேண்டும். ஏனென்றால், எருக்கலம்பிட்டி, விடத்தல் தீவு ஆகிய கிராமச் சங்கங்களைப் பட்டின சபைகளாக ஆக்கப் போவதாக நான் அறிகிறேன். எனவே, அவ்விரு கிராமச் சங்கங்களையும் பட்டின சபைகளாக ஆக்கினால், மன்னூர்ப் பட்டின சபையை மாநகர சபையின் தரத்துக்கு உயர்த்த வேண்டியது அவசியமாகின்றது.

அடுத்ததாக, கிராமச் சங்கங்களுக்கு அவைகளின் பாதைகளைப் பரிபாலிப்பதற்காகக் கொடுக்கப்படும் பணம மிகவும் சொற்பமாகும். பல கிராமச் சங்கங்கள் எத்தனையோ விஸ்தாரமான பாதைகளை உடையனவாய் இருக்கின்றன. அப் பகுதிகளில் ஒவ்வொரு கிராமத்துக்கும் போவதற்கு ஒவ்வொரு பாதை இருக்கின்றது. பணம் இல்லாத காரணத்தினால் கிடைக்காமல் அந்தப் பாதைகளை அச் சங்கங்களுக்கு முடியாமல் இருக்கின்றது. கொடுக்கப்படும் நிதியும் மிகவும் சொற்பமாக இருக்கிறபடியால் இப்பாதைகளை நல்ல விதமாக வைத்திருக்க அச்சங்கங்களுக்கு வசதியில்லை. அரசாங்கத்தின் பொருளுதவி அவைகளுக்குக் கிடைக்காமல் அந்தப் பாதைகளை அச் சங்கங்கள் எவ்விதம் திறமையாக வைத்திருக்க முடியும்? மராமத்து இலாகாவுக்கு (P. W. D.) அதன் பாலனத்துக்குட்பட்ட பாதைகளையே சரியாக வைத்திருக்க முடியாதிருக்கும் பொழுது கிராமச் சங்கப் பாதைகளை எவ்விதம் அந்த இலாகா திறமையாக வைத்திருக்க முடியும்? எனவே, உள்ளூராட்சி இலாகாவே இந்தப் பாதைகளைத் திறமையாக வைத்திருக்கக்கூடிய முறையில் பண உதவி வழங்கி உதவி செய்ய வேண்டும்.

எனவே, இவையெல்லாவற்றையும் உங்கள் முக்கிய கவனத்திற்கொண்டு, பிற்போக்கான மன்னூர்ப் பகுதியை நல்லவிதமாக வைக்க ஆவன செய்ய வேண்டுமென்று உங்களை வினயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ඩී. ආර්. ජයරත්න මයා. (හලාවත)**
**(திரு. எஸ். டீ. ஆர். ஜயரத்ன—சிலாபம்)**
**(Mr. S. D. R. Jayaratne—Chilaw)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු සභාවේ වටිනා කාලය වැඩිය ගන්නට මා අදහස් කරන්නෙ නැහැ. මා නැගී සිටියෙ හැකි තාක් ලුහුඬින් ඉතා වැදගත් කාරණයක් දෙකක් ගැන පමණක් යම් දෙයක් ප්‍රකාශ කරන්නයි. විශේෂයෙන්ම කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා (ජිනදාස මයා.) කළ කථාවෙදි එක්තරා කාරණයක් මතක් කළ නිසා ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවෙත්, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් අවධානය යොමු කරන්න සිද්ධ වෙලා තියෙනව. යම් යම් පළාත් පාලන ආයතනවල—මහා නගර සභාවල වේවා, පළාත් ආණ්ඩු සභාවල වේවා, සුළු නගර සභාවල වේවා, ගම්කාර්ය සභාවල වේවා—අධිපතීන් හෙවත් ප්‍රධානීන් නැත්නම් සභාපතිවරුන් විශයෙන් දැනට සිටින මෙන්ම හිටපු ඇතැම් පුද්ගලයන් සම්බන්ධයෙන් දූෂිත පාලනයක් ගෙන යාම පිළිබඳව හෝ අකාර්යක්ෂම භාවය පිළිබඳව හෝ මුදල් හදල් වංචා කිරීම පිළිබඳව හෝ නගන ලද චෝදනාවල් ගැන අපට වරින් වර අහන්න ලැබෙනව. එවැන්නන්ට විරුද්ධව නීතියේ හැටියට උසාවියටම ගිහිල්ල දඬුවම් පමුණුවන්න උත්සාහ කළොත් නීතියේ තිබෙන යම් යම් දුර්වල තැන්වලින්, හිල්වලින්, රිංගා යන්න බලනව. මහජන මුදල් ගසා කෑමෙන් හෝ මහජන මුදල් වංචා කිරීමෙන් හෝ පොදු ජන යහපතට අහිත කර අන්දමට ක්‍රියා කරන පුද්ගලයන්ට විරුද්ධව උසාවි යනවට වඩා වෙනත් ක්‍රමයකින් දඬුවම් පැමිණවියහැකි පහසු මාර්ගයක් සලකා බලනව නම් හොඳයි. එවැනි අක්‍රමිකතාවලට වැරදිකරුවන් වන පුද්ගලයින්ගේ ප්‍රජා අයිතිවාසිකම් නැති කරන්නත් ඉඩ ලැබෙන විධියේ පනතක් මේ ගරු සභාවට ගෙන එන්න පුළුවන් නම් එයින් විශාල යහපතක් සෙතක් සැලසෙන්න ඉඩ තියෙනවය කියා මා හිතනව. බදු ගෙවන්නන්ගෙ මුදල් වංචා කර, ඒ මදිවිට රජයෙන් ලැබෙන ආධාර මුදල් පවා තමන්ගෙ ප්‍රයෝජනයට යොදා ගත් සහ යොදා ගන්න පුද්ගලයන් ගැන අහන්නට ලැබෙනව. එහෙත් ඔවුන්ට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන චෝදනා සාමාන්‍ය නීතියේ හැටියට උසාවි මාර්ගයෙන් ඔප්පු කරන්න අමාරුයි. ඒ නිසා ඒ අමාරුව මග හරවා ගත යුතුව තිබෙනව. මහජන සේවය ඉතා පිරිසිදුව තබා ගත යුතු නිසා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ගන්න ඕනෑ. ඒ සඳහා වහාම කෙටුම්පත් පනතක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ යුතුය කියා මා කල්පනා කරනව. ඒ පනත යටතේ කරන ලද යම් විභාගයකින් පසු වැරදිකරුවන් හැටියට නිගමනය කරනු ලැබූ පුද්ගලයන්ගෙ ප්‍රජා අයිතිවාසිකම් යම්කිසි කාල සීමාවකට නැති කරන්න ඕනෑ. එහෙම නොකළොත් පළාත් පාලන ආයතනවල තිබෙන දූෂණ සහ මුදල් වංචාවල් මෙන්ම හොරමැරකම් ආදියත් වැඩි වෙනව. ඒ නිසා ඒ කාරණය කෙරෙහි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගේ සැලකිල්ල වහාම යොමු කර අවශ්‍ය පණත් සකස් කරන මෙන් ඉල්ලා සිටිනව.

ගම්කාර්ය සභාවලට රජයෙන් මුදල් වෙන් කිරීමේදී ගම්කාර්ය සභාවල තත්ත්වය සහ ගම්කාර්ය සභාවලට සේවය කරන්න සිදු වන ප්‍රදේශය ගැනත් සලකා එය කළ යුතුය කියා මා කල්පනා කරනව. සමහර ගම්කාර්ය සභා ඉතා විශාල ප්‍රදේශයකට සේවය කරන අතර තවත් සමහර ඒවා කුඩා ප්‍රදේශයකට සීමා වෙනව. සමහර ඒවායේ නියෝජිතයින් විසි ගණනක් සිටින අතර දහ දොළොස් දෙනෙකු සිටින ගම්කාර්ය සභාත් තිබෙනව. කොයි එකටත් එක සමාන මුදලක් වෙන් කිරීම වැරදියි. සමහර ගම්කාර්ය සභාවලට අයත් ප්‍රදේශ ගංවතුරට යට වෙනව. ඒවාට ගංවතුර ආධාර මුදල් වශයෙනුත් වැඩි මුදලක් වෙන් කරන්න ඕනෑ. දියුණු නොදියුණු තත්ත්වය ගැනත් සලකා, දෙන ආධාර මුදල අඩු වැඩි කිරීම එකම ප්‍රමාණයක් දෙනවට වඩා සුදුසුය යනු මගේ අදහසයි.

ඊළඟට ඉතා ලුහුඬින් යමක් කියන්නට මා අදහස් කරන්නෙ රා ප්‍රශ්නය ගැනයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

The Sitting is suspended till 4.30 p.m.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

**ජයරත්න මයා.**
*(திரு. ஜயரத்ன)*
(Mr. Jayaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේ පානය සඳහා රැස්වීම තාවකාලිකව අත්සිටුවන විට මා මේ රටේ පැන නැග තිබෙන වැදගත් ප්‍රශ්නයක් වන රා ප්‍රශ්නයට පය තැබුවා පමණයි. අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී ගරු මුදල් ඇමතිතුමා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. එතුමා කියා සිටියා පොල් ගහක් මැද ගැනීමට කැමති කෙනෙකුට ඒ සඳහා අවසර දීම ගැන කල්පනා කර තිබෙනවාය කියා. එතුමා කිව්වෙ ගහක් මැදගෙන රා බොන්න කැමති කෙනෙක් ඉන්නව නම් ඒ සඳහා ඉල්ලුම් කළොත් අවසරයක් දීමට කල්පනා කරන බවයි. එතුමා කාට වත් රා බොන්න කියල බල කරනවය කිව්වෙ නැහැ. පොල් ගස ලංකාවේ සෑම තැනම වාගෙ ජීවත් වන මනුෂ්‍යයින්ට එක සේ ප්‍රයෝජන ගැනීමට ස්වභාව ධර්මයෙන් ලැබී තිබෙන ඉතා වටිනා දායාදයක් බව කවුරුත් පිළිගන්නවා ඇතැයි මා විශ්වාස කරනව. ඒ වගේම ගස් මැදීමේ ව්‍යාපාරයත් මේ රටේ බොහෝ කාලයක සිට කෙරීගෙන එන දෙයක් බවත් කවුරුත් පිළිගන්නව. සමහර පළාත්වල අය බෙහෙවින් රා බොනව. ඒකත් පිළිගන්න පුළුවන් දෙයක්ය කියා මා කල්පනා කරනව. ඇතැම් අය තමන්ගෙ ප්‍රයෝජනයට පමණක් ගැනීමට රා මදිනව. හැබැයි, මා නියෝජනය කරන ප්‍රදේශයට රා මැදීම සඳහා බලපත්‍ර දීමේ යෝජිත ක්‍රමය බල පාන්නෙ නැත්තෙ එහි හැතැප්ම තුන හතරකට එහා මෙහා රා තැබෑරුම් තිබෙන නිසයි. එහෙත් ගම්බද පළාත්වල ඉතා සුළු සංඛ්‍යාවක් හැරුණාම වැඩි දෙනෙක් රා මැදීමට අවසර දීම ගැන කැමතියි. සමහර අය විරුද්ධ වන බව පෙනී යනව. සමහර බෞද්ධයන් මීට විරුද්ධ වන නිසා යටත් පිරිසෙයින් අබෞද්ධයන් ඉන්න පළාත් වලවත් අත්හදා බැලීමක් වශයෙන් රා මැදීමේ අවසරය දෙන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් මා ඉල්ලා සිටිනව. සෑම තැනම ඒ විධියට නැහැ. කෙසේ වෙතත් අබෞද්ධයන් සිටින පළාත්වල අත්දැකීමක් වශයෙන් රා මැදීමට අවසර ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනව. මා, රා ගැන මෙසේ කතා කරන්නෙ රා බොන මිනිසෙක් නිසා නොවෙයි. මට බොන්න පහසුව සලස්වා ගන්න නොවෙයි, මා මෙසේ කතා කරන්නෙ. රා තබා සිගරට් එකක්වත් මම බොන්නෙ නැහැ. නමුත් වැඩි දෙනාගෙ අදහසයි, මා ප්‍රකාශ කරන්නෙ. මේ රටේ රා ස්කාගාර තිබෙනව. සීදුවෙ තියෙනව, රජයේ රා ස්කාගාරයක්. හලාවත ප්‍රදේශයටත් සමුපකාර රා ස්කාගාරයක් ලැබෙනවාය කියා ගිය වර අයවැය ලේඛන අවස්ථාවේදී කීවා මට මතකයි. එවැන්නක් හලාවත ප්‍රදේශයට ලැබෙනව කියා පත්‍රවලත් පළ වී තිබෙනව මා දුටුව. නමුත් දැන් එම කාර්‍යය යටපත් වී තිබෙනව. රජයෙන් ලැබෙන්න ගිය එම සමුපකාර ස්කාගාරයට සිදු වුණේ කුමක්ද කියා මා දැනගන්න කැමතියි. එවැනි ස්කාගාර පිහිටුවා අරක්කු වැනි දේ පෙරීමෙන් රජයට විශාල ආදායමක් ලබා ගන්න පුළුවනි. හැමෝටම බලෙන් අරක්කු පොවන්නය කියනව නොවෙයි, මේ. රජය මගින් වැඩි වැඩිය අරක්කු නිෂ්පාදනය කළොත් අරක්කු මිළ හුඟක් දුරට අඩු කරන්න පුළුවනි. එසේම මෙරට අරක්කු හොඳට නිෂ්පාදනය කර පිටරට පටවන්නත් පුළුවනි. අරක්කු පිට රට පැටවීමෙන් විශාල ආදායමක් අපේ රටට ලබා ගත හැකියි. ක්‍රමානුකූලව රා නිෂ්පාදනය කොට, ඒවා නරක් නොවන ලෙස බෝතල්වල අසුරා බීර බෝතල් සහ අරක්කු බෝතල් ආකාරයට පිටරට පටවන්න පුළුවන්කම තියෙනව. ඒ මගිනුත් විශාල ආදායමක් අපේ රටට ලබා ගන්න පුළුවනි. බෝතල් කළ රා එක්තරා සමාගමක් මගින් නිෂ්පාදනය කරන බවත් ඒවා තැබෑරුම්වල විකුණන්න තබා තිබෙන බවත් අපි දන්නව.

අපි, පොල් පාවිච්චි කරන්නෙ කෑමට පමණක් නොවෙයි. අපේ රටේ පොල් වලින් වැඩි හරියක් පිටරට පටවනව. ගරු ඉඩම් ඇමතිතුමා පොල් වැවීම සඳහා ආධාර දෙනවා. ලංකාවෙ නොයෙකුත් පළාත්වලට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඒ සඳහා ඉඩම් වෙන් කර දී තිබෙනව. පොල් වැවීම සඳහා මධ්‍යම පන්තියට අක්කර දහස් ගණනක් ලබා දී තිබෙනව. පොල් පරීක්ෂණාගාර මගින් අළුත් ක්‍රම අනුව පොල් වවා විශාල ආදායමක් ලබා ගන්න කටයුතු කරනව. මගේ කොට්ඨාශයෙ අඹ මූකලාන නමැති ප්‍රදේශයෙ පොල් බීජ තවානක් තිබෙනව. එහි, අක්කරයකින් පොල් දහස් ගණන් ලබා ගන්න හැකි වන ආකාරයට වැඩ කටයුතු සකස් කර ගෙන යනව. වැඩි කලක් යන්න පෙර මෙරටට වුවමනා ප්‍රමාණයටත් වඩා පොල් ලබා ගන්න අපට හැකි වෙනවා ඇති. ඒ අන්දමට පොල් ගෙඩියෙන් ගතයුතු ප්‍රයෝජන ගන්නවත් සමගම පොල් මලෙන්ද ගත යුතු ප්‍රයෝජන ලබා ගැනීමට වැඩ පිළිවෙළක් යොදන එක හොඳයි.

කසිප්පු බොන අයට රා බීමෙන් වැඩක් නැති බව කියනව. කසිප්පු කාරයො රා බොන්නෙ නැත කියන මතයකුත් තියෙනව. ඒ අදහස්වල ඇත්තක් තියෙන්න පුළුවනි. මේ රටේ හැම දෙනාටම බලහත්කාරයෙන් රා පොවා මෙරට සැම දෙනාම රා ගුඩ්ඩන් බවට පත් කරන්න නොවෙයි, අපි කියන්නෙ. කැමති කෙනෙකුට රා බෝතලයක් බොන්න කටයුතු සකස් කරන්නයි, මේ අවස්ථාවෙ වැඩ කරන්න යන්නෙ.

ලංකාවෙ හැම ප්‍රදේශයක්ම වාගෙ කසිප්පුවලින් පිරී පවතින බව පේනව. රාවලින්වත් මීරාවලින්වත් කිසිවකු කසිප්පු නොපෙරන බව අපි දන්නව. වැඩි දෙනා කසිප්පු හදන්නෙ සීනිවලින් සහ රට ඉඳිවලිනුයි. සීමෙන්ති දිය කරලත් විෂ මත්පැන් හදාගෙන ඇතැම් දෙනා බොන බව කියනව. මිනී "එම්බාම්" කරන "ෆේර්මලින්" දමලත් කසිප්පු පෙරනව. ඒ වගේම සෝඩ බෝතලයකට අළුත් සතේ ඒව සහ සත දෙකේ ඒවි කපා දමා වසා තබා බොනවලු. ඔය විධියටයි, අපේ රටේ විෂ මත්පැන් පැතිර යන්නෙ. රාවලින් හෝ මීරාවලින් හෝ හැළි අරක්කු යනා දියවත් පෙරාගෙන බොනව නම් කමක් නැහැ.

කසිප්පු විතරක් නොවෙයි, මේ රටෙන් මත්පැන් ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නැති කර දමනව නම් මා ඊට කැමතියි. බලහත් කාරයෙන් හෝ ගහල හෝ කුස පහර දීල හෝ නැති කරනව නම් මා කැමතියි. කසිප්පු පමණක් නොවෙයි, මාළු ඇල්ලීමත්, සතුන් මැරීමත් නැති කරනව නම් මම බොහොම සන්තෝෂයි. නමුත් සමහර කොටසක් තමන්ට වුවමනා කරන පිළිවෙළට රසට මත්පැන් පාවිච්චි කරනව නම්, කම්කරුවෙක් රා බෝතලයක් බිව්වම ඇති වැරැද්ද මොකක්ද? විස්කි ගෙන්වන්න ඉඩ දෙනව නම්, බ්‍රැන්ඩි ගෙන්වන්න ඉඩ දෙනව නම්, ඒ වගේම ලොකු උදවියට බීමට තවත් වටිනා මත් ද්‍රව්‍ය ගෙන්වීමට ඉඩ දෙනව නම්, වැදගත්ය කියන ලොකු උදවියට කලිසම් කෝට් ඇඳගෙන, ටොප් හැට්ස් දාගෙන විස්කි බීල බදාගෙන නටන්න ඉඩ දීල තියෙනව නම්, දුප්පත් කම්කරුවකු වැඩ කර මහන්සි වූ අවස්ථාවේදි ඔහුට රා බෝතලයක් දෙකක් බොන්න ඉඩ සැලැස්වීම වැරදි නැහැ.

අද රා තැබෑරුම් රාශියක් තියෙනව. ඒවත් වහනව නම් මම කැමතියි. තැබෑරුම්වල රා හොඳ නැහැ. ඒවායෙ රා හදනව. රා හැදීමෙන් දවසකට රුපියල් 15 ක් 20 ක් ආදි වශයෙන් විශාල වශයෙන් ආදායම් ලබන සමහර මලයාලි මිනිස්සු ඉන්නව. තැබෑරුම් අයිතිකාරයන් ඒ අයව තියාගෙන රා හදව ගන්නව. කොළඹ පළාතේ තැබෑරුම්වල හුඟක්ම තියෙන්නෙ හදන රා. හදපු රා බෝතල ලක්ෂ ගණන්, කෝටි ගණන් අලෙවි වෙනව, තැබෑරුම්වල. ඒවා බීමෙන් මිනිස්සු අමාරුවෙ වැටෙනව. මා මත්පැන් නොබොන පුද්ගලයකු වුවත්, මේ රට ප්‍රජාතන්ත්‍රවාදි එකක් නිසා, මත්පැන් බොන්නට කෙනකුට වුවමනාවක් තියෙනව නම්, බලහත්කාරයෙන් ඒ බීම නැවැත්වීමට බැරි නිසා, විෂ බොන්නෙ නැතිව හොඳ රා වීදුරුවක් බොන්නට අවස්ථාව සැලසිය යුතු බව ප්‍රකාශ කරන්න සතුටුයි. මේ රටේ සුරා සම්පූර්ණයෙන් නැති කරන තුරු ඒ අවස්ථාව සලසන්න ඕනැ.

මේ රටේ රට බීම සාප්පු සඳහා බලපත්‍ර පරම්පරාවලට දීල තියෙනව. ඒවා දී තිබෙන්නෙ ලාංකිකයන්ට නොවෙයි. රට බීම විකිණීම සඳහා බලපත්‍ර ලබා ගන්න සමහර අය ඒවා අවුරුද්දකට රුපියල් දහස් ගණනකට තවත් කෙනකුට බදු දෙනව. රුපියල් පනස් දාහ, ලක්ෂය ආදී විශාල ගණන්වලට බදු දෙන අය ඉන්නව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයරත්න මයා.]

නිකම් ගෙදර ඉඳගෙන සල්ලි හම්බ කරනව. ඒවා නහනම් කරන්න ඕනෑ. යම්කිසි ප්‍රශ්නයක් විසඳනව නම් ඒකෙ මුල හොයලා විසඳන්න ඕනෑ. ප්‍රශ්නය අගින් විසඳන්ට බැහැ. කසිප්පු ව්‍යාපාරය නවත්වන්න ඕනෑ. කසිප්පු ව්‍යාපාරය නිසා ලංකාවෙ ඉබ්බොත් වඳ වේගන යනව. කසිප්පු බොන අයට ඉබි මාළු බොහොම හොඳය කියා පත්‍රයේ තියෙනව මම දැක්ක. කාලයක් යන විට අපේ දරුවන්ට ඉබ්බෙක්ව දකින්නවත් බැරි වෙයි. ඉබ්බව ඇඳල පෙන්වන්න වෙයි, මෙන්න මේ වගේ සතෙක් ලංකාවෙ හිටියය කියා.

සුරා බදු දෙපාර්තමේන්තුවෙත්, පොලිස් දෙපාර්තමේන්තුවෙත් සමහර නිලධාරීන් නිසා තමයි, කසිප්පු ව්‍යාපාරය නවත්වන්න බැරි වෙලා තියෙන්නෙ. සුරා බදු දෙපාර්තමේන්තුවටත්, පොලිස් දෙපාර්තමේන්තුවටත් ඕනෑකම තිබෙනව නම් කිසිම අමාරුවක් නැතිව කසිප්පු ව්‍යාපාරය මාසයක් ඇතුළතදී නවත්වන්න පුළුවන්. සුරා බදු දෙපාර්තමේන්තුවෙ ප්‍රාදේශික නිලධාරී සියළු දෙනාම දන්නව ඒ පළාත්වල කසිප්පු තියෙන්නෙ කොහෙද, බලපත්‍ර නැතිව ගස් මද්දවන්නෙ කොහේද කියා. නඩුවක් දමන්න වුවමනා නම් අහිංසක මිනිසකුව අල්ලගෙන යනව.

අ. භා. 4.45

කසිප්පු නිෂ්පාදනය කරන ස්කාගාර තියෙනව. වෙන්නප්පුවෙ පොලිසියෙ ඉන්න රාහුල සිල්වා මහත්මයා ළඟදී එවැනි කසිප්පු ස්කාගාරයක් අල්ලගෙන ගියා, ලොරි දෙකක පටවගෙන. පටවගෙන යන ගමන් වෙන්නප්පුවෙ සුරා බදු ස්ථානය ළඟ නවත්වල හූ කියල පෙන්නලයි, අරගෙන ගියෙ. සුරා බදු දෙපාර්තමේන්තුවෙ නිලධාරීන්ගේ අනුදැනීම උඩ කසිප්පු නිෂ්පාදනය කරන බව පෙන්වීමටයි, එහෙම කළේ. ඒ පොලිස් නිලධාරි මහත්මය අවංක පුද්ගලයෙක්. ඒ නිසා සුරා බදු ස්ථානය ළඟ නවත්වල, මෙන්න අපි අල්ලගෙන යනවය කියා පෙන්වල, අරගෙන ගියා. දැන් ඉන්න සුරා බදු කොමසාරිස් මහත්මයා හොඳ කෙනෙක් ; කලින් හිටි නැනැත්තා වගේ නොවෙයි. සුරාබදු නිලධාරීන්ගෙ දූෂණ ගැන කලින් සිටි සුරා බදු කොමසාරිස්තුමාට මා නොයෙක් වර කරුණු ඉදිරිපත් කළා. හොර කසිප්පු තිබෙන තැන් ගැන සඳහන් කළා. මා නියෝජනය කරන ප්‍රදේශයේ මැරවිල නමින් එක්තරා ගමක් තිබෙනවා. එය තිබෙන්නේ කලපුව අයිනේයි. මැරවිල කියන ගමේ, එසේ නැත්නම් කලපුව අයිනේ තිබෙන දූපත්වල කසිප්පු කර්මාන්තය බොහොම සරුවට කෙරෙනවා. ඒ නිසා ඒ දූපත්වල තිබෙන ළඳු කැළෑ කපා ගිනි තබා කසිප්පු වසංගතය නැති කිරීමට ඉදිරිපත් වන ලෙස මා කලින් සිටි සුරාබදු කොමසාරිස්තුමාට කීවා. මුළු හලාවත නගරයටම කසිප්පු සපයන්නේ මේ මැරවිල කියන ගමෙනුයි. කලින් සිටි සුරාබදු කොමසාරිස්තුමාට කොපමණ කරුණු කීවත්, ඔහු හැමදාම ලැස්ති වුණා මිස නියම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. නමුත් දිසානායක මහත්මයා සුරාබදු කොමසාරිස් වශයෙන් පත්වුනාට පසු සුරාබදු දෙපාර්තමේන්තුව දැන් එක්තරා තත්ත්වයකට පත් වී තිබෙන බව මතක් කරන්නට කැමතියි. එතුමා අවංක නිලධාරියකු නිසා ලංකාවේ සෑම තැනම තිබෙන කසිප්පු ව්‍යාපාරය නවත්වන්නට ක්‍රමවත් වැඩ පිළිවෙළක් යෙදනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

තවත් කාරණයක් ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්වරියගේ අවධානය යොමු කරවන්නට කැමතියි. ඉන්දියාවෙන් ගස් මදින්නන් නොගෙන්වන බවට කලින් සිටි පාර්ලිමේන්තු ලේකම්තුමා අපට පොරොන්දුවක් දුන්න. නමුත් ගස් මදින්නන් 500 දෙනකු පමණ ඉන්දියාවෙන් ගෙන්වන්නට යන බව නොබෝදා පුවත්පත් මගින් දැන ගන්නට ලැබුණා. ඉන්දියානු ප්‍රශ්නය බේරා ගන්නට බැරිව තිබෙද්දී ගස් මදින්නන් වශයෙන් හෝ ඉන්දියානුවන් ගෙන්වීම ඒ තරම් හොඳ වැඩක් නොවන බවයි, මා කල්පනා කරන්නෙ. දැන් කම්කරු දෙපාර්තමේන්තුව ගස් මදින්නන් පුහුණු කර ගෙන යනවා. මා නියෝජනය කරන ප්‍රදේශයේ දැන් තුන් පොළකම ගස් මදින්නන් පුහුණු කරගෙන යනවා. කම්කරු දෙපාර්තමේන්තුව මගින් ලංකාවේ පොල් ගස් තිබෙන වෙනත් ප්‍රදේශවලත් ගස් මදින්නන් පුහුණු කරවන්නට පුළුවනි. තත්ත්වය එසේ තිබියදී ඉන්දියාවෙන් ගස් මදින්නන් ගෙන්වන්නට යන්නේ මක් නිසාදැයි මට නම් තේරෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නේ නැහැ. ඉන්දියාවෙන් ගස් මදින්නන් ගෙන් වුවහොත් ටික කලක් යන විට ඔවුන් ලොකු මුදලාලිලා බවට පත් වෙනවා. දැනටත් සමහර ගම්වල ඒ විධියේ මුදලාලිලා සිටිනවා පමණක් නොව ඔවුන් ගම් ප්‍රධානීන් බවටත් පත් වී සිටිනවා. ඒ වගේම ඔවුන් රුපියල් දහස් ගණනින් ඉන්දියාවට මුදල් යවනවා. එම නිසා ඉන්දියාවෙන් මදින්නන් ගෙන්වීම ගැන මා සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. ගස් මදින්නන් දෙන බවට මා මේ ගරු සභාවේදී පොරොන්දු වුණා. දැන් මදින්නන් පුහුණු කරගෙන යනවා වගේම මදින්නන්ගේ ලැයිස්තුවක්ද මා මේ අමාත්‍යාංශයේ හිටපු ස්ථිර ලේකම්තුමාට දීලා ඇති. ඉන්දියාවෙන් මදින්නන් ගෙන්වීම සම්පූර්ණයෙන්ම විරුද්ධ බව ප්‍රකාශ කරන අතර අපේ රටේ රැකී රක්ෂා නැති උදවියගෙන් ගස් මදින්නන් පුහුණුකර ගන්නට පුළුවන් බව මතක් කරන්න කැමතියි.

ඊළඟට මීගමුවේ නගර සභාවේ සභාපතිතුමාත්, කොමසාරිස්තුමාත් එහි සේවකයන්ට කරන හිරිහැර ගැනද මතක් කළ යුතුයි. මේ නගර සභාවේ වෘත්තීය සමිතියක සේවකයන් කීප දෙනකු ගරු ඇමතිතුමාත්, පාර්ලිමේන්තු ලේකම්වරියත් හමු වී ඔවුන්ට මුහුණ පාන්නට සිදු වී තිබෙන තත්ත්වය ගැන කරුණු ප්‍රකාශ කළා. ඒ වගේම ඔවුන් පළාත් පාලන කොමසාරිස්තුමාත් හමුවී කරුණු ඉදිරිපත් කළා. මීගමු නගර සභාවේ සභාපතිතුමාත්, කොමසාරිස්තුමාත් අත්තනෝමතික විධියට කටයුතු කරගෙන යන අතර, සේවකයන්ගේ වෘත්තීය සමිති ව්‍යාපාර කඩාකප්පල් කිරීමට ක්‍රියා කරනවා. ඒ නිසා ඒ කරුණු ගැන පරීක්ෂණයක් පවත්වන මෙන් මා ඉල්ලා සිටිනවා

අවසාන වශයෙන් පළාත් පාලන කටයුතු දියුණු කිරීමට මහන්සි ගැනීම ගැන පළාත් පාලන කොමසාරිස් මහතන්තිල මහත්මයාට ස්තුතිය පළ කරන්නට ඕනෑ. ඒ මහත්මයා පළාත් පාලන කොමසාරිස්වරයා වශයෙන් පත් වී තවම වැඩි කලක් නැහැ. නමුත් එතුමා බොහොම මහන්සියෙන් කටයුතු කරගෙන යන බව පෙනෙන්නට තිබෙනවා. නොදියුණු ගම්කාර්ය සහා ප්‍රදේශ දියුණු කිරීම සඳහා එතුමා බොහොම මහන්සියෙන් කටයුතු කරගෙන යනවා. ඒ මහත්මයාගේ සේවය ලබාගෙන පිටිසර ප්‍රදේශවල ගම්කාර්ය සභා දියුණු කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.** (කලවාන)

*(திரு. எல். டி எஸ். ஏ. குணசேக்கர—களவான)*

(Mr. L. de S. A. Gunasekera—Kalawana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මා නියෝජනය කරන ප්‍රදේශයේ තිබෙන අඩුපාඩු ගැන කථා කරන්නටයි, මා අදහස් කරන්නේ. මගේ කොට්ඨාශයේ, කුකුල් කෝරළේ ආදායම් පාලක නිලධාරියකු නැතුව දැන් මාස 9ක් ගත වී තිබෙනවා. 1964 ජනවාරි මාසයේ සිට තවම කිසිවකු ඒ ප්‍රදේශය වෙනුවෙන් පත් කර නැහැ. ආදායම් පාලක නිලධාරියකු නොමැතිව ඒ ප්‍රදේශයේ ජනතාව වැඩ කර ගන්නෙ කාගෙන්ද කොහොමද? කියා මම ප්‍රශ්න කරනවා. විශේෂයෙන්ම මේ කාරණය ගරු ඇමතිතුමාගේත්, ස්ථිර ලේකම්තුමාගේත් සැලකිල්ලට යොමු කරවනවා. මේ සිද්ධිය පිළිබඳව සම්පූර්ණ විස්තරයක් පසුව කිරීමට මම අදහස් කරනවා. මෙසේ ආදායම් පාලක නිලධාරියකු නොමැතිවීම නිසා ඒ ප්‍රදේශයේ ජනතාවට විඳින්නට සිදු වී තිබෙන කරදර අප්‍රමාණයි. හාල් පොතක් ලබා ගැනීමට, කච්චේරියෙන් ඉඩමක් ලබා ගැනීමට, වෙනත් රාජකාරි කටයුත්තක් කර ගැනීමට නොහැකිවීම නිසා ඒ ප්‍රදේශයේ ජනතාව හිරිහැර විඳිනවා. මොකද, ඒ ප්‍රදේශවල ජනතාව ආදායම් පාලක නිලධාරිතැනගේ මාර්ගයෙන් බොහෝ කටයුතු කර ගන්නවා. එම නිසා ආදායම් පාලක නිලධාරියකු නැති වීමෙන් ඒ අයට සිදු වන පාඩුව බොහොමයි. නමුත් මෙපමණ කලක් ගත වන තුරුත් නිලධාරියකු පත් කර එවීමට නොහැකි වීම ගැන මම කනගාටු වෙනවා.

හිටපු ආදායම් පාලක නිලධාරිතුමා ගැනත් වචනයක් සඳහන් කරන්න ඕනෑ. මගේ කල්පනාවේ හැටියට මුළු ලංකාවේම සිටින ආදායම් පාලක නිලධාරිවරුන් අරගෙන බැලුවාම, මේ තරම් හොඳ, යහපත් ආදායම් නිලධාරිතුමකු මුළු ලංකාවේම නැතැයි කියා මට නිර්භයවම කියන්න පුළුවනි. එවැනි උතුම් පුද්ගලයකුට දෙපාර්තමේන්තුවෙන් නොයෙකුත් තාඩන පීඩනවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

භාජන වෙන්නට සිදු වුණු නිසා එතුමා සේවයෙන් විශ්‍රාම ගත්ත. සිංහල පණත උඩ ඒ මහත්මය විශ්‍රාම ගත්ත. ආර්. බී. රත්නායක මහත්මයාය කීවාම ඕනෑම කෙනෙකු හඳුණනව. බෞද්ධ රත්නායක යනුවෙන් හඳුන්වන්නෙත් මේ මහත්මය මයි. උසස් තැන්වල අත ගැසීම් නිසා, දෙපාර්තමේන්තුවල අනිසි වැඩ කටයුතු නිසා ඒ මහත්මයට රජයේ සේවයෙන් ඉවත් වෙන්න සිදු වුණා. මෙවැනි තත්ත්ව යක් ඇති වීම ගැන ඇත්ත වශයෙන්ම අප කනගාටු වෙනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආදායම් පාලක නිලධාරිතුමකු වශයෙන් ඒ මහත් මයා වැදි හත්පත්තුව, කලවාන වැනි ප්‍රදේ ප්‍රදේශවල වැඩ කර ඉන් පසු දුම්බර ආදු යම් පාලක කොට්ඨාශයට මාරු කර හැරිය. ඒ මහත්මය රිය අනතුරකට මුහුණ පා තිබුණු නිසා වෛද්‍යවරුන් ඒ මහත්මයට නියම කළා, දුෂ්කර ප්‍රදේශවල වැඩ කරන් නට යන්නට එපාය කියා.

අවුරුදු විසි ගණනක කාලයක් අවංකව රජයේ සේවය කළ මේ මහත්මය දුම්බර ප්‍රදේශයට මාරු කර හැරිය. එසේ මාරු වීම ලැබුණු දාට පසුවදා උදේ නැවතත් ඒ මහත්මයව වැදි හත්පත්තුවට මාරු කර යවා තිබුණා. ඇත්ත වශයෙන් මේ අන්දමට, දුම්බරට මාරු කළ දිනයේම නැවතත් මාරු කර යැවීම ගැන එතුමා ඉතාමත් කළකිරුණා. මොකද කාරණය. රත්නායක මහත්මයා මාරු කර යවා, දුම් බරට ආදුයම් පාලක වශයෙන් පත් කර එව්වෙ මැණික්දිවෙල කියන මහත්මයකුයි. ගිය වර්ෂයේදී මැණික්දිවෙල මහතා පිළිබඳව ගරු සභාවේදී ඇතැම් මන්ත්‍රී වරුන් වර්ණනා මුඛයෙන් කථා කළා. නමුත් ඒ විධියට ගුණ වර්ණනා කරන එක අගුණ බවයි මට හැඟෙන්නෙ. මැණික්දිවෙල කියන නම මතක් කරන විට, කතරගම දේවාලය ගැන මැණික්දිවෙල මහතා සම් බන්ධ වැඩ කටයුතු ගැන අපට සිහි වෙනව. මට මතක හැටියට ඒ මැණික්දිවෙල මහතාදි මන්ත්‍රීවරුන් කීප පළක්ම විවේ චනය කළා. එසේම ඒ මහත්මයා ගැන නොයෙකුත් අන්දමේ වැරදි ඉදිරිපත් කළ නිසයි, ඒ මහත්මය මාරු කර තිබෙන් නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කියන මැණික්දිවෙල මහත්මය නෑදෑකම් කියන්නෙ රත්වත්තෙ පවුලටයි. එස්. එල්. රත්වත්තෙ මහත්මයාගෙ පුතා බැඳලා ඉන්නෙ මේ මැණික්දිවෙල මහත් මයා බැඳල ඉන්න නෝනගෙ නංගියි. මෙන්න මේ කාරණය උඩ තමයි දුම්බර ආදායම් පාලක කොට්ඨාශය මැණික්දිවෙල මහත්මයාට ලැබුණේ. මේ කාරණය උඩයි රත්නායක මහත්මයාට ඉල්ලා අස් වෙන්න සිදු වුණේ. එසේ ඉල්ලා අස් වීමෙන් පුරප්පාඩු වූ ධුරයට කෙනෙක් පත් කර නැති නිසා අද කලවාන කුකුල් කෝරළේ මහජනතාවට දුක් විඳින්න සිදු වී තිබෙනව. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලු වාම කියනවා, පත් කර එවීමට ආදායම් පාලක නිලධාරීන් නැත කියා. නමුත් ආදායම් පාලක නිලධාරි මහත්වරුන් උසස් කර වෙන ඨානාන්තරවලට පත් කරනවා නම් ඊට පහළින් සිටින නිල ධාරීන් උසස් කර ආදායම් පාලක නිලධාරි තනතුරුවලට පත් කරන්නෙ නැත්තෙ ඇයි? එහෙම කෙනෙක්වත් පත් කර එවනවා නම් අපි සන්තෝෂ වෙනව. මා එසේ කියන්නෙ වෙන යම් කිසි දෙයක් නිසා නොව, මගේ කොට්ඨාශයේ ජනතාව අද දුක් විඳින නිසයි. හාල් පොතක් නැති වූ විට පොතක් ගැනීම පිණිස සාමදාන විනිශ්චයකාර වරයෙක් අත්සන් කරන්න ඕනෑ. ඒ කොට්ඨාශයට සාමදාන විනිශ් චයකාරවරුන් වශයෙන් සිටින්නේ පළාතේ මන්ත්‍රීවරයාත් නිල බලයෙන් පත් වන ගම් සභාපතිවරු තුන් දෙනාත් පමණයි.

මේ කරුණු අනුව මේ මාසය ගත වන් නට කලින් ඉක්මනින්ම කලවාන ප්‍රදේශ යට ආදායම් පාලක නිලධාරිතුමෙක් පත් කර එවන්නය කියා මම ඉල්ලනවා. ඒ අතරම මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, රත්නායක මහත්මයාට ලැබුණ මාරුව මැණික්දිවෙල මහත්මයාට දුන්නෙ මොන කාරණයක් උඩද කියා පරීක්ෂා කර බලන්නය කියා. ඒ ගැන ක්‍රියා කරන ලෙස උප ඇමතිතුමියගෙනුත් ඉල්ලා සිටිනව.

රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් දිගු කාලයක් එක තැනකම සේවය කිරීම ගැනත් කරුණු කීපයක් සඳහන් කරන්න ඕනෑ. සමහර කච්චේරිවල නිලධාරීන් අවු රුදු 7, 8, 10, 12 ආදි වශයෙන් දීර්ඝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයක් තිස්සේ ඉන්නව. විශෙෂයෙන් ගාල්ල, නුවර වැනි ප්‍රදේශවල අවුරුදු 10, 12, පරණ නිලධාරීන් ඉන්නව. නමුත්, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, කලවාන, මඩකලපුව වැනි ප්‍රදේශවල දුක් විඳින අහිංසක නිලධාරීන් ඉන්නව. ඒ නිසා කොළඹ වැනි නගරබද ආශ්වාදය ලබා ගැනීමට ඒ නිලධාරීන්ටත් අවස්ථාවක් සලසා දෙන්න ඕනෑ. රජයේ සේවයට බඳවාගෙන තිබෙන්නේ එක් ස්ථානයක පමණක් සේවය කරන්න නොවෙයි: ලංකාවේ ඕනෑම තැනක සේවය කරන්නයි. එසේ නම්, ඇයි සමහර දෙනකුට පමණක් විශෙෂ වරප්‍රසාද දී තිබෙන්නෙ? සමහර නිලධාරීන්ට තමන් මුලින් පත් වූ කාර්යාලයේම පෙන්ෂන් යන තුරු සේවය කිරීමට සිදු වී තිබෙනව. එම නිසා මේ ක්‍රමය වහාම වෙනස් කරන ලෙස මා ඉල්ලනව.

අ. භා. 5

ඊ ළඟට මම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටින්න කැමතියි, දිසාපතිවරුන් පත් කර යවන විට තරමක දැනීමක් තිබෙන අය ඒ තනතුරුවලට පත් කර යවන්නය කියා. කිසිම පළපුරුද්දක් නැති අවුරුදු 3ක් 4ක් පමණ සිවිල් සේවයේ සිටි උදවිය දිසාපතිවරුන් වශයෙන් පත් කර යවනව. එවැනි අය පළාතක් භාරව ගිය විට ඒ පළාත පිළිබඳ වගකීම සම්පූර්ණයෙන්ම පැවරෙන්නෙ ඒ අයටයි. ඒ නිසා ඒ සඳහා හොඳ හැටි පළපුරුදු තිබෙන අය යවන්න ඕනෑ. කොළඹට පමණක් සීමා වූ සමහර සිවිල් සේවකයන් ඉන්නව. දක්ෂ සිවිල් සේවකයන් ඉන්නව. ඒ අය අදහස් කරන්නෙ වැඩ තිබෙන්නෙ කොළඹ පමණය කියා. නැහැ, වැඩ තිබෙන්නෙ කොළඹ පමණක් නොවෙයි. කොළඹ තිබෙන වැඩේ නම් උදේ 9 ට කාර්යාලවලට පැමිණ සවස හතර හමාරට ගෙදර යාමයි. එයත් වැඩි හරියක්ම තිබෙන්නෙ මැද කොළඹයි. පරිපාලන සේවකයන් උදේ දහයට, දහය හමාරට කන්තෝරුවට එනව. දවල් 12 ට විතර කෑමට යනව. හැන්දැවෙ කාර්යාලයට එන්නෙත් නැහැ. ඒ ගැනත් වහාම පරීක්ෂණයක් කරන්ට කියා මා ඉල්ලා සිටිනව.

ග්‍රාම සේවකයන් ගැන කිය වුණා. ග්‍රාම සේවකයන්ට වැඩ වැඩි බව බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. දැනට ග්‍රාම සේවකයන්ට භාර වී තිබෙන වැඩම තමයි, ඉස්සර හිටපු ගම්මුලාදෑනීන්ටත් පැවරී තිබුණේ. එදා සිටි ගම්මුලාදෑනීන්ට එතරම් අධ්‍යාපනයක් ලැබී තිබුණේත් නැහැ. අද ග්‍රාම සේවකයන් සෑම කෙනෙකුටම අධ්‍යාපන සුදුසුකම් තිබෙනව. අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය සමත්වුණු උදවිය තමයි, අද වැඩි වශයෙන් ග්‍රාම සේවකයින් වශයෙන් පත් වී සිටින්නෙ. මාරු කිරීම් සහිතව ග්‍රාම සේවක ක්‍රමය ආවොත් ඔවුන්ට ආරක්ෂාවක් නැති බව මා එදා කිව්ව. ඒ ක්‍රමය ගෙනෙනවා නම් ග්‍රාම සේවක මහත්වරුන්ට නිවාස තනා දෙන්ට යයි මා ඉල්ලා සිටියා. අද පවතින ක්‍රමය උඩ ග්‍රාම සේවකයින්ට තම රාජකාරිය හරි හැටි ඉටු කරන්ට ලොකු අපහසුවක් තිබෙනව. ග්‍රාම සේවකයන්ට ඉන්ට තැනක් නැහැ. තමන්ගේ ගමේ තමන්ගේ ගෙදර නොවෙයි, අද ග්‍රාම සේවකයන් සිටින්නෙ. අද ඔවුන්ට සිදු වී තිබෙන්නෙ වෙනත් කෙනෙකුගෙ ගෙදරක බෝඩිං වෙන්ටයි. ඔවුන්ට අද බෝඩිං ගාස්තුව වශයෙන් රුපියල් හැට-හැත්තෑවක් ගෙවන්ට සිදු වී තිබෙන අතර ආණ්ඩුවෙන් ගෙවල් කුලී වශයෙන් ලැබෙන්නෙ රුපියල් හයක් හෝ හතක් පමණයි. ඒ ගෙවල් හිමියන් කියන විධියට ග්‍රාම සේවකයන්ට අද රාජකාරි කටයුතුත් කරන්ට සිදු වී තිබෙනව. එසේ නැත්නම් ගෙදරින් යන්ට සිදු වෙනව. ග්‍රාම සේවකයන්ට වැඩ අඩු කළොත් ඒකෙන් පහර වදින්නෙ මහජනයාටයි. ග්‍රාම සේවකයන්ට වැඩ වැඩි නම් තවත් නිලධාරීන් කොටසක් පත් කරන්ටයි, සිදු වෙන්නෙ. රජයේ මුදල් නැති නිසා ඒක කරන්ටත් බැහැ. ආණ්ඩුවෙන් මා ඉල්ලා සිටිනව, වහාම ග්‍රාම සේවකයන්ට නිවාස තනා දීමේ ක්‍රමයක් යොදන්ටය කියා.

ඒ අතරම මතක් කළ යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනව. උඩරට ගැමි කොමිසමට සබරගමුවත් ඇතුළත් කරන්ට කියා යෝජනා කර තිබෙනව. අපි බලාපොරොත්තු වුණා, ඒක ඉක්මනින් කෙරෙයි කියා. අර කොකා මුහුදෙ වතුර හිඳෙන තුරු බලා සිටින්න වගේ අපිත් බලා සිටිනව; නමුත් තවම ඒක ඉටු වුණේ නැහැ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

ගැන තවම පියවරක් මේ දෙපාතීමේන්තුව මගින් නොගැනීම ගැන මා කනගාටු වෙනව. අපට යෝජනාවල් විතරක් මදි; වැඩත් කෙරෙන්ට ඕනෑ.

ඊළඟට සුරාව සම්බන්ධයෙන් අදහස් සැම දෙනකුගෙන්ම වගේ කිය වුණා. රා සඳහා පොල් ගස් මැදීමට ඉඩ දීම ගැන මා නම් ඉන්තේරුවෙන්ම විරුද්ධයි. පොල් වලට විතරක් අවසර දී තිබෙනව. බොහෝ දෙනකු කල්පනා කරන්නෙ නැහැ, කලවාන වගේ ප්‍රදේශවල කිතුල් තිබෙන බව. කිතුල් මදින්ට අවසර දුන්න නම් මීට වඩා යහපතක් සිද්ධ වෙනව. පොල්වලින් ඒ තරම් යහපතක් ඇති වන්නෙ නැහැ. කිතුල් රාවල විටමින් ද මොනවදත් තියෙන වලු. කිතුල් ගහක් යටින් ගියත් ඇගේ තිබෙන උෂ්ණය, රක්ත වාතය නැති වෙන වාය කියාත් සමහරු කියනව. ඒ වගේම ලංකාවේ සැම තැනම රා මදින්න අවසර දීල කසිප්පු වසංගතය නැති කරන්ට කවදා වත් බැරි බව මා කියනව. කසිප්පු නැති කිරීමට නම් ඒ ඒ දෙපාතීමේන්තුවලට වහාම පියවර ගන්ට යයි කියන්ට ඕනෑ. පොලිස් දෙපාතීමේන්තුව තිබෙනව; සුරා බදු දෙපාතීමේන්තුව තිබෙනව; ග්‍රාම සේවකයන් සිටිනව; ග්‍රාම සංවර්ධන සමිති තිබෙනව; පාසැල් හා පන්සල් තිබෙනව; ඒවා මාර්ගයෙන් කසිප්පු මර්දනය කරන්ට අපි උත්සාහ නොගන්නෙ ඇයි? එෆ්.ආර්. සේනානායක මහත්මයා, ශ්‍රීමත් බාරොන් ජයතිලක, ඊ. ඩබ්ලිව්. පෙරේරා මහත්මයා වැනි අය අවුරුදු 50 කටත් වැඩි කාලයක් මහන්සි දරා සුරාව නැති කරන්න වැඩ කටයුතු කළා. අද අපි එක පෑන පාරකින් රා මදින්න ඉඩ දෙන්නට කල්පනා කරනවා. අවුරුදු පණස් ගණනක් තිස්සේ ඒ මහත්වරුන් මහන්සි දරා නැති කරන් නට වීරිය කළ දෙයකට අපි එක පෑන් පහරකින් ඉඩ දෙනවා නම්, ඒක කොයි තරම් අපරාධයක්ද? මේ රටේ සුරාව නැති කරන්නයි අප උත්සාහ කළ යුත්තෙ. එහෙම නැතිව සුරාවට නැත්නම් රා මැදීමට ඉඩ දීමෙන් මේ රටේ කසිප්පු වසංගතය නැති කරන්න පුළුවන්ය කියා මා හිතන්නෙ නැහැ.

අද මහජනයා හොඳ දේකට පොළඹ වන්න අමාරුයි. නරක දේකට නම් සැම කෙනෙක්ම බොහොම ඉක්මනින් පොළඹ වන්න පුළුවන්. රා මැදීමට ඉඩ නොදෙන අතරම, මේ රටේ තිබෙන සැම බීම සාප්පු වක්ම වහන්නට කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. කසිප්පු නැති කරන්න නම් එසේ නොකර බැහැ. ලංකාවේ තිබෙන සැම රටබීම සාප්පුවක්මත් නැති කරන්න කටයුතු කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රා බොන්නට ඉඩ දුන් නොත් කසිප්පු නැති කරන්න පුළුවන්ය කියා අපි හිතනවා නම්, පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් මම එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. අපි සිගරට් බොන්න පුරුදු වී සිටිනව. එහෙත් එක එක්කෙනා බොන්නෙ එක එක වර්ග. සමහර අය "පිකොක්" බොනවා; සමහර අය "ත්‍රී රෝසස්" බොනවා; තවත් සමහරෙක් "බ්‍රිස්ටල්" "නැවිකට්", "ආඩත්", "ඩුමෝරියර්" ආදි වශයෙන් බොනව. "බ්‍රිස්ටල්" බොන්න පුරුදු වූ කෙනෙකුට "පිකොක්" එකක් දුන්නට බොන්න කැමති නැහැ. "පිකොක්" බොන්නට පුරුදු වී සිටින කෙනෙකුට "නැවිකට්" එකක්, "ආඩත්" එකක් නැත්නම් "ඩුමෝරියර්" එකක් දුන්නට බොන්න කැමති නැහැ. බීඩි බොන කෙනෙක් බීඩි බොනවා මිස සිගරට් බොන්නෙ නැහැ. ඒ වගේ කසිප්පු බොන්න පුරුදු වූ කෙනෙක් කසිප්පු බොනවා මිස, වෙන දෙයක් බොන්නෙ නැහැ.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

කසිප්පු බොන එක හොඳයි කියලද කියන්නෙ?

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேகா)*
(Mr. L. de S. A. Gunasekera)

කසිප්පු බොන එක නතර කරන්න නීති හදන්න ඕනෑ. සුරාබදු දෙපාර්තමේන්තුව මොකක්ද කරන්නෙ? රා බොන්නට ඕන හැටියට අවසර දුන්නම කොතනද කසිප්පු තිබෙන්නෙ, කොතනද රා තිබෙන්නෙ, කියල සොයා ගන්න පුළුවන්ද? එහෙම නම් සුරාබදු දෙපාර්තමේන්තුව වහාම නැති කරන්න. එහෙනම් මොනවටද ඔවුන් පත් කරන්නෙ? ඒවා කරන්න බැරි නම්, මොනවටද දෙපාර්තමේන්තුවක් ඇති කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නෙ? එහෙනම් ඒ අයට තිබෙන වැඩේ මොකක්ද? ගමක කසිප්පු තිබෙන්නෙ කොහේද කියා සොයා ගන්න ග්‍රාම සේවකයාට බැරිද? සුරාබදු දෙපාර්තමේන්තුව කරන්නෙ මොකක්ද? ඒවා කරන්න බැරි නම් ඒ අයට පඩි දෙන්නෙ ඇයි? සමහර අය කියනවා ඒ අයට "වීරවිලිං" එක දෙන්නෙ බොහොම ටිකයි; ඒ නිසා අමාරුයි කියල. අද හැමෝම තමන්ගේ සේවය රට වෙනුවෙන් කරන්න බලාපොරොත්තු වන්නේ පඩියටයි. අපට වුවමනා කරන්නෙ ඒක නොවෙයි. අපි බලාපොරොත්තු වන්නෙ සේවය. රටට සේවයක් කරන තැනැත්තා පඩිය ගැන බලන්නෙ නැහැ. සැම නිලධාරියෙක්ම අවංක වෙන්න ඕනැ. එහෙම කියන සැම කෙනෙක්ම වැඩ කරන්නෙ පඩියට. ඔවුන් බටා ඉල්ලනව. පඩියක් දෙන්නෙ තමන්ගෙ සේවයට. පඩිය අනුව වැඩ කරන්න අමාරුයි කියා අපි පිළිගන්නවා. නමුත් අපි අවංක වෙන්න ඕනැ.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

The hon. Member has already taken about 20 minutes.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேகர)*
(Mr. L. de S. A. Gunasekera)

බොහොම ඉක්මනින් ඉවර කරනව. ඊළඟට මා රේස් ගැන එක කාරණාවක් අහනව. අපි රේස් තහනම් කරනවා, තහනම් කරන්න උත්සාහ ගන්නවා, නමුත් සුරාවට අවසර දෙනවා. අපි සුරාව තහනම් කරන්ට උත්සාහ කරනව. අපි සුරාව නැති කරන්ට වුවමනා ය කියනව. නමුත් සුරාව ඇති කරනව. ඒ අතරම රේස් නැති කරන්ට යනව. රේස් කොහොමද නැති කරන්නෙ? අද රේස් නැති කරන්න ගිහින් මේ රටේ සංවර්ධන වැඩවලට ගන්න තිබුණු රුපියල් කෝටි ගණනක් නැති කරගෙන තිබෙනව. කව්ද ඒ මුදල හම්බු කර ගත්තෙ? මුක්තාර්, තැ.හ., ආදීන් හොර බුකිවලින් අද ඒ මුදල හම්බ කරගෙන තිබෙනව. නිලධාරීන්ගේ කීම උඩ සංවර්ධන වැඩවලට ගන්න තිබුණු විශාල මුදලක් නැති කරගෙන තිබෙනව. රේස් කවදාවත් නැති කරන්න බැහැ. [...] නැති කළත් සුදුව කියන එක නැති කර කරන්න බැහැ. අද සමහරු කා.ඩ් එකක් එන විට ඒකෙ අංක ඔත්තෙද ඉරට්ටෙද කියා ඔට්ටු අල්ලනව.

**සුමනපාල දහනායක මයා.**
*(திரு. ஸுமனபால தகநாயக்க)*
(Mr. Sumanapala Dahanayake)

තමුන්නාන්සෙ රේස් පවත්වනවාට පක්ෂද?

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி எஸ். ஏ. குணசேகர)*
(Mr. L. de S. A. Gunasekera)

මම මේ පක්ෂවවත් විපක්ෂවවත් කථා කරනවා නොවෙයි. මා පක්ෂද විපක්ෂද කියා තමුන්නාන්සෙ වටහා ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර උදවිය කපුටා වහන්නෙ කොයි වහලෙද කියා ඔට්ටු අල්ලනව. තවත් සමහරු කඩදාසි කෑලි තබා මැස්සා වහන්නෙ කොයි කඩදාසියෙද කියා ඔට්ටු අල්ලනව. මේවා අපි නැති කරන්නට ඕනැ. රේස් සම්බන්ධයෙන් මා එපමණයි කියන්නෙ.

ඊළඟට මගේ කොට්ඨාශයේ කහන්නැන්නෙ පාලමකට 1960 දී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රුපියල් 76,000 ක් අනුමත කළා. ඊට පසු වැඩේ කොන්ත්‍රාත් දුන්නා. කොන්ත්‍රාත් දුන්නට පස්සෙ ගැසට් කළා. ඒ අවස්ථාවේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව කියා සිටියා, මේක අපේ පාරක්, ඒ නිසා පළාත් පාලන අංශයෙන් මේක කරන්ට දෙන්න බැරිය, කියා. පසුව මා මේ ගැන නොයෙක් අවස්ථාවලදී තර්ක කර, ඇමතිවරුන් දෙදෙනා එකඟ කරවා ගත්තා. ඊට පසු අමාත්‍යාංශ දෙකේ ස්ථාවර ලේකම්වරු දෙදෙනාත් මේකට කැමති කරවාගෙන, මේ මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට දෙන්නටය කියා තීරණය කර ගත්තා. ඇමතිවරු දෙදෙනාත් මේකට එකඟ වුණා. දැනට අවුරුදු 4 ක් ගත වී තිබෙනව. නමුත් තවමත් ඒ කොන්ත්‍රාත්තුව සඳහා මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අරගෙන නැහැ. මේ කාරණය සම්බන්ධයෙන් මා මේ දෙපාර්තමේන්තු දෙකට 117 විතාවක් ගිහින් තිබෙනව. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරයෙකු [...] හරියට පියන් කෙනෙකු වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

මමත් ලිපි ගොනු මිටිය කිහිල්ලෙ ගහ ගෙන කාර්යාලයෙන් කාර්යාලයට ගියා. පළාත් පාලන දෙපාර්තමේන්තුවට ගියාම කියනව, ගරු මන්ත්‍රීතුමාගෙ ලියුම් නම් ඇවිත් තිබෙනව, ගිහින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙ ඇමතිතුමා මුණ ගැසෙන්නය කියා. රජයේ වැඩ දෙපාර්ත මේන්තුවට ගියාම කියනව, ස්ථාවර ලේකම් ළඟට යන්නය කියා. මේ විධියට කාර්යාලයෙන් කාර්යාලයට 117 වතාවක් ගිහින් තිබෙනව. නමුත් තවමත් රජයේ වැඩ දෙපාර්තමේන්තුව මේ වැඩ කටයුතු කරන්නෙ නැහැ. මේ නිසා මුළු රත්නපුර දිස්ත්‍රික්කයටම විශාල පාඩුවක් වී තිබෙනව. "මේජර් බ්‍රිජ්ස්" වලටය කියා පළාත් පාලන අංශයෙන් අවුරුද්දකට එක දිස්ත්‍රික්කයකට එක පාලමකට මුදල් වෙන් කරනව. ඒ අනුව දැනට පාලම් 4 සාදන්න තිබුණා. නමුත් මේ දක්වා එක පාලමක්වත් සාදා නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරන මෙන් මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 5.15

ඊළඟට අයගමටත් කලවානටත් නිවාස යෝජනා ක්‍රම දෙකක් ඉදිරිපත් වී තිබුණා. හිටපු ඇමතිතුමා පොරොන්දු වුණා අයගම ටත් කලවානටත් නිවාස යෝජනා ක්‍රම දෙකක් දෙනවාය කියා. ඒ දෙකම යටපත් වී තිබෙන බව මට දැන් පෙනෙනව. මොන හේතුවක් නිසා මේවා යටපත් වුණාද කියා මා දන්නෙ නැහැ. නිවාස යෝජනා ක්‍රම වුවමනා කරන්නෙ නොදියුණු ප්‍රදේශවලට බව මා විශේෂයෙන් මතක් කරන්ට ඕනැ. අපේ ප්‍රදේශවල මහජනයාට උළු නැත් නම් ටකරන් සෙවිලි කළ ගෙවල් සාදා ගන්න පුළුවන්කමක් නැහැ. අද රජයේ සේවකයන් එවැනි ප්‍රදේශවලට යන්න බයයි. මොකද, ඉන්න තැනක් නැහැ; ඉන්න ගෙවල් නැහැ. මැටියෙන් හදල අතු සෙවිලි කරපු ගෙවලටයි යන්න වෙලා තියෙන්නෙ. ඒත් නැත්නම් මැටියෙන් හදල බට පැළලි සෙවිල්ලපු ගෙවලටයි යන්න තියෙන්නෙ. විද්‍යාලයාධිපතිවරුන් වශයෙන් හෝ පාඨශාලාධිපතිවරුන් වශයෙන් හෝ ගුරුන් වශයෙන් හෝ එසේත් නැත්නම් වෙනත් රජයේ දෙපාර්තමේන්තුවල ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් හෝ පත්වීම් ලබාගෙන කොළඹින් එන උදවියට ඉන්නවත් තැනක් එහෙ නැහැ. ඒ අයට ඉන්න සුදුසු නිවාස යක් ගැමියන් විසින් හදලත් නැහැ; දෙපාර්තමේන්තු මගින් හදලත් නැහැ. එහාට එන කුමන තරාතිරමක හෝ නිලධාරීන්ට කාගේ හෝ ගෙදරක කාමරයකට වෙලා ඉන්නයි සිදු වෙලා තියෙන්නෙ. එහෙ තියෙන බොහොමයක් ගෙවල තියෙන්නෙත් කාමර දෙක තුනක් පමණයි. එවැනි ගෙදරක රජයේ සේවක යෙකුට ඉන්න කාමරයක් දුන්නම ගෙයි අයිතිකාරයට එක කාමරයක ඉන්න වෙනව. රජයේ සේවකයට අනෙක් එකම කාමරයේ ඉන්න වෙනව. ඒ නිසයි කලවානටත් අයගමටත් නිවාස යෝජනා ක්‍රම දෙකක් දෙන ලෙස මා ඉල්ලා සිටියෙ. ගම්බද ප්‍රදේශවලටත් නිවාස යෝජනා ක්‍රම වුවමනා කරනව. ඒවා නගරබද ප්‍රදේශවලට පමණක් සීමා කිරීම යුතු නැහැ. ඇයි එහෙම කරන්නෙ?

මේ රටේ ධනය උපදවන්නෙ කවුද? මට නිර්භයව කියන්න පුළුවනි, මේ රටේ ධනය නිපදවන්නෙ වැඩි වශයෙන්ම මා නියෝජනය කරන කොට්ඨාශය වැනි ගම් ගම්බද ප්‍රදේශවලය කියල. රබර් විශාල වශයෙන් නිපදවන්නෙත්, තේ සැලකිය යුතු ප්‍රමාණයක් නිපදවන්නෙත්, මුළු ලෝකයේම වටිනා මැණික් ලැබෙන්නෙත් රත්නපුරය සහ කලවාන වැනි ප්‍රදේශවලි නුයි. මට පෙනෙන හැටියට, ධනය වැඩි යෙන්ම නිපදවන ප්‍රදේශවලටයි අඩුවෙන් ම සේවය කරන්නෙ. වැඩියෙන්ම සේවය කළ යුත්තෙ අපේ ප්‍රදේශවලටයි. රබර් හෝ තේ හෝ මැණික් හෝ විකුණා ලබන අති විශාල ජාතික ධනය යොදා තමයි රජයේ නිලධාරීන්ට වැටුප් ගෙවන්නෙත්. ඒ නිසා කලවාන ඡන්දදායක කොට්ඨාශය වෙනුවෙන් හිටපු ගරු ඇමතිතුමා අනුමත කළ නිවාස යෝජනා ක්‍රම දෙක වහාම ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනව.

ඒ. රත්නායක මයා. (වත්තේගම)

(திரு. ஏ. ரத்நாயக்க—வத்தேகம)

(Mr. A. Ratnayake—Wattegama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ප්‍රීතියෙන් මගෙ අදහස් ප්‍රකාශ කරන්න බලා පොරොත්තු වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

How long will the hon. Member take ?

**ඒ. රත්නායක මයා.**
*(திரு. ஏ. ரத்னாயக்க)*
(Mr. A. Ratnayake)

Less than 10 minutes, Sir.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැද කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීතුමා එතුමගෙ කථාවේදි කියා තිබෙනව, විශේෂ කාරක සභාවෙ හිටපු මන්ත්‍රීවරු පොල් රා මැදීමට සතුටු වුණාය කියල. ඒක වැරදි ප්‍රකාශයක් බව කියන්න ඕනෑ. ඒක කියන්ටයි මා ඉදිරිපත් වන්නෙ. මක්නිසාද කියනවා නම්, ඒ කාරක සභාවේ, අපේ පක්ෂයෙ වෙනුවෙන් හිටපු මන්ත්‍රීවරයා මා නිසයි. එවකට ප්‍රසිද්ධියට පත් කර තිබුණු කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශවලට අපේ පක්ෂය සම්පූර්ණයෙන්ම එකඟ වෙනවය කියල මා මුලදිම ඒ විශේෂ කාරක සභාවට පැහැදිලිවම කියා සිටියා. ඒ කොමිෂන් සභාව පත් කළේ මා ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා හැටියට ඉන්න කොටයි. අලුවිහාරේ උන්නැහෙගෙ ප්‍රධානත්වයෙනුයි ඒ කොමිෂන් සභාව පත් කළේ. මන්ත්‍රීවරු කීප දෙනෙකුත් එහි හිටියා. ඒ කොමිෂන් සභාව ලංකාවේ සෑම තැනකටම වගේ ගිහිල්ල—ලංකාවේ පමණක් නොවෙයි, ඉන්දියාව ආදි වෙනත් රටවලටත් ගිහිල්ල—ඉතා හොඳින් කරුණු පරීක්ෂා කර බැලුව. ලංකාවේ දෙසිය ගණනක්, කොමිෂන් සභාවට සාක්ෂි දී තිබෙනව. ඒ වගේම සමස්ත ලංකා බෞද්ධ සමිති සම්මේලනය, තරුණ බෞද්ධ සමිතිය වැනි සමිති සමාගම් මගිනුත්, භික්ෂූන් වහන්සේලා කීප නමක් විසිනුත් කාරණා රාශියක් අඩංගු කරන ලද ලියුම් දෙසියයක් පමණ ලියා එව්වාය කියා මා කල්පනා කරනව. එතකොට ඒ කොමිෂන් සභාව බොහොම කාලයක් තිස්සේ මේ ගැන සාකච්ඡා පවත්වා ඉතාමත් වැදගත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව බණ්ඩාරනායක මැතිතුමා මේ රටේ අගමැතිවරයා වශයෙන් හිටපු කාලයේදී ආණ්ඩුවට ඉදිරිපත් කළා. 1957 දී එය ලංකා ආණ්ඩුවේ සැසි වාර්තාවක් හැටියටත් නිකුත් කරනු ලැබුවා. 1957 අවුරුද්දෙ 19 වැනි සැසි වාර්තාව හැටියට ඒ වාර්තාව ප්‍රසිද්ධ කළාය කියා මා හිතනව. එහි තිබෙන්න වූ නිර්දේශ හැම එකක්ම සමග අපි එකඟ වෙනව. මුලදිම ඔය විශේෂ කාරක සභාවට ඒ බව මා කියා සිටියා. ඒ අය මෙම කාරණය ගැන බොහෝ කාලයක් සාකච්ඡා කරලයි, මෙම කරුණු ඉදිරිපත් කළේ.

ඊට පසු වර්තමාන ආණ්ඩුව මගින් 1961 දී කාරක සභාවක් පත් කළා. එම කාරක සභාව අවුරුද්දකින් පමණ අහෝසි වුණා. නැවත කාරක සභාවක් පත් කර අවුරුදු 2 ක් පමණ ගත වුණා. ඒ කාරක සභා දෙකේ නිර්දේශ ඉදිරිපත් කරන්නත් පෙර "පටස්" ගාල මෙවැනි නිගමනයකට ඇමති මණ්ඩලය බැස්සෙ කුමන හේතුවක් නිසාද යන්න මා නම් දන්නෙ නැහැ.

අයවැය ලේඛනයට ඇතුළත් සෑම දෙයක් ගැනම මේ ඇමතිවරු පැය දෙකකට වඩා සාකච්ඡා කර නැහැ. මගේ කල්පනාවෙ හැටියට රා මැදීම ගැන මිනිත්තු පහක්වත් සාකච්ඡා කර නැහැ. ඒකයි, කනගාටුව. තමුන්නාන්සෙලගෙ ආණ්ඩුව පත් වුණේ, සුරා සූදු ව්‍යාපාර සම්පූර්ණයෙන් නැති කරන ප්‍රතිපත්තිය උඩයි. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා විශාල සුරා විරෝධි ව්‍යාපාරයක් පටන් ගත්ත. තමා අගමැති වුණොත් පැය 24 න් සුරාව සම්පූර්ණයෙන්ම තහනම් කරනව කීව. එම ව්‍යාපාරය පිළිබඳ පළමු රැස්වීම පැවැත්තුවෙ කැළණිය ආසනයෙයි.

**රෝයි රාජපක්ෂ මයා.** (හක්මන)
*(திரு. ரோய் ராஜபக்ஸ—ஹக்மன)*
(Mr. Roy Rajapakse—Hakmana)

පැය විසි හතරෙන් සිංහල භාෂාව රජයේ භාෂාව කරනව කියලයි කීවේ. එතුම කවදාවත් එහෙම කීවෙ නැහැ. බොරු කියන්න එපා.

**ඒ. රත්නායක මයා.**
*(திரு. ஏ. ரத்னாயக்க)*
(Mr. A. Ratnayake)

එතුම, සුරාව තහනම් කරනව කීව. මල් කොමිෂන් සභාවෙ වාර්තාවක් තිබියදීත්, තව කොමිටියක් අවුරුදු 2 ක් පමණ කාලයක් මේ ගැන සාකච්ඡා කර තිබියදීත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

තමුන්නාන්සෙලගෙ ඇමති මණ්ඩලය රා සම්බන්ධයෙන් මිනිත්තු පහක්වත් සාකච්ඡා කළාය කියා මා සිතන්නේ නැහැ. පැරණි නිර්දේශ ඔක්කොම පැත්තකට දමා "කසිප්පු මර්දනය සඳහා රාවලට පොල්ගස් මැදීම හොඳය" කියා නිගමනය කට බැසීම යුක්ති සහගතද නැද්ද කියා මා තමුන්නාන්සෙලගෙන් අහනව.

කසිප්පු මර්දනය සම්බන්ධයෙන් අපේ ප්‍රතිපත්තිය අපි කාරක සභාව ඉදිරියෙ කියා සිටිය. කසිප්පු මර්දනය සඳහා අපි රජයෙන් බලාපොරොත්තු වුණේ විශාල ව්‍යාපාරයක්. කසිප්පු මර්දනය කිරීමෙ ව්‍යාපාරය අමද්‍යප සභාවට පමණක් භාර නොදී රජයෙනුත් ඒ සඳහා විශාල ව්‍යාපාරයක් ගෙන යා යුතු බව මා කියා සිටිය. එදා කාරක සභාවේදි බොහොම විස්තර ඇතුව නිර්දේශ රාශියක් අපි ඉදිරිපත් කළා. ඒ රටේ මහ ජන මතයයි. මෙතරම් සොයා බලා මහජන මතය පැහැදිලි කර තිබියදීත් මේ විධියටයි තමුන්නාන්සෙල මහජන මතය තෝර ගෙන තියෙන්නෙ. කවුරුවත් කීවෙ නැහැ. ඔය විධියට ගස් මදින්නය කියා. කාරක සභාවේදි ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) එහෙම කීවදැයි මට මතක නැහැ. කසිප්පු මර්දනය සංස්කෘතික දෙපාර්තමේන්තුවට පැවරිය යුතුය කියායි, එදා කල්පනා කළේ. තවත් දෙයක් තමයි, මෙම ගොඩනැගිල්ලෙ බීම තහනම්. ඒක, දිවංගත බණ්ඩාරනායක රජය මගින් ක්‍රියාවෙ යෙදෙව්ව. තමුන්නාන්සෙල මෙම නිර්දේශ ක්‍රියාවෙ යොදවන්න බැදිලයි, සිටින්නෙ. මත් ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම තහනම් කිරීමයි, තමුන්නාන්සෙලගෙ පරමාර්ථය වී තිබුණේ. එම වැඩ පිළිවෙළ ඉටු කරන්නෙ කෙසේද යන්න ගැන සාකච්ඡා පවත්වා තිබෙනව. එක පාරටම නොවෙයි. මේ සම්බන්ධව මහජන මතය ඇති කරල, මෙහි ආදීනව සම්බන්ධව මහජනයට පුළුවන් තරම් කරුණු අවබෝධ කරල, මහජනයාගෙන් සහයෝගය ඇතිව මත්පැන් වගී තහනම් කරන්න ඕනෑ. යාපනයේ ගස් මැදීමට දැනට අවසරය දී තිබෙනව. 298 වැනි පිටුවේ ඒ ගැන මේ විධියෙ නිර්දේශයක් කර තිබෙනව: In the Jaffna District the tree tax system should be replaced by the tavern system.

යාපනයෙම දැන් ගස් 43,000 කට පමණ අවසර දී තිබෙන බව මෙහි තියෙනව. අපි එහාට ගියාම කිව්, යාපනයේ තැබෑරුම් 43,000 ක් තියෙනව කියා. යාපනයේ පමණක් ගස් 43,000 ක් මදිනව නම් අනික් පළාත්වලත් අවසර දුන්නොත් මේ පිළිවෙළට ලක්ෂ දෙකකට වැඩි ගස් ප්‍රමාණයක් මදින්නට පුළුවන්. ලක්ෂ දෙකක් පමණ ගස් මදින්නට දීමෙන් සිදු වන්නෙ, සුළු තැබෑරුම් ලක්ෂ දෙකක් පමණ ඇති වීමයි. ඒවායේ රා, කසිප්පුත් වෙනත් නොයෙක් නොයෙක් ජාතිත් හදන්න පාවිච්චි කරන්න පුළුවන්. හැළිඅරක්කු කසිප්පු ජාතියක්. ඒවා හදන්නෙ රා වලින්, ඒ නිසා මේක බොහොම කල්පනා කරල කළ යුතු වැඩක්. කසිප්පු මර්දනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක්. ඒ සඳහා වෙනම ව්‍යාපාරයක් රජය මගින්ම ආරම්භ කළ යුතුයි. ගස් මැදීමෙන් කසිප්පු අඩු වේය කියා විශ්වාස කරනව නම්, එය මිථ්‍යාවක්. වර්තමාන රජය සුරා සම්බන්ධව මේ නිගමනයට බැස්සට මට කනගාටුයි. 1912 දී අධිරාජ්‍යවාදීනුත් කල්පනා කළා, ලංකාවෙ බෞද්ධයන් සුරා බොන්නෙ නැති නිසා මේක නීත්‍යානුකූලව කිරීමට ඉඩ දීම සුදුසුද කියා. ඒ පිළිබඳව එංගලන්තයේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාකච්ඡාවක් ඇති කළා. ඒ නිසා මේ සම්බන්ධව මැද කොළඹ දෙවැනි මන්ත්‍රීතුමාගේ වැරදි අදහස හරිගැස්සීමටයි, මා නැගිට්ටෙ. අපේ පක්ෂය සම්පූර්ණයෙන්ම ඒ කොමිෂන් සභාවෙ වාර්තාව අනුව ක්‍රියා කිරීමට එකඟයි. එක පාරටම මත්පැන් තහනම් කිරීමටත් අපි සතුටු නැහැ. ඒ සඳහා සැලැස්මක් අනුව වැඩ පිළිවෙළක් යෝජනා කරල තියෙනව.

අ. භා. 5.30

තවත් එක කාරණයක් කියන්න සතුටුයි. හවුල් ආණ්ඩුව ඇති කළ අවස්ථාවේදි ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයාගෙන් ඉවත් කරල වෙනම අමාත්‍යාංශයකට භාර දීම ගැන මම කනගාටු වෙනව. මා කල්පනා කරන විධියට ලංකාවේ ඉතාම හොඳ පළාත් ආණ්ඩු සභාව තමයි, ගමේ සභාව. ගම් කීපයක් එකතු කරල දැන් ඇති කර තියෙන ගම් සභා කොමිටියට වඩා හොඳ ආයතනයක් වෙනව, ගමේ දියුණුව සඳහා වැඩ කරන ගමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාවක් ව්‍යවස්ථානුකූල කරල පළාත් ආණ්ඩු ක්‍රමයේ පදනම හැටියට ඇති කළා නම්. ග්‍රාම සංවර්ධන සමිතිය කියන්නෙ ගමේ සියලු දෙනාගෙම ආයතනයක්. ග්‍රාම සංවර්ධන සමිතිය ගමේ ආණ්ඩුවක් බවට පත් කර ගන්නට පුළුවනි. මහත්මා ගාන්ධිතුමා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැන ලොකු ඇල්මක් දැක් වූ කෙනකු බව මතක් කරන්නට කැමතියි. ඉන්දියාව යම් දවසක නිදහස් රජයක් වුවහොත් එය ගම්සභාවලින් යුක්ත පොදුරාජ්‍ය මණ්ඩලයක් බවට පත් කිරීමට එතුමා බලාපොරොත්තු වුණා. ඉන්දියාව "A commonwealth of village republics" බවට පත් කිරීමට එතුමා අදහස් කළා. මේ ක්‍රමය අනුව ගම්වලට සම්පූර්ණ බලතල දීමට එතුමා කල්පනා කළා. අධ්‍යාපනය, සෞඛ්‍ය, ආගම, පාරවල් සම්බන්ධ වැඩ, ආදී හැම එකක්ම ගම්වලට භාර දීමට එතුමා කල්පනා කළා. ලංකාණ්ඩුව ලංකාවේ සෑම පළාතකම මේ වැඩ කරන්නේ කොළඹ තිබෙන මධ්‍යස්ථාන මාර්ගයෙනුයි. කිසිම ඇමතිවරයකුගේ අවසරයක් නැතිව ඒ ඒ ඇමති අංශයන් යටතේ තිබෙන කිසිම කටයුත්තක් ගම්බද ප්‍රදේශවල කරන්නේ නැහැ. ගාන්ධිතුමා ප්‍රාර්ථනා කෙළේ නම් එවැනි ක්‍රමයක් නොවෙයි. ගාන්ධිතුමා මහා දර්ශනවාදියෙක්. ලෝකයේ නොයෙකුත් දර්ශනවාදීන් එතුමා අනුගමනය කර තිබෙනවා. ග්‍රාම සංවර්ධනය මගින් සැනසීමේ මාර්ගය උදා කර ගත හැකි බවයි, ගාන්ධිතුමා කල්පනා කෙළේ. එම නිසා පුළුවන් තරම් දුරට ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ශක්තිමත් කළ යුතුයි. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ශක්තිමත් කළ තරමටයි, නියම ස්වතන්ත්‍ර පාලනයක් ඇති වන්නේ. ගම්වැසියන්ට තම ගමට අවශ්‍ය කටයුතු ගැන ක්‍රියා කිරීමේ අයිතිය ඒ මගින් ලැබෙනවා. එක්රැස් වී සාකච්ඡා කොට තම ගමට අවශ්‍ය අධ්‍යාපන පහසුකම් ගැන, සෞඛ්‍ය පහසුකම් ගැන, වෙනත් නොයෙකුත් දේ ගැන තීරණයකට බැස ක්‍රියා කරන්නට ගම්වැසියන්ට ඒ මගින් ඉඩ ලැබෙනවා. ලංකාණ්ඩුව අවුරුද්දකට රුපියල් කෝටි 200 ක පමණ මුදලක් වියදම් කරන බව අප දන්නවා. මේ මුදලින් භාගයක් ගම්වලට දුන්නා නම් ආර්ථික දියුණුව අතින්, සෞඛ්‍ය පහසුකම් අතින්, අධ්‍යාපන පහසුකම් අතින් ගම්වලට කොයි තරම් ලොකු සේවයක් සලසා ගන්නට පුළුවන්කම තිබුණාද ?

ගරු සභාපතිතුමනි, වර්තමානයේ සිටින ලංකාවාසීන් ගැන මා තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා. ආණ්ඩුව සම්බන්ධයෙන්, ගමේ දියුණුව සම්බන්ධයෙන් පොදු වැඩ සම්බන්ධයෙන් ඔවුන් තුළ ලොකු හැඟීමක් තිබෙනවා. ඔවුන් සාමූහික වැඩ කටයුතුවල යෙදෙන්නේ අවංකවමයි. ගමේ පාරක් කපන විට සියලු දෙනාම ඒ ගැන දන්නා අතර සියලු දෙනාගේම සහයෝගය ඊට ලැබෙනවා. ළිං කපන විටත් වෙන කටයුතු කරන විටත් ඒ විධියමයි. හොරකම් කිරීමට ඔවුන් ලැස්ති වන්නේ නැහැ. ඒ නිසා පළාත් පාලන ක්‍රම අතුරින් හොඳම ක්‍රමය ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය බව කල්පනා කොට, ඒ ව්‍යාපාරය තහවුරු කිරීම සඳහා පුළුවන් තරම් උදව් දිය යුතුයි. ග්‍රාම සංවර්ධන සමිතිවලට හැකි තරම් බලතල දිය යුතුයි. ග්‍රාම සංවර්ධන සමිතිවලට හැකි තරම් වරප්‍රසාද දී යම්කිසි දවසක ඒ අනුව ආණ්ඩුවද සකස් කර ගන්නවා නම් එය ඉතාමත්ම උසස් විධියේ ආණ්ඩුවක් වෙනවාට සැකයක් නැහැ. කෙසේ වෙතත් සවදේශ කටයුතු භාර ඇමතිතුමා භාරයේ තිබිය යුතු මේ අංශය ඒ ඇමතිතුමාගෙන් වෙනස් කිරීම කනගාටුවට කාරණයක්. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය පළාත් පාලනයේ වැදගත් අංශයක් හැටියට කල්පනා කොට එම ව්‍යාපාරය දියුණු කිරීමට ක්‍රියා කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා. පෞද්ගලික වශයෙන් කාරණයක් දක්වන්නට කැමතියි. මම කියන්නට සතුටුයි මෙම ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ඇති කළේ මගේ උත්සාහයෙන් බව. ක්‍රම ක්‍රමයෙන් එය දියුණු කර උසස් තත්ත්වයකට ගෙන ඒමට මගේ බලාපොරොත්තුවක් තිබුණා. එම නිසා ගරු මන්ත්‍රීවරයාට කියන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]
කැමතියි, මන්ත්‍රීවරයා හැමදාම ඔය තත්ත්වයෙන්ම සිටින්නෙ නැති බව, දවසෙන් දවස වයසට යන බව.

ඇල්බට් මයා.
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

එතුමා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ඇති කළා නම්, ඒක බොහෝම හොඳ දෙයක්. මම එතුමා කියන කාරණය පිළිගන්නව. නමුත් මේ ව්‍යාපාරය ඒ කාලයේදී ඇති කළේ ඡන්ද ව්‍යාපාරයක් වශයෙන්ය කියායි මා කල්පනා කරන්නෙ. නමුත් එම ව්‍යාපාරයට පණ දී උසස් තත්ත්වයට ගෙන ඒමට අපට පුළුවන්කම ලැබී තිබෙනව. අද ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ඉතා දියුණු තත්ත්වයකට පත් වී තිබෙනවා පමණක් නොවෙයි, එයින් විශාල සේවයකුත් සිදුවී ගෙන යනව. මගේ කොට්ඨාශයේ, මා හිතන හැටියට ග්‍රාම සංවර්ධන සමිතිවලින් විශාල වැඩ රාශියක් කර තිබෙනව. ගරු වත්තේගම මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට එතුමා මෙම ව්‍යාපාරය ආරම්භ කළා නම්, එසේ කිරීම ගැන අප ස්තුතිවන්ත වෙනව. ඒ වාගේම මේ කටයුතු සම්බන්ධයෙන් අපට කිසි අන්දමක දෝෂාරෝපණයක් කරන්නට ඉඩ නැති බවත් කියන්නට කැමතියි.

තවත් වැදගත් කාරණයක් ගැන මේ අවසථාවේදී සඳහන් කරන්නෙ නැතුවම බැහැ. අපේ ඇතැම් දෙනාගේ පුරුද්දක් වී තිබෙනව, විශේෂයෙන්ම අපේ ඇතැම් මන්ත්‍රීවරුන්ගෙ පුරුද්දක් වී තිබෙනවා, මේ රටේ කොතැන හෝ නිලධාරී මාරුවක් ඇති වුණොත්, එහෙම නැත්නම් යම් කිසිවක් කිරීමට උත්සාහ ගෙන බැරි වුණොත්, එසේත් නැත්නම් මොනව හරි දෙයක් වුණොත් ඒ සිද්ධියට රත්වත්තේ පවුල එහෙම නැත්නම් මහවෙලතැන්නෙ පවුල සම්බන්ධ කර, එය චෝදනාවක් වශයෙන් ගෙන මේ රජයට එල්ල කිරීම. මේ අන්දමට අහේතුක ලෙස, සාධාරණ හේතුන් නැතුව හිතේ සැක ඇති කරගෙන මේ අන්දමට කථා කිරීම ගැන මම කනගාටු වෙනව.

විෘශ්ෂයෙන්ම කලවානේ ගරු මන්ත්‍රීවරයා (එල්. ද එස්. ගුණසේකර මයා.) මා හිතන්නෙ වැරදි අවබෝධයක් ඇතිව, මේ ගරු සභාවෙදි කථා කළා. මේ අන්දමට වැරදි වැටහීමෙන්, වගකීමෙන් තොර වූ ප්‍රකාශ මේ ගරු සභාවේදී කරන මන්ත්‍රීවරුන් සිටිනව. ඒ අය මේ රටේ කෙරෙන හැම දෙයකටම මහවෙලතැන්නෙ එහෙම නැත්නම් රත්වත්තෙ පවුල සම්බන්ධ කර දක්වන්නට බොහෝ දුරට උත්සාහ කරනව. නමුත් ඒ වාගේ අයුතුකම් කරන තැනැත්තියක් නොවෙයි, අද බලයට පත් වී සිටින රත්වත්තෙ පවුලට සම්බන්ධ අපේ ගරු අගමැතිනිය. අන්න ඒ කාරණය මම ඒ මන්ත්‍රීවරුන්ට කියන්නට කැමතියි. යම් විධියකින් මඩ ගැහීමකට ඒ අය සූදානම් වෙනවා නම් ඒ අයටම ආපසු මඩ වැදෙන්නට පුළුවන් බව විශෙෂයෙන්ම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ අඩුපාඩුකම් ගැන කථා කරන විට ගාලු කච්චේරියේ නිලධාරී හිඟකම ගැනත් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. කච්චේරියේ නිලධාරීන් පත් කිරීම කෙරෙන්නෙ ඉතාමත්ම අඩුවෙන්. මොන හේතුවක් නිසාද කියන්න මම දන්නෙ නැහැ. මේ නිසා ඒ ප්‍රදේශයේ වැඩ කට යුතු රාශියක්ම නැවතී තිබෙනව. වැඩ කිරී කිරීම බාගෙට අඩපණ වී තිබෙනවාය කියන්නට පුළුවනි. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව වහාම මේ අඩුපාඩුකම් මගහැර ගැනීමට අවශ්‍ය නිලධාරීන් පත්කර එවීමට කටයුතු කරන ලෙස. එසේ නැතිනම් ප්‍රදේශයේ මහජනතාවට විශාල කරදරවලට මුහුණ දෙන්නට වෙනව.

සුරා ප්‍රතිපත්තිය ගැනත් හුඟක් මන්ත්‍රීවරුන් සඳහන් කළා. එක මන්ත්‍රීවරයකු සුරා හොඳ නැතැයි කියන විට තවත් මන්ත්‍රීවරයකු කියනව සුරා හොඳය කියා. එම නිසා නොයෙක් නොයෙක් අදහස් මේ පිළිබඳව ප්‍රකාශ වුණු බව පැහැදිලියි. හලාවත මන්ත්‍රීතුමා (එස්. ඩී. ආර්. ජයරත්න මයා.) ගස් මැදීමට ඉඩදීම හොඳය කියා කීවා. නමුත් කලවාන මන්ත්‍රීතුමා කීවෙ පොල් ගස් මැදීමට ඉඩ දීම හොඳ නැත නමුත් කිතුල් ගස් මදින්නට ඉඩදීම වරදක් නැහැයි කියා. සුරාව ගැන විරුද්ධව කථා කරන ඒ මන්ත්‍රීතුමා කිතුල් මැදීම ගැන විරුද්ධ වෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා හිතන හැටියට අද මහජනයා තුළ තිබෙන කෝපය අනුව යම් කිසි පහරක් පිටි පස්සෙන් වදීය කියන බය නිසා වෙන්න ඇති කිතුල් ගස් මදින එක හොඳය කියා කියන්න ඇත්තෙ.

සමහර. මහත්වරු තර්ක කරනවා කුකුළෙක් මැරුවට පස්සෙ ඒ මස් කෑවාට පව් නැත කියා. මරා දුන්නට පස්සෙ කෑවාට පව් නැත කියා හොඳ බෞද්ධ පරම්පරාවලින් එන අය එසේ තර්ක කරන්නේ—

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු මන්ත්‍රීතුමාට සිංහල භාෂාව තේරෙනවා නම් එහෙම කථාවක් මා කවදාවත් නොකී බව වැටහී යා යුතුයි. නමුත් නාන්සෙ සිංහල ගුරුවරයෙක් වෙලත් එසේ කථා කිරීම ගැන මා කනගාටු වෙනව. නොකී දෙයක් කියන එක මන්ත්‍රීකෙනෙකුට කරන අවනම්බුවක්.

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

මට තේරුණ හැටියටයි මම කිව්වෙ. ඒ මන්ත්‍රීතුමා එසේ කිව්වෙ නැත්නම් මගේ ප්‍රකාශය ගැන මා කනගාටු වෙනව. නමුත් මා දැන් කිව්වෙ ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වාය කියල නොවෙයි. මම කිව්වෙ මරපු කුකුළෙකුගෙ මස් කෑවට පව් නැත කියා සමහර බෞද්ධයන් තර්ක කරනවාය කියායි. හරක් හෝ කුකුල්ලු හෝ වෙනත් සතකු හෝ මරන්නෙ, කන්න මිනිසුන් ඉන්න නිසයි. පව් සිදු වන්නේ මරණ මිනිහට පමණක්ය කියන තර්කය බුද්ධාගමේ ප්‍රතිපත්තිවලට අනුකූලය කියා මා හිතන්නෙ නැහැ. මම නම් කවදාවත් මත් පැන් පාවිච්චි කරන්නෙ නැහැ. ඒ වාගේම සුරුට්ටු සිගරට් පවා පාවිච්චි කරන්නෙ නැහැ. නමුත් අද සුරාව ගැන විශාල කැක්කුමක් ඇති වී තිබෙන්නෙ කට ගණනක් විස්කි බොන උදවියටයි. ඒ අය තමයි මේ සම්බන්ධයෙන් බොහෝම හයියෙන් කෑ මොර ගහන්නෙ. මම කියන්නෙ නැහැ හොඳ මහත්වරු නැත කියා. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා වාගේ, ඒ බිහිසඩ ඉදිරිපත් වී කටයුතු කරන හොඳ අය ඉන්නව. නමුත් හයියෙන් කෑ ගහන වැඩි දෙනා උගුරට එන තුරු විස්කි බීගෙන ඇවිත් කෑ ගහන උදවියයි. එබඳු උදවිය කෑ ගැසීමයි වැරදි ප්‍රතිපත්තිය. සුරාව ඇත්තවශයෙන්ම හොඳ නැහැ. සුරාව පාවිච්චි කරන අයට හොඳ සිහියෙන් ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ අයට දියුණු වෙන්න බැහැ. ඒ බව අපි ක්‍රියාවෙන් ඔප්පු කර තිබෙනව. ඒ බව රටේ මහජනතාව පිළිගන්නවා නම් ඔවුන්ට හැදෙන්න ඒ ඇති.

සමහර ගරු මන්ත්‍රීවරුන් කිව්ව, පුරුද්දක් ඇති වුණොත් එය අත් හැර ගන්න බැහැ කියා. නමුත් මම කියන්න කැමතියි, නරක පුරුදු අත් හැර ගන්නට බැරි උදවිය මේ රටේ ඉන්නවා නම් ඒ නරක පුරුදුවලින්ම ඔවුන්ගේ විනාශය ළං වන බව. ඒ නිසා ඒ නරක පුරුදු නැති කිරීමට අපි උත්සාහ කරන්න ඕනැ. කසිප්පුව නරක දෙයක් හැටියට පිළිගෙන තිබෙනවා නම්, ඒ නරක දේ නැති කිරීම පිණිස නරකින් ඊට වඩා අඩු වූත්, මනුෂ්‍ය ශරීරයට ගුණ වූත් දෙයක් පාවිච්චි කිරීමෙන් වඩා නරක දේ අත් හරින්න උත්සාහ නොගන්නෙ ඇයි? මේ රට සම්පූර්ණයෙන්ම වියළි ප්‍රදේශයක් බවට පත් කරනවා නම් මා වඩාත් කැමතියි.

අ. භා. 5.45

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please! The hon. First Member for Colombo Central, (Sir Razik Fareed, O.B.E.,) will now take the Chair.

**අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපති මූලාසනයෙන් ඉවත් වූයෙන්, ශ්‍රීමත් රසික් ෆරීඩ්, ඕ.බී.ඊ., මූලාසනාරූඪ විය.**

**ඇල්බට් මයා.**
*(திரு. அல்பேட்)*
(Mr. Albert)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ධර්මපාලතුමා, ඩී. එස්. සේනානායක අගමැතිතුමා ආදී ඒ කාලයේ සිටි උසස් අය මේ රටේ සුරාව නැති කිරීම පිණිස විශාල සටනක් ගෙන ගියා. ඒ වාගේම අද සිටින අමද්‍යප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

වීරයනුත් ලොකු සටනක් ගෙන යනවා. ඒ ගෙන යන සටන අද මේ රටේ සිටින ඇතැම් බෞද්ධ මහජනයාට නොපෙනී තිබීම ගැන මා කනගාටු වෙනව. ඒ සටන ගෙන යන්න ගෙන යන්න මේ රටේ කසිප්පුව එන්න එන්න වර්ධනය වෙනව. කසිප්පු මේ රටේ එන්ට එන්ටම වර්ධනය වී තිබෙනව. අද ගම්බද ප්‍රදේශවල මිනිසුන් ගෙන් සියයට 80ක් විතර කසිප්පු උවදුරට ගොදුරු වී සිටිනව. හවසකට මගේ කොට්ඨාශයේ ඕනෑම කඩ හන්දියකට ගිහින් පෙන්වන්ට පුළුවන්, එවැනි විෂ මත්පැන් පානය කරන විශාල පිරිස්. ඔවුන් ශරීරයට අහිතකර විෂ මත්පැන් බොමින් සිටින බව ඕනෑම තැනකට ගියොත් දකින්ට ලැබෙනව. මේ තත්ත්වය උදා වී තිබෙන්නෙ මේ රටේ අමද්‍යප වීර යන් සිටිද්දීයි. පසුගිය අර්ධ ශත වර්ෂය මුළුල්ලේ අපේ ජාතික මහා අමද්‍යප වීරයන් අමද්‍යප හඬින් සම්පූර්ණයෙන් රට හොල්ලා තිබුණා. එවැනි තත්ත්වයක් තිබෙද්දීත් අද මොකක්ද සිදු වී තිබෙන්නෙ? ඒ ව්‍යාපාරය එන්ට එන්ට වර්ධනය වෙද්දී මේ රට එහෙම පිටින්ම කසිප්පු ගංගාවක් බවට පත් වී තිබෙනව. මුළු රට පුරාම කසිප්පු ගංගාවන් ගලා යනව. ඒ ගඳ ගසමින් තිබෙද්දී අදත් මේ රටේ සමහර උදවිය නැවත වරක් අමද්‍යප ව්‍යාපාරය ගැන කථා කරනව. ඒ උදවියට වුවමනා වී තිබෙන්නෙ මේ රටේ සුරා නැති කිරීම නොවෙයි ; මේක දේශපාලන ප්‍රශ්න යක් කර ගැනීමටයි ඒ උදවියට වුවමනා වී තිබෙන්නෙ. එහෙත් මේ රටේ මහජන තාව සම්පූර්ණයෙන් ඊට මුළා නොවන බව මේ අවස්ථාවේදී මා කියන්ට ඕනෑ.

මේ රටේ යම්කිසිවෙක් මේ ප්‍රශ්නය දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් යොදා ගන්න සැරසෙනවා නම්, ඔහු කල්පනා කරන්ට ඕනෑ, පසුගිය අර්ධ ශත වර්ෂයේ මේ රටේ ඉතිහාසය ගැන. මහා ජාතික වීර යන් අමද්‍යප ව්‍යාපාර ඇති කර තිබෙද්දීත් මේ රටේ කසිප්පු ගංගා ඇති වුණු බව එවිට හොඳ හැටි වැටහෙනවා ඇති. කසිප්පු වසංගතය නිසා මේ රටේ ජනතාව ගෙන් සියයට හැට හත්තෑවක් අද ලෙඩුන් බවට පත් වී සිටිනව. මේ රටේ අනාගත පරම්පරාවන් විනාශ මුඛයට ගොදුරු කර තිබෙනව. කසිප්පු ව්‍යාපාරය නැති කරන්ට ජාතික කැක්කුමක්, ජාතික හදවතක් ඇත්නම්, සම්පූර්ණයෙන් තමුන්නාන්සේලා ඊට සහයෝගය දෙන්ට ඕනෑ. මේ ප්‍රශ්නය විසඳන්ට යම් කිසි අන්දමක පියවරක් ගන්ට ඕනෑ යයි කල්පනා කර තමයි, රජය මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ රටේ සමහරු කියනව, සුරා බදු දෙපාර්තමේන්තුව අවංකව කටයුතු කරනව නම්, පොලිස් දෙපාතීමේන්තුව අවංකව කටයුතු කරනව නම්, මේව නවත්වන්ට පුළුවන් කියා. එසේ ක්‍රියා කරන්නෙ නැත කියා, සුරා බදු දෙපාර්තමේන්තුවටත් පොලිසිය ටත් බොහෝ විට බණිනව. එහෙත් ඒ මගින් මේ කසිප්පු ව්‍යාපාරය නැති කරන්ට බැරි බව අපට ඔප්පු වී තිබෙනව. එහෙම නම් අප ඊළඟට ගතයුතු පියවරක් කුමක්ද ?

ඉන්දියාවත් සම්පූර්ණයෙන්ම සුරා වලින් වියළි ප්‍රදේශයක් කරන්ට හිතා ගෙන ඒ ආණ්ඩුවත් සමහර ප්‍රදේශවල සුරා තහනම් කළා. ඒ ප්‍රදේශවලත් කසිප්පු ව්‍යාපාරය පැතිර යාම නිසා ඒ ක්‍රමය සාර්ථක වුණේ නැහැ. අපේ ෆේඩ රල් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් එක් කෙනෙක් දෙදෙනෙකුත් කිව්ව, යාපනය අර්ධ ද්වීපයේ කසිප්පු ව්‍යාපාර සම්පූර්ණ යෙන් තුරන් වෙලා කියා. ඊට හේතුව ඒ ප්‍රදේශයේ කලක සිට ගස් මැද ගැනීමට ඉඩ දී තිබීමයි. විෂ මත්පැන් නැති කිරීමට ගස් මැදීම උපකාරී වෙනවා නම් මා කොප පණ මද්‍යයට විරුද්ධ කෙනෙක් වුණත්, මගේ අත් දෙකම ඔසවා මගේ කැමැත්ත පළ කරනවා. මා එසේ කරන්නෙ වෙන කිසි කරුණක් නිසා නොවෙයි ; මේ රටේ අමද්‍යප ව්‍යාපාරිකයන් කියන හැටියට මේ රටේ කසිප්පු ගංගා නැත්නම් රා ගංගා ගලවන්නට නොවෙයි. මේ රටේ ඕනෑ කෙනෙකුට, ගස් මදින්න ඉඩ දුන් නත් නැතත් නොබී ඉන්ට පුළුවන්. අප කියන්නෙ නැහැ කිසිම කෙනෙක්, බොන්ට හෝ බොන්ට එපා කියා. කාරණා වටහා දෙන විට එපා යයි හිතෙන පුද් ගලයා බොන්නෙ නැහැ. අමද්‍යප ව්‍යාපා රිකයන් මේ ප්‍රශ්නය ඇදගන්නෙ වේදිකා වෙදි හෙවත් " ස්ටේජ් " එකේදි, විතරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුරා බොන්ට එපා කියමින් අනුන්ට බණ කියන්නෙ සමහරවිට උගුරට එන තෙක් බීල ඇවිත්. අදත් ඒ තත්ත්වය තමයි, පවතින්නෙ. සුරා ප්‍රතිපත්තිය පිළිබඳව යම්කිසි පියවරක් ගන්න විට ඒ පිළිබඳව සම්පූර්ණයෙන් සලකා බලන ලෙස සවදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් පාර්ලිමේන්තු ලේකම්වරිය මාර්ගයෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට මතක් කරන්ට ඕනෑ, අපේ ප්‍රදේශයේ ගම්කාර්ය සභා පිළිබඳව. අපේ පළාත්වල ගම්කාර්ය සභා දෙස බලන විට පෙනී යනවා, ඒවාට තවම කිසිම සැලකිල්ලක් දක්වා නැති බව. තවම රජයෙන් කිසිම ලොකු ආධාරයක් ඒවාට ලැබී නැහැ. එම නිසා ඉක්මනින් අපේ ප්‍රදේශවල ගම් කාර්ය සභාවලට වැඩිපුර ආධාර දී අපේ ගම්මුන් දියුණු කරන්ට උදව් උපකාර කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*

(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මාත් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. වැඩි වේලාවක් නොවෙයි, මිනිත්තු 10 ක් පමණ ගන්නයි අදහස් කරන්නෙ. අපේ පාර්ලිමේන්තු ලේකම්වරියගේ පත්වීම ගැන එතුමියට මා ප්‍රශංසා කරන්න ඕනෑ. එතුමිය කඩිසර දක්ෂ කෙනෙක් බව

**මූලාසනාරූඪ මන්ත්‍රී**

*(தலைமை தாங்கும் அங்கத்தவர்)*

(The Presiding Member)

As time is running out I am afraid you will have to restrict your speech to about 10 minutes.

**ආර්. ජී. සේනානායක මයා.**

*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*

(Mr. R. G. Senanayake)

Yes, Sir, I will do that.

පාර්ලිමේන්තු ලේකම්වරිය පත්වූ ඉක්මනින්ම ඉතාමත්ම වැදගත් පියවරක් ගත්ත. එනම්, යම් යම් නඩුවල්ට අසු වූ සභාපතිවරුන් අද සිටිනවා. ඒ උදවිය ඒ ස්ථානවල ඉඳීමෙන් අර නඩුව නියම ආකාරයට ගෙන යන්නට අමාරුයි. සභාපතිවරුන්ගේ යම් යම් දූෂණ සම්බන්ධයෙන් නඩු පවරා තිබෙන අවස්ථාවල් බොහෝ තිබෙනවා. එසේ දූෂණයක් ගැන නඩු පවරන අවස්ථාවේදී සභාපති ධුරය දරන්නෙත් අර දූෂණයට අසු වූ තැනැත්තාමයි. ඒ නිසා අර නඩුව ගෙන යන්න ඉතාමත්ම අමාරුයි. ආණ්ඩුවේ නිලධාරියෙකුට විරුද්ධව නඩුවක් තිබෙනවා නම්, තාවකාලික ලෙස ඔහු අස් කරනවා. එතකොට නඩුව හරියට ගෙන යන්න පුළුවනි. අර නඩුව අවසාන වන තුරු සාධාරණ විභාගයක් ඇති වන තුරු වෙන කෙනෙකුට ඒ කටයුතු බාර දී තාවකාලික වශයෙන් ඔහු ඉවත් කරනවා. නමුත් ගම්සභා ක්‍රමය අනුව යම් කෙනෙක් සභාපති වශයෙන් සිටිනවා නම්, ඔහුට විරුද්ධව දූෂණ චෝදනාවකුත් උසාවියෙ තිබෙනවා නම්, ඔහු ඒ තනතුරේ සිටියදීම මේ නඩුවත් ගෙන යන්න ඕනෑ. නමුත් ලියුම් ගනුදෙනු ආදිය සම්පූර්ණයෙන්ම තිබෙන්නෙ සභාපති අතේයි. එතුමාගෙ පරණ බලතල පාවිච්චි කළ හැකි තත්ත්වයක එතුමා සිටිනවා නම්, නඩුව ගෙන යන්න ඉතාමත්ම අමාරුයි. එම නිසා පාර්ලිමේන්තු ලේකම්වරියට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වන්න ඕනෑ, මෙය බාර ගත් වෙලාවේ සිටම මේ ගැන කටයුතු කරන්න සූදානම් වීම ගැන.

ඒ වගේම කලවාන ගරු මන්ත්‍රීතුමාට (එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.) මා ස්තුති කරන්න ඕනෑ. මේ සභාව වැඩිපුරම නිලධාරීන්ගේ පව් කඩන සභාවක්, නිලධාරීන් වනසන සභාවක්. හැම අවස්ථාවකදීම අපි නිලධාරීන්ට දොස් කියන සිරිතක් මෙහි තිබෙනව. නිලධාරියකුට යම් ප්‍රශංසවක් කියන්නේ කලාතුරකින් තමයි. එතුමා මතක් කළ ආදායම් පාලක නිලධාරිතුමා මමත් හොඳට අඳුනනවා. මගේ කාලයේත් ඔහු වැඩ කළා. ඒ නිසා ඒ ප්‍රශංසාවට මගේ ප්‍රශංසාවත් එක් කරන්න කැමතියි. ආර්. බී. රත්නායක උන්නැහේ ඉතාමත්ම පිරිසිදු සේවයක් කළා. එමෙන්ම එතුමා ඉතාමත්ම සද්ධ පිරිසිදු බෞද්ධයෙක් බව මා මතක් කරන්න කැමතියි. එතුමා සේවයෙන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

අස්වීම ලොකු පාඩුවක්. විශේෂයෙන් ම කලවාන මන්ත්‍රීතුමාගේ හොඳ ගතියක් වන්න ඕනෑ, හැම විටම පහර නොගසා පැසසිය යුත්තට පැසසීම හා පිදිය යුත්තාට පිදීම. එම නිසා ඒ මහතා ගැන වර්ණනා මුඛයෙන් වචන කීපයක් සඳහන් කිරීම ගැන මම එතුමාට ප්‍රශංසා කරනව.

අනික් කාරණාව මේකයි. අපේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය දැන් අඩපන වී තිබෙන බව පාර්ලිමේන්තු ලේකම්වරියට කියන්න මා කැමතියි. පළාත් පාලනයේ දියුණුව සම්බන්ධයෙන් ඉතාමත්ම වැදගත් යෝජනාවක් මට ඉදිරිපත් කරන්නට තිබෙනව. පළාත් පාලනය දියුණු කිරීම, ප්‍රගතිය කරා ගමන් කරන හැම ජාතියකටම ඔබින දෙයක්; අවශ්‍ය දෙයක්. මධ්‍යම ආණ්ඩුවට යම් බලතල ලැබෙනවා නම්, පුළුවන් තරම් මහජන යාට පුරුදු වන්නට, ඒ බලතල ක්‍රමක්‍රම යෙන් මහජනයා අතට යන්නට ඕනෑ. එසේ යෑමෙන් තමයි, මහජනයා නිදහස් ජාතියක් වශයෙන් ඔප්පු වන්නෙ. එහෙම නැතිව මහ ආණ්ඩුව නිදහස් වුණාය කියා බලතල සම්පූර්ණයෙන්ම මහ ආණ්ඩුව අතේ තබා ගන්නවා නම්, අර පරණ ක්‍රමයටම නිලධාරීන්ගෙන් ගම් පාලනය වෙනවා නම්, රටට ලැබුණු නිදහස තවම ගමට බැහැල නැති බවයි අපට පිළි ගන්නට තිබෙන්නෙ. ගමටත් බහින්නට මාර්ගයක් තිබෙනවා නම්, ගමේ කටයුතු ගම්වලටම කර ගන්න මාර්ගයක් සැලසෙ නව. මහ ආණ්ඩුව නිදහස් වුණා නම්, මහජන මණ්ඩලයකට, මහජන මතයෙන් පාලනය වන මහ සභාවකට, සම්පූර්ණ යෙන් බලතල ඇතිව වැඩ කරන්න බල යක් තිබෙනවා නම්, ඒ භුක්තිය ඒ වරප්‍ර සාදය ගමටත් ලැබෙන්න ඕනෑ. අන්න එතකොට මහ ආණ්ඩුවට ලැබුණු නිදහස ගමටත් ලැබුණායයි කියන්න පුළුවන්. මහ ආණ්ඩුවට නැත්නම් රටට නිදහස ලැබුණු බවට, සාක්ෂියක් වශයෙන් මේ මන්ත්‍රණ සභාව තිබෙනව. නමුත් ගම්වල එදා තිබුණු අධිරාජ්‍යවාදී ක්‍රමය අනුව නිලධාරි ක්‍රමයෙන් අදත් පාලනය වෙනව. ඒ නිසා පුළුවන් තරම් පොදු මණ්ඩලවලට ගම් පාලනය බාර දෙන්නට ඕනෑ. එන් සාභා

දැරීම හා ඒ අනුව ක්‍රියා කිරීම අපේ යුතු කමක්. ඒ නිසා මේ ගම්සභාවල බලතල මීට වඩා ක්‍රමක්‍රමයෙන් වැඩි කරන්නට ඕනෑ. අපි දැන් ගම් සභා පිහිටුවා අවුරුදු ගණනාවක් වෙනව. නමුත් ගම්සභාවලට භාර දී තිබෙන්නෙ කුමක්ද? කුඩා පාර වල පාලනය පමණයි ගම් සභාවලට භාර දී තිබෙන්නෙ. මහජන ඡන්දයෙන් නියෝජිතයන් පත් වන මේ ගම් සභාවලට අවුරුදු ගණනාවක් තුළ ලබා ගත් පල පුරුද්ද තිබෙනව. ඒ වාගේම මුදල් පාලනය ගැනත් ගම් සභාවලට අවබෝධ යක් තිබෙනව. ඒ නිසා අවුරුදු ගණනා වක් තුළම අපි ගම්සභා පවත්වාගෙන ආවා නම් ක්‍රමක්‍රමයෙන් ඒවායේ බලතලත් වැඩි කරන්නට ඕනෑ. අධ්‍යාපන අංශයෙන් කෙරෙන යම්කිසි වැඩ කොටස්, සෞඛ්‍ය අංශයේ යම්යම් වැඩ කොටස් ඒ වාගේම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති වැඩවලින් සමහර වැඩ කොටස්, යනාදී වශයෙන් නොයෙකුත් වැඩ කොටස් ක්‍රම ක්‍රමයෙන් ගම් සභාවලට භාර දෙන්න ඕනෑ. දැන් එහෙම කරන්න පුළුවන්කම තිබෙනව. ඒ ආකාරයට අපි ගම් සභා දියුණු කරන්න ඕනෑ. දැන් අවුරුදු 20 ක පමණ කාලයක් තුළ අපි මේ ගම් සභා පවත්වාගෙන එනව. නමුත් තවමත් ගම් සභාවලට අයිතිව තිබෙන්නේ කුඩා පාරවල් පමණයි. ඇයි ගම් සභාවලට ඊට වඩා දියුණුවක් නැද්ද? මේකද ස්වර්ගය? මේකද විමුක්තිය? මීට වඩා ගම් සභා දියුණු කරන්න බැරිද?

ගම් සභා දියුණු නොකර දැන් රට සභා නමින් අමුතු පාලන ක්‍රමයක් ඇති කරන්න අදහස් කරනව. සමාන්‍යයෙන් අපේ රටේ ජාතිභේද සට්ටන නැත්නම් රට සභා ක්‍රමය බොහොම හොඳයි. නමුත් අපේ රටේ භේද තිබෙනව. වෙන් වෙන්න දඟලන පිරිස් අපේ රටේ ඉන්නව. ඒ නිසා මෙවැනි අවස්ථාවකදී රට සභා ක්‍රමය ඇති කළොත් ඉතාමත් භයානක තත්ත්වයක් ඇති වන බව මා මතක් කරනව. අපේ රටේ පමණක් නොවෙයි, ලෝකයේ සෑම රටකම ඒ විධියට වෙන් වී සම්පූර්ණ යෙන්ම වෙනස් පාලන ක්‍රමයක් ඇති කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්න වුවමනාය කියන ජාතීන් ඉන්නවා. මේ විධියෙ ප්‍රශ්න ඉන්දියාවෙත් තිබෙනවා.

නමුත් නාන්සේ දන්නවා ඇති දකුණු ඉන්දියාවෙ ද්‍රවිඩයන්, තමන්ට වෙනම ආණ්ඩුවක් ඕනෑය යන හැඟීමකින් යුක්තව කටයුතු කරනවාය කියා ඉන්දියන් ආණ්ඩුවද කල්පනා කරන බව. ඒ වාගේම ශීක් වර්ගයාත් ඔවුන්ට අමුතු පාලනයක් වුවමනාය යන අදහසින් කටයුතු කරනවා. නමුත් නේරු තුමා කීවෙ ඒවා සියල්ලම රටට කරන ද්‍රෝහි වැඩ කියායි. එවැනි අදහස් දියුණු වන ක්‍රම සම්පූර්ණයෙන්ම නැති කර දැමීමට නේරු තුමා ක්‍රියා කළා. ඒ සම්බන්ධයෙන් එතුමා කොයි තරම් දුරට ක්‍රියා කළාද කිවහොත් ද්‍රවිඩ මුන්නේත්‍ර කලගම් කියන පක්ෂය වරක් තහනම් කරලත් තිබෙනවා. මේ වෙන් වෙන්න, කැඩෙන්න උත්සාහ කිරීම නැවැත්වීමට ඒ තරම් දුරට නේරු තුමා ක්‍රියා කළා. ඒ නිසා අපිත් මේ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ. අපේ රටේ ජාතීන් අතර අද යම් යම් අමනාපකම්, භේද තිබෙනවා නම් ක්‍රම ක්‍රමයෙන් ඒවා බේරා ගෙන අවුල් සංසිඳවා ගෙන වැඩ කරන්න අප හැම අවස්ථාවකදීම උත්සාහ කරන්න ඕනෑ. එහෙම නැතිව අමුතු බලතල තිබෙන පාලන සංස්ථා ඇති කිරීම නොවෙයි කළ යුතුව තිබෙන්නෙ.

අද රටේ නැති අමුතු සංස්ථා ඇති කර වෙන් වෙන්න උත්සාහ කරන අයට උපකාර කරන්න එපා. අමුතු සංස්ථා ඇති කර රට බෙදා දෙන්නට උපකාර කරන්න එපා. මේ මෑත කාලය තෙක්ම ද්‍රවිඩ ජනතාවත් සිංහල ජනතාවත් එකට වැඩ කළා. නමුත් අද ඒ පරිසරය නැහැ. අද ඒ ජාතීන් දෙක අතර යම් යම් භේද තිබෙනවා. අපි පුළුවන් තරම් උත්සාහ කළ යුත්තේ ඒ භේද අඩු කර ගන්නයි. එහෙම නැතිව මේ අමුතු බලතල දුන්නොත් කෙළින්ම රට බෙදීමට අප උපකාර කරනවා. මේක දැන් අධිරාජ්‍යවාදීන්ගේ අළුත් ආයුධයක් වී තිබෙනවා. අද ලෝකයේ රටවල් කීයක් ඉර ගසා බෙදා දී තිබෙනවාද? මේ යෝජනා කර තිබෙන රට සභා ක්‍රමය ක්‍රියාත්මක කළොත් අපේ රටත් ඉර ගසා බෙදා දෙන්න වේවිය කියා මා තුළ බයක් තිබෙනවා. අද කොරියාව මේ විධියට ඉර ගසා බෙදා දී තිබෙනවා. කාෂ්මීරය බෙදා දී තිබෙනවා. වියට්නාමය බෙදා දී තිබෙනවා. ජර්මනිය බෙදා දී තිබෙනවා. බුරුමයත් බෙදා දෙන්න සූදානම් වුණා. නමුත් විප්ලවයක් සිදු වී එය නතර වුණා. ඒ නිසා මෙවැනි රට සභා ක්‍රමයක් ක්‍රියාත්මක කළොත් අපිත් අපේ රට බෙදා දීමට උපකාර කරනවා. රට සභා ක්‍රියාත්මක කිරීමේ අදහස දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා තුළ තිබුණු බව මා දන්නවා. නමුත් එතුමා ඒ අදහස ඇති කර ගත්තේ ඒ කාලයේ තිබුණු පරිසරය අනුවයි. ජාතීන් දෙක සමගි නම්, කිසිම භේදයක් නැත්නම් අන්න එවැනි පරිසරයකට රට සභා ක්‍රියාත්මක කිරීම හොඳයි. කඩන්න දඟලන උදවියට ඉරක් ගහල දුන්නොත් එයින් අමුතු රටක් බිහි වන බව හිතේ තියා ගෙන කටයුතු කළ යුතුයි. ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මොනවටද අමුතු සංස්ථා ඇති කරන්නෙ? අවුරුදු ගණනාවක් තිස්සෙ මේ රටේ ගම් කාර්ය සභා, සුළු නගර සභා, පාළාත් ආණ්ඩු සභා, නාගරික සභා යනුවෙන් පළාත් පාලන ආයතන තිබෙනවා. ගම්කාර්ය සභා ආදිය මගින් පාලනය කරන්නෙ කුඩා පාරවල් පමණයි. ගම්කාර්ය සභාවල උදවියට දියුණුවක් නැහැ. නැඟීමක් නැහැ. රට සභා වැනි අමුතු සංස්ථා හදන්නෙ නැතිව, මෙපමණ කාලයක් වැඩ කළ ගම්කාර්ය සභාවලට මීට කලින් කවදාවත් නුදුන් අමුතු දේ දැන් නොදිය යුතු බව මතක් කරන්න කැමතියි.

අ. භා. 6

හුඟ දෙනෙක් කථා කරනවා රා සම්බන්ධයෙන්. පහසුවෙන් රා ලබා ගන්න පුළුවන් වුණොත් කසිප්පු බීම නවතිනවාය කියන අදහසක් ඇතැම් අය තුළ තිබෙන බව ඒ අයගෙ කථාවලින් පෙනෙනවා. රා මදින්න අවසර දෙන්න කල්පනා කළේ ඒ පරමාර්ථයෙන්ය කියන නමුත් අපි බලමු බලතල දුන්නොත් රා මදින්නෙ කොහෙද කියල. වැඩිපුරම පොල්ගස් තියෙන්නෙත් මුහුදුබඩ ප්‍රදේශයෙයි. වැඩිපුරම රා පාවිච්චි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

වෙන්නෙත් දූන් මුහුදු බඩ ප්‍රදේශයෙයි. හලාවත නැත්නම් පුත්තලමේ සිට කොළඹ දක්වාත්, කොළඹ සිට බෙන්තර, ගාල්ල, මාතර දක්වාත් අනන්ත තැබෑරුම් තියෙනව. හැතැප්ම දහයෙන් දහයට මේ පළාත්වල තැබෑරුම් තියෙනව. හැතැප්ම දහයෙන් දහයට තැබෑරුම් තිබෙන නිසා ගරු මුදල් ඇමතිතුමා නියම කළ දුර ප්‍රමාණයේ හැටියට කොහොමද ගස් මදින්නෙ බලපත්‍ර ඇතිව? රා වැඩිපුර තියෙන මූදුබඩ පළාත්වල කසිප්පුත් වැඩිදුර පාවිච්චි කරන බව හිතේ තියා ගන්න ඕනෑ. රා වැඩිපුර පාවිච්චි කරන ප්‍රදේශවලම තමයි කසිප්පුත් වැඩිපුර තියෙන්නෙ. එහෙ මුදල් ඇමතිතුමාගේ අලුත් ව්‍යාපාරය මුහුදුබඩ ප්‍රදේශය තුළ ගෙන යන්න විධියක් නැත්තෙ දූනටමත් හැතැප්ම දහයෙන් දහයට තැබෑරුම් තිබෙන නිසයි. තැබෑරුම් තියෙන පළාත්වල බීමේ පුරුද්දට වැටුණු අය බොහොම ඉන්නව. තැබෑරුම් නැති ප්‍රදේශවල එහෙම පුරුද්දක් නැහැ. ඒ පළාත්වලත් අලුත් පුරුද්දක් ඇති වෙනව මේ වැඩ පිළිවෙළ නිසා.

කසිප්පු පමණ තද බීමක් අද නැහැ. සීල් අරක්කු ගිහිල්ල දෙනකොට කියනව, "අනේ මේකද, මේක නිකම් වතුර වගෙයි; මෙයින් අපට සැරක් නැහැ" කියල.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)
කොහොමද දන්නෙ?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

අපට සැරක් දූනෙන්න නම් දෙන්න කසිප්පු කියනව. අපි ගම්වල උදවිය ආශ්‍රය කරන නිසා මට ඒ උදවිය කියන දේ තමයි මාත් මෙතන කියන්නෙ. අරක්කු දීලත් කසිප්පු බොන මිනිහ කසිප්පු බීමෙන් වළක්වන්න බැරි නම් රා දීලා පුළුවන් වෙයිද කසිප්පු බිම නතර කරන්න? කසිප්පු බොන මිනිහට කසිප්පුම ඕනෑ. ඊට වඩා සැර අඩු බීමකින් එයා සතුටු වෙන්නෙ නැහැ. රා ඇති වුණොත් එයින් වෙන්නෙ කවදාවත් මත්පැන් නොබී හිටපු අයත් රා බොන්න පුරුදු වන එකයි. තේ බොන උදවියත් එතකොට රා බොන්න පටන් ගන්නව. එතකොට තේ බොන්නවත් කඩයක් හොයා ගන්න බැරි වෙයි. හැම ගෙදරකම රා මදින්න බලපත්‍ර ගන්න පුළුවන් වුණොත් හැම දෙනාම මදින්න පටන් ගනීවි. මේක පාලනය කරන්න පුළුවන් දෙයක්ද කියා බලන්න. එක්කෙනෙකුට එක ගහයි මදින්න දෙන්නෙ. එක් ගහක් මදින්න බලපත්‍රයක් අරන් එක් ගහක් විතරක් මැදගෙන ඉන්නවය කියල අපට හිතන්න පුළුවන්ද? ලයිසන්ස් ගන්නෙ එක් ගහක් මදින්න විතරයි. ඒ වුණාට ඒ ලයිසන්ස් එක ළඟ තියාගෙන ගස් දහයක්ම මදින්න බලයි. මොන දෙපාර්තමේන්තුවටද පුළුවින් වෙන්නෙ මේ දහය හොයන්න? මේක ලේසි වැඩක්ද? මුලාදෑනීන්ට බැරි නම් කසිප්පු නවත්තන්න—බලපත්‍රයක් නැතුවයි, අවසරයක් කොහොත්ම නැතුවයි කසිප්පු මදින්නෙ—හැම තැනම වාගේ අවසර ඇතුව පොල් ගස් මදින්ට පටන් ගත්තම පුළුවන් වෙයිද අර වැඩිපුර මැදපු ගස් හොයන්න? එක අවසර පත්‍රයෙන් ගස් 25 ක් මදින්න පටන් ගත්තම ඒක නවත්තන්න පුළුවින් වෙයිද මේ උදවියට? කසිප්පු බීමට ඇබ්බැහි වී සිටින අයගෙ එම සිරිත ඉතා භයානකයි. කසිප්පු කාරයන්ට දෙන දඬුවම් තද මදි නම් තව තද දඬුවම් නියම කළාට වරදක් නැහැ. කසිප්පු මුදලාලිල ඕනෑ තරම් අපරාධ කරන්න සූදානම් වී සිටිනව, වෙනත් අය හිරේට යවන්න තියෙන පහසුව නිසා. "මේක අහු වුණොත් උඹ කළාය කියපන්; කියල, හිරේට පලයන්; උඹේ පවුලත් අනික් අයත් මම බලාගන්නම්; මෙන්න සල්ලි" කියා මිනිසුන් හොයාගන්නව, ඒ අය. [බාධා කිරීමක්] කාට දුන්නත් කමක් නැහැ. කසිප්පු මුදලාලිල වෙනුවෙන් ඉදිරිපත් වෙලා "ඒ වරද කළේ අපියි" කියන්න තරම් අය දූන් රටේ සිටිනව. ඒ මොකද? හිරේට යාම එතරම් අමාරු දෙයක් නොවන නිසයි, එසේ කරන්නෙ. කසිප්පු නවත්වන්න නම්, කසෙන් දඬුවම් දෙන්න ඕනෑ. වරද කරන අයට කස පහර ගහන්න ඕනෑ. එතකොට "පවුල බලා ගන්නවා" කියා මොන කසිප්පු මුදලාලි කීවත්, ඒක හරි යන්නෙ නැහැ. එම නිසා—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු චම්ලි ගුණවර්ධන (රජයේ වැඩ ඇමති)**
*(கௌரவ சம்ளி குணவர்தன—அரசாங்கக் கட்டடுவேலை அமைச்சர்)*
(The Hon. Cholmondeley Goonewardene—Minister of Public Works)

එල්ලුම් ගහට යවන්නත් පුළුවනි.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

අපේ රට කසිප්පු උවදුරෙන් බේරා ගන්න ඕනෑය කියා, මුළු සමාජයම රා බේරුවන් කරන්න ඕනෑද? ඒ විධියට මුළු ජාතියම විනාස කරන්න ඕනෑද? කසිප්පු පැතිරීම වැළැක්වීමෙ අදහසින් මුළු සමාජයම රා ගුඩ්බෝ කරන්න යනව. මේක, පුදුම තර්කයක් නේද? රා වලින් අපේ රට විනාස කරන්න යනව. අපි හැම විටම කල්පනා කරන්න ඕනෑ, මෙසේ—

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

I thought the hon. Member wanted to leave at 6.05, so I gave him 10 minutes, now he has exceeded that time.

**එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)**
*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*
(Mr. S. M. Rasamanickam—Paddiruppu)

The hon. Member is trying to go beyond his time limit without giving other Members a chance to reply. There are many Members waiting to reply.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

The Junior Minister wants at least 30 minutes to reply.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

It is not yet 6.10, there are two minutes more, I will speak till then.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

He can have a public meeting outside.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

උතුරේ අය රා බොනවය කියනව. මුහුදු බඩ අය කසිප්පු බොනවය කියනව. නමුත් බලන්න, නැගෙනහිර පළාතෙ ජීවත් වන අපේ මුස්ලිම් ජනතාව දෙස. එහෙම කවුරුවත් බීම පාවිච්චි කරන්නෙ නැහැ. එහෙ කසිප්පුත් නැහැ; රාත් නැහැ. එම ආදර්ශය අපට ගන්න බැරිද? ඇයි අපි යාපනේ රා බීමෙ ආදර්ශය භාර ගන්නෙ? නැගෙනහිර පළාතෙ මුස්ලිම් ජනතාව සම්පූර්ණයෙන්ම රා වලින් වැළකී සිටින සිරිත අපි ආදර්ශයට ගනිමු. [බාධා කිරීමක්] රටක යම්කිසි නරක සිරිතක් පැතිර තිබෙනව නම් එය නැති කිරීමේ අදහසින් තවත් නරක සිරිතක් බෝ කරන්න හදන්න හොඳ නැහැ. කසිප්පු නැති කිරීමෙ අදහසින් රා පාවිච්චි කරන්න පුරුදු කරනව නම්, අබිං පාවිච්චි කිරීම නැති කරන්න මොනවද පාවිච්චි කරන්න පුරුදු කරන්නෙ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(An hon. Member)

ගංජා

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ගංජා පාවිච්චි කරන්න පුරුදු කරනවද? අබිං, ගංජා යනාදිය පාවිච්චි කිරීම සීමා කරල දැන් ඒව හුඟක් දුරට අඩු කර ගන්න පුළුවන් වී තිබෙනව නේද? කසිප්පු පාවිච්චිය නැති කරන්න රා පාවිච්චිය බෝ කරනව නම් ගංජා, අබිං යනාදිය පාවිච්චි කිරීම නැති කරන්න තවත් යමක් කවුරුන් විසින් හෝ සොයා ගන්න වේවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

மூதூர்ப் பிரதிநிதி அவர்களே, தமிழிற் பேசுங்கள்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා. (මූතූර් දෙවන මන්ත්‍රී)**
*(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது—மூதூர் இரண்டாவது அங்கத்தவர்)*
(Mr. A. L. Abdul Majeed—Second Mutur)

Mr. Chairman, as the Federal Party Leader has requested me to speak in Tamil, I shall make my observations accordingly in Tamil.

கௌரவ அக்கிராசனர் அவர்களே, இன்று இங்கு நடைபெற்றுக் கொண்டிருக்கும் விவாதத்தைக் கவனிக்கும்போது ஒரு உண்மை எனக்குத் தென்படுகின்றது. அதாவது, 1956 ஆம் ஆண்டிலே அமைக்கப்பட்ட ஆட்சியைக் கவனிக்கும்போதும், அதற்குப்பின் 1960 ஆம் ஆண்டிலே அமைக்கப்பட்ட ஆட்சியை அவதானிக்கும்போதும் இந்நாட்டில் வாழுகின்ற சிறுபான்மை மக்களுடைய பிரச்சினையைத் தீர்க்குமுகமான சூழ்நிலை உருவாக்கப்படும் என்ற நம்பிக்கை இந்நாட்டில் வாழும் சிறுபான்மையினரிடையே ஏற்பட்டதைத் திட்டமாக நாங்கள் கண்டோம். இதனைக் கண்ட தமிழ் பேசும் மக்கள் களிப்படைந்தார்கள். ஆனால் ஸ்தல ஸ்தாபனங்களிலே நிலவுகின்ற சூழ்நிலையைக் காணும்போது, அல்லது இந்நாட்டிலே அமைக்கப்பட்டிருக்கும் உள்ளூராட்சி மன்றங்களிலும் ஸ்தல ஸ்தாபனங்களில் காணப்படும் சூழ்நிலையைக் கவனிக்கும்போது அந்த அந்த உள்ளூராட்சிப் பகுதியிலே எந்த மொழி உபயோகிக்கப்படுகின்றதோ, வழங்கப்படுகின்றதோ அந்த மொழி மூலமாக நிர்வாகங்களை அமைக்க முடியுமென்று ஒரு திட்டவட்டமான அமைப்பு முறையை, நிர்வாகத்தைக் கௌரவ ஸ்தல ஸ்தாபன அமைச்சர் கூறியிருப்பினும், இன்று வட கிழக்கு மாகாணங்கள் ஆகிய இவ்விரு மாகாணங்களையும் எடுத்துக் கொள்ளும் போது இவ்விரண்டு மாகாணங்களுக்கும் அதிகப்படியாகத் தலைமைக் காரியாலயத்திலிருந்து கடிதங்கள், கட்டளைகள் சிங்கள மொழியிலேதான் அனுப்பப்படுகின்றன என்பதை கௌரவ அமைச்சர்களுக்குக் கூற நான் ஆசைப்படுகிறேன். உண்மையிலேயே தனிச் சிங்கள மசோதாவின் கீழ் நியாயமான அளவு தமிழ்மொழி உபயோகத்துக்கும் சரத்து இருக்குமாயிருந்தால் இன்று வட மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் அமைக்கப்பட்டிருக்கும் அமைந்திருக்கும் உள்ளூராட்சி மன்றங்களுக்கு ஏன் சிங்கள மொழியில் உத்தரவுகளோ வேண்டுகோள்களோ கடிதங்களோ—

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

காசோலைகளோ—

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனுப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

காசோலைகளோ போக வேண்டுமென்று கேட்க நான் ஆசைப்படுகிறேன்.

ஏனென்றால் இந்நாட்டிலே, கௌரவ அமைச்சர் கவனிக்க வேண்டியது என்னவென்றால், கடந்த பல நூற்றாண்டுகளாக தமிழ் பேசும் மக்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள்; இதனை யாராலும் மறுக்கவோ மறைக்கவோ முடியாதென்பதைத்தான். ஆகையினால், இச்சிறுபான்மை மக்களுடைய மூலாதார உரிமைகளை ஸ்தல ஸ்தாபன நிறுவனங்கள் மூலமாகக் கட்டாயம் கொடுக்க வேண்டுமென்று ஆசைப்படுபவன் நான். எனவே இந்நாட்டிலே சுபிட்சமான சூழ்நிலை நிலவ வேண்டுமென்றால் இந்த ஸ்தல ஸ்தாபன நிறுவனங்கள் மூலமாகத்தான் இதற்கான சூழ்நிலையை உருவாக்க முடியுமென்பதை யாரும் மறுக்க முடியாது. இந்நாட்டிலே அமைந்திருப்பது சோசலிசம் என்று பேசுகிறார்கள். சம தர்ம ஆட்சி இந்நாட்டிலே நிலவுகின்றது என்று சொல்லிக் கொள்ளுகிறார்கள். சிறுபான்மை மக்களுக்கு இந்த அரசாங்கத்தினால் எவ்வித கஷ்டமும் ஏற்படாதென்று பேசுகிறார்கள். ஆனால் இன்று வட, கிழக்கு மாகாணங்களில் உள்ளவர்கள் படுகின்ற கஷ்ட நிலையைக் கௌரவ அமைச்சர் உணர வேண்டுமென்பதுதான் எனது ஆணித்தரமான வேண்டுகோள். சிங்கள மொழியை இந்நாட்டிலே வாழுகின்ற சிறுபான்மை மக்கள் ஒருபோதும் ஒதுக்கவில்லை. அதே நேரத்திலே சிங்களமொழி பேச முடியாத தமிழ் பேசும் மக்களும் இந்நாட்டில் வாழுகின்றார்கள்; அவர்களுடைய மொழியை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஓரளவுக்கு ஏற்றுக்கொள்ளக் கூடிய முறையி லும், அவர்களும் இந்நாட்டுப் பிரசைகள் என் பதை ஏற்றுக்கொள்ளக் கூடிய முறையிலும் ஒரு சூழ் நிலையை உருவாக்க இந்த அரசாங் கம் கடமைப்பட்டிருக்கின்றது என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆகவே இந்தச் சூழ்நிலையை இந்த அரசாங் கம் உருவாக்க வேண்டுமென்பது எனது வேண்டுகோள்.

அடுத்ததாக இச்சபையிலே பலர் மாவட்ட சபைகளைப்பற்றியும் பேசினார்கள். என்னைப் பொறுத்த வரையில், மாவட்ட சபைகள் நிறு வப்பட்டால் அது முஸ்லிம் மக்களுக்கு முற்றி லும் மாருனதாகத்தான் இருக்குமென்று திட்டவட்டமாகக் கூற விரும்புகின்றேன். எனி னும், இந்நாட்டில் தமிழ் மொழியைத் தாய் மொழியாகவும் போதனமொழியாகவும் கொண்ட மக்களுக்கு இம் மாவட்ட சபைகள் மூலம் நிச்சயமாகச் சுபீட்சம் ஏற்படும் என் பதையும் திட்டவட்டமாகத் தெரிவித்துக் கொள்கின்றேன். "விரைவில் மாவட்ட சபை கள் பற்றிய மசோதா சபையில் சமர்ப்பிக்கப் படும், நியாயமான அளவு தமிழ் உபயோகம் பற்றி பாராளுமன்றத்தில் விசேட ஷரத்துக் கள் மூலமாக ஏற்பாடுகள் செய்வோம்"என்று கூறுகின்ற அரசாங்கம் விரைவில் இம் மாவட்ட சபைகளை அமைத்து இந்நாட்டில் பரம்பரை பரம்பரையாக வாழ்ந்து கொண்டி ருக்கும் சிறுபான்மை மக்களுடைய பிரச்சினை களைத் தீர்க்க வேண்டும் என்பதுதான் என் பணிவான வேண்டுகோள்.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
**(Mr. Rasamanickam)**
கட்டாயம் நடக்குமா?

**අ. භා. 6.15**

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
**(Mr. A. L. Abdul Majeed)**
நிச்சயமாக நடக்குமென்று தமிழரசுக் கட் சித் தலைவருக்குத் தெரிவித்துக் கொள்ளுகின் றேன். இந்த நாட்டிலே சிறுபான்மை மக்க ளுடைய பிரச்சினைகள் தீர்க்கப்படாத பட்சத் தில் எந்தவிதமான அரசாங்கத்தினுலும் நல்ல முறையில் ஆட்சியை நடத்த முடியாது என்று தெரிவித்துக் கொள்ள ஆசைப்படுகின் றேன். சிறுபான்மை மக்கள் என்று குறிப் பிடும்பொழுது, இந்த உலகத்தில் எந்த ஒரு நாட்டை எடுத்துக் கொண்டாலும், எந்த ஒரு பகுதியை எடுத்துக் கொண்டாலும் அந் தந்த இடங்களிலெல்லாம் அவ்வவ்வரசாங்கங் கள் சிறுபான்மை மக்களுடைய பிரச்சினை களை வெற்றிகரமாகத் தீர்த்துவைத்திருப்ப தைக் காணக்கூடியதாக இருக்கும். இதன் காரணமாகத் தான் அங்கெல்லாம் சமதர்ம மும் சனநாயகமும் செழித்தோங்குகின்றன என்பதே என் கருத்து.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
**(Mr. Rasamanickam)**
உங்களுடைய ஆட்சியில் என்ன நடக் கிறது?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
**(Mr. A. L. Abdul Majeed)**
இந்த ஆட்சியில் என்ன நடைபெறுகின்றது என்று தமிழரசுக் கட்சித் தலைவரவர்கள் கேட் கிருர்கள். தமிழரசுக் கட்சியினர் தமிழ் பேசும் மக்களிடையே செய்யும் பிரசாரங்களைப் பற்றி முதலில் அறிய வேண்டும். இவர்கள் பொது மக்களிடம் சென்று என்ன சொல்கிருர்கள்? "வடக்கு, கிழக்கு மாகாணங்களை சிங்கள ஏகாதிபத்தியம் விழுங்கிக் கொண்டு வருகின் றது. சிங்களம் வலுக்கட்டாயமாக இம் மாகா ணங்களில் திணிக்கப்படுகின்றது. எனவே, தமிழ் பேசும் மக்களே ஒன்று திரளுங்கள்" என்று கூறுகிருர்கள். தலைவரவர்கள், உண்மை யிலே இந்த அரசாங்கத்துக்கு நான் கூறுகின் றேன், ஐக்கிய தேசியக் கட்சியினரை நான் கேட்கின்றேன், 1948 ஆம் ஆண்டிலே அல் லது 1952 ஆம் ஆண்டிலே நீங்கள் இந்தப் பிரச்சினையைத் தீர்த்திருந்தால் இப்படியான நெருக்கடியான நிலை ஒருபோதும் ஏற்பட்டி ருக்காதல்லவா? தமிழரசுக் கட்சியினர் கூறு வது போல, பொது மக்கள் தமிழரசு வேண்டு மென்று கேட்கவில்லை. நாட்டைப் பிரிக்க வேண்டும், இரு கூருக்க வேண்டும் என்றும் விரும்பவில்லை.

**ඒ. අමිර්තලින්ගම් මයා. (වඩ්ඩුකෝඩෙයි)**
*(திரு. ஏ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)*
**(Mr. A. Amirthalingam—Vaddukoddai)**
நாங்கள் அப்படிச் சொல்லவில்லை.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

நாட்டைப் பிரிக்க வேண்டுமென்று—

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

நாங்கள் பேசுவது உங்களுக்கு விளங்க வில்லை.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

நீங்கள் பேசுவது எனக்கே விளங்கவில்லை என்றால், சாதாரண பொதுமக்களுக்கு எப்படி விளங்கப் போகின்றது?

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

சமஷ்டி என்பது பிரிவினை அல்ல.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

சமஷ்டி என்றால் என்ன?

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

ஒன்றுபட்டு வாழ்தல்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

சமஷ்டி என்றால் நாட்டைப் பிரிப்பது அல்ல என்று என்னுடைய நண்பர் கூறுகின்றார். ஆனால் உங்களுடைய பிரசாரப்படி நாடு பிரிக்கப்படவே வேண்டும். தமிழ்ப் பகுதி என்று ஒன்று தனியாக இருக்க வேண்டும் என்று கருதுகின்றீர்கள்.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

இல்லவேயில்லை.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

நீங்கள் இப்படிக் கூறியதற்காக நன்றி கூறுகின்றேன். இந்த நாட்டின் மொழிப்பிரச்சனை உடனடியாகத் தீர்க்கப்பட வேண்டும். இப் பிரச்சினையைத் தீர்க்க எங்களது உள்ளூராட்சி உதவி அமைச்சர் அவர்களினால்தான் முடியும் என்று கருதுகின்றேன். இப் பிரச்சினையைத் தீர்க்க அவர் உண்மையிலேயே விரும்புவாரேயானால் மாவட்ட சபைகள் மூலமோ அல்லது அதற்கு முன்னர் நியாயமான தமிழ் உபயோக மசோதா சம்பந்தமான ஷரத்துக்கள் மூலமோ இந்த நாட்டிலே நல்லதொரு சூழ்நிலையை ஏற்படுத்த அவராலேயே முடியும் என்று திடமாக நம்புகின்றேன். இப்படிச் செய்தால் சமஷ்டிக் கோரிக்கை தோல்வியடையும்.

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

நாட்டைப் பிரிக்க வேண்டுமென்பது சமஷ்டிக் கட்சியின் கோரிக்கையல்ல. சிங்களம் மாத்திரம் சட்டத் திணிப்பு மூலமே இந்த நிலையை உருவாக்குகின்றீர்கள்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

தமிழரசுக் கட்சியின் பொதுச் செயலாளர் திரு. அமிர்தலிங்கம் அவர்கள் கூறுவதுபோல இந்த நாட்டைப் பிரிக்க வேண்டுமென்ற நோக்கம் தமிழரசுக் கட்சியினருக்கு இல்லை. குறிப்பாக சிங்கள மக்களோடு இணைந்து வாழ்வதையே இந்த நாட்டிலுள்ள தமிழ் பேசும் மக்கள் விரும்புகிறார்கள்.

**රාසමාණික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

ஆம். உண்மை. சிங்கள மக்களோடு இணைந்து வாழ்வதையே இந்த நாட்டில் உள்ள தமிழ் பேசும் மக்கள் விரும்புகிறார்கள்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

கௌரவ தலைவர் அவர்களே! தமிழரசுக் கட்சியினருடைய இணைந்து வாழுகின்ற கோரிக்கையில் எந்தவிதமான குற்றமும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இல்லை. ஒருசில வகுப்புவாத வெறிபிடித்த கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பி. ராஜரத்ன) கௌரவ தம்பதெனியாப் பிரதிநிதி (திரு. ஆர். ஜி. சேனநாயக்கா) போன்றவர்கள்தான் இந்த நாட்டை மண்ணோடு மண்ணாக்கத் திட்டம் போட்டுக் கொண்டு வருகிறார்கள். நான் இங்கே கூறுவது தமிழரசுக் கட்சியினரைப் பற்றிய பிரச்சினைகள் அல்ல. தமிழரசுக் கட்சியினர் இந்த நாட்டில் எந்த விதமாகப் பிரசாரம் செய்தாலும் அவர்களுடைய பிரச்சாரத்தைப் பற்றி எங்களுக்குக் கவலையில்லை. ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினரைப் பொறுத்த வரையில் இந்த நாட்டின் ஸ்தல ஸ்தாபனத் தந்தையாகிய காலஞ்சென்ற திரு. எஸ். டப்ளியு. ஆர். டி. பண்டாரநாயக்கா அவர்கள் கூறிய முறைப்படி ஆட்சி செய்ய அவர்கள் திட்டமிட்டுள்ளார்கள். இந்த நாட்டின் மொழிப் பிரச்சினை மாவட்ட சபைகள் ரீதியாகவோ அல்லது நியாயமான அளவு தமிழ் உபயோகச் சட்டத்தின் மூலமாகவோ தீர்க்கப்படும் பொழுது நாட்டில் பிரிவினைப் பிரச்சினை எழவே முடியாது. இதைக் கௌரவ அமைச்சர் அவர்கள் தங்களுடைய கவனத்திற்கு எடுத்துக் கொள்ள வேண்டும். திருமலையில் நடைபெற்ற தமிழரசுக் கட்சி மகாநாட்டில் கட்சியின் புதிய காரியதரிசியாகத் தெரிவு செய்யப்பட்ட வட்டுக் கோட்டைப் பிரதிநிதி (திரு. ஏ. அமிர்தலிங்கம்) அவர்கள் பேசுகையில் தமிழ் மக்களுடைய மொழிப் பிரச்சினை தீர்க்கப்படாவிட்டால் வருகிற அக்டோபர் மாதத்தில் ஒரு ஹர்த்தால் நடைபெறுமென்று கூறினார்கள்.

**අමිර්තලින්ගම් මයා.**
*(திரு. அமிர்தலிங்கம்)*
(Mr. Amirthalingam)

அது பொய்.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

கௌரவ அங்கத்தவர் நேரத்தை வீணாக்காமல் தமது பேச்சைச் சுருக்கமாக முடிக்க வேண்டும்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

இந்த நாட்டில் அமைந்துள்ள அரசாங்கம் ஒரு சோசலிச அரசாங்கமாக இருந்தாலுஞ் சரி அல்லது வேறு எந்தவிதமான அரசாங்கமாக இருந்தாலுஞ் சரி இந்த நாட்டிலுள்ள சிறுபான்மை மக்களுடைய பிரச்சினையைத் தீராத பட்சத்தில் அரசாட்சியை நடத்த முடியாது.

மீண்டும் அதிக தூரத்திற்கு நான் போக விரும்பவில்லை. எனது மூதூர்த் தொகுதியைப் பற்றிச் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். எனது தொகுதி இரட்டை அங்கத்தவர் தொகுதியாகும். எனது நண்பர் இப்பொழுது இச்சபையிலே இல்லை. இந்த நாட்டில் பல பெரிய பிரச்சினைகள் இருக்கும் சூழ்நிலையில் வட கொரியாவிற்கு அவர் போகிறார் என நான் அறிகிறேன். சிங்களம் பேசுகின்ற மக்களுக்காக அமைந்த மூன்று நான்கு உள்ளூராட்சி மன்றங்கள் எனது தொகுதியில் இருக்கின்றன. அதைப் போல தமிழ் பேசும் மக்களைப் பெரும்பான்மையாகக் கொண்ட சில உள்ளூராட்சி மன்றங்களும் இருக்கின்றன. தமிழ் பேசும் மக்கள் பெரும்பான்மையாகவுள்ள உள்ளூராட்சி மன்றங்களுக்கு வருகின்ற கடிதங்கள் சிங்களத்திலேயே வருகின்றன. அப்படிப்பட்ட கடிதங்களையெல்லாம் அம்மன்றங்கள் திருப்பியனுப்பி விடுகின்றன. இதனை அமைச்சர் அவர்கள் கவனிக்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். இப்பொழுது இங்கு அடியெடுத்து வைத்த உதவி அமைச்சர் அவர்கள் சோசலிஸக் கொள்கையை மேற்கொள்ளும் ஒருவர். சிறுபான்மை மக்களுக்காக எதுவும் செய்யத் தயாராயிருப்பவர்கள். எனவே, அவர் இதனைத் திருத்தியமைக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

கந்தளாய்க் குடியேற்றத்திட்டம் பெரும்பான்மையாக சிங்கள மக்கள் வாழும் குடியேற்றத்திட்டமாகும். நான் மிகவும் கஷ்டப்பட்டு ஒரு டீ. ஆர். ஓ. கந்தோரை அச் சிங்கள மக்களுக்காக அங்கு ஏற்படுத்திக்கொடுத்தேன். அதே நேரத்தில், கிண்ணியாவிலே ஒரு டீ. ஆர். ஓ. கந்தோர் இருக்கின்றது. கௌரவ அமைச்சர் அவர்களின் நிரந்தரக் காரியதரிசியை அணுகி, கிண்ணியா டீ. ஆர். ஓ. கந்தோருக்கு நிரந்தரமான டீ. ஆர். ஓ. ஒருவரை நியமிக்க வேண்டுமென்று கேட்

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[අබ්දුල් මජීඩ් මයා.]
டேன். ஆனால், அதனை அவர் மறுத்துவிட்டார். எனவே, இவ்விஷயத்தையும் அமைச்சர் அவர்கள் கவனிக்க வேண்டுமென வேண்டிக் கொள்கின்றேன்.

மூதூர் கொடியாரைப் பத்து டீ. ஆர். ஓ. கந்தோரிலே ஒரு பதில் டீ. ஆர். ஓ. தான் கடமையாற்றுகின்றார். அவரை நிரந்தரமாக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, இந்த அரசாங்கம் கிராம சேவகர்களை நியமித்தது. எனது தொகுதியைப் பொறுத்த அளவிலே இன்னும் ஏழு இடங்கள் இருக்கின்றன. இந்த ஏழு இடங்களுக்கும் இந்த அரசாங்கம் ஒரு கிராம சேவகரையேனும் இன்னும் நியமிக்கவில்லை. இதனால் அங்கு வாழும் சிங்கள மக்கள் என்னைத் தவறாக நினைக்க வேண்டியிருக்கின்றது. நான் திருவாளர் ஏ. பீ. ஜயசூரியா அவர்களை எத்தனையோ தடவைகள் இது சம்பந்தமாகச் சந்தித்துக் கதைத்திருக்கின்றேன். சிங்களம் பேசும் மக்கள் வாழும் இந்தப் பகுதிகளுக்கு கிராம சேவகர் நியமிக்கப்பட வேண்டிய அவசியத்தை அவரிடம் நான் பலமுறை வற்புறுத்தியிருக்கின்றேன்.

I have requested the Hon. Minister of Local Government and Home Affairs to appoint three Sinhala *grama sevakas* to the three existing Sinhala *grama sevaka* divisions, but so far the Hon. Minister has not taken any action at all. In fact, I remember mentioning this matter to the hon. fair Parliamentary Secretary, too. I do not know what action has been taken so far.

தலைவர் அவர்களே, இன்னொரு விஷயத்தைப் பற்றிக் குறிப்பிட விரும்புகின்றேன். சிங்களம் பேசும் மக்கள் கூறுகின்றார்கள், அத்துடன் இங்குள்ள சில பிரதிநிதிகளும் கூறுகின்றார்கள், "மஜீது ஒரு வகுப்பு வாதி" யென்று; முஸ்லிம்களுக்காகவும் தமிழர்களுக்காகவும் மட்டும் பாடுபடுகின்ற ஒருவரென்று. நான் திருவாளர் ஏ. பீ. ஜயசூரியா அவர்களை இது பற்றிப் பல தடவை கண்டு கதைத்துள்ளேன். இந்த மூன்று சிங்களப் பகுதிகளுக்கும் சிங்களக் கிராம சேவகர்களை நியமிக்க வேண்டுமென்று அவருக்கு எடுத்துக் கூறியிருக்கின்றேன். ஆனால், எனது வேண்டுதலுக்கு அவர் செவிசாய்க்கவில்லை.

நான் நீண்டநேரம் பேச விரும்பவில்லை. இச்சந்தர்ப்பத்தில் ஒன்றை மாத்திரம் கூற ஆசைப்படுகின்றேன். புதிதாகக் கந்தளாய்க் குடியேற்றத்திட்டம், அல்லைக் குடியேற்றத்திட்டம் போன்ற பல குடியேற்றத்திட்டங்களைக் கிழக்கு மாகாணத்திலே ஏற்படுத்தி, அங்கு உள்ளூராட்சி அமைப்பு முறைகளை அரசாங்கம் ஏற்படுத்தி வருகின்றது. இந்த அமைப்பு முறைகளிலே தமிழ் பேசும் மக்களின் உரிமைகள் கவனிக்கப்பட மாட்டாது என்று பலரும் கூறுகின்றார்கள். என்னைப் பொறுத்த அளவிலே, இந்த அரசாங்கத்திலே எனக்குப் பூரண நம்பிக்கையுண்டு. ஆனால், கந்தளாய், அல்லை, தீகவாப்பி, கல்முனை, நிந்தவூர், மட்டக்களப்பு போன்ற இடங்களிலே ஏற்படுத்தப் பட்டு வருகின்ற இந்த உள்ளூராட்சி மன்ற அமைப்பு முறைகளிலே பெரிய இருட்டடிப்புக்கள் செய்யப்படுவதாக அறிகின்றேன். இது பற்றி கௌரவ மட்டக்களப்புப் பிரதிநிதி அவர்கள் (திரு. சீ. இராஜதுரை) நேற்றைய தினம் என்னுடன் கதைத்தார். முள்ளிப் பொத்தானைக் கிராமத்திலே வாழ்கிறவர்கள் அதிகமானோர் முஸ்லிம்களாயிருக்கிறார்கள். அப்படி இருந்தும் அக்கிராமத்துக்கு அமைக்கப்பட்ட உள்ளூராட்சி மன்றத்திலே இரண்டு பிரதிநிதித்துவந்தான் முஸ்லிம்களுக்குக் கொடுக்கப்பட்டிருப்பதாக எனக்கு அவர் கூறினார். நான் இன்னும் வர்த்தமானியைப் பார்க்கவில்லை. எப்படியாயினும் இப்படியான இருட்டடிப்பு வேலைகளை, ஏகாதிபத்தியச் செயல்களைச் செய்தால் இந்நாட்டில் சுபிட்ச சூழ்நிலை உருவாக முடியாது; சமுதாய ஒற்றுமை காண முடியாது—

அ. භා. 6.30

මූලාසනාරූඪ මන්ත්‍රී
(தலைமை தாங்கும் அங்கத்தவர்)
(The Presiding Member)

Order, please! The Hon. Speaker will now take the Chair.

**අනතුරුව ශ්‍රීමත් රසීක් ෆරීඩ් මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.**

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(வைத்திய கலாநிதி டப்ளியு. தகனாயக்க)
(Dr. W. Dahanayake)

Sir, may we know what the position is in regard to this Debate? How long will the Ministry of Local Government and Home Affairs be discussed?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

How long will the hon. Parliamentary Secretary take to reply ?

විවියන් ගුණවර්ධන මිය.
(திருமதி விவியன் குணவர்தன)
(Mrs. Vivienne Goonewardene)

At least 45 minutes.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Let us then stop at 7 o'clock.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(வைத்திய கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

Let us stop at 7.15 P.M. and give the hon. Parliamentary Secretary 45 minutes.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

No. Let us stop at 7 P.M. and give the hon. Parliamentary Secretary 45 minutes.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(வைத்திய கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

Then what about the other Ministries ?

ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
(ஜனப் ஏ. எல். அப்துல் மஜீது)
(Mr. A. L. Abdul Majeed)

கௌரவ அக்கிராசனர் அவர்களே, இப்பொழுது ஒரு உண்மையை வற்புறுத்த நான் ஆசைப்படுகிறேன். எனக்கு இன்று மிகப் பெருமையாக இருக்கின்றது, இப்பொழுது சபைக்குத் தலைமை தாங்கிக் கொண்டிருக்கும் கௌரவ அக்கிராசனராகிய தங்களுக்கு நான் பேசுகின்ற தமிழ் மொழி திட்டவட்டமாக விளங்குமென்பதை எண்ணும்போது. இன்று அக்கிராசனர் அவர்களே, கிழக்கிலங்கையைப் பொறுத்தவரையிலே அப்பகுதியிலே வாழுகின்ற தமிழ் பேசும் மக்களுடைய உரிமையைப் பொறுத்த அளவிலே ஸ்தல ஸ்தாபனங்கள் மூலமாகத்தான் அவர்களுடைய உரிமையைப் பாதுகாக்க முடியுமென்பது எனது அசைக்க முடியாத நம்பிக்கை.

அடுத்ததாக, எனக்கு முன் பேசிய கௌரவ தம்பதெனியப் பிரதிநிதி கள்ளைப் பற்றியும் கசிப்பைப் பற்றியும் பேசினார். என்னைப் பொறுத்த அளவிலே நான் கள்ளைப் பற்றியும் கசிப்பைப் பற்றியும் பேசுவதற்கு ஆயத்தமாக இல்லை. அவர் பேசும்போது கூறினார் யாழ்ப்பாணத்திலே கள் நிறைய இருக்கின்றது; அதனால் அங்கு கட்குடி அதிகம்; அதேபோல, தென்மாகாணத்திலே கசிப்பு அதிகம்; அதனால் இங்கே கசிப்பைக் குடிக்கிறார்கள் என்று.

கௌரவ அக்கிராசனர் அவர்களே, இந்நாடு ஒரு பௌத்த நாடு, இந்நாட்டிலே பௌத்த தர்மத்தைப் போதிக்கவும் செயல் படுத்தவும் பல்லாயிரக்கணக்கான பௌத்த பிக்குகள் முன் வருகிறார்கள், இப்பௌத்த பிக்குகள் எதற்காகக் கள்ளைப் பற்றியும் கசிப்பைப் பற்றியும் பேச வேண்டுமென்று கேட்க நான் ஆசைப்படுகிறேன்? பௌத்த தர்மம் என்றால் 2,400 ஆண்டுகளுக்கு முன் பாரத நாட்டிலிருந்து உதயமான அணையாத சோதி கௌதம புத்தர் அவர்கள் போதித்த தர்மம் அது. அவர் பௌத்த தர்மத்தைப் பற்றித்தான் பேசினார். அவர் அவ்வாறு பேசியபோது இந்தக் குடியைப்பற்றி, கள்ளைப்பற்றி, கசிப்பைப் பற்றி பேசவில்லை. அதே தர்மத்தைப் போதிக்கிறவர்கள், இந்தத் தர்மத்தை அப்பட்டமாகச் செயல்படுத்த வேண்டுமென்று விரும்புகிறவர்கள், இந்தத் தர்மத்தினால் மக்கள் மத்தியிலே புதிய கருத்துக்கள் பூத்துக் குலுங்க வேண்டுமென்று ஆசைப்படுகிறவர்கள் எதற்காக கள்ளைப் பற்றி, கசிப்பைப் பற்றிப் பேச வேண்டுமென்று கேட்க நான் ஆசைப்படுகிறேன்?

உண்மையிலேயே கள்ளை அருந்துவதால், கசிப்பை அருந்துவதால் மதியை இழந்து மிகவும் கேவலமான நிலையை அடைய வேண்டியிருக்கின்றது. ஆனால் இதனை வளர்க்க வேண்டும் என்று கௌரவ தம்பதெனியா பிரதிநிதி (திரு. ஆர். ஜீ. சேனநாயக்க) அவர்கள் கேட்கின்றார்கள். அவரைப் போலவே கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பீ. ராஜரத்ன) அவர்களும் கேட்கிறார் என்று கருதுகின்றேன். பௌத்த தர்மத்துக்கு மாறான, விரோதமான முறையில் அனுவசியமான கருத்துக்களை நாட்டில் பரப்பக் கூடிய, நாடுகளுக்கிடையில் யுத்த அபாயத்தையே ஏற்படுத்தக் கூடிய, தப்பபிப்பிராயங்களை வளர்க்கக் கூடிய, மதுவை ஏன் இந்த நாட்டிலிருந்தே ஒழித்துவிடக் கூடாது என்று

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් මජීඩ් මයා.]
கேட்க விரும்புகின்றேன். என்னுடைய கட்சி நண்பர்களுக்கும் கூறுகின்றேன். மது, திட்டவட்டமாக நமது சமுதாயத்தை வளர்க்கக் கூடிய ஒன்று அல்ல. ஆனால் நண்பர் தம்பதெனியாப் பிரதிநிதி அவர்கள் மது வேண்டும் என்கிறார்.

கனம் தலைவரவர்களே, முஸ்லிம் மக்களைப் பொறுத்த அளவில் அவர்கள் மது அருந்துவதில்லை என்பது குறித்து நான் பெருமைப்படுகின்றேன்.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
குதிரைப் பந்தயம்?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
மதுவை இந்த நாட்டிலே வாழும் இஸ்லாமியர்கள் மாத்திரமல்ல, பௌத்த தர்மத்தைப் பின்பற்றும் சிங்களத் தோழர்களும் அருந்துவதில்லை. இது போலவே, இந்துக்களும் மது அருந்துவதில்லை என்று கூறாமலிருக்க முடியாது. இருந்தாலும் பௌத்த தர்மத்துக்கெதிராக மதுவை ஏன் கொண்டு வரவேண்டும் என்று கௌரவ அங்கத்தவர்களைக் கேட்க விரும்புகின்றேன். பௌத்த தர்மத்துக்காக அதிகமாகப் பரிந்து பேசும் கௌரவ அவிசாவளைப் பிரதிநிதி (திரு. டீ. பீ. ஆர். குணவர்தன) அவர்களைக் கேட்கிறேன். பௌத்த தர்மத்தை நம்புகின்ற கௌரவ தம்பதெனியாப் பிரதிநிதியைக் கேட்கிறேன். கௌரவ வெலிமடை அங்கத்தவரைக் கேட்கிறேன். பௌத்த மதத்தைப் பாதுகாப்பதாகப் பேசும் கௌரவ உதவி அமைச்சரவர்களைக் கேட்கிறேன். எதற்காகக் கள் வேண்டும்? பௌத்த தர்மம் வளருகின்ற ஒரு நாட்டிலே கள் எதற்காக வேண்டும் என்று கேட்கிறேன்?

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
மதுவை அடியோடு ஒழிக்க வேண்டும்.

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)
ஆம். எனது நண்பர் தமிழரசுக் கட்சித் தலைவர் கூறுவது போல, மதுவை அடியோடு ஒழிக்கத் தான் வேண்டும். பௌத்த தர்மம் இந்த நாட்டிலே வாழ வேண்டுமானால் மதுவை அடியோடு ஒழிக்கத் தான் வேண்டும் என்று திரும்பவும் கூறஆசைப்படுகின்றேன். கௌதம புத்தர் இந்த நாட்டுச் சிறுபான்மை மக்களுக்குத் துரோகம் செய்யுங்கள் என்று கூறவில்லை. இந்த நாட்டிலே அனுவசியமான கருத்துக்களைப் பரப்புங்கள் என்று சொல்லவில்லை. இந்த நாட்டிலே கள்ளும் கசிப்பும் இருக்க வேண்டும் என்று போதிக்கவில்லை. நாட்டிலே உண்மையான, தர்மமான ஒரு மார்க்கத்தைப் பின்பற்றுங்கள் என்று தான் கௌதம புத்தர் கூறினார். உண்மையாகவே அவரது பொன்னான போதனைகளைப் பின்பற்றினால், இந்த நாடு பொன்கொழிக்கும் பூமியாக விளங்கும் என்பதற்கு எதுவிதமான சந்தேகமுமில்லை.

எனவே, தலைவரவர்களே, ஏற்கெனவே நான் கூறிய கருத்துக்களின் அடிப்படையில் எங்கள்நாடு மாற்றாரால் மதிக்கப்படும் நாடாக விளங்க வேண்டும் என்று, பொன்கொழிக்கும் பூமியாக மிளிர வேண்டும் என்று கூற ஆசைப்படுகின்றேன். இந்த நாடு இந்தியாவுக்கோ அல்லது வேறெந்த நாட்டுக்குமோ அடிபணிந்து போவதை எவருமே விரும்பவில்லை. இதனையொரு பௌத்த நாடாகவும், சிங்கள நாடாகவும் ஆக்க வேண்டும். ஆனால் அதற்கு முதலில் எங்களுடைய மொழிப் பிரச்சினை தீரவேண்டும்; தீர்க்கப்படவேண்டும். அப்படிச் செய்தால், எங்கள் நாடு உலகத்திலேயே பொன்னாடாக விளங்கும் என்பதை அழுத்தந் திருத்தமாகவும் ஆணித்தரமாகவும் கூறி எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)
ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ කථා කිරීම සඳහා අවස්ථාවක් ලබා ගන්නට මහන්සි ගත්තා. නමුත් සභාපතිතුමා හෝ නියෝජ්‍ය සභාපතිතුමා හෝ මට මෙතෙක් වේලා ඒ සඳහා අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. දැන් මට කථා කරන්නට ඉඩ දී තිබෙන්නෙත් මගේ කථාව මිනිත්තු 10 කින් අවසන් කළ යුතුය කියන කොන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

දේසියක් ද ඇතිවයි. මිනිත්තු 10 කින් මොනවා කථා කරන්නදැයි මට තේරෙන්නේ නැහැ. කෙසේ වෙතත්, පළාත් පාලන ආයතනවල තිබෙන දූෂණ ගැන මා විශේෂයෙන්ම කථා කරන්නට අදහස් කරන බව මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, 1959 ජූලි මස 20 වැනිදා අකුරැස්සේ ගරු මන්ත්‍රී දොස්තර වික්‍රමසිංහ මහත්මයා විසින් මේ ගරු සභා වේදී අසන ලද ප්‍රශ්නයකුත් එවකට පළාත් පාලන ඇමති වශයෙන් සිටි විමලා විජයවර්ධන මහත්මිය ඒ ප්‍රශ්නයට දුන් පිළිතුරත් මා දැන් කියවන්නට අදහස් කරනවා.

"HAKMANA BAZAAR : LEASING OF LAND BY VILLAGE COMMITTEE CHAIRMAN

3. Dr. Wickremasinghe asked the Minister of Local Government and Housing : (a) Is she aware that a building site about 9 perches in extent in the Hakmana Bazaar has been leased by the Village Committee Chairman to his brother to construct permanent buildings ; that the V. C. Chairman had not obtained sanction from the Commissioner of Local Government before this land was leased to a private individual for such purposes ; that this land is actually vested in the Government Agent, Matara, and that the V. C. Chairman had no right whatsoever to alienate it for the personal benefit of his brother ; that despite the action of the V. C. Chairman, the Government Agent has decided to vest the property in the Village Committee without any inquiry into the action taken by the V. C. Chairman ; and that the Commissioner of Local Government and the D. R. O. have strongly protested against this decision of the Government Agent ? (b) In the event of the Government Agent vesting this property in the Village Committee, what action does she intend taking in order to remove all encumbrances as a result of illegal occupation and construction of permanent buildings on the land to enable the Commissioner of Local Government to discharge his duty by the Village Committee and prevent public property from being put to uses other than those approved by him ? "

The Hon. Vimala Wijewardene, the then Minister of Local Government and Housing, replied thus :

" (a) I am aware that a building site in Hakmana Bazaar has been leased by the Chairman, Village Committee, to his brother although the land has not been vested in the Village Committee. The Government Agent, Matara, has noticed this individual, Mr. D. S. Abeywickrema of Kongala, to remove the encroachment immediately. (b) Does not arise in view of Answer to (a)."—[OFFICIAL REPORT, 20th July, 1959 ; Vol. 35, c. 685.]

දූෂණ හෙළි වී අවුරුදු 5 ක් ගත වී ඇතත්, තවම ඒ ගැන ක්‍රියා කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට බැරි වුණා. මා ඒ ගැන ඒ නිලධාරීන්ට චෝදනා කරනවා.

This is what is called the delaying tactics of the department and the Government.

ගරු සභාපතිතුමනි, අද මේ රටේ තිබෙන්නේ "නිලධාරි රජයක්". ඒකයි, මේ වැඩ මෙහෙම වන්නේ. හරියාකාර නොකරන්නේ ඒකයි. ස්ථිර ලේකම්වරුන් සී. සී. එස්. පාස් කරල ඉන්නේ හිතුවක්කාර වැඩ කරන්න වෙන්න ඇති. පළාත් පාලන ආයතනයක සභාපතිකෙනකු හෝ වෙනත් නිලධාරියකු ගැන මහජන ප්‍රසාදයක් නැත්නම්, ඔවුන් වෙනුවෙන් මහජනයා කරන ඉල්ලීම් වලට කන් දෙන්නට උසස් නිලධාරීන්ට බැරි මොකද ? අප මන්ත්‍රීවරුන් හැටියට මේ ගරු සභාවට පත් කර එවන ලද්දේ මේ රටේ මහ ජනයා විසිනුයි. අප පත් වූ නිසා ඇමතිවරුන් පත් වුණා. පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් හෝ වේවා, ගම් ප්‍රදේශයක සිදු වන වැරදි වැඩ සම්බන්ධයෙන් හෝ වේවා අඩුපාඩු සම්බන්ධයෙන් හෝ වේවා, මහජනයා අපෙන් ප්‍රශ්න කරනවා. පාරක වළක් තිබුණත් මහජනයා දොස් කියන්නේ මන්ත්‍රීවරයාටයි. එසේ නම් ගම්කාර්ය සභාපතිවරයකු නැත්නම් වෙනත් නිලධාරියකු ගැන මහජන ප්‍රසාදයක් නැති විට, ඒ අයගෙන් මහජනයාට කරදර සිදු වන විට, ඒ පිළිබඳව ප්‍රදේශයේ මන්ත්‍රීවරයා කරුණු ඉදිරිපත් කරතොත්, ඇමතිවරයා හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් හෝ ඒවාට ඇහුම්කන් නොදෙන්නේ මොන හේතුව නිසාද ?

අ. භා. 6.45

ගරු සභාපතිතුමනි, කෝන්ගල ගම්කාර්ය සභාවේ සභාපතිවරයාගේ දූෂණ තවත් තිබෙනවා. ගම්කාර්ය සභාවේ මුදල් වියදම් කොට ඉහත කියන ලද ඉඩමේ ලිඳක් සාදා තිබුණත්, දැන් එය ගොඩ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රෝසි රාජපක්ෂ මයා.]

ඔහුගේ සහෝදරයාට එහි ගොඩනැගිලි සාදන්නට ඉඩ දී ඇති ඇති අතර ඒ ගොඩ නැගිලිවලින් බදු අය කරලත් නැහැ. දැන් ගොඩනැඟිලි දෙකක් සාදා තිබෙනවා. මේ ලඟදී එක ගොඩනැගිල්ලකට නම් බදු අයකර තිබෙනවා. ඒ වගේම තවත් ගොඩනැඟිල්ලක් සෑදීමට ලෑස්ති වෙනවා.

ගරු සභාපතිතුමනි, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා වැදගත් මෙන්ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. 1931 වර්ෂයේ සිටම ඔහු මන්ත්‍රීවරයකු හැටියට ක්‍රියා කළා. එතුමා මේ ගරු සභාවේදී ප්‍රශ්නයක් අසා දැන් අරවුදු 5 ක් ගත වී ඇතත්, ඒ ප්‍රශ්නයට අදාළ කරුණු සම්බන්ධයෙන් තවම නිසි පියවර ගෙන නැහැ. තවම මහජනයාට කිසිම සෙතක් නැහැ. මෙච්චර කල් ඇමතිවරුනුත් බුදි. නිලධාරීනුත් බුදි. ඇයි කෝන්ගල පළාත් පාලන ආයතනය ගැන මෙතෙක් කල් නිසි පරීක්ෂණ නොපැවැත් වූයේ ?

ගරු සභාපතිතුමනි, හිතුමතේ අනුව ගම් කාර්ය සභා සීමා වෙනස් කරනවා. කොට්ඨාශ විශාල ගණනක් තිබෙන ගම්කාර්ය සභා ඇතත් ඒවා ගැන කිසිවක් කර නැහැ. ඒ වගේම විශාල ප්‍රදේශයක් නියෝජනය කරන ගම්කායඹ සභාවකටත්, සුළු ප්‍රදේශයක් නියෝජනය කරන ගම් කායඹ සභාවකටත් දෙන "ග්‍රාන්ට්" මුදල එක සමානයි. ජනගහනය දෙස බලා, විශාලකමේ ප්‍රමාණය දෙස බලා, ආධාර මුදල් දීමට ක්‍රමානුකූල ' ක්‍රමයක් සකස් කර නැත්තේ ඇයි? දෙකට කඩන්න වුවමනා කරන ගම්කාර්ය සභා දෙකට කඩා, එසේ නැත්නම් ජනගහනය අනුව සලකා බලා, සුදුසු ලෙස ක්‍රියා නොකරන්නේ මන්ද? අර මන්ත්‍රීවරය කිව්වය, මේ නිලධාරිය කිව්වය කියා ඇයි ක්‍රමානුකූල පිළිවෙළක් නැතිව ගම් කායඹ සභා කඩන්නෙ? අපේ ප්‍රදේශයේ ගම් කායඹ සභා 3 ක් තියෙනව. ඒ තුනටම ආසන 15 ගණනෙ තියෙනව. එකක්වත් තවම කඩල නැහැ. මුදල් කාබාසිනියා වෙනව, ආසන 15 ක් තියෙන ගම්කායඹ සභාවක පාරවල් සඳහා රුපියල් 12,000 ක් දෙන අතරෙදි ආසන 6 ක් තියෙන ගම්කායඹ සභාවක ටත් පාරවලට 12,000 ක් දෙනව නම් යාපනයේ එහෙම දීලය කියා අපට ආරංචියි. ඒ අනුව ආණ්ඩුවේ වැඩි මුදලක් යන්නේ උතුරු පැත්තේ ගම්කායඹ සභා වලට නේද කියා මම ප්‍රශ්න කරනව.

පළාත් පාලන අ යතනවලින් ගෙවල් රාශියක් හදා තිබෙනව. මාස්පතා බදු ගෙවීමේ ක්‍රමයට දීමෙන්, ඒවා අළුත් වැඩියා කිරීමට පළාත් පාලන අ යතනවල මුදල් හුඟක් නාස්ති වෙනව. ඒ ගෙවල පදිංචි උදවිය ඒ ගෙවල් පරෙස්සම් කිරීම ගැන සලකන්නෙ නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතනවල ගෙවල් සඳහා මාස් පතා බදු ගෙවීමෙන් සින්න වන විධියේ ක්‍රමයක් යොදන ලෙස මම ඉල්ලනව.

දැන් අවුරුදු තුන හතරක් තිස්සෙ මගේ කොට්ඨාශයේ පාරවල් කීපයකටම ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කරල තියෙනව. පාරකට ඉඩමක් අත්පත් කර ගන්න අවුරුදු 4 ක් යනව නම් ගම්කායඹ සභාවක් වැඩ කරන්නෙ කොහොමද? ගම්කායඹ සභාවක කාලය අවුරුදු 3 යි. පාරක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීමට අවුරුදු 4 කටත් වැඩි කාලයක් යනව නම් ඒ ගම්කායඹ සභාවල සභාපතිවරු, සමාජික මහත්වරු වැඩ කරන්නෙ කොහොමද කියා මම අහන්න කැමතියි. ඉඩම් ඇමතිතුමා හෝ පළාත් පාලන ඇමතිතුමා හෝ මොකක් හෝ ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ, ඉඩම් අත්පත් කර ගන්නා තුරු ඒ ඉඩම්වල පාරවල් කැපීමට. ඩොනල්ඩ් රණවීරගෙ සෙන්ට් පීටාස් වත්තෙන් වුවමනා ඉඩම් කොටස තවම අත්පත් කර ගන්න බැරි වෙලා තියෙනව, අවුරුදු 4 ක් පහු වෙලත්.

කඳුපිට වලකඩ ගම්කායඹ සභාවේ හිටපු සභාපති මහතාගේ පෙත්සමක් මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමිට ඉදිරිපත් කරනව. බෙරගම-රණ්ගල පාරට ඉඩමක් අත්පත් කර ගන්න සියළුම වැඩ පිළිවෙළ අවසානයි. ඉඩම මැණල ගල් දැමීමට පස්සෙ ඉඩම් අයිති කාරය භාර දෙන්න ලෑස්ති වුණේ නැහැ.

හක්මන ඩී. ආර්. ඕ. ගැන මම මීට කලිනුත් කීපයක් ප්‍රකාශ කළා. ඒ. ඩී.ආර්.ඕ. මහත්මයා උදේ සිට සවස් වන තුරුම බීගෙනයි. කායඹාලයේ ඉන්නෙ සමානය කට දවසයි. මහජනයට කිසිම වැඩක් කරන්නෙ නැහැ. මේ ඩී.ආර්.ඕ. ත් ඇනට ඉන්න සභාපතිතුමාත් නඩුව ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරල තියෙද්දී, වළලපු ගල් ගළවා වීසි කරල පාර වෙන තැනකින් කපන්න ලැස්ති වෙලා තියෙනව. පාර්ලිමේන්තු ලේකම්තුමීට කටයුතු කිරීම සඳහා මම මේ පෙත්සම ඉදිරිපත් කරනව. ඇයි මේ දෙපාර්තමේන්තුව fප්ලයින් ස්කෝඩ් එකක් පිහිටුවා මේ ඩී.ආර්.ඕ. කන්තෝරු වල මහජනයාගේ වැඩ කරනවද කියා සොයා බලන්නෙ නැත්තෙ? හක්මන ඩී.ආර්.ඕ. දැන් අවුරුදු 4 ක් තිස්සෙ එතැනට වෙලා ඉන්නව. කොහේද ගැවසෙන්නෙ? හෙට්ටිගේ සිරිසේන මහත්මයගෙ දික් දෙනි පොත වත්තෙ, බතිමුර වත්තෙ. දවස් දෙක තුන ගැවසෙන්නෙ ඒ තැන් වලයි. කරුණා කරල දෙපාර්තමේන්තු වෙන් fප්ලයින් ස්කෝඩ් එකක් පිටත් කරල ඩී.ආර්.ඕ. වරුන් වැඩ කරනවද, මහ ජනයාගෙ මුදල්වලින් මහජනයට නියම සේවයක් කරනවද කියල සොයා බැලීම යුතුය කියා මම ප්‍රකාශ කරනව. පසුගිය මැතිවරණයෙදී ඩී.ආර්.ඕ. අබේසිංහ කච්චේරියට වෙලා මොනවද කළේ? කච්චේරිය ඉස්සරහපිට තේක්ක ගහ යට ඉඳගෙන එක්සත් ජාතික පක්ෂය ගැන ප්‍රචාරය කළා. මී ළඟ වාරයෙදී එස්. ඒ. වික්‍රමසිංහ දොස්තර මහත්මය සමග තරග කරන්නට ලැස්ති වෙනවය කියා මට ආරංචියි. ඡන්දය දෙන්න එපාය කියා මිනිසුන්ට කියනව. එක්සත් ජාතික පක්ෂයට ඡන්දය ලබා ගන්න රෑ තිස්සෙ ගම් මුලාදෑනිවරුන්ගේ ගෙවලට යනව. අකුරැස්ස මන්ත්‍රීතුමත්, තවත් මන්ත්‍රීවරු කිප දෙනකුත් කරුණු ඉදිරිපත් කරල මේ ඩී.ආර්.ඕ. මීගමුවට මාරු කළා. කලින් මාරු කරන්න වැඩ කළ අයගෙ කම්මුලට ගැහුව වගේ නැවතත් මෙහාට එවල තියෙනව. හේතුව කුමක්ද කියා අපි දන්නව. ලබන අවුරුද්දේ අකුරැස්සට තරග කරන්න ලැස්ති කරන්නයි, මේ එවල තියෙන්නෙ. මේ විධියට නීච වැඩ කරන්න හිටියොත්, මහජන විප්ලවයක් ඇති වී වැඩි කල් යන්නට මත්තෙන් ඔය නිලධාරීන්ට නිසි පාඩම් ඉගෙන ගන්නට ලැබේවි. අපි කාටවත් අස්ථානයේ දොස් කියන්නෙ නැහැ. දැන් බලන්න, ද්‍රවිඩ දිසාපති කෙනෙකු ඉන්නව, හම්බන්තොට. ද්‍රවිඩ දිසාපති කෙනෙකු සිටිය, නවරත්නනායක කියල, මාතර. හොඳ ලක්ෂණට වැඩ කටයුතු ගෙන ගියා. ශ්‍රමදාන වැඩ, ග්‍රාම සංවර්ධන සමිති වැඩ, ගෙන ගියා. ඒ වාගේම හම්බෝ කියල මාතර දිසාපතිතුමෙක් සිටිය. හොඳට ලක්ෂණට වැඩ ගෙන ගියා. ඒ අයට මහජන ප්‍රසාදය තිබුණා; මහජන සහයෝගය තිබුණා. ඒ උදවිය ගැන කවුරුන්වත් දොස් කියන්නෙ නැහැ. දැන් කොටපල ඉන්නව ඩී.ආර්.ඕ. කෙනෙක්. හොඳ ලක්ෂණට වැඩ කරගෙන යනව. ඒ වාගේම බෙරලපනාතර ගම්කාය්‍ය සභා සීමාව තුළ සිටින ඩී. ආර්. ඕ. හොඳ ලක්ෂණට වැඩ කරගෙන යනව. අපට තේරෙන්නෙ නැහැ, ඇයිද මේ සමහර ඩී.ආර්.ඕ. වරුන් හොඳට වැඩ කරන්නෙත්, සමහර අය නරකට වැඩ කරන්නෙත්, කියා. ඒ නරකට වැඩ කරන අයට තමයි ප්‍රතිගාමීන් කියන්නෙ. මහජනය ගැන කිසිම අනුකම්පාවක් ලැදිකමක් නැතිව ඉන්න මේ අය මහජන ප්‍රශ්න විසඳන්න නොවෙයි, ආණ්ඩුවෙන් පඩි ලබ ලබා මහජනයාට හිරිහැර කරන්නටයි, ඉන්නෙ.

ගරු සභාපතිතුමනි, ආර්.ඩී.එස්. සමිති තිබෙනව, මේවායෙ ආර්.ඩී.ඕ. ලා ඉන්නව. ග්‍රාම සංවර්ධන සමිති තිබුණත් දැන් ඒ සමිති කොයි දෙපාර්තමේන්තුවට අයිතිද කියන්න මම දන්නෙ නැහැ. ගිය අවුරුද්ද වන තුරු තිබුණේ නම් ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතෙයි. කොහොම වුණත් මේවායෙ පාලනය ඒජන්ත උන්නැහැල යටතෙයි. මම අද යෝජනා කරනවා මෙම ආර්.ඩී.ඕ. ලාගෙන් මාස්පතා වාර්තාවක් ගෙන්වා ගන්න, ඒ ඒ මාසය තුළ ඒ අය කරන්නට බලාපොරොත්තු වෙන්නෙ මොනවාද, කොයි ග්‍රාම සංවර්ධන සමිතියද ක්‍රියාත්මක වෙන්නෙ, කොයි ඒවද ක්‍රියාත්මක නොවන්නෙ, ආර්.ඩී.ඕ. ලාගේ රැස්වීම් කීපයක් මාසය තුළ පවත්වනවාද, පැවැත්වූවාද, මොන විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබුවාද, ඉදිරියට කොයි විධියේ වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙනවාද, මේ ආදී විස්තර ඇතුළත්ව. අත්ත වශයෙන්ම මහජන නියෝජිතයන් වන අපටත් ඒ වාර්තා වෙන් පිටපතක් එවීම වැදගත් බව සඳහන් කරනව. මන්ද, එහෙම එව්වොත් තමයි සම්බන්ධතාවක් ඇතුව, සහයෝගතාවක් ඇතිව වැදගත් වැඩ පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රෝයි රාජපක්ෂ මයා.]
වෙලක් ක්‍රියාත්මක කරන්නට පුළුවන් වෙන්නෙ.

ඊළඟට රා ප්‍රශ්නය. යූ. එන්. පී. කාල යෙදි මොනවද කළේ? වතු හිමියන්ට, "ප්ලාන්ටර්ස් ක්ලබ්" තියාගෙන විස්කි, ජින්, බ්‍රැන්ඩි, බීර බිලා, තෝනලාව අල්ලා ගෙන ඔක්කොම සෙල්ලම් නටන්න පුලු වනි. නමුත් තේ වතුවල වස්තුව හම්බ කර දෙන ඒ කම්කරුවන්ට රාත් නැහැ. අද රා කඩ දිහා බලන්න. යූ. එන්. පී කාල යේදී, දුප්පත්කම නිසා ඒ උදවිය මෘග කොටසක් හැටියට නමුන්නාන්සෙල සැලකුවෙ නැද්ද? අපේ කම්කරුවන්ට ගෙ විජනතාවට, කොයි තරම් පහත් තත්ත්වයෙන්ද සැලකුවෙ? මෙය වෙනස් කිරීම අපේ බලවත් යුතුකමක්. වතුකාර යන් හාන්සි පුටුවලට වී සැප විඳිනව. කම් කරුවා දහඩිය මහන්සියෙන්, අව්වෙ වේලි වේලී, වැස්සට තෙමී තෙමී වස්තුව සම්බ කර දෙනව. නමුත් එවැනි කම්කරුවට විනෝද වෙන්න තැනක් නැහැ.

එතකොට කොළඹ බලමු. හැමතැනම ක්ලබ් තියෙනව. බෝල ගහන්න, පන්දු ගහන්න, හොකි ගහන්න, fපුට් බෝල් ගහන්න, ක්‍රිකට් ගහන්න ඕනෑ තරම් ක්ලබ් තියෙනව. නමුත් මේ කර්මාන්ත ශාලාවල බඩු නිෂ්පාදනය කරන, ආර්ථික ප්‍රශ්න විසඳන කම්කරුවන්ට විනෝද වෙන්න තැනක් කෝ? කෝ ඒ අයට විස්කි, ජින්, බ්‍රැන්ඩි, බියර්.

මම නමුන්නාන්සේගෙන් එක් ප්‍රශ්න යක් අහනව. ඒ කාලයෙ කිතුල් මල් තලන්න අවසර පත්‍ර තිබුණද? ගම්වල රා ගුදම් තිබුණද? ගම්වල කසිප්පු තිබුණද? අවසර පත්‍ර තිබුණද කිතුල් මදින්න? ඒ කාලෙ සීනි හකුරු තිබුණේ නැද්ද? අද අව සර පත්‍ර නිකුත් කරන්නට වෙලා සීනි- හකුරු අඩුයි. මම උපඇමතිතුමියගෙන් අහන්නෙ, ඇයි මේ විධියට අවසර පත්‍ර නිකුත් කරන්නෙ? කිතුල් මල් කපන්න අවසරපත්‍ර මොනවටද? කිතුල් මලක් එන් නෙ හය මාසයකට නැත්නම් තුන් මාසය කට සැරයක්. ඒ වාගේම බොහොම අමාරුයි සොයා ගන්න මේවායෙ රොත් තිබෙන වාද නැද්ද කියා. ඒ විතරක් නොවෙයි, මලක් ආවාම සී. ආර්. ඕ. ගෙන් අවසර ගන්න හැතැප්ම 15 ක් 20 ක් දුර සී. ආර්. ඕ. කන්තෝරුවට හතර පස් වතාවක් යන්න වෙනව, සී. ආර්. ඕ. නැති නිසා. මේ විධියට අවසර පත්‍රය ගන්න කොට මල පැළිලා. අද කිතුල් පැණියි කිතුල් හකුරුයි බොහොම හිඟයි. ඒ හේතුකොට ගෙන අද ගොවි ජනතාවට ලොකු කරදර යක් වී තිබෙනව. ඒ නිසා මම ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා, අවසරයක් නැතිව කිතුල් මල් කපන්න දෙන්නය කියා. රා මැදීමට අවසර දීමෙන් ආණ්ඩුව කියන් නෙ නැහැ කාටවත් රා බොන්න කියා. රා මැදීම තිබෙනවා නම් මල් කැපීම සඳහා පිහියා වුවමනා කරනව; කොහුලනු වුවමනා කරනවා; ඒ වාගේම මුට්ටි වුවමනා කර නවා. ඒ නිසා රා මැදීම හේතුකොටගෙන ඒ කර්මාන්තත් දියුණු වෙනව. ඒ අනුව බොහෝ දෙනෙකුට රක්ෂා ලැබෙනව. ඒවා ගේම විනාකිරි නිෂ්පාදනය කරන්න පුලු වන් වෙනව. මාතර හබල පෙතිවලට ප්‍රසිද්ධයි. නමුත් හබලපෙතිවල රසවිඳීම සඳහා වුවමනා කරන පොල් හකුරු අද සොයා ගන්න බැහැ. ඒ නිසා මල් කපන්න අව සර දුන්නාය කියා මිනිස්සු රා බොන්නම ලැහැස්ති වෙන්නෙ නැහැ. ඒකටත් වේලා වක් තිබෙනව. ගම්බද ගොවීන්ට පුලුවන් වෙනව, වී ගොවිතැන් කලාට පසු කුඹුරු පැසෙන තුරු පොල් හකුරු නිෂ්පාදනය කරන්න.

එක්සත් ජාතික පක්ෂයේ උදවිය කෑ ගහනව. ඩොක්ටර් එල්. ඒ. රාජපක්ෂට හොඳයි උසාවිවලට ගිහින් නඩුවිකට කථා කිරීම සඳහා ගිනි සීයක් ගන්න. ගිනි සීයක් අරගෙන මිසක් ඇඩ්වකේට්ලා නඩුවලට කථා කරන්නේ නැහැ. ගෙදර තිබෙන බඩු ටික උගස් තියල, ළමයින්ට කන්න නැතිව සිටියදී ගිනි සීයක් ගෙවන්න ඕනෑ. ඒවා පව් නැහැ. මලක් කපාගෙන රා ටිකක් බොන එක පව්. උදේ පාන්දර කුඹුරට බැස දවස තිස් සෙම අව්වෙ ඇල්වතුරෙ ඉඳගෙන හැන් දෑවට ගෙදරට ආවාට පස්සෙ රා ටිකක් නොබී ඒ මනුෂ්‍යයාට ඉන්න පුළුවන්ද? එහෙම නම් මම තුවත් එකක් කියන් නම්. කුකුල්ලු මැරීම, හරක් මැරීම, එළු වන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරන්න ඕනෑ. දැනට තිබෙන සියලුම මස් කඩ වහන්න ඕනෑ. සියලුම සුරා සැල් වහන්න ඕනෑ. හැබැයි ලොක් කෙනෙක් විතරක් විස්කි, ජින් බොන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැහැ. බීලා අහු වුණොත් වෙඩි තියන්න ඕනෑ. නීතියක් දාන්න, අසු වුණ හැටි යෙම වෙඩි තියනවාය කියා.

අ. භා. 7

ආගම මුල් කරගෙන මේවා දේශපාලන ප්‍රශ්නවලට හරවාගෙන තමුන්නාන්සේලා මොන විධියට සටන ගෙන ගියත් ඒවා පිළිගන්නට තරම් රටේ ජනතාව මෝඩ නැහැ. ඒ දවස්වල බොරු දෙසා බෑවා, අපි රට දෙකට බෙදා උතුරත් නැගෙනහිරත් පෙඩරල් පක්ෂයට අයිති කර දෙන්න යනවාය කියා. මහජනයා ඒවා විශ්වාස කළාද? අපි පුළුවන් තරම් ලනුව දෙනවා. බෙල්ලට හිර වුණාට පස්සෙ ඇදල ගන්නව. එම නිසා මේ සුළු ප්‍රශ්න දේශපාලන ප්‍රශ්නවලට හරවාගෙන මහජනතාව මුළාවෙ දාන්න එපාය කියා ඉල්ලන අතර, තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනව.

**සී. රාජදුරෙයි මයා.** (මඩකලපුව පළමුවන මන්ත්‍රී)

*(திரு. சீ. இராஜதுரை—மட்டக்களப்பு முதலாம் அங்கத்தவர்)*

(Mr. C. Rajadurai—First Batticaloa)

கௌரவ தலைவர் அவர்களே! இந்த மன்றத்திலே உள்ளூராட்சி உள்நாட்டு விவகார அமைச்சின் மானியங்கள் சம்பந்தப்பட்ட விவாதத்திலே ஒரு சில வார்த்தைகள் பேசத் தாங்கள் அளித்த சந்தர்ப்பத்திற்காக நான் முதற்கண் தங்களுக்கு நன்றி கூறிக் கொள்ள விரும்புகிறேன். இந்தக் கௌரவ சபையிலும் இந்தச் சபைக்கு வெளியிலும் ஒரு சில அரசியல்வாதிகளுடைய வாழ்க்கை இரண்டு பிரச்சினைகளில்தான் தங்கியிருக்கிறது. ஒன்று இந்த நாட்டுத் தமிழ் பேசும் மக்களுடைய மொழிப்பிரச்சினை. இரண்டாவது இவர்களோடு மொழியால் இணைந்திருக்கக்கூடிய தோட்டத் தொழிலாளர்களுடைய பிரச்சினை. இந்த இரண்டு பிரச்சினைகளிலுந்தான் இந்த நாட்டில் சில அரசியல் வாதிகளுடைய வாழ்க்கை தங்கியிருக்கிறது. இதை நான் கூறுவதற்கு என்னைக் கௌரவ அங்கத்தவர்கள் மன்னிக்கவேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். முழு இலங்கையினது நிர்வாகமும் கொழும்பிலிருந்து நடக்கின்ற காரணத்தால் வீணான காலதாமதம் ஏற்படுவதாகவும் கருமங்கள் அதி வேகமாக நடைபெறுமல் தடைப்படுவதாகவும் பல ஆண்டுகளாகச் சுட்டிக் காட்டப்பட்டு வந்திருக்கின்றது. இதன் காரணமாக நாட்டின் அதிகாரங்கள் பரவலாக வழங்கப்பட வேண்டுமென்று அப்போது கூறப்பட்டது. அப்படியான ஆலோசனைகளின் பேரில் வெகு சமீபத்திலோ அல்லது சில மாதங்களுக்குப் பின்போ அரசாங்கம் உருவாக்க இருக்கும் மாவட்ட சபைகள் பற்றி இப்பொழுது நாட்டில் வீணான துஷ்பிரசாரம் செய்யப்பட்டு வருகின்றதென்பதை இச்சபையின் கவனத்திற்குக் கொண்டு வர விரும்புகிறேன். சற்று முன்பு இச்சபையில் பேசிய கௌரவ தம்பதெனியாப் பிரதிநிதி (திரு. ஆர். ஜி. சேனநாயக்கா) அவர்களின் கூற்றிற்குப் பதிலளிக்கு முகமாகவே இக்கருத்துக்களை வெளியிட வேண்டிய நிர்ப்பந்தம் எனக்கேற்பட்டிருக்கிறது.

நாட்டின் பிரிவினைச் சக்திகளுக்கு இடமளிக்கும் வகையில் மாவட்ட சபைகள் அமையப் போவதாக நாட்டிலே எச்சரிக்கை செய்யப்பட்டிருக்கிறது. சில நாட்களுக்கு முன்னர் வேறொரு இலாகாவின் மானிய விவாதத்திலும் பேசுகையில் கௌரவ தம்பதெனியாப் பிரதிநிதி இவ்வாறுதான் இச்சபையிலே எச்சரிக்கை செய்திருக்கிறார். அதன் பிறகு இன்று இச்சபையிலே பேசிய மூதூர்த் தொகுதியின் கௌரவ இரண்டாவது பிரதிநிதி (திரு. ஏ. எல். ஏ. மஜீத்) அவர்களும் நாங்கள் நாட்டைத் துண்டாட முயல்வதாகத் தமது பேச்சிலே குறிப்பிட்டார்கள். அவரது கூற்றுக்களுக்கு எங்கள் கட்சியைச் சேர்ந்த உறுப்பினர்கள் திட்டவட்டமாகப் பதிலளித்துள்ளார்கள். எந்தச் சந்தர்ப்பத்திலும் நாடு பிரிபடுவதை நாம் விரும்பவில்லையென்று கூற விரும்புகிறேன். சமஷ்டி அரசியல் முறை என்பது நாட்டைப் பிரிப்பதல்ல என்று இச்சபையிலே நாம் பல ஆண்டுகளாக வற்புறுத்தி வந்திருக்கிறோம். நாட்டைத் துண்டாடுவதல்ல நமது கட்சியின் நோக்கம். இந்த நாட்டு மக்கள் ஒன்றுபட்டு இணைந்து வாழ வேண்டுமென்பதுதான் எமது கட்சியின் கொள்கையாகும். எமது இந்தக் கொள்கையைப் பற்றி மேடைகளிலும் மகாநாடுகளிலும் இப்பாராளுமன்றத்திலும் ஐயந்திரிபுகளுக்கு இடமின்றிப் பல பல சந்தர்ப்பங்களில் எடுத்துக் கூறியிருக்கிறோம். நாட்டைப் பிளவுபடுத்துகின்ற கொள்கையுடையவர்கள் நாம் என்று இந்த நாட்டுப் பெரும்பான்மை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජදුරෙයි මයා.]

மக்களிடையே துஷ்பிரசாரம் செய்து அதன் மூலம் தமது சொந்த வாழ்க்கையைக் காப்பாற்றிக் கொண்டு வாழ்கின்ற ஒரு சிலரை நான் இச்சந்தர்ப்பத்திலே கண்டிக்காமல் இருக்க முடியாது.

சமீபத்திலே சிங்களப் பத்திரிகைகளில் கட்டுரைகள் சில வெளியாகியிருந்தன. மாவட்ட சபைகளுக்கு அதிக அதிகாரம் அளிப்பதன் மூலம் இந்த நாட்டுச் சிறுபான்மை மக்களுக்கு தனியே ஒரு அரசாங்கம் அமைக்க வழியேற்படுமென்று அந்தக் கட்டுரைகளில் எச்சரிக்கை செய்யப்பட்டிருந்தது. அப்படியாகச் சிறுபான்மை மக்கள் தனியரசை அமைக்கும் பட்சத்தில் அந்த அரசை இந்தியாவோடு சேர்க்கவும் முயற்சிகள் நடைபெறுமென்றும் அந்தக் கட்டுரைகளில் எச்சரிக்கைகள் செய்யப்பட்டிருந்தன. இத்தகைய துஷ்ப்பிரசாரங்களுக்கு மூல காரணமானவர்கள் யார் என்று இப்பொழுது தான் தெரிகிறது. இந்த நாட்டை ஆளும் உரிமை கௌரவ தம்பதெனியாப் பிரதிநிதிகள் போன்றவர்களின் கைகளில் கிடைக்காமல் இருப்பது இந்த நாட்டிற்குக் கிடைத்த நல்ல காலம். தீவிரவாதிகள் கையில் இந்த நாட்டை ஆளும் உரிமை சிக்குமாயின் இந்த நாடு பல பிரிவுகளாகத் துண்டாடப்பட்டு விடும் என்பதில் சந்தேகமே இல்லை. சமஷ்டி அரசியல் என்பது நாட்டைப் பிரிப்பதா என்று கேட்கிறேன்.

சமஷ்டி அரசியல் பலவித ரூபங்களில் உலகத்தில் நடைபெறுகிறது. சோவியத் ருசியாவிலே ஒரு வகையான சமஷ்டி அரசியலமைப்பு அமுலில் இருக்கிறது. சுவிச்சர்லாந்தில் வேறொருவகையான சமஷ்டி அரசியல் முறை நிலவுகிறது. ஐக்கிய அமெரிக்காவை எடுத்துக் கொண்டால் அங்கும் மற்றொரு வகையான சமஷ்டி அரசியலமைப்பைக் காண முடியும். கனடாவை எடுத்துப் பார்த்தால் அங்கும் இன்னொரு முறையில் சமஷ்டி அரசியலமைப்பை அவதானிக்கலாம். எனவே சமஷ்டி அரசியலமைப்பு என்பது நாட்டைத் துண்டாடுவதல்ல என்பதை இந்தச் சபையின் கவனத்திற்குக் கொண்டு வர விரும்புகிறேன்.

கௌரவ தலைவர் அவர்களே! சமஷ்டி அரசியல் அமைப்பைப் பற்றி விளக்க எனக்குக் கொடுக்கப்பட்டுள்ள நேரம் போதாமல் இருக்கிறது. இந்த அரசியல் முறை பற்றி மேலும் பல விளக்கங்களை என்றால் இங்கு கூற முடியும். ஒரு நாட்டுச் சிறுபான்மை மக்களை, அவர்களது பாரம்பரிய உரிமைகளை, அவர்களது மொழியை, அவர்கள் வாழ்ந்து கொண்டிருக்கக்கூடிய பிரதேசத்தை அடக்கவோ அழிக்கவோ முனைந்த தேசங்கள் உலகத்தில் உருப்படவில்லை என்பதை சரித்திரவாயிலாக என்றால் உங்களுக்கு நிரூபிக்க முடியும்.

ஸ்பானிய தேசத்தை எடுத்துக்கொள்ளுங்கள். ஐரோப்பிய நாட்டிலே ஸ்பானிய தேசம் ஒரு காலத்தில் புகழோடு விளங்கியது. அங்கிருந்த சிறுபான்மை மக்களான அராபிய மக்களை ஸ்பானிய தேசத்துப் பெரும்பான்மை மக்கள் எப்பொழுது துன்புறுத்த முனைந்தார்களோ, எப்பொழுது அவர்களின் மொழியை, உரிமையைப் பறிக்க முனைந்தார்களோ அன்றிருந்தே ஐரோப்பிய நாட்டிலே அத்தேசம் நோஞ்சல் நாடாக, பின்தங்கிய நாடாக, நோயாளி நாடாக ஆகிவிட்டது என்பதைச் சரித்திரம் நமக்குச் சொல்கின்றது.

இதுமட்டுமல்ல. பிரான்சு தேசத்தை எடுத்துக் கொள்ளுங்கள். பிரான்சு நாட்டிலே வாழ்ந்த சிறுபான்மை மக்களான ஹிஷ்பகிஸ் இனத்தவர்களுக்கு பெரும்பான்மை மக்கள் செய்த அநீதியின் காரணமாக பிரான்சு நாட்டின் புகழ் அழிந்தது. இன்னும் சொல்லப் போனால், ஜெர்மன் தேசத்தை எடுத்துக் கொள்ளுங்கள். ஜெர்மன் தேசத்திலே என்ன நடைபெற்றது? இரண்டாவது உலக மகாயுத்தத்தின் போது ஹிட்லர் அங்கிருந்த சிறுபான்மையினரான யூத மக்களை அழிக்க முனைந்தான். நடந்தது என்ன? ஹிட்லர் நினைத்ததற்கு மாறாக சரித்திரம் முடிந்தது. ஹிட்லர் அழிந்தொழிந்தான். நாஸிப் படைகள் அழிந்தொழிந்தன. ஆகவே, எந்த நாட்டிலே பெரும்பான்மை மக்கள், சிறுபான்மை மக்களின் உரிமைகளைக் கொடுக்க மறுத்தார்களோ, சிறுபான்மை மக்களின் உரிமைகளை அழிக்க முனைந்தார்களோ, அந்நாடு பொருளாதாரத் துறையில், தேசிய வளத் துறையில், முன்னேற்றத்தில் பின்தங்கிய நாடாக ஆகிவிட்டது என்பதைச் சரித்திரம் நமக்குப் பகர்கின்றது.

**ගරු ද සොයිසා සිරිවර්ධන**

(கௌரவ டி சொய்சா சிறிவர்தன)

(The Hon. de Zoysa Siriwardena)

I rise to a point of Order, we are talking of local government, the hon. Member is straying from the point and talking about socialism.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජදුරෛයි මයා.

(திரு. இராஜதுரை)

(Mr. Rajadurai)

I am speaking about District Councils.

රාසමාණික්කම් මයා.

(திரு. இராசமாணிக்கம்)

(Mr. Rasamanickam)

He is giving a reply to the hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake) who raised the point about District Councils.

රාජදුරෛයි මයා.

(திரு. இராஜதுரை)

(Mr. Rajadurai)

ஆகவே, காலஞ்சென்ற பிரதமர் திருவாளர் பண்டாரநாயக்கா அவர்கள் ஸ்தல ஸ்தாபன அமைச்சராக இருந்த காலத்தில் இந்நாட்டின் திருவாக இயந்திரங்கள் நாடு முழுதும் பரவலாக்கப்பட வேண்டுமென்று விரும்பினர். அவர் மாகாண அமைப்பு முறைகளைக் கொண்டுவர விரும்பினர். அதற்குத் தடை வந்தது. இப்பொழுது மாவட்ட அமைப்பு முறைகள் கொண்டுவரப்பட விருக்கின்ற இந்த நல்ல சூழ்நிலையிலே, அதன் உருவம் பற்றி நாட்டு மக்கள் அறியாதிருக்கின்ற இந்நிலையிலே, அதுபற்றி பயங்கரமான விஷயங்களைப் பொறுப்புவாய்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் நாட்டு மக்களின் முன்னிலையிலே சொல்வதனால், அதன் அமைப்பு பற்றித் தவருன விளக்கம் கொடுப்பதனால், நாட்டின் சூழ்நிலை மீண்டும் பழுதடைந்து, நாட்டில் தப்பபிப்பிராயங்கள் மலிந்து, ஒரு சமூகத்தை மற்றொரு சமூகம் சந்தேகக் கண்ணோடு பார்க்கக்கூடிய சாத்தியக் கூறுகள் ஏற்பட இடமுண்டு. அதனால் இந்நாடு பொருளாதாரத் துறையில் பின்தங்கி விடும் என்பதைக் கூறிவைக்க ஆசைப்படுகின்றேன்.

அடுத்ததாக, கிராமச் சங்கங்களைப் பற்றிச் சில வார்த்தைகள் கூற விரும்புகின்றேன். எனக்கு முன் பேசிய பிரதிநிதியொருவர் கூறியது போன்று, ஐந்து அங்கத்தினரைக் கொண்ட, கிராமச் சங்கத்துக்கும் பதினைந்து அங்கத்தவரைக் கொண்ட கிராமச் சங்கத்துக்கும் ஒரேயளவான தொகைதான் ஒதுக்கப்படுகின்றது. இந்தப் பாரபட்சத்தைத் தயவு செய்து புதிதாக அமைச்சரவையில் பொறுப்பேற்றுள்ள உதவி அமைச்சர் அவர்கள் தம் கவனத்தில் எடுத்துக் கொள்வதோடு, இந்தத் தாரதம்மியங்களிலே மாற்றம் கொண்டுவர வேண்டுமென்றும் வேண்டிக் கொள்கின்றேன்.

அடுத்ததாக, பெரும் நிலப் பரப்பைக் கொண்ட கிராமச் சங்கங்களைப் பிரிப்பதில் உடனடியாகத் தீவிர கவனம் செலுத்த வேண்டும். பெரிய நிலப்பை உள்ளடக்கியனவாக எத்தனையோ கிராமச் சங்கங்கள் இருக்கின்றன. எனது தொகுதியிலே ஆரைப்பற்றுக் கிராமச் சங்கம், கன்னன் குடா கிராமச் சங்கம் ஆகியனவும் பட்டிருப்புத் தொகுதியிலே இன்னும் பல கிராமச் சங்கங்களும் ஏராளமான பிரதேசத்தை உள்ளடக்கியனவாக இருக்கின்றன. எனவே, இக் கிராமச் சங்கங்கள் கூடிய கெதியில் பிரிக்கப்பட்டு அவற்றின் எண்ணிக்கையும் கூட்டப்படவேண்டும்.

கிராமச் சங்கங்களுக்கு டெலிபோன் வசதி செய்து கொடுக்கப்பட வேண்டும். கிராமங்கள் தாம் நாட்டின் மிக முக்கியமானவை என்பதை மறுக்கக் கூடாது. கௌரவ வத்தேகமப் பிரதிநிதி ( திரு. ஏ. ரத்நாயக்க ) அவர்கள் இந்தச் சபையிலே பேசிய பொழுது, மகாத்மா காந்தி அடிகள், புதிதாக உதயமாகின்ற இந்தியாவின் முன்னேற்றத்துக்குக் கிராமச் சங்கங்கள் எவ்விதம் அபிவிருத்தி செய்யப்படவேண்டுமென்று குறிப்பிட்டதாகக் குறிப்பிட்டார். அந்த ஆலோசனையை தயவு செய்து உங்கள் கவனத்தில் எடுக்க வேண்டும்.

அடுத்ததாக, கிராமங்களுக்கு மின்சார வசதி அளிப்பதில் துரிதமான நடவடிக்கை எடுக்க வேண்டும். அதனால், கிராமங்களிலே குடிசைக் கைத்தொழில்கள், தொழில் திட்டங்கள் ஆகியவற்றை உருவாக்குவதற்கான வசதிகள் ஏற்படும். பிரதானமாக அம்பாறையிலிருந்து பொலன்னறுவை நோக்கிச் செல்கின்ற மின்சாரக் கம்பிகளுக்கிடையே எத்தனையோ கிராமச் சங்கங்கள் இருக்கின்றன. அவற்றுக்குக் குறைந்த செலவில் மின்சார வசதி செய்து கொடுக்க அரசாங்கத்தால் முடியும். எனவே, இவ் விஷயத்தில் நீங்கள் அதிக அக்கறை காட்ட வேண்டும்.

அடுத்ததாக, மட்டக்களப்புக் கச்சேரி நிர்வாகத்தை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன். அங்கு போதிய உத்தியோகத்தர் இல்லை. அங்கு கடமையாற்றுகின்ற உத்தியோகத்தரிற் பற்றுக்குறை காணப்படுகின்றது. அது காரணமாக மட்டக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

களப்புக் கச்சேரியில் ஒரு சில நாட்களில் முடியும் வேலைக்கு, ஒரு சில வாரங்களில் முடியும் வேலைக்கு, ஒரு சில மாதங்களல்ல, வருஷக் கணக்காகக் காத்துக் கொண்டிருக்க வேண்டியிருக்கிறது. ஆகவே, இவ்வுத்தியோகத்தர் பற்றுக்குறையை நீக்குவதில் உடனடியாகக் கவனம் செலுத்த வேண்டுமென நான் கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்ததாக, மட்டக்களப்பு நகர சபையைக் கூடிய விரைவில் மாநகர சபை அந்தஸ்துக்கு, "முயுனிசிபல்" சபை அந்தஸ்துக்கு உயர்த்த வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். அங்கத்தவர்கள் பதின்மரைக் கொண்டிருந்த மட்டக்களப்பு நகரசபை இப்பொழுது 12 அங்கத்தினரைக் கொண்டதாக மாற்றப்பட்டிருக்கின்றது. இதற்கேற்ப இதன் எல்லையும் விஸ்தரிக்கப்பட்டிருக்கின்றது. ஆகையால், இந்நகர சபையின் அந்தஸ்தை மாநகர சபை அந்தஸ்துக்கு உயர்த்த நடவடிக்கை மேற்கொள்ள வேண்டுமென்று நான் இங்கு வற்புறுத்த விரும்புகிறேன்.

அடுத்ததாக, மட்டு நகரத்தில் வீட்டுத் தட்டுப்பாடு மிக அதிகமாகக் காணப்படுகின்றது. வெளிப் பிரதேசங்களிலிருந்து மட்டக்களப்புக்கு கடமையாற்ற வந்துள்ள அரசாங்க உத்தியோகத்தர்களுக்குப் போதிய வீடுகள் இல்லாத நிலை இருப்பதனால் மட்டக்களப்பு நகர எல்லைக்குள் ஒரு வீட்டுத்திட்டத்தை அமைக்க நீங்கள் ஏற்ற ஒழுங்குகளைச் செய்துகொடுத்து உதவவேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். அத்தோடு மட்டக்களப்பு நகரசபையின் அந்தஸ்தை மாநகர சபை அந்தஸ்துக்கு உயர்த்தும்போது மட்டக்களப்பு நகரை அடுத்துள்ள முஸ்லிம் பகுதியான காத்தான்குடி பட்டண சபையின் அந்தஸ்தை நகரசபை அந்தஸ்துக்கு உயர்த்த வேண்டுமெனவும் நான் இச்சந்தர்ப்பத்திற் கேட்டுக்கொள்ளுகிறேன்.

இன்னும் பல விஷயங்களை நான் இங்கு எடுத்துரைக்க வேண்டியிருந்தாலும் அக்கிராசனர் அவர்கள் எனக்களித்த நேரத்துக்குக் கட்டுப்பட வேண்டியிருப்பதால் இன்னொரு விஷயத்தை மாத்திரம் குறிப்பிட்டு எனது பேச்சை முடித்துக்கொள்ள ஆசைப்படுகிறேன்.

உள்ளூராட்சி மன்ற கிராமச் சங்கங்களின் எல்லைகள் நிர்ணயிக்கப்படும்போது அக்கிராம மக்களுக்கு அநீதி இழைக்கக் கூடாதென்று நான் கேட்டுக் கொள்ளுகிறேன். ஏனென்றால், மூதூர்த் தொகுதியைச் சேர்ந்த முள்ளிப்பத்தானக் கிராமச் சங்கத்தைப் பற்றி கௌரவ மூதூர் இரண்டாம் அங்கத்தவர் தற்பொழுது இங்கு குறிப்பிட்டார். இக்கிராமத்தில் 600 முஸ்லிங்களுக்கு ஒரு அங்கத்தவரும் 40 சிங்களவருக்கு ஒரு அங்கத்தவரும் என்ற விதத்தில் முள்ளிப்பத்தானக் கிராமச்சங்கம் பிரிக்கப்பட்டிருப்பதை நான் உங்களுடைய கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இந்தக் கிராமம் முஸ்லிம் மக்களைப் பெருவாரியாகக் கொண்டது. கிராமச் சங்க எல்லையைப் பிரிக்கும் விடயத்தில் பாரபட்சத்துக்கு இடமளிக்காமலும், இதேபோல புதிய கிராமச் சங்க எல்லைகளைப் பிரிக்கும்போது அவ்வப் பகுதி மக்களுக்குச் சரியான முறையில் நீதி வழங்கக் கூடிய விதத்திலும் நடந்து கொள்ளும்படி நான் உங்களைக் கேட்டுக் கொள்ளுகிறேன்.

இந்த நெருக்கடியான நேரத்தில் எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பமளித்த தங்களுக்கு எனது நன்றியைத் தெரிவித்து, நான் பேசுவதற்கு இன்னுமெத்தனையோ விடங்கள் இருந்த போதிலும் எனக்குள்ள நேரம் போதாத காரணத்தினால் அவற்றையெல்லாம் இங்கு விவரிக்காமல் எனது பேச்சை முடித்துக் கொள்ளுகிறேன்.

அ.ப. 7.15

**විවියන් ගුණවර්ධන මිය.**
(திருமதி விவியன் குணவர்தன)
(Mrs. Vivienne Goonewardene)

ගරු සභාපතිතුමනි, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කටයුතු ගැන කථා රාශියක් අද මේ සභා ගර්භයේ කරන්ට යෙදුණා. ඒ කථාවලින් පැන නැගුණු පෞද්ගලික ප්‍රශ්නවලට පිළිතුරු දෙන්ට ප්‍රථමයෙන්, රජයේ ප්‍රතිපත්ති පිළිබඳව මූලික වශයෙන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්ටයි මා අදහස් කරන්නෙ.

ප්‍රථමයෙන්ම මා පිළිගන්නවා, ගම්කාර්ය සභාවලට අද රජයෙන් ලැබෙන මුදල් ප්‍රමාණය මදි බව. පාරවලට සහ සුළු මාර්ග වත්වලට ලැබෙන ආධාර මුදල් ප්‍රමාණවත් නොවන බව මා එකහෙළාම පිළිගන්නවා. ඒ නිසා පළාත් දියුණු කිරීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් ලබා ගැනීමත් දුෂ්කර කරුණක් බව අපි පිළිගන්නව. පළාත් පාලන ආයතන මඟින් ප්‍රදේශයේ දියුණුව ප්‍රජා මණ්ඩල, ආයුර්වේද බෙහෙත්ශාලා, ආදිය පිහිටුවන්ට ඉඩම් ලබා ගන්ට යෑමේදී, අවුරුදු දෙක තුන ඒ කටයුතු ප්‍රමාද වන නිසා සමහරවිට ඒ පළාත් පාලන ආයතනවල සභාපති ඇතුළු නියෝජිත මහතුන්ගේ කාලසීමාව තුල ඒ කටයුතු ඉටු කර ගන්ට බැරි වන බවත් මා පිළිගන්නව. එම නිසා මේ අවස්ථාවේදී පළාත් පාලන අංශය වෙනුවෙන් ගම්කාර්ය සභා ගැන කරුණු ඉදිරිපත් කළ මාවතගම ගරු මන්ත්‍රීතුමා ඇතුළු—ඒ මන්ත්‍රීතුමා ගැන මා විශේෂයෙන් සඳහන් කළේ, එතුමා ලංකාවේ ගම්කාර්ය සභා සම්මේලනයේ සභාපති වශයෙන් කටයුතු කරන නිසා එතුමාට ඒ පිළිබඳව මනා දැනුමක් ඇති නිසයි—සෑම මන්ත්‍රීවරයෙකුටම මා ස්තුති කරනව. රජය හා ගම්කාර්ය සභා අතර ඇති මුදල් ප්‍රශ්න පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඒ පිළිබඳව සම්පූර්ණ කාලය යොදා කටයුතු කර මේ අවුරුද්ද අවසාන වීමට පෙර අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කර ඒ ප්‍රශ්න විසඳන්ට ක්‍රියා කරන බව මතක් කරන්ට කැමතියි.

මුදල් පිළිබඳ නොයෙක් ප්‍රශ්න මතු වුණා. ඉහත කාලයේ පළාත් පාලන ආයතනවලට මෝටර් රථවාහන ලියාපදිංචි කිරීමේ බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන් ලැබුණා. ඒක පැහැර ගත්තේ, එක්සත් ජාතික පක්ෂයෙ පාලනය යටතේ බව මතක් කිරීම මගේ යුතුකමක්. 1952 දී රජයේ මුදල් අර්බුදයක් ඇති වුණු අවස්ථාවේදී ඒ මුදල් අර්බුදය පිරිමසා ගැනීමට පළාත් පාලන ආයතනවලින් ඒ ආදායම සම්පූර්ණයෙන්ම පැහැර ගත්ත. එහෙත් දිවංගත අගමැතිතුමාගේ රජය බිහි වුණු අවස්ථාවේදී ඒ ගාස්තුවලින් සියයට 50 ක ප්‍රමාණයක් ආපසු පළාත් පාලන ආයතනවලට ලබා දුන්න. ඊට පසු ඒ සියයට 50 ට තවත් සියයට 12 ක මුදලක් ඇතුළත් කර විශේෂයෙන්ම ගම්කාර්ය සභාවලට දුන්න. අද මා මතක් කරන්ට සතුටුයි, රථවාහන බලපත්‍ර ගාස්තු වශයෙන් ලැබෙන සම්පූර්ණ මුදලම පළාත් පාලන ආයතනවලට—සෑම සභාවකටම--යළිත් ලබා දීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙන බව.

එපමණක් නොවෙයි, ඉඩම් විකිණීමේදී මුද්දර ගාස්තු වශයෙන් ලැබෙන ආදායම දැන් සම්පූර්ණයෙන් පළාත් පාලන ආයතනවලට ලැබෙනනෙ නැහැ. ඒ ආදායමත් සම්පූර්ණයෙන්ම පළාත් පාලන ආයතනවලට ලැබෙන අන්දමට නීති සංශෝධනය කරන්ට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙන බව මතක් කරන්ට කැමතියි.

ඒ වගේම අනිකුත් මුදල් ප්‍රශ්න පිළිබඳවත් ගම්කාර්ය සභාපතිවරුන්, පළාත් ආණ්ඩු සභා සභාපතිවරුන්, සුළුනගර සභාපතිවරුන් හා මහ නගර සභාවල නගරාධිපතිවරුන් හා ඒවායේ සභික මහතුන්ගේ සාකච්ඡා සම්මේලන ඇති කර, නීතිවල තිබෙන දුර්වලකම් මගහරවා, පළාත් පාලන ආඥාපනත සංශෝධනය කර, ක්‍රියා කරන බව මතක් කරන්ට කැමතියි. එවිට නොයෙක් කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර, ආදියට බලපත්‍ර නිකුත් කිරීම ආදි කටයුතු පළාත් පාලන ආයතනවලට පවරා දී වැඩිපුර මුදල් ඒ ආයතනවලට ලබා ගැනීමට විධිවිධාන සලස්වා ඒ අයගේ නිර්දේශ අනුව පළාත් පාලන ආඥාපනත තව දුරටත් සංශෝධනය කිරීමට ක්‍රියා කරන බවත් මතක් කරනව. රට වෙනුවෙන් වැඩි වැඩියෙන් බලතල, වැඩි වැඩියෙන් වගකීම්, පළාත් පාලන ආයතනවලට බාරදිය යුතුය කියා රජය පිළිගන්නා නිසා තමයි, අද දින—District Councils—දිස්ත්‍රික් සභා පිළිබඳව යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නෙ. එය කැබිනට් අනු කාරක සභාව ඉදිරිපිට තිබෙනව. ඒ ගැන සම්පූර්ණයෙන් පරීක්ෂා කර බලා මේ සභාවට කෙටුම්පත් පණතක් ඉදිරිපත් කිරීමට විධිවිධාන සලස්වා තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරනවා. ඇත්ත වශයෙන්ම දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී මේ ක්‍රමය ගැන අවතාර මවා පා, මේ අනුව මේ රට බෙදීමට ඉඩ දෙනවාය, ඒ නිසා මෙයින් ප්‍රවේසම් විය යුතුය, රට සභා ක්‍රමය යටතේ ෆෙඩරල් වාදයට ඉඩ දෙනවාය, ආදී වශයෙන් කියමින් මහජනයා භය කිරීමට තැත් කළා. මේක ඔහුගේ පුරුදු ව්‍යාපාරයමයි. දැන් ළඟකදී සිට—අවුරුදු තුන හතරක සිට—ඔහු ගෙන යන ජාතිවාදී ව්‍යාපාරය අනුවයි. ඔහු ඒ ප්‍රකාශයත් කළේ. එහෙත් රට සභා ක්‍රමය නැත්නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විවියන් ගුණවර්ධන මිය.]

දිස්ත්‍රික් සභා ක්‍රමය යටතේ අදහස් කර තිබෙන්නේ වඩාත් සම්බන්ධකම් ඇති කර, වඩාත් සමගිය ඇති කර, පළාත් පාලන වගකීම් අනුව කටයුතු කිරීමයි. අධිරාජ්‍යවාදී කාලයේදී වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම සීමා වී තිබුණේ කච්චේරි ක්‍රමයටයි. එමෙන්ම සෑම කෙනෙකුටම සුළු වැඩක් කර ගන්නට පවා කොළඹට නැත්නම් මධ්‍යස්ථානයකට එන්නට සිදු වුණා. එසේ ඇවිත් තමයි, තමාගේ සෑම දෙයක්ම කර ගන්නට සිදු වුණේ. එවැනි දේවල් පහසුවෙන් කර ගැනීමට හැකි වන පරිදි, වැඩ පහසුවෙන් කර ගැනීමට හැකිවන පරිදි, දිස්ත්‍රික් සභා ක්‍රමයක් ඇති කිරීමට රජය තීරණය කර තිබෙනව. ඒ අනුව කෙටුම්පත් සාදා තිබෙනව. නමුත් ඒ කෙටුම්පත තවම සාකච්ඡා කර නැහැ. ඒ ගැන සාකච්ඡා කර, පරීක්ෂා කර බලා කැබිනට් අනුකාරක සභාවේ තීන්දු උඩ ඒ කෙටුම්පත් සකස් කර, එය ඔබ හමුවේ තබනවා ඇත කියා මා විශ්වාස කරනවා. එයින් අප රටේ ජීවත් වන සුළු ජාතීන් හා මහ ජාතිය අතර තවත් සම්බන්ධකම් ඇති වී, සමගිය ඇති වී, අපේ රටේ සංවර්ධනය සඳහා කටයුතු කිරීමට අපට ඉදිරියට යන්නට පුළුවන් වේය යනු මාගේ විශ්වාසයයි. ඒ ගැන සැකයක් ඇති කර ගන්නට දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමාට හැර වෙන කෙනෙකුට බැරිය කියලයි මා කල්පනා කරන්නෙ.

විශේෂයෙන්ම ඉලෙක්ෂන් නීති රීති පිළිබඳව මතක් කළ යුතුයි. පාර්ලිමේන්තු මැතිවරණ නීති පිළිබඳව අලුත් සංශෝධන ඇති කර තිබෙනව. ඒවා මේ සභාවෙන් සම්මත කර තිබෙනව. නමුත් ඒවා පළාත් පාලන මැතිවරණ සඳහා බලපාන්නේ නැති නිසා ඒ අඩු පාඩුව සම්පූර්ණයෙන්ම නැති කර, පාර්ලිමේන්තු මැතිවරණ නීති රීති පළාත් පාලන මැතිවරණ වලටත් බලපාන ආකාරයට කටයුතු කරන්න ඕනෑය කියන අදහස් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණා. ඒ පිළිබඳව කියන්න තිබෙන්නේ, පාර්ලිමේන්තු මැතිවරණ හා පළාත් පාලන මැතිවරණ යන දෙකම එකම ආකාරයකින් පැවැත්වීමට හැකි වන පරිදි විධිවිධාන සලස් වන්නට කටයුතු කරනවාය කියා මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රකාශ කර තිබෙන බවයි.

තවත් වැදගත්ම ප්‍රශ්නයක් තිබෙනව. වැරදි කළ නැත්නම් දූෂණ කළ සභාපතිවරුන් අස් කරන්නට අද තිබෙන නීතියෙන් ඉඩක් නැහැ. අද තිබෙන නීතියෙ හැටියට ඔවුන් අස් කරන්න බැරි නිසා නැවත වරක් මැතිවරණයකට ඉදිරිපත් වී සභාපතිවරුන් වෙනව. එම නිසා ඒ නීතිය සංශෝධනය කිරීමටත් නියෝග කර තිබෙන බව මතක් කරන්න කැමතියි. අද සිටින සභාපතිවරුන් පසුගිය කාලයේදී කළ වැරදිවලටත් යටත්ව—ඒ කාලසීමාවත් ඇතුළත් වන විධියට—නීතිය සංශෝධනය කරනවා. මේ ප්‍රශ්නය මතු කළ ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එය මතක් කරන්නට මා කැමතියි. එමෙන්ම දස දහස් ගණනින් දූෂණ පිළිබඳව ඇමති අංශයට පැමිණිලි ඇවිත් තිබෙන බව මා කියන්න කැමතියි. ඒ ගැන විශෙෂයෙන් පරීක්ෂා කරන්න ඇමති අංශයෙන් කොටසක් එහෙම නැත්නම් වෙනම අංශයක් ඇති කර තිබෙනව. ඒ අනුව වැඩි කාලයක් යන්නට කලින්, විශේෂ සැලකිල්ලක් අරගෙන, ඒවාට පිළිතුරු නැත්නම් ඒ පිළිබඳව වාර්තා ඇමති අංශයට සපයන්නය කියා පළාතේ ප්‍රාදේශීය සහකාර කොමසාරිස්වරුන්ට ලඟදීම නියෝග කරනවා ඇති. එමෙන්ම චොක්සි කොමිෂන් වාර්තාවෙත් මේ ගැන කියා තිබෙනව. රුපියල් 50 කට වැඩි ගණනක් ගම්කාර්ය සභාවක සභාපති කෙනෙකුට, හෝ රුපියල් 500 කට වැඩි ගණනක් යු. සී. සභාවක සභාපති කෙනෙකුට, ගෙවන ලෙස ඔඩිට්වරුන් නියෝග කර තිබෙනවා නම්, ඒ ආයතනවල සභාපතිවරුන් ඉවත් කරනවා පමණක් නොවෙයි, අවුරුදු 5 ක කාලයකට ඡන්දයකට ඉදිරිපත් වීමටද ඉඩ නොදිය යුතුය කියා චොක්සි කොමිෂන් සභා වාර්තාවෙන් සඳහන් කර තිබෙනව. ඒ අනුව අපේ ඇමති අංශයෙන් ඇමති මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර, ඒ නීති රීති සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනු ඇත කියා මා කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැමි පුනරුත්ථාපන ක්‍රමය පිළිබඳව සමහර ගරු මන්ත්‍රීන් ප්‍රශංසා කළා, සමහර ගරු මන්ත්‍රීන් විවේචනය කළා. 1951 දී මේ ගැමි කොමිෂන් සභා වේ වාර්තාව පිළිබඳ වැඩ කටයුතු පටන් ගත්තාය කියා එක්සත් ජාතික පක්ෂය කිව්වා. නමුත් කඩිමුඩියේ 1955 දී එක්සත් ජාතික පක්ෂය ගැමි කොමිෂන් සභාවේ වාර්තාව නිකුත් කළා පමණයි. ඒ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට වැය ශීර්ෂයන් වෙන් කළේ නැහැ. ඔවුන් දෙපාර්තමේන්තුවට බල කළා ඒ නිර්දේශයන් ක්‍රියාත්මක කරන්ටය කියා. එපමණයි. ඇත්ත වශයෙන්ම 1957 දී තමයි පළමුවරට වැය ශීර්ෂයන් ඇති කර ගැමි කොමිෂන් සභාවේ අදහස් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ. ඒ වාගේම ගැමි පුනරුත්ථාපන ක්‍රමය යටතේ ඒ කටයුතු කිරීම සඳහා නොයෙක් නොයෙක් දෙපාර්තමේන්තුවලටත් මුදල් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම ගම් පළල් කිරීමේ කටයුතු කිරීමට ඒ විධියට මුදල් වෙන් කර තිබෙනව. නමුත් අද දෙපාර්තමේන්තු මේවා ගැමි කොමිෂන් සභා වාර්තාව මාර්ගයෙන් කළ යුතු දේවල්ය කියා සමහර වැඩවලට අතගසන්නෙ නැහැ. ඒ නිසා ඒ ගැන සොයා බලා ඒ කටයුතු කරන අතර දෙපාර්තමේන්තුවලට වෙන් කර තිබෙන වැය ශීර්ෂයන් සම්බන්ධ කරගෙන මීට වඩා පුළුල් ආකාරයෙන් කටයුතු කිරීමටත් බලාපොරොත්තු වන බව මතක් කරන්නට සතුටුයි.

මා හිතන්නෙ ගරු මන්ත්‍රීන් දෙදෙනෙක් පමණ සබරගමු ප්‍රදේශය පිළිබඳවත් මතක් කළා. මේ පුනරුත්ථාපන ක්‍රමය යටතේත් වෙනත් නොයෙක් නොයෙක් නීතිරීති යටතේත් සබරගමු ප්‍රදේශයේත් ඒ කටයුතු ගෙන යා යුතුය කියා යෝජනාවක් දැනටමත් කැබිනට් මණ්ඩලය ඉදිරියේ තබා තිබෙනවාය කියා කොමසාරිස් මහත්මයා මට දැනුම් දුන්නා. ඒ වාගේම පුනරුත්ථාපන ක්‍රමය යටතේ තමාට සිටින නිලධාරීන්ගේ සංඛ්‍යාවේ ප්‍රමාණයට කටයුතු කර තිබෙනවාය යන්නත් මට දැනුම් දී තිබෙනව. උඩරට ප්‍රදේශවල පරවල් සඳහා මේ අනුව රුපියල් 45,00,000 ක් පමණ අවුරුද්දකට වියදම් කර තිබෙනවා. මේ අවුරුද්දෙ රුපියල් 34,00,000 ක් වෙන් කර තිබෙනව. ගැමි පුනරුත්ථාපන ක්‍රමය යටතේ ළඟදීම බණ්ඩාරවෙල අභ්‍යාස විද්‍යාලයකුත් ආරම්භ කිරීමට මුදල් වෙන් කර තිබෙන බවත් මතක් කරන්ට සතුටුයි. ඒ නිසා මේ කටයුතු සෑහෙන ප්‍රමාණයකට කෙරී තිබෙනවාය කියා සෑහීමකට පත් නොවුවත්, තෘප්තියට පත් නොවූවත්, වැය ශීර්ෂයන් යටතේ මුදල් වෙන් කර තිබුණු ආකාරයට ප්‍රමාණවත් විධියට වැඩකටයුතු සැලසී තිබෙනවාය යන්න මා මතක් කරනවා.

ග්‍රාම සේවක ක්‍රමය පිළිබඳව ගරු මන්ත්‍රීන් ප්‍රශංසා කළා. පරණ දූෂිත මුලාදෑනි ක්‍රමයට වඩා ග්‍රාම සේවක ක්‍රමය ප්‍රගතිශීලී ක්‍රමයක් බව අපි සියලු දෙනාම පිළිගන්නවා. ඒ වාගේම රජයෙන් ඒ අයට නිවාස ඉදි කර දීම අවශ්‍ය බවත් මා පිළිගන්නවා. ඉස්සර නම් ගම්මුලාදෑනීන්ට එකම ප්‍රදේශයකයි කටයුතු කරන්ට නියම කර තිබුණේ. නමුත් දැන් ග්‍රාම සේවකයන් ලංකාවේ ඕනෑම පළාතක සේවය කරන්න බැඳී සිටිනවා. ඒ අනුව ග්‍රාම සේවකයින්ට රජයෙන් නිවාසයක් සැපයීම හෝ එසේ නැත්නම් ඒ වෙනුවට ගෙවල් කුලී දීමනාවක් ගෙවීම අත්‍යවශ්‍ය බව අප පිළිගන්නව. මේ සම්බන්ධයෙන්, ග්‍රාම සේවකයාගෙන් නියම විධියේ සේවයක් බලාපොරොත්තු වෙන්න නම්, රජයෙන් නිවාස සපයා දීම හෝ ගෙවල් කුලී දීමනාවක් ගෙවීම අත්‍යවශ්‍යය කියා අප අමාත්‍යාංශය භාණ්ඩාගාරයට දැනුම් දී තිබෙනවා. ඒ අනුව කටයුතු කිරීමට භාණ්ඩාගාරය කැමති කරවා ගැනීමට උද්ඝෝෂණයක් කරන මෙන් අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගෙන් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஸ)*
(Mr. Roy Rajapakse)

ගෙවල් සපයනවාට වඩා ගෙවල් කුලී දීමනාවක් ගෙව්වොත් නරකද ?

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

එහෙම තමයි අප යෝජනා කර තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විවියන් ගුණවර්ධන මිය.]

තුවක්කු අවසර පත්‍ර සම්බන්ධයෙන් විශේෂයෙන්ම මන්නාරමේ ගරු මන්ත්‍රීතුමා (වී. ඒ. අලගකෝන් මයා.) කරුණු ඉදිරිපත් කළා. ගොවීන්ගේ කුඹුරු නැත්නම් වෙනත් ධාන්‍ය වගාවන් වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අද තුවක්කු අවසර පත්‍ර නොදීමෙන් විශාල අවහිරකම් ඇති වී තිබෙනවාය කියා එතුමා මතක් කළා. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රදේශවලට තුවක්කු අවසර පත්‍ර නිකුත් කරන්ට එපාය කියා නියම කර නැහැ. නමුත් සෑම ප්‍රදේශයකම දිසාපතිවරුන්ට නියෝගයක් යවා තිබෙනව, තුවක්කු අවසර පත්‍ර දීමේදී ටිකක් පරීක්ෂකාරී වෙන්නය කියා.

**අලගකෝන් මයා.**
*(திரு. அளககோன்)*
(Mr. Alegacone)

They are confiscating guns. They are taking them away from the Tamils and refusing to renew their licences.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තුවක්කු අවසර පත්‍ර තහනම් කරන්ට එපාය කියා ඇමතිතුමා කලින් නියෝගයක් ඇරිය. නමුත් සෑම ප්‍රදේශයකම දිසාපතිවරුත් ආදායම්පාලක නිලධාරිවරුත් පොලිසියත් වාර්තා කරනව, ඒ තුවක්කු අවසර පත්‍ර නිකුත් කරන්ට එපාය කියා. මොන හේතුවක් උඩද අපි දන්නෙ නැහැ.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

සමහර විට තුවක්කු අවසර පත්‍ර දීමේදී පරීක්ෂාකාරීව කටයුතු කරන්නය කියා නියම කර තිබෙන නිසා වෙන්න ඇති, අද මේ විධියට ඒ අවසර පත්‍ර නොදී තිබෙන්නෙ. ඒ ගැන නැවත වරක් සලකා බලන්න බලාපොරොත්තු වෙනව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

කිසිම වැරැද්දක් නැතිව අවුරුදු පහළොවක් තිස්සෙ පාවිච්චි කළ ඒවත් දැන් ගෙනෑදී තියෙනව.

අ. භා. 7.30

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

එතකොට දැන් මන්නාරමේ ගරු මන්ත්‍රීතුමා ඒ අනුව පිළිගන්නව ඇති, මේ කාරණයේදී සියලු දෙනාටම එකම විධියට සලකා තිබෙන බව. පළාත් අනුව, ජාති භේද අනුව, වෙනත් එබඳු කරුණු අනුව කළ දෙයක් නොවන බව එයින්ම පැහැදිලි වෙනව. ඒ කොයි හැටි වෙතත්, මේ සම්බන්ධයෙන් තව දුරටත් සොයා බලා මෙතෙක් කල් ලයිසන්ස් තිබුණු අයට ඒවා නැවතත් දෙන්න ක්‍රියා කරන බව දන්වන්න කැමතියි. අවශ්‍ය අයට ඒ අයගෙ සුදුසුකම් අනුව ලැබෙන්නට කටයුතු සලස්සන්න බලාපොරොත්තු වෙනව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මගේ කොට්ඨාශයෙනුත් දෙකක් අද ඉදිරිපත් කළා.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

සොයා බලා ඒ හැම කරුණක් ගැනම සුදුසු පරිදි කටයුතු කරන්න යනව.

මැද කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) ඉතා වැදගත් ප්‍රශ්නයක් ගෙවල් කුලී ගෙවන්නත් සම්බන්ධයෙන් ඉදිරිපත් කළා. ගෙවල් කුලී නීතිය බල පාන ආකාරය, බල පාන ස්ථාන, ආදි නොයෙක් කරුණු සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශය ලංකා ගුවන් විදුලි සේවය මගින් ප්‍රචාරය කළා. අපේ වැඩ පිළිවෙළ අනුව, 1962 සිට මේ දක්වා ගත වූ කාලය ඇතුළත යම් කෙනෙකුට ගෙවල් කුලී සම්බන්ධයෙන් නඩු දමා තිබෙනවා නම්, ඒවා අහෝසි වෙනව. පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ඒ ගැන වැඩි දුරටත් කළ යුතු දේ කරනවා ඇති. පළාත් පාලන ආයතන සම්බන්ධව මේ කාරණය බල පාන සැටිත් පරීක්ෂාවට ගන්නව. ඒ හැම දෙයක්ම කර කුලී ගෙවල සිටින අය කෙරෙහි බල පාන නීතිය සංශෝධන කරන්නයි අප බලාපොරොත්තු වන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන්දේසි කිරීමෙන් හෝ විකිණීමෙන් හෝ ඒ ගෙවල සිටින අය ඉවත් කරන්න බැහැ. යම් කෙනෙක් මෝඩකමට යම් වෙන්දේසියකින් ගෙයක් ගත්තත්, ඒ ගෙයි පදිංචි වී සිටින කුලී ගෙවන්නන් ඒ ගෙයින් දොට්ට දැමීමට ඉඩ දෙන්නෙ නැහැ. මෝඩ වෙලා ගෙවල් ගත්තට, ඉඩම් ගත්තට, ඒවායේ පදිංචිකරුවන් පන්නන්න ලැබෙන්නෙ නැහැ. ඒ සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් යථා කාලයේ පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන එනවා ඇති.

අයවැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේ ඉදිරිපත් කරන්නට යෙදුණු කරුණුවලින් තව දුරටත් අපේ වැඩ පිළිවෙළ ගැන පැහැදිලි හැඟීමක් ඇති කර ගන්න පුළුවන් වෙනවා ඇතැයි මා විශ්වාස කරනව. ගෙවල් හිමියන්ට කැමති හැටියට ගෙවල් කුලිය අය කරන්න බැරි වන විධියට, සීමාවෙන් පිට යන්න ඉඩ ලැබෙන්නෙ නැති හැටියට, කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙනව. සෑම ගෙයක්ම තක්සේරු කිරීමට කමිටුවක් හෙවත් මණ්ඩලයක් පත් කර තිබෙනව. රජයේ තක්සේරු නිලධාරියත්, නගර නිර්මාණ ශිල්පියත්, නගර සභාවේ තක්සේරු නිලධාරියත් මේ මණ්ඩලයට ඇතුළත් වෙනව. ඒ මගින් නියම තක්සේරුවක් ඇති කර ඒ අනුව සීමා කිරීමක්--"කොන්ට්‍රෝල්" ක්‍රමයක්—ඇති කරනව. නුවුවමනා අන්දමට ගසා කෑමේ වැඩ පිළිවෙළ නැවැත්වීමට සංශෝධන පණතින් බලාපොරොත්තු වන බව දනුම් දෙන්න කැමතියි.

ට්‍රෝලි බස් පිළිබඳවත් මැද කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇහුව. ඒ සම්බන්ධයෙන් දැනටමත් සාකච්ඡා කරගෙන යන බව පළමුවෙන්ම ප්‍රකාශ කරන්න කැමතියි. කොළඹ නගර සභාවේ සාමාජිකාවක් හෙවත් මන්ත්‍රීවරියක් හැටියට ට්‍රෝලි බස්වල තත්ත්වය ගැන මට කියන්නත් කනගාටුයි. මේ ට්‍රෝලි බස් නම් දැන් කිසිම කෙනෙකුට පාවිච්චි කරන්න බැරි තත්ත්වයකයි තියෙන්නෙ. ප්‍රයෝජනවත් ලෙස පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයක මේ ට්‍රෝලි බස් රථ තිබෙනවය කියන්න බැහැ. කාලෙකින්ම හරියාකාර රෙපෙයාරුවක්වත් කරලා නැහැ. ඒ වගේම ඉලෙක්ට්‍රික් වයරිං ක්‍රමයක්වත් හරියට නැහැ. මේ විධියට හිස් බවට පත් වී තිබෙන පිටස්තර බොඩිය පමණක් ගැනීම හැර වෙන කරන්න දෙයක් නැහැ. හැරත්, ඒවායේ කිසිම වටිනාකමක් නැති බව කියන්න ඕනැ. මේවා ගැනීමේදී විගකීමක් ඇතිව කටයුතු කරන්න ඕනැ. රටටත් නගර සභාවටත් ගමනාගමන සේවයක් හරියාකාර සැලසීමේදී විගකීමක් ඇතිව කටයුතු කරන්න ඕනැ නිසා මේ කාරණය ගැන දැනට සාකච්ඡා කරගෙන යනව. ඒ අතරම ට්‍රෝලි බස් ව්‍යාපාරය මගින් කෙරෙන ගමනාගමන සේවයේ නියුක්තව සිටින ඒ අංශයේ සේවකයින්ගේ සේවා අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමට කටයුතු කිරීමත් අපේ යුතුකමක් බව කියන්න කැමතියි. ඒ ගැන අපි ඉතා සැලකිල්ලෙන් කටයුතු කරනව. ඒ ප්‍රශ්නය හා සම්බන්ධ කරුණු කිසි සේත් අපේ සිත්වලින් බැහැර වන්නේ නැති බවත් කියනව.

හැම දෙනාගේම පාහේ සිත් විශේෂයෙන් යොමු වී තිබෙන වැදගත් ප්‍රශ්නය කටයි ඊළඟට අවසාන වශයෙන් බහින්න බලාපොරොත්තු වන්නෙ. ළඟදී ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් කථා කළ අවස්ථාවේ ඒ ගැන සඳහන් කළා. ගහක් මැදීමට වුවමනා සෑම කෙනෙකුටම ඒ සඳහා රුපියල් පහළොවක් ගෙවීමෙන් නියමිත අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉඩ දෙන්න අප අදහස් කරනවය කියලයි ගරු මුදල් ඇමතිතුමා කියා සිටියෙ. මේ අනුව දැන් මුළු රට පුරාම විශාල ගාල ගෝට්ටියක් ඇති වෙලා තියෙන බව කවුරුත් දන්නව. මේ ප්‍රශ්නයටම සම්බන්ධ එක් කාරණයක් පමණක් ඉතා ලුහුඬින් සඳහන් කරන්න තිබෙනව. එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්න කාලේ සීදුවේ ඉස්කාගාරය විවෘත කළා. එතකොට මේ රට ඇත්ත වශයෙන්ම බෞද්ධ රටක්ව තිබුණද නැද්ද? එතකොටත් මේ රට ඉතාම හොඳ බෞද්ධ රටක් හැටියටයි තිබුණෙ. ඒ ගැන සැකයක් නැහැ. හදිසියෙන්ම මේ රට බෞද්ධ රටක් වෙලා තියෙන්නෙ දැන්ද? ඒ අයම තමයි දැන් මේ කාරණය දේශපාලන ප්‍රශ්නයක් කරගෙන, නායකත්වය දීගෙන, මේ සභාග ආණ්ඩුවට විරුද්ධව රට පුරාම ප්‍රචාරය කර ගෙන යන්නෙත්. භික්ෂූන් වහන්සේලාත් සමග අපේ යෝජනාවට බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කරමින් රට පුරාම ප්‍රචාරක කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විවියන් ගුණවර්ධන මිය.]

යුතු කරගෙන යන්නෙ වැඩි වශයෙන්ම මේ අයයි. [බාධා කිරීමක්] මම ඔය හිස් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න අදහස් කරන්නෙ නැහැ.

අමද්‍යප කොමිෂන් සභාවේ වාර්තාව එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කියෙව්වා. රජයට මත්පැන් වහාම නවත් වන්නය කියා එහි කිසි තැනක කියා නැහැ. මත්පැන් නැවැත්වීම ඉක්මනින් කරන්න හැකි දෙයක් නොවේය කියායි, එහි සඳහන් වී තිබෙන්නෙ. එහි සඳහන් කර තිබෙනව, මෙයට කාල සීමාවක්වත් දෙන්න බැරි බව. මේ සඳහා විශාල ප්‍රචාරයක් රට පුරා ගෙන ගිය යුතුය කියා එහි සඳහන් වී තිබෙනව. ඒ අන්දමේ නිර්දේශයන් තිබිය දී අමද්‍යප ව්‍යාපාරය ගෙන යාම සඳහා බීමත්කමේ දෝෂය පිළිබඳවත්, එය බෞද්ධ ධර්මයට විරුද්ධයි කියන හැඟීම පිළිබඳවත් මහජනයාට කරුණු අවබෝධ කර දෙන්න මෙතෙක් කල් සභා රැස්වීම් නොතිබ්බෙ මන්ද කියා මා අහනව, බෞද්ධ සම්මේලනයෙන් සහ අතිකුත් භික්ෂූන් වහන්සේලාගෙන්. ඒ අයට හදිසියෙද බෞද්ධකම මතක් වුණේ ? මේ අවස්ථා වේදි එම ප්‍රශ්නය මා අහනව, බෞද්ධ සම්මේලනයෙන්. [බාධා කිරීම්]

මෙම අයවැය ලේඛනය යටතෙ ඇති වී තිබෙන නොයෙකුත් දේ නිසා ධනපති පන්තියට විශාල වේදනාවක් ඇති වී තිබෙනව. ගෙවල් බදු, තේ අක්කර බදු යනාදී නොයෙකුත් බදු ක්‍රම නිසාත්, පොත පත රජය මගින් මුද්‍රණය කිරීමට යාම නිසාත්, හෙට අනිද්ද පුවත්පත් අරගෙන පුළුල් අත්තිවාරමක් උඩ ඒවා මගින් මහ ජනතාවගෙ අදහස් උදහස් ප්‍රචාරය කිරීමට යාම නිසාත්, කෙටියෙන් කියනව නම් නොයෙකුත් ප්‍රශ්නවලදි රජය අනු ගමනය කරන්න යන වැඩ පිළිවෙළ නිසා ධනපති පන්තියට බියක් ඇති වී තිබෙනව. ඒ කිසිවක් ගැන ප්‍රකාශ නොකර අද දවසෙ බෞද්ධ ධර්මය නැති වෙන්න යන වය කියන පැරණි ව්‍යාපාරය එක්සත් ජාතික පක්ෂය ගෙන යනව. 1936 සිට ඒ අය ගෙන ගිය ව්‍යාපාරය නැවතත් මතු කරගෙන ඒකට තවතවත් නොයෙකුත් කොටස් අමුණාගෙන ක්‍රියා කරගෙන යන්නෙ එක ගැනයි, අපේ කනගාටුව. අද එක්සත් ජාතික පක්ෂයට ඇති වී තිබෙන වේදනාව උඩ වෙනත් අතකින් රට පෙරළන්න අදහස් කරනවය කියන ප්‍රකාශය මේ අවස්ථාවෙදි අපට කරන්න පුළුවනි.

අපි කිසිවකුට කියා නැහැ, රා බොන්න ය කියා. දඹදෙනියෙ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) කීව, රා තියෙන්නෙ මුහුදු වෙරළෙ විතරක්ය කියා. ඒ ප්‍රදේශ වල කසිප්පුත් තියෙනවය කියා එතුමා කීව. ඔහුගේ තර්කයෙ හැටියට පෙනෙන් නෙ අභ්‍යන්තර වශයෙන් උතුරු මැද පළාතෙ එහෙම එවැනි මත්පැන් පාවිච්චිය නැතෙයි කියන එකයි. නමුත් එතුමට එක කාරණයක් මතක් කර දෙන්න කැමතියි. ඊයෙ පෙරේද කොළඹ පොලිස් මධ්‍යස්ථාන යෙන් පොළොන්නරුවට ගිහින් කසිප්පු පොළවල් 90ක් අල්ලාගෙන තිබෙනව. දැන් ඒ අයට නඩු පවරන්න ක්‍රියා කර ගෙන යනව. ඕනෑම ප්‍රදේශයකට ගියාම අපට එම තත්ත්වය පේනව. හැබැයි, එහෙ වී. සී. සභාපති කියා තිබෙනව, "මම රාවලට විරුද්ධයි" කියා. ඒ විධියටයි, මා ළඟ තියෙන පත්‍රයෙ සඳහන්ව තියෙන්නෙ.

රා ප්‍රශ්නයට වඩා බරපතළ ප්‍රශ්න තමන් ගෙ ප්‍රදේශයෙ තියෙද්දියි එතුමා ඒ විධිය ට කතා කරන්නෙ. අර කසිප්පු පොළවල් 90 අල්ලුවෙ එහි පොලීසිය විසින් වත්, එහි "එක්සයිස්" දෙපාර්තමේන්තුව මගින්වත් නොවෙයි ; කොළඹ මධ්‍යස්ථාන යෙන් ගිහිල්ලයි, අල්ලුවෙ. එතුම කීව, කසිප්පු තියෙන්නෙ පොල් ගස් තියෙන ප්‍රදේශවල විතරයි ; අනිත් තැන්වල වැඩි ය නැහැ, කියා. නමුත් කොළඹ වික්ටෝරි යා පාක් එකට ගියොත් කසිප්පු විකුණන තැන් දෙතුන් පොළක් දකින්න ලැබේවි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
එතුමා කියනව, පොල් කන එක ඊට වඩා හොඳය කියා.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)
කොළඹ නගර සභාව මෙම කසිප්පු ප්‍රශ්නය පිළිබඳව විශේෂ කොමිෂමක් පත් කළා. එය ඉදිරියට මානසික රෝග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේ දොස්තරවරුත්, සමාජසේවා දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂවරුත්, ශල්‍ය කර්ම විශෙෂඥයන් සහ වෙනත් වෛද්‍ය විශෙෂඥයනුත් පැමිණිය. මහාරෝග්‍ය ශාලාවෙ ඇන්තනීස් වැනි වෛද්‍යවරුන් පැමිණියා. පැමිණ කරුණු ඉදිරිපත් කළා. කසිප්පු පානය නිසා අද රටේ ජනතාවගෙ සෞඛ්‍ය තත්ත්වය සම්පූර්ණයෙන්ම පිරිහී තිබෙනව කියා ඒ අය කීව. ඒ හේතුවෙන් ඔවුන්ගෙ සර්වාංගයම දූෂණය වී සෑම ලෙඩ රෝගයකටම භාජන වන තත්ත්වයකට ඔවුන් පරිවර්තනය වී සිටින බව ඒ අය ප්‍රකාශ කළා. මානසික ආරෝග්‍යශාලාවලත් අනිකුත් ආරෝග්‍ය ශාලාවලත් සිටින ලෙඩුන් දෙස බලන විට මෙම කසිප්පු පාවිච්චිය නිසා සිදු වී ඇති ඛෙද ජනක තත්ත්වය පැහැදිලිව පෙනී යන බව ඔවුන් තරයේම කීව. ඒ තත්ත්වය දැන දැනම අනිකුත් දේශපාලන ප්‍රශ්න පැත්තකට දමා රා මදින්න අවසර දෙන්න යාමෙ ප්‍රශ්නය විතරක් අරගෙන මේ බෞද්ධ රට සම්පූර්ණයෙන්ම අබෞද්ධ රටක් කරන්න හදනවය කියා බොහෝ දෙනා කෑ ගහනව.

ආගමික පරිසරයක ඇති දැඩි නොවුණු අයට නම් මේකෙ කැක්කුමක් ඇති වන්නෙ නැත කියා හෝමාගම ගරු මන්ත්‍රීතුමා (ගාමිනී ජයසූරිය මයා.) කීව. නමුත් මා දන්නෙ නැහැ—

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)

1956 වන තුරු මෙතනත් තැබෑරුමක් තිබුණ; ශ්‍රාවස්තියෙත් තැබෑරුමක් තිබුණ. මන්ත්‍රීවරු රුපියල් 14 යි, ගෙදර ගෙනිච්චෙ.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

මේක ලංකාවට අමුතු දෙයක් නොවේයි. ලංකාවෙ සෑම ප්‍රදේශවලම වගේ රා මදිනව. සියලු දෙනාටම රා බොන්නය කියා අපි කියන්නෙ නැහැ. රාවලින් විනාකිරි හදන්න පුළුවන්. අද අවුරුද්දකට රුපියල් කෝටි 22 ක පමණ මුදලක් අරක්කුවලින් අපි ලබා ගන්නව. අපේ අරක්කු එවන්න පුළුවන්ද කියා පිටරටවලින් කරුණු විමසා තිබෙනව. රා ඇති කලොත් ගෙවල්වලට ගිහින් ස්ත්‍රී පක්ෂයටත් දරුවන්ටත් රා පොවනවය කීම, ගහක් ගහක් ගානෙ රා තැබෑරුම් ඇති වෙනවය කීම, අර පරණ විධියට අවතාර මවල දිෂ්ටි ගැහීමක් වගේ වැඩක්. නැති බයක් ඇති කිරීමක් පමණයි, ඒ අය කරන්නෙ. දේශපාලන වශයෙන් තමන්ගේ විරුද්ධකම් වෙනත් පිළිවෙළකින් පෙන්වන්න බැරි නිසා, රටේ ජනතාව බෞද්ධ ජනතාවක් නිසා, ඒ අය කලබල කරල රා වලට විරුද්ධව ප්‍රචාරයක් ගෙන යන බව කියන්නට සතුටුයි. මේ ව්‍යාපාරය ගෙන යන කසිප්පු කාරයන් සහ ලොකු ලොකු ව්‍යාපාරිකයන් උත්සාහ කරන්නෙ එක්සත් ජාතික පක්ෂය බලයට පත් කරන්නයි; වැලිමඩ මන්ත්‍රීතුමත්, අවිස්සාවේල්ලෙ මන්ත්‍රීතුමත්, දඹදෙනියේ මන්ත්‍රීතුමත් බලයට පත් කරන්න නොවෙයි. කරුණා කරල මේ ගැන කල්පනා කරල මේ ව්‍යාපාරයෙන් අයින් වන ලෙස මම ඒ මන්ත්‍රීවරුන් තුන් පොළගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනව. මේ ව්‍යාපාරයේ නායකත්වය අරගෙන දෙන්න උත්සාහ කරන්නෙ ඒ මහත්වරුන්ට නොවෙයි, එක්සත් ජාතික පක්ෂයටයි. ධනපති පන්තිය ආරක්ෂා කරන්නයි, ධනපතීන්ට පාඩු වන බදු ක්‍රමය, බැංකු පිළිබඳ වැඩ පිළිවෙළ නැති කරන්නයි, තමන්ගේ පොත් අච්චු ගැසීම තමන්ටම තබා ගන්නයි, ඔය ආදි පෞද්ගලික ප්‍රයෝජන දිගටම ලබා ගන්නයි, අද මේ ව්‍යාපාරය ගෙන යන්නෙ. පිටස්තර වශයෙන් රා ප්‍රශ්නය ඉදිරිපත් කරගෙන කටයුතු කළාට මේක බෞද්ධ ප්‍රශ්නයක් නොවන බව අපි මතක් කරනව.

රා මැදීමට ඉන්දියාවෙන් මිනිසුන් ගෙන්වනවට මැද කොළඹ දෙවැනි මන්ත්‍රීතුමා විරුද්ධ වුණා. තවත් මන්ත්‍රීවරු ඒ ගැන විරුද්ධ වුණා. දැන් ගස් මදින්නන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 7 ක් තිබෙනව. ඒ මධ්‍යස්ථාන 7 න්ම පුහුණු වන්නේ 112 දෙනයි. අපට අද දින පැහිච්ච රා ගෙවත් පරණ රා දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ රා ගුදම්වල තියාගෙන මාසය කට වඩා පරණ කරන්න පුළුවන්කමක් නැහැ. අරක්කු ඒ තරමට වවමනා වෙලා [illegible] එදා මහජනතාවට අරක්කු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විවියන් ගුණවර්ධන මිය.]

විකුණුවෙ අවුරුද්දක් තිස්සෙ ගුදම්වල තියා ගත්තට පසුවයි. දැන් මාසයක්වත් ගුදමේ තියාගෙන පරක්කු කරල දෙන්න බැරි බව මතක් කරනව. ඒ නිසයි, තවත් රා වුවමනා බව කියන්නෙ. ඒ රා අරක්කු වලට හරිගස්සන්නයි, බලාපොරොත්තු වන්නෙ. වැලිමඩ මන්ත්‍රීතුමාත්, අවිස්සාවේල්ලෙ මන්ත්‍රීතුමාත්, දූවමොට්ටාවේ අමරවංශ ස්වාමින් වහන්සෙත්, "දවස" පත්‍රයට ලියන මීටියාගොඩ ගුණරතන ස්වාමින් වහන්සේත්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා සෑම කෙනෙක්ම මුළු රට පුරාම ගොස් අමද්‍යප ව්‍යාපාරයක් ඇති කිරීම, මත්පැන් පාවිච්චි කිරීම ඇඟට හොඳ නැත, බෞද්ධ කමට හොඳ නැත, කියා ප්‍රචාරය කිරීම හොඳය කියා ප්‍රකාශ කරන අතර, එවැනි ව්‍යාපාරයක් ගෙන යන ලෙස අපි ඒ සියලු දෙනාටම ආරාධනා කරනව. එවිට අපට මදින රා ටික නියම විධියට අරක්කුවලට හරවා රටේ ජනතාවට වුවමනා නැත්නම් පිටරට ගෙන ගොස් අපේ විනිමය මුදල වැඩි කර ගැනීමට පුළුවන් වෙනව.

ගරු සභාපතිතුමනි, අපට රා වලින් විනාකිරි හරිගස්සන්න පුළුවන්. හකුරු වලට සහතික මිළක් දීමටත්, පැණිවලට සහතික මිළක් දීමටත් රජය අදහස් කරනව. මේවා සුළු සුළු කර්මාන්ත බවට පත් කරල ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට ආදායමක් හකුරු වලින් සහ පැණිවලින් ලබා දීමට අපි අදහස් කරනව.

**එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.**
*(திரு. எல். டி. எஸ். ஏ. குணசேக்கர)*
(Mr. L. de S. A. Gunasekera)

පොල් හකුරු නොවෙයි, කිතුල් හකුරු.

**විවියන් ගුණවර්ධන මිය.**
*(திருமதி விவியன் குணவர்தன)*
(Mrs. Vivienne Goonewardene)

අපේ කලවානෙ ගරු මන්ත්‍රීතුමාට රා ප්‍රශ්නය ගැන තියෙන එකම කැක්කුම, පොල් ගහට අවසර දුන්නය, කිතුල් ගහට අවසර දුන්නෙ නැත, කියන එකයි. ඒ නිසා ඒ ගැනත් සලකා බලනවය කියන අදහස මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනව. රුපියල් 10 ට තිබූ අරක්කු රුපියල් 8 කිරීමෙන් මේ රටේ කසිප්පු තුනෙන් එකක් පමණ නැති වූ බව වාර්තා වෙලා තියෙනව. අපට තවත් රා තිබෙනව නම්, තවත් අරක්කු හරිගස්සන්න පුළුවන් නම්, ඒ අනුව අරක්කු මිළ රුපියල් 5 ට බස්සවන්න පුළුවන් නම්, සර්වාංගය පුච්ච ගන්න විෂ මත් ද්‍රව්‍ය බීම නවත්වන්න පුළුවන්. ඒ සඳහා වුවමනා කරන්නෙ ශරීරයට අහිතකර නැති සැර බීමක් සුළු මුදලකට දීමයි. සල්ලි තියෙන උදවිය විස්කි, බ්‍රැන්ඩි, ජින් ආදිය බීම ගැන විරුද්ධ වන්නේ නැතිව දුප්පත් මිනිසා බොන රා පොල් කට්ට ගැන පමණක් විරුද්ධ වන්නේ මොන කරුණක් නිසාද යන්න මට නම් ලොකු ප්‍රහේලිකාවක්. තැබෑරුම්වලට යන උදවියට මින් පසු පොල් කටුවේ රා දෙනවා වෙනුවට හොඳට මේසය පුටුව සපයා පිරිසිදු ලෙස වීදුරුවේ රා දෙන හැටියට දැන් සුරාබදු කොමසාරිස්තුමා තැබෑරුම්වලට දැනුම් දී තිබෙනවා. එතකොට දැන් හැංගි හොරා ගොස් බොනවා වෙනුවට හොඳට වාඩි වී පිරිසිදු ලෙස රා බොන්නට අවස්ථාව ලැබෙනවා.

අ. භා. 7.45

ඉන්දියාවෙන් ගස් මදින්නන් ගෙන්වීම ගැන මේ සභාග ආණ්ඩුව ඇති වන්නටත් පෙර කරුණු ඉදිරිපත් වී තිබුණා. ගස් මද්දවන අය මදින්නන් 1,000 ක් ලබා දෙන ලෙස සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළා. නමුත් ඒ කාලයේදී ඒ කාරණය සම්බන්ධයෙන් නොයෙකුත් විධියේ විවේචන ඇති වූ නිසා ගස් මදින්නන් ඉන්දියාවෙන් ගෙන්වීමේ අදහස අතහැර දමා, අවශ්‍යවන ගස මදින්නන් 1,000 සම්පූර්ණ කර ගැනීම සඳහා පුහුණු කර ගැනීම පිණිස මිනිසුන් එවන ලෙස දන්වා සුරාබදු දෙපාර්තමේන්තුව මගින් සෑම මන්ත්‍රීවරයකුටම ලියමන බැගින් යවන්නට යෙදුණා. නමුත් කිසිම මන්ත්‍රීවරයෙකුගෙන් පිළිතුරක් ලැබුණේ නැහැ. බොහොම ලොකුවට කෑ ගසන වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගෙන්වත් පිළිතුරක් ලැබුණේ නැහැ. නමුත් ඒ ගරු මන්ත්‍රීතුමා ඉන්දියානු ප්‍රශ්නය ගැන මේ ගරු සභාව වේදිකාවක් කරගෙන ගැලරියටත්, පත්‍රයටත් ඇසෙන සේ කෑගසනවා. ගස් මදින්නන් ඉන්දියාවෙන් ගෙන්වා ආපසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යවන බවට ඇපයක් වශයෙන් රුපියල් 5,000 බැගින් තැන්පත් කිරීමටත්, වීසා ටැක්ස් ගෙවීමටත් එකඟ වී ඕසට්ලර් අයිති කාරයන් පොරොන්දු පත්‍රයකටද අත්සන් කර තිබෙනවා. මේ හැර ගස් මදින්නන් මේ රටට ගෙන්වන්නට යන්නේ ඉන්දියානුකාරයන් මේ රටට ගෙන්වීමේ අදහස අනුව නොවෙයි. මේ අතරතුර මේ අවුරුද්දේ දී අපේ මධ්‍යස්ථානවලින් ගස් මදින්නන් වශයෙන් පුහුණු කර ගන්නට පුළුවන් වී තිබෙන්නේ 112 දෙනකු පමණයි. වීසා නැති, නැත්නම් බලපත්‍ර නැති ගස් මදින්නන් 1947. 1948 සිටම ඉන්නවා නම් ඒ අය පිළිබඳ වාර්තාවක් සපයන ලෙස අප දැනුම් දී තිබෙන බව මැද කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා දන්නවා. උන්නැහෙලාගේ සමිතියකින් අප එවැනි ඉල්ලීමක් කර තිබෙනවා. ඒ විධියේ අයගේ ලැයිස්තුවක් ලැබුණොත් ඔවුන් පිළිබඳ ප්‍රශ්නයද නිරාකරණය කොට පිටින් ගෙන්වන සංඛ්‍යාවෙන් ඔවුන්ගේ සංඛ්‍යාව අඩු කරන්නට බලා පොරොත්තු වෙනවා. එම නිසා නිකම් කෝප වී මේ ප්‍රශ්නය අවුල් වන ආකාරයට කල්පනා කරන්නේ නැතිව මෙය මේ රටේ කරගෙන යන කර්මාන්තයක් හැටියට කල්පනා කර ඒ සඳහා දිය හැකි සහයෝගයත් ආධාරයත් දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මට ලැබී තිබෙන කාලය අනුව මූලික වශයෙන් ඉදිරිපත් කරන ලද කරුණ පිළිබඳව සෑහෙන විස්තරයක් කළා යයි මා කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු පෞද්ගලික කරුණු රාශියක්ද ඉදිරිපත් කළා. පද්දිරිප්පුවේ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ කාරණය ගැන—තුරේනීලාවනෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය ගැන—ගරු ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කළ බව ඒ ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති.

About the Thuraineelavanai water scheme, I believe the hon. Member for Paddiruppu (Mr. Rasamanickkam) discussed the matter with us in the Ministry. I wish to inform him that the matter is again being re-investigated to see what the difference is between the various estimates that were given. I assure him that not only that scheme but his scheme will also be given consideration. That assurance I can give on behalf of the Minister.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින්ද කරුණු රාශියක් ඉදිරිපත් කරන්නට යෙදුණා. විදුලි පරීක්ෂකාරයකු ගැන එතුමා චෝදනා රාශියක් ඉදිරිපත් කළා. ඒ නිලධාරියාට විරුද්ධව ඇති චෝදනා සඳහා කරුණු දක්වන ලෙස දැනටම ඔහුට දන්වා තිබෙන බව පළාත් පාලන කොමසාරිස්තුමා අප වෙත දැනුම් දී තිබෙනවා. දඬුවම් කිරීමට හෝ වැඩ තහනම් කිරීමට හෝ ප්‍රථමයෙන් පරීක්ෂණයට වුවමනා කරන කරුණු ගැන දැනටම විමසා තිබෙනවා. දැනට එපමණකින් ගාල්ලේ මන්ත්‍රීතුමාට තෘප්තිමත් වන්නට පුළුවන් යයි මා කල්පනා කරනවා.

නාත්තන්ඩිය ප්‍රදේශ වාසීන්ට මරණ සහතික සහ කසාද සහතික ලබා ගැනීම සඳහා කරදර සිදු වන බව නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. දැනට එම සහතික ලබා ගැනීම සඳහා පුත්තලමටම යන්නට සිදු වී තිබෙන බවත් එතුමා කීවා. නමුත් 1964 ජූලි මාසයේ සිට හලාවතින් එම සහතික ලබා ගැනීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් විධිවිධාන යොදා තිබෙන බව මතක් කරන්නට කැමතියි. කලවාන මන්ත්‍රීතුමා (එල්. ද. එස්. ඒ. ගුණසේකර මයා.) පාලමක් ගැන සඳහන් කළා. ඒ පාලමේ සැලැස්ම පළාත් පාලන සභාව විසින් සකස් කර තිබියදී, පසුව කරන ලද පරීක්ෂණවලින් එය පී. ඩබ්ලිව්. ඩී. එකට අයිති කටයුත්තක්ය කියා දැනගන්නට ලැබුණු නිසා, දැන් පී. ඩබ්ලිව්. ඩී. එකට භාර දී තිබෙනවා. දැන් පාලම තැනීමට වුවමනා මුදල් පළාත් පාලන සභාව දෙන්න පොරොන්දු වී තිබෙන බව කලවාන මන්ත්‍රීතුමාට දන්වන්න කැමතියි.

ඒ වාගේම හලාවත මන්ත්‍රීතුමා, (එස්. ඩී. ආර්. ජයරත්න මයා.) ඉස්කාගාරය පිළිබඳ ප්‍රශ්නයක් නැගුව. ඉස්කාගාරයක් හලාවතට දෙන්නට පොරොන්දු වී තිබුණේ නමුත් තවමත් ඉස්කාගරයක් හලාවත ඉදිකර නැතැයි කීවා. ඒ ගැන අපේ දෙපාර්තමේන්තුවෙන් කරන්නට ඕනෑ වැඩ කටයුතු දැනට කර තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විවියන් ගුණවර්ධන මිය.]

සමුපකාර ඉස්කාගාරයක් නිසා සමුපකාර කොමසාරිස්වරයාට ඒ ගැන කටයුතු කිරීමට කරුණු ඉදිරිපත් කර තිබුණේ වී නමුත් ඔහුට ඒ ගැන මතක් කර ලිපි යැවූ නමුත් තවම එයට පිළිතුරුවත් එම දෙපාර්තමේන්තුවෙන් අපට ලැබී නැහැ. ඒ ගැන කරුණු සොයා බලා කටයුතු කරන අතරම, ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටි නවා ඒ ගැන මන්ත්‍රීතුමාත් වඩාත් උනන්දුවෙන් ක්‍රියා කරන්නටය කියා.

ඒ වාගේම, ජල නළ පිළිබඳ ප්‍රශ්නයක් නැගුවා.

